AGNI WARSHA
A Sinhala Novel
by
Deeman Ananda
Published by
Roland A. Fernando
THARAKA PUBLISHERS
St Anthony's Road,
Pinnawala - Balangoda,
Sri Lanka.

Buddyalbums
www.buddyalbums.net

අග්නි වර්ෂා

ඩීමන් ආනන්ද

ප්‍රකාශනය
තාරක ප්‍රකාශකයෝ
සාන්ත අන්තෝනි පාර, පින්නවල, බලංගොඩ.

අග්නි වර්මා

© ධීමන් ආනන්ද

ප්‍රථම මුද්‍රණය - 2000

Buddyalibrary
www.buddyalibrary.com

1

පිටකෝටටේ මංසන්ධියේ උඩ අතට වැටුණු රජමහා වීහාර පාර ඔස්සේ සැතපුම් කාලක් පමණ ගිය පසු වම් පසින් කුඩා මාවතක් හමුවෙයි.

සුදත් වීරසේකර පදවාගෙන ආ හොන්ඩා - 125 වර්ගයේ අලුත්ම පන්නයේ යතුරු පැදිය මේ පටු මාවතින් හැරී ටික දුරක් ධාවනය වී උස් තාප්පයකින් ආරක්ෂිතව තිබූ දෙමහල් නිවසක යකඩ ගේට්ටුව ඉදිරියේ නැවතිණ.

ආරක්ෂක හිස්වැස්ම අතට ගනිමින් ඔහු ගේට්ටුව පසෙක තිබූ විදුලි බොත්තම තද කළේය.

විනාඩි කීපයක නිහඬතාවක් පැතිරිණ.

මඳ අවසරයකින් යකඩ දොර සෙමෙන් සෙමෙන් තරමක් විවර විණ.

"ගුඩ් මෝනිං සර්! මම ගන්නද බයික් එක ඇතුළට"

ඒ ගේට්ටුව විවෘත කල මැදිවිය පසුකල මෙහෙකරුය

"නෝ තැන්ක්ස් - මම ගන්නම්"

සුදත් යතුරු පැදිය ඇතුලට ගත් පසු ගේට්ටුව යලි වැසිණ.

යතුරු පැදිය පෝට්කෝව යට නවතා ඉන් බැසගත් සුදත් නිවසේ ආලින්දය වෙත පා තබන්ම මෙනෙක් වේලා ඔහු ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි ගෙහිමි කාන්තාව මද සිනාවකින් මුව සරසා ගන්නාය.

"මෝනිං මැඩම්"

"මෝනිං සුදත් - අද හෙල්මට් දෙකක්ම තියෙන්නෙ. ලිෆ්ට් එකක් දෙන අලුත් යාළුවෙක් ඉන්න පාටයි."

ඒ ගෙහිමි කාන්තාවගේ කටහඬ මන වසඟ කරන ඇගේ රූප ශෝභාව මෙන් කන්කලුය. මිහිරිය.

බැලූ බැල්මට ඇයට වයස අවුරුදු තිහක් පමණ ඇත. වක්ව, දික්ව උස්, පහත් සිහින්, මහත්විය යුතු නැන් වලින් නියමිත ආකාරයට නිර්මාණව පිහිටි සිරුරේ අවයව ඕනෑම කෙනෙකු - ඇය දෙස දෙවරක් බලනු නියත බව ඇයද දැන සිටියා විය හැක.

එමෙන්ම ඇගේ කනා විලාශය ද රූසපුව සමඟ සැසැදෙන බවක් පෙනෙන්නට තිබුණි.

ඇය සුදත් සමඟ කනා කලේ යාන්තමට සිනා සෙමිනි. එවිට ඇගේ මුහුණේ රාගනිගිත පෙනුම කෙනෙකුට ලෙහෙසියෙන් අමතක කල හැකි නොවේ.

සුදත් තම තරුණ ස්වාමිදුව දෙස එක එල්ලේ නොබැලුවේය.

"හදිස්සියෙ යාළුවෙක් එහෙම මගදි හම්බවුනොත් ලිෆ්ට් එකක් දෙන එක හොඳනෙ"

"වැඩේ නම් හරක නැහැ. හැබැයි ඔයත් ලස්සන කොල්ල. වැඩිපුර ගැනුු ළමයින්ට එහෙම ලිෆ්ට් දෙන්න ගිහින් නිකං අමාරුවේ වැටෙන්න එපා"

සුදත් සරදමට මෙන් සිනාසුණි.

"වටපිට ඇස් ඇරල බැලුවම, ගැනු ගන්න ඕන දෙපාරක් නෙවි හතර පාරක් ඕතර හිතල."

තරුණියාගේ ප්‍රකාශයෙන් කාන්තාවගේ පෙනුම එක්වර වෙනස් විය. ඇගේ පෙනුමට ගෝකී බවක් මුසු වූ අතර කටහඬ ද වෙනස් විය.

"සුදත් මට ද ඒ ඇනුම් පදේ කිව්වේ"

තමන් නොදැනුවත්වම වරදක් කල කෙනෙකු සේ සුදත්ට දැනින. "මං එහෙම කිව්වේ නෝනා ගැන හිතල නෙවි. ඒත් මට

එක වෙලාවකට මෙන්න මෙහෙම හිතෙනව. හාත්තු කරපු රූපයක් වගෙ නෝනා කෙනෙක් ගෙදර ඉන්දෙද්දි අපේ මුදලාලි නටන මේ නෙයියාඩන් මොනවද කියල. මට නම් තේරුං ගන්න බෑ"

ඇය සුදත් දෙස එක එල්ලේ බලා සිටියාය. ඇ නැඳ සිට දුහුල් නයිටිය නිසා විද්‍යමානවූ අඟපසඟ දෙස සුදත් ගේ දෙනෙත් ඔනුටත් නොදැනුවත්වම වරින්වර යොමු නොවූවා නොවේ.

දුහුල් නයිටිය තුළින් සිරුරේ හිරු එළිය නොවැටෙන කොටස් විනිවිද පෙනෙන විට තම සිරුරට වරින්වර විදුලිය සැර වදින්නාක් මෙන් සුදත්ට දැනින.

එහෙත් සින කැළඹුන බවක් නොඇඟවීමට ඔහුට ඇතුලතින් ලොකු සටනක යෙදෙන්නට සිදුවිය.

සුදත්ගේ පිළිතුරෙන් ඇගේ පෙනුම නැවත වෙනස් විය. තරමක් වේගයෙන් හුස්ම ගැනීම නිසා රිද්මයානුකූලව උස් පහත් වූ ඇගේ පිරිපුන් ලැම පෙදෙස නෙත ගැටීමෙන් හැඟීම් යටපත් කර ගැනීමේ සටනින් සුදත් අන්ත පරාජයක් ලැබීමට ආසන්නව තිබියදී නිවසේ මෙහෙකාර ගැහැනිය කුස්සිය පැත්තේ සිට එතැනට පැමිණියාය.

ගෙහිමි කාන්තාව මෙහෙකාරිය දෙස හැරුණාය.

"මොනවද අම්ම, උදේට තන්න ලැස්ති කලේ"

මනු යටි සිතින් මෙහෙකාර ගැහැනියට කෘතවේදී වූවාය. ඇය මෙහි නොපැමිණියේ නම්, ඔහුට සිය හැඟීම් පාලනය කරගත නොහෙන තත්ත්වයක් උද්ගතව තිබිණි.

මෙහෙකාරිය සුදත් දෙස බලමින්ම ස්වාමිදුවට පිළිතුරු දෙන්නට වූවාය.

"ඉදිආප්ප තියෙනව, මහත්තයට හිල් බතුන් ඇති කිරි හොදින් එක්ක, කට්ට සම්බෝලෙකුත් හැදුව."

තරුණ කාන්තාව සුදත් දෙස අමුතු ආකාරයේ බැල්මක් හෙලුවාය. "සොපි අම්ම තමයි මෙයා නරක් කරන්නෙ. ආස කරන හැම දේම හදල දීල"

මෙහෙකාරිය ඇය දෙස නොරිස්සුම් බැල්මක් හෙලුවාය.

"ඇයි නෝනම නේ කිව්වෙ, පව්, බෝඩින්කාරයා හැමදාම කඩ කෑම කන්නෙ. ඒ හින්ද හොඳට කන්න දෙමු කියලා"

"හරි! හරි!! ගිහින් ඉක්මණට කෑම ටික ලැස්ති කරන්නකෝ"

ඇය නවදුරටත් කුස්සි අම්මා කතා කරනු වැලකීමට උත්සාහ දරමින් පැවසුවාය.

සුදත් ද කුස්සි අම්මා කී දෙය නො ඇසුණ හා තැකීමක් නොකල බව පල කලේය.

"මේ දවස් දෙක තුනේම මුදලාලි ඇස් දෙකට දැක්කෙ නැහැ. කඩේ පැත්තෙ වත් ආවෙත් නැහැ"

ඇය සිනාසුනාය

"ගිටපු ගමන් අලුත්, වැදගත් බිස්නස්වලට අවුට්ස්ටේෂන් යනව. එන්නෙ දවස් ගණන් පහුවෙල. හැබැයි ඔය බිස්නස් වැඩි හරියත් කෙරෙන්නෙ ලොකු හෝටල්වල නැත්නම් රෙස්ට් හවුස්වල කාමර ඇතුලෙ"

සුදත් ඇය දෙස නොරිස්සුම් බැල්මක් හෙලා නිහඬ වූ විට යලි ඇගේ මල්බර සිනහව දෙතොලඟ රඳවා ගත්තාය.

"යමු ඉක්මනට තේ බොන්න. දැන් ඔයාගෙ ගෝලයො ටික ඇවිල්ල බලන් ඇති"

සුදත් ඇගේ පසු පසින් කෑම මේසය වෙත පිය නැඟුවේ කාන්දමක් පසුපස ඇදෙන ලෝහයක් මෙනි.

අනෝමා වීරසිංහ තමන් සමග උදෑසන ආහාරය ගෙන කොළඹ ආමර්විදියේ පිහිටි යකඩ බඩු වෙළෙඳ සැලේ යතුරු රැගෙන තම යතුරු පැදියේ නැගී ගේට්ටුවෙන් පිටව යන සුදත් වීරසේකර, එනම් තම සැමියා ගේ ව්‍යාපාරයේ කලමනාකාර තරුණයා නොපෙනී යන තෙක් උඩුමහලේ සඳලුතලයේ සිට බලා සිටියාය.

යතුරු පැදියේ දසුන මැකි ගිය පසු දිගු සුසුමකින් ලය සැහැල්ලු කරගෙන කිසියම් සියුම් චින්දනයකින් ලද අස්වැසීමකින් ලද තෘප්තියකට පත්වූ නියාවක් පලකරමින් සැහැල්ලු ගමනින් තම සයනාගාරය වෙත පා නැඟුවේ යළි සිතින් සිනාසෙමිනි.

අනෝමා රත්නපුර ප්‍රදේශයේ මධ්‍යම පංතියේ පවුලක තරුණියකි. මැණික් ගැරීම ජීවනෝපාය කරගෙන සිටි පියා ඇගේ පාසැල් ගමන නිමකරන අවදියේ දී තරමක් අතමිට සරු මැණික් මුදලාලි කෙනෙක් බවට පත්ව සිටි අතර අවට ගැරුම්කරුවන් ලබා ගන්නා මැණික් කොළඹ ජාවාරම්කරුවන්

වෙත ගෙන යන අතරමැදියෙකු බවට පත්ව සිටියේ. ප්‍රදේශය පුරාම අතමිට සරු විශ්වාසනීය ප්‍රසිද්ධියක්ද ලබමිනි.

ඇගේ මව මියගියේ ද මේ වකවානුව තුළය. අතබාල සොහොයුරන් දෙදෙනා රැකබලා ගනිමින් මියගිය මවගේ යුතුකම් කොටස නොපිරිහෙලා ඉටුකරමින් ජීවිතය ගෙවන එක් දිනෙක සවස පියා තම සම වයසේ සුහද මිතුරෙකු සමග නිවසට පැමිණියේය.

පියාගේ මිතුරා ඇද හොඳින් දන්නා කෙනෙකි. වසර ගණනාවක් පියා සමග ව්‍යාපාර කටයුතුවල නිරතවීම මේ දැනගැනීමට හේතුවිය.

නිවසට පැමිණි අන්කල්ට තේ කෝප්පයකින් සංග්‍රහ කිරීමට අනෝමා අමතක නොකළාය. විසිත්ත කාමරයේ වාඩිවී සිටි අනෝමාගේ පියා සහ ව්‍යාපාරික මිතුරා කල්පනාකාරීව තේ කෝප්ප අතට ගත්හ.

හින් නිලමේ - එනම් - අනෝමාගේ පියා තේ කෝප්පය බොන තමාට අතිශයින් විශ්වාසවන්තවූ - හිතවත් වූ සුහද මිතුරා දෙස බැඟෑපත්ව බලා සිටියේය.

ව්‍යාපාරික මිතුරාවන වීරසිංහ උගුරට දෙකට තේ කෝප්පය හිස්කර දැමීය.

"දැන් බලනම- ඔය බිස්නස් එකෙන් මට ලක්ෂ විසිපහත් විතර පාඩුයි" යි ඔහු දැඩි ස්වරයෙන් පැවසීය.

"මම දන්නව මුදලාලි, ඒත් මෙහෙම දෙයක් " හින් නිලමේගේ ස්වරය බැඟෑපත්ය. යදින සුලුය.

"දැනගත්තට හරියන්නෙ නැහැ. ඒකෙන් මගේ පාඩුව පිරිමහන්න බැහැ. කොහොම හරි මගේ සල්ලි ඕන"

"මගේ මැණික් ටිකත් නැති වුනා. මට දැන් ගම්මුන්ට මූණ දෙන්න බැහැ. පතල්කාරයන්ට මම සල්ලි ගෙවන්න ඕන"

මද වේලාවක් නිහැඩියාවේ වෙලී සිටියේය.

"නමුසෙ පතල් කාරයින්ට කීයක් විතර දෙන්න තියෙනවද?"

"ලක්ෂ පහළොවක්, විස්සක් විතර"

"හොඳයි නමුසෙට දෙන්න බැරිවුනොත්, මේ සල්ලි"

"මම ඉවරයි. උන් මාව මරයි. මුලු පවුලමත් එක්ක"

"නමුසෙම දන්නව මට ඔය ගණු දෙනුවෙන් කෝටියක විතර පාඩුවක් වුනා. රතු, නිල්, ආරනුල් පසිංගල්, කැටස් අයි ඒ

එක්කොම මට නැතිවුනා"

"මම නොදන්නව නෙව්. සල්ලි බේරුවෙ නැත්තං මුන් මාව කයි ඇවින්"

වීරසිංහ එය ගණනකට නොගත්තාක් මෙන් සිනාසෙන්නට විය.

"නවුසෙ බයවෙලා හරියට. හෙට එනව මගේ ඔෆිස් එකට, මම බලා ගන්නම් සේරම"

ඔහු නැඟිට මිතුරා වැළඳ ගත්තේය. හින් නිලමේ වීරසිංහ දෙස හෙලුවේ කෘතවේදී බැල්මකි.

"මම හීනෙකින්වත් හිතුවෙ නැහැ මේ විදියට උදව්වක් කරයි කියල"

"හෙට එන්නකෝ. අපි කතාබහ කරල පිළිවෙලක් කරගමු. කොහොම හරි ණය ගෙවන්නත් ඕන නේ."

"නැතුව, නැතුව, මට මොනදේ වුනත් කමක් නැහැ. ණය ටික ගෙවල දාල ගමට මුණ දුන්නොත්"

වීරසිංහ තම සගයා පත්ව සිටින අසරණ තත්ත්වය සානුකම්පිනව නිරීක්ෂණය කරන බවක් පළ කලේය.

අපි සල්ලි හම්බකරනව, නැති කරනව. සමහරු හම්බ කරන්න ගිහින් අමාරුවෙත් වැටෙනව. එහෙම වෙලාවට එකට බිස්නස් කරපු මිනිස්සු දැනගන්න ඕන අමාරුවෙ වැටිච්ච මිනිහට පිහිට වෙන්න"

"කොල්ලො දෙන්නත් හරිම බයෙන් ඉන්නෙ"

"බයවුණාට ප්‍රශ්නෙ විසඳෙන්නෙ නැහැ. අපේ පාඩුව පැත්තක තියල පතල් කාරයින් ණය ටික ගෙවල දාන්න බලමු. කොහොම හරි"

"මට ඒ උදව්ව කෙරුවොත් ඇති"

ඒ උදව්ව ඒ අයුරින්ම ඉටු කෙරින.

වෙනසකට සිදුවුනේ ලාබාල අනෝමා ඇගේ පියාගේම වයසේ සිටි වීරසිංහගේ බිරිඳ වීම පමණි. ලක්ෂ පහළොවක් බොල් ණය ලෙස කපා, හරින ලදී. තම සම වයසේ මිතුරාට දියණිය බිරිඳ වශයෙන් බාරදීමට තරම් පහත් තත්ත්වයකට ඇද දැමුවේ මේ ලෝකය පාලනය කරන රුපියල් ගත විය හැක. කෙසේ වෙතත් තම දියණියගේ දෙනෙතින් වැගුරුණු ලේ කඳුළුවල ශාපයට ඔහු දෙසතියක් ඇතුලත අදිසි දේව නීතිය හමුවේ දණ

නැමිය.

අනෝමාගේ විවාහයෙන් දෙසතියකට පසු පියාගෙන් ලැබුන ලිපිය දහවල් කෑම මේසයේදී අනෝමා තමන් නොකැමැති පිළිකුල් සැමියාගේ මුනුණටම දමා ගැසුවේ නිරිසන්කමේ ජඩකම පෙන්වීමට මෙනි.

එය දියණියකගෙන් සමාව අයදින කෙටි ලිපියකි. තමන් විසින් කළ පවට වන්දි ගෙවීමක් වශයෙන් ගල්ඔය ජන්දයේදී කාමිනාගක තෙල් පානය කිරීමට පෙර ලියූ අවසන් ලිපිය සියවූ වීරසිංහ ඉන් සසල වූ හෝ කම්පාවූ බවක් නොපෙන්වීය. අනෝමා ලිපිය කියවන තැනැත්තාගේ ඉරියව් ගැන සුපරීක්ෂාකාරී වූවාය.

"ජීවත් වෙන්න නොදන්න එකා මැරුණම සමහර මෝඩයො අඬනව"

ලිපිය කියවා පසෙකට දැමූ වීරසිංහ එසේ කීවේ දෙතොලට නංවාගත් සරදම සිනාවකුත් සමගය.

අනෝමා මුවින් නොබැන කෑම මේසයෙන් නැඟිට ගියාය. ඒ කෙටි කාලීන විවාහය ජීවිතයේ අවසන් දිනයද විය. පියා ඇය ලංසුවකට නබා විවාහකර දීම, තමාට වඩා දෙගුණයක් වයසැති බෙබදු සල්ලාලයකුට ඒ කෙටි කාලය තුළම ඇඹූ කඳුළින් නැඹීමට සමත් විය.

පියාගේ සියදිවි නසා ගැනීම ගැන හැඬීමට තරම් කඳුළු ඇය තුළ නොවිණ.

ඇය පියාගේ වියෝව ගැන කඳුළු බිඳුවක් වැගුරුවේ නැත. පිය සෙනෙහස ගිලිහී ගියේ ඒක පාක්ෂික බලහත්කාර විවාහ දිනයේදීමය.

ඇය තුළ මුළු පිරිමි සංහතිය ගැනම ඇතිවූයේ අන්ත කලකිරීමකි. බද්ධ වෛරයකි.

මෙතරම් මල්ලේවව, පහත් නිරිසන් ගතිගුණ පිරිමින් තුළ තිබෙන බව ඇය දැන ගත්තේ එදාය. තාත්තා කියා නිරිසනෙකුට මෙතෙක් අමතා ඇති බව, ආදරය කර ඇනිසැටි, අම්මා නැති පිඩුව ඇයට දැනුනේ ඒ ජඩ විවාහ දිනයේය. පියා යැයි කියාගෙන සිටි තැනැත්තාට අවශ්‍යව තිබුණේ මුදල් පමණි. තම දියණියගේ විවාහය ගැන වචනයක් හෝ නොවීමසීමට තරම් ඔහු

www.buddyalibrary.com

බලධාරියෙකු විය.

විවාහයට පෙර දින වූ කතාබහ ඇයට හොඳින් මතකය.

"දුව අපි යමු කොළඹ හෙට. වැඩ ගොඩාක් තියෙනව කරගන්න"

පියාගේ යටි සැලැස්ම ගැන කිසිවක් නොදන් අනෝමා කොළඹ යාමේ අවස්ථාවට එක එල්ලේ එකඟ වූවාය.

"මල්ලිල දෙන්නත් එක්ක යමු, කොළඹ යන්නෙ කලාතුරකින්නෙ"

"ඒක බැරිය වෙන දවසක, අපි දෙන්න විතරක් යමු හෙට"

"ආපහු එනව නේ රෑට"

"නැහැ, වීරසිංහ මුදලාලිගෙ ගෙදර නවතිනව රෑට"

"අර මෙහෙ එන වීරසිංහ අන්කල්, නාත්තගෙ යාළුව. මම හොඳට දන්නව. අපේ ගෙදරට ඇවිල්ල තියෙනව කීප දවසක්ම"

පියා ඇය දෙස ටික වේලාවක් බලා සිටියේය.

"ආ, ඒ ගෙදර තමයි නවතින්නෙ. හරිම හොඳ ගතිගුණ තියෙන මනුස්සයා. ඒ වගේම වැදගත්, සල්ලි වකාරෙට. බිස්නස් කිව්වම කෙලවරක් නැහැ. ගේ දොර රජ මාලිගාවල් වගේ. අතට පයට වැඩ කාරයෝ. කාර් බාර්, වතු පිටි කිසිම දේකින් අඩුපාඩුවක් නැහැ."

"ඒ මොකුත් නැතිව ආවත් මෙහෙ නවාතැන් දිල හොඳට කන්න බොන්න දුන්නෙ"

පියා නැවතත් ඇය දෙස බලා සිටී.

අද ඉන්න තිබුනෙ උඹේ අම්ම.

මේවිටම තරුණයන් දෙදෙනෙකු එතැනට පැමිණියහ. එකෙකු අවුරුදු දහ අටක් තරමය. අනෙකා අවුරුදු දෙකකින් පමණ ලාබාලය.

වැඩිමහල් තරුණයා කෝපයෙන් බැල්මක් හෙලීය. "මෙහෙ දෙන්න කයිය. අර මිනිස්සු සල්ලිවලට වලි කනව. අපිට ටවුමෙ ඉන්නත් බැහැ. ගල්වලට පොල්ල දැම්ම කියල කියනව."

පියා පුතුන් දෙදෙනා අස්වසාලීමට වෙර දැරීය.

"ගල් ගත්තෙ, වෙච්ච දේ දන්නෙ මම විතරයි"

"ඔව ඒ මිනිස්සුන්ට වැඩක් නැහැ. සල්ලි විතරක් ගෙවන්න."

"වෙනද ගෙව්වෙ නැද්ද වැඩියත් එක්ක?"

"හැමදාම ඒ විදියට කෙරෙන්න ඕන, ගලක් නොයා ගත්තෙ

මොනතරම් දඟලුක් විඳලද? දහඩිය හලලද?"

"කවුද සල්ලි දෙන්නෙ නැතෙයි කිව්වෙ?"

වැඩිමහල් පුතා පියා වෙත ලංවිය. මහු පියා දෙස එක එල්ලේ මද වේලාවක් බලා සිටියේය.

"නාත්තා මේ අහන්න. ඔය ගල් අරාබියෙකුට දුන්න. ඌ ගලුත් අරන් මාරුවුණා. ඔවා අර වීරසිංහගෙ පට්ටපල් බොරු. මේකලා නාත්තාව රවටටන්න අටවපු උගුලක්. ආන්න ඒක දැනගන්න. අපි හැමෝම යනව. ඔය නාත්තගෙ මහ ලොකු යාළුව වීරසිංහයගෙ ගෙදරට.

පියා පුතුන් දෙදෙනා දෙසට මාරුවෙන් මාරුවට බැල්මක් හෙලීය. අවසන ඒ බැල්ම නැවතුනේ දියණිය වෙතිනි.

"මමයි, අක්කයි හෙට කොළඹ යනව. ඹම එන්නෙ සල්ලි අරගෙන"

බාල සොහොයුරා මහත් සේ කෝපයට පත්වූවා සේය. "ඇයි අක්ක යන්නෙ. එයා හිටපුදෙන් ගෙදර"

නව වැඩ වගයක් තියෙනව කරන්න. වීරසිංහ මුදලාලි අක්කට හොඳ රස්සාවක් බලල තියෙන්නෙ"

"මන නැහැ එයාට රස්සාවල්. අපි දෙන්න කොහොම හරි කන්න බොන්න අදින්න දෙනව"

පියා කෝපයෙන් මෙන් පුතුන් දෙදෙනා දෙස රවා බැලීය. "උඹල හෙට අනිද්දට ගැනු ගත්තම අක්කට කවුරුවත් නැහැ. මමත් නැතිවුනාම ඒකිට යන කල දවසක් ගැන මේ බලන්න ඕන, අම්මත් නැති එකේ"

"ඕන දෙයක් තරහොන ඉක්මණට එන්න. අපි දෙන්නා එන්න එපාද කොළඹ"

"වැඩක් නැති වියදන්. මම කොහොම හරි සල්ලි ගේනවා. මේ ගෙදර උගහට තියල හරි ණය බේරනව"

අනෝමා නිවසේ සාලයේ අසුනකට බරව රූපවාහිනිය දෙස නෙත් යොමාගෙන සිටියාය. මෙසේ පසුවන අතර හිටි හැටියේම නාද වූ විදුලි සීනු හඬින් ඇය තරමක් නොසන්සුන් වූවාය. විනාඩි කිහිපයක් ගෙවී යන්ම අමුත්තෙක් ඇය අසලට පැමිණියේය.

"හලෝ සිස්ටර් ගුඩ් ආෆ්ටර්නූන්"

ඇය නොසතුටෙන් මෙන් අමුත්තා දෙස බැල්මක්

හෙලුවේය.

"එන්න මල්ලි ඇතුලට. මනක් වෙනව අපිත් ඉඳල හිටල"

අමුත්තා කතාබහක් නැතිවම සෙටියක අසුන් ගත්තේය.

"ආවෙ නැද්ද අයිය ගෙදර නාම"

ඇය නිහඬව රූපවාහිණිය දෙස බලා සිටි අතර අමුත්තා ද කාන්තාව දෙස බලමින් කල්පනාවට වැටී ඇත.

වික්ටර් වීරසිංහ, ඒ නිවසට පැමිණි අමුත්තාය. අනෝමාගේ සැමියා වූ වීරසිංහ මුදලාලිගේ එකම සොහොයුරා ඔහුය. හොඳට උගත් නමුදු, ඔහුට රැකියාවක් නැත. මව්පිය උරුමයෙන් ලැබුන කුලියාපිටිය පෙදෙසේ පොල් අක්කර විසිපහක වත්තක හිමිකරු ඔහුය. නවමත් අවිවාහකය.

සියාගේ අකල් මරණයෙන් පසු වෙළෙඳ ව්‍යාපාර සියල්ල තමන් සතුකරගත් තම වැඩිමහල් සොහොයුරු එඩමන් වීරසිංහ එම ව්‍යාපාර වලින් ලැබෙන ලාබවලින් නඹ සතයකුදු වික්ටර්ට දුන්නේ නැත.

"කොහොමද මල්ලි සැප සනීප ?"

"කියන්න තරම් වරදක් නැහැ. මෙහෙත් වෙනසක් පේන්න නැහැ වගෙයි."

අනෝමා ඔහු දෙස ගුප්තාර්ථ බැල්මක් හෙලුවාය.

"මේක ගෙදරක් නෙව්. ගෙයක් විතරයි"

වික්ටර් කල්පනාකාරීව වටපිට බලන්නට විණ. ඔහුගේ කටහඬේ ශෝකාකුල බවක් ගැබ්වී නිබිණි.

"මට හරිම කණගාටුයි අක්කා ගැන. ඒත් කරන්න දෙයක් නෑ. ඒ අක්ක ලබා උපන් හැටි."

"කාගේවත් පව් නවත් කෙනෙක් ගෙවන්න හදන එක විහිළුවක්. කපාගත්තු කට්ටියම කරතියා ගනිවි"

වික්ටර් නිහඬව සිටියි.

මේ තරම් සුරූපී නරුණ කිරිදක් ගෙදර තනිකර මුදල් නාස්ති කරමින් බෙබදු සල්ලාල අපචාර ජීවිතයක් ගෙවන තම සොහොයුරා ගැන ඔහු තුළ හටගත්තේ කලකිරීම, ද්වේශය හා කෝපය මුසු හැඟුමකි.

"ඔය පව් කාරයන්ට කවද හරි හෙන වදිනව. ඒ කොහොම වුණත් අක්ක ඉදිරි ජීවිතේ ගැන කොහොමද කල්පනා කරන්නෙ?"

අනෝමා ඔහු දෙස තෙත් දල්වා බැල්මක් හෙලුවාය.

"මොනවද කරන්න තියෙන්නෙ?"

වික්ටර්ගෙ බැල්ම යොමුව තිබුණේ අනෝමාගේ කතා විලාශය කෙරෙහිය. දුම්වැටියක් දල්වාගත් ඔහු මද වේලාවක් නිහැඬියාවේ පසුවිය.

"මම කරන්නද පොඩි යෝජනාවක්?"

අනෝමා නැති ගත් බවත් පල කළාය. එවිට වික්ටර් කොක් හඬලා සිනාසෙන්නට විණ.

"වචනෙටම ඔයවුණා වගෙයි. මම කියන්නෙ අක්කගේ යහපතට. මම අක්කයි කිව්වත් අක්ක මට වඩා වයසින් අඩුයි. නවම තරුණයි. ලස්සනයි. සල්ලි තියෙනව. ඇයි නිකම් මෙහෙම නිරපරාදේ දුක් විඳින්නේ? අයිය හදා ගන්න බැලුවේ නැද්ද?"

"බැරිද උණ පුරුකක්, ඇද නැති එකක් හොයාගන්න?"

"එස්ලෝන් බටයක් හොයල දෙන්නම්"

"දාල බලමු බලු වලිගයක් එයින් එකකට"

වික්ටර් සිනාසෙමින් නැඟී සිටියේය.

"මම කියන්න ලැස්ති වුනෙත් ඒක, නරකද දික්කසාද වුණොත්"

අනෝමා අමුතු ලොවකට ඇද දැමුවාක් මෙනි. එම අදහසට ඇය නිහඬව එක එල්ලේ බලා සිටියාය.

"ඊට පස්සෙ?"

"දැන් හාඩ්වෙයාර් එක සැහෙන තත්ත්වෙක තියෙ නේනෙ. බඩු ඔක්කොම කෙළින්ම ඕටරවින් ගෙන්වන්නෙ. නියම බර."

"ඒව කරන්නෙ මම නෙව්, සුදත්"

වික්ටර් ඇය කරා ලංවිය.

"දැන් නමයි නියම තැනට ආවේ. ඒ හැම දෙයක්ම කරන්නෙ සුදත්, මෙතන මැනේජර්. කලින් සේල්ස්මන් කොල්ල. වැල්ලවත්තෙන් ගත්ත කඩයක් රෙදි බිස්නස් එකකට දුන්න. බලාගෙන, තව තොටලඟිනුත් කඩයක් ගත්ත. වැලි ගඩොල් බිස්නස් වලට."

"එයාගෙ නමට"

"නැහැ, නැහැ, මගේ නමට. දැන් හාඩ්වෙයාර් එක අංග සම්පූර්ණයි. මුල්ලේරියාවෙත් ගඩොල් පෝරනේකුත් අරගෙන ඒත් මගේ නමට."

වික්ටර් දසන් පෙන්නා සිනාසෙන්න ටිය.

"ඒ ඔක්කොම මතු බලාපොරොත්තු ඇතිව කරන දේවල්"

"බිස්නස් එක දියුණු කරන්න මිනිහ හරි දක්ෂයෝ"

"ඒක තමයි කිව්වෙ මතු බලාපොරොත්තු ඇතුව කරන දේවල් කියල"

අනෝමාගේ මුව'ගට සිහින් සිනාවක් නැඟුණි.

"මල්ලී, මේ හැම දෙයක්ම වරදවා තේරුම් අරගෙන-"

"මම උපන්නෙ, හැදුනෙ කොළඹ, සමාජේ හොඳට දන්නව. කෙනෙක්ගෙ ඉරියව් දිහා බැලුවම පේන කියන්න පුලුවන්"

"පේන, ඕව, බොරු"

"මගේ පේන්, ඇහැට පේන, ඇත්ත පේන අක්ක දිහා බලලන්"

"එහෙනම් කියන්න බලන්න පේනයක්"

"අක්ක සුදත්ට රයිට් නෑ අවුට් ලව්. හරිද මගේ පේනෙ?"

අනෝමා ගල් ගැසුනාක් මෙන් සිය මස්සිනා දෙස හැඟීම වලින් තොර බැල්මක් හෙලා නිහඬව සිටියාය. වික්ටර් සිනාසෙන්නට විණ.

"සේල්ස්මන් හිටපු කොලුව දැන් මැනේජර්, මහත්තය අරන් දුන්න බයිසිකල් කටුව ඉබේම මෝටර් බයික් එකක් වුණා. ඉහළ මට්ටමේ ඇදුම් පැළඳුම්"

"දියුණුව එයාගේ දක්ෂකම. හැම කෙනෙකුටම තමන්ගෙ උපන් හපන්කම් අනුව දියුණු වෙන්න පුලුවන්."

"ඇත්ත ඇති හැටියට පිළිගන්න බය උගුරට හොරා බෙහෙත් කන්න හදන අය. සුදත් සම්පූර්ණයෙන්ම වෙනස් කළේ ඔයා. ඇත්ත මේකයි. පරණ සුදත්ගෙත්, ඔයාගෙත් තත්ත්වෙට ගැලපෙන වල් එඩියුකේටඩ්, ෂෝල්, කල්චර්ඩ්, සුදත් කෙනෙක් හදන්න උත්සාහ කරන්නෙ හරිද?"

"ඔය වගේ නිගමනේකට සාධාරණ හේතු සාධක තියෙන්න ඕන. හැම දේටම වැඩිය මගේ ඇස් කන් මට විශ්වාසයි. සුදත් ලඟ ඉන්න වෙලාවට ඔයා සම්පූර්ණයෙන්ම වෙනස්, ඉන්නෙ අමුතුම ලෝකෙක. බැල්ම කතාබහ, හැසිරීම, සේරම වෙනස්, තමන්ටම නොදැනුවත්වම අමුතුම සුන්දර ලෝකෙකට ඇදගෙන වැටෙනවා."

ඇය නිහඬව ඔහු දෙස බලා සිට බැගෑපත් බවෙකින් ඔහු

නියම තත්ත්වය අවබෝධ කරගෙන තිබෙන බව නොකැමැත්තෙන් හෝ පිළිගැනීමට ඇයට සිදුව ඇත. ඇත්ත වසන් කිරීමට තැත් කරනු වෙනුවට යථාර්ථයට මුහුණදීම මිනිස්කමේ හා එඩිතර බවේ ලක්ෂණයන්ය.

"විනක්කණානාඩියෙන් බලල පේනෙ හරියට කිව්ව. ඒත් මගේ උත්සාහය ඵලක් වෙයිද?"

"යමක් කරන්න ඕන හොඳ ස්ථාවරේක ඉඳගෙන. විරසිංහගෙ කසාද ගැනි සුදත්ට ආදරේ කරනව. ඔය අතරතුරේ කසාදෙ කටු ගාන්න ඕන. ඒකට සුදත් නවුල් කරගන්න. මම සයිඩ් සපෝට්. දික්කසාද වෙන්න හේතුව සුදත්ට නිකමට තේරුම් යන විදියට වැඩේ කරමු."

"මල්ලී කැමතිද මම දික්කසාද වෙනවට?"

වික්ටර් ඇය දෙස සානුකම්පිත බැල්මක් හෙලීය.

"අයිය වගේ ආත්මාර්ථකාමියෙක් නෙවී මම. අක්කා තාම තරුණයි. ලස්සනයි. විවාහ ජීවිතේ එහෙම පිටින්ම අසාර්ථකයි. ජීවත්වෙන්නෙ හිතට විරුද්ධව. මේ අපායෙන් ගොඩවෙලා - සතුටෙන් සමගියෙන් ජීවත්වෙනව දකින්න මම හරිම ආසයි. මම සුදත් එක්ක මේ....."

ඇය ඔහුට හරස් කැපුවාය.

"එපා මල්ලී ඒක කරන්න. එයාටම හිතිල කරන දේකට ඉඩ දෙමු. එයාට වෙන එෆෙයාර් එකක් තිබුණොත් හිතේ - ?"

"එහෙම දෙයක් නෙවී. තහනම් ගහට කිට්ටු වෙන්න බයෙන් ඉන්නෙ. නියම පසුබිම, අවස්ථාව සැලසෙන කල් බිස්නස් එක දැන් සීයට දෙසීයක් දියුණුයි. ලඟදිම අනෝමා හාඩ්වෙයාර් එක අනෝමා ගෘප් ඔෆ් කම්පැනීස් වෙනව"

"මම කියන දේ"

"මට හොඳට අවබෝධය තියෙනව. බලෙන් ආදරේ ලබාගන්න කැමති නැහැ. මම අතර මැදිය වෙන්නද?"

"මඟුල් කපුවො අවශ්‍ය වෙන්නෙ දිග යන්න බැරි ගෑනු පිරිමින්ට."

"මේක මඟුල් කපු කමක් නොවෙයි. හිතින්, ගහින් දුක් විඳින නැනට පිහිට වීමක් විතරයි."

අනෝමා ඔහු නිරීක්ෂණය කරන්නට ඛුවාය.

වික්ටර්!

තම විවාහක ස්වාමී පුරුෂයාගේ එකම සොහොයුරා වන මොහු තමා කෙරෙහි දැක්වූ අනුකම්පාවට සෙසෙනෙහි ලබාදීමට අනාගතය ගැන අපේක්ෂාවෙන් සාධාරණ තීරණයක් ගැනීම සඳහා ගැන කැක කිරීමට සිතුවා එසේ කෙරුණු අවස්ථාවේ. ගැසිරීම් පුද්ගලික හා විශ්වාස කටයුතු මේ ආදී සියල්ල ගැන සියුම් ලෙස පූර්වාලෝකනාවීම් සිටියේය.

මොහු කෙරෙහි කොතෙක් දුරට විශ්වාස කැකිය හැකිද?

සුදත් හැඟ තම අදහස් කෙළින් වළ කිරීමෙන් තමන් තාවාදීමක් හා සිත තුළ තලෙක සිට පැලපදීමක් වෙමින් සිටුන ඇතැමුන් එසේම සිතෙන ආදරයට දෙබිවීමෙන්ද?"

මේ කුළින් සුදත්ට කෙබඳු තත්ත්වයකට මුහුණදීමට සිදුවිය හැකිද?

මෙවැන්න් ධනවත්ය: බලවත්ය. එතුළින් විනෑම් තාරා වැවක් කර ඇත මෙහා ගැනීම සඳහා එකරම් දෙයක් කොළඹ.

ඇය තමා දෙස බලා සිටින අයුරු වික්ටර් හොඳින් දුටුවේය. අහසුරුව නිහැඩියාව සිනාදේය.

"අත්තම් තැනයි තේ හාවත්?"

අනෝමා පියවී සිසිල ලැබුවාත් ඇත්ත එක එවම දෙගෙනත් විනෑම කොට ගෙන පුවට සිතා රැල්ලක් නොතා අත්තාය.

"මෙහෙම අදුරුවී මොකද?"

"මම හේත කාරණයක් ගැන පුදුම්ම සිටිවෙන."

ඇය පරාසා ඔළුවත් හෙය. ඔවුන් හෙතුමත් ඇගේ සිතුවෙන් විත් ඇය නිහඬව අවත බලා සත්තාය.

කල්‍යාණී අත්ත බලන්න ඉක් සෝතත් මේ විකරයි. වික්ටර් ද නිහැඩියාවෙන් පසු සඳහන් කළේය.

අනෝමා තතු දෙස බැලුවාය.

"කවුද කල්‍යාණී?"

"අවුරුදු ගෙනත් අවියත් එක්ක වසුල් කපු කල්‍යාණී අත්තගෙ එක ගොත ගැන මම ද කියන්න ඕන"

අනෝමා තතු දෙස විස්මිතක බැල්මක් හෙලුවාය.

"ඇත්තටම කවුද මේ කල්‍යාණී?"

වික්ටර් අසුනෙන් නැගිට හොස් සිත්ගියේ ටයෙක වල්ලා සිමෙන සෝයාරුවක් දෙස හොඳින් බලා සිට ආපසු හැරුණි.

"අදුටනවද මේ හොටෝ එකේ ඉන්න දෙන්නා?"

අනෝමා එය ගණන් නොගනී.

"ඔය තියෙන්නෙ හොටෝ ඔක්ක තරම්"

"මේ ඉන්නෙ මගේ පරණ නෑන"

අනෝමා මියගත් පූ බවක් පල කළාය. එහෙ අවාණ පූ බවක් ඇය කෙරෙහි විදහාමෙන විය. මේ අතර ඉදිරිවෙන දොරපියවේ විදුලි සිතුර නාඳුන හඬ ඇසින.

දෙදෙනාම කිසිඩුව ඉන්නා අතර විනාඩි කිහිපයකින් එතැනට පැමිණියේ සුදත්ය. සුදත් වික්ටර් දෙසතාගෙන සිනාවකින් සංග්‍රහ කළේය.

"වික්ටර් අහන්නෙයාල ඇති ලොකු සිස්තක්. කිසිතව කවි එන්නෙ නැහැ, හාඩ්වෙයාර් එක පැත්තෙ.

වික්ටර් සිනාසෙන්නට විය.

"හාඩ්වෙනට අයිතෙ. දැන් හාඩ්වෙයාර් එක හොඳ එකක් වෙලා, මම දන්නව සේරම"

සුදත් අසුනකට බැඳිය. අනෝමා අසුනින් නැගිට තෙතැවට හමන් කළාය.

"මම හදන්නෙ කොමිසැනිය දියුණු කරල තන්න"

වික්ටර් තමන් ගෙදර වලා ගෙන එන තරමේ ලෙස සිනාසෙන අන්දම සුදත්ට පෙනිණ.

"අනෝමාට හොඳ දවස විලෙන්ටර් කොහෙත් නම්බෙවිලා සිටෙනවා. ඒ නැත අවත් ගව තත්තෙන්නැති."

මොහුගේ කතා විලාසයක්, තාවිඳ සිනාගවත් සුදත්ගේ සිත් නොගන්නේය. සහුගේ හැම වචනයක්ම දැකුතේ තමාව වල්ල කරන උද ඇතුම් පදයක් ලෙසිනි.

"කොමිසැනිය දියුණු කරල තන්නෙත් කාවවත් කරදරයක් වෙයිද?"

දැන් වික්ටර් එක වල්ලේම තතු දෙස තෙත් හොඳි කළේය. මෙවිට අනෝමා සවුන් සිට තැනට පැමිණි අතර මේතෙකාර කොටි හාමි අතුරුපස සහිත තේ සත්කාරයක් රැගෙන විත් එය තතා දැක්වීමත් මෙන් තනාස්තුව මත තැබුවාය.

ඉන් වික්ටර් කෝපයට පත්වූ සේය.

"කොහි, හිටපන් ගානට, මගොඩ තැබ මිහි කියන්නෙ?"

හොඳාසේ තතු දෙස පිළිකුල සහ කෝපය තැවී බැල්මක් හෙලුවාය.

"මම මේක දන්න කාලෙ ඉඳල හැම එකාටම කන්න බොන්න දීල තියෙනවා. මොකෝ ට්‍රේ එක කකුල් දෙක ළඟ තියල වැදල පිළිගන්නන්නද කියන්නෙ?"

සොපිහාමිගේ දඩබිඩර ප්‍රකාශය නිසා සැවොම නිහඬය. සුදත් තුෂ්නිම්භූතව සිටි අතර වික්ටර් කෝපයෙන් නැඟී සිටියේය.

"පර බැල්ලී! දැන් දානව නෝ එළියට"

සොපී කුස්සියේ දොර කොනකට ලංව සිට සිනාසුනාය.

"දානව ඇලන්න ප්‍රංචි මහත්තය මාව එළියට. එදාට තමුසෙ එළියෙ"

අනෝමා නිකට අත්ලේ නබාගෙන සිටිද්දී සුදත් කල්පනා සයුරේ කිමිදෙමින් සිටියේය. වික්ටර් කුස්සිය දෙසට යාමට උත්සාහ දැරූ නමුදු, සුදත් ඔහු වළකාලීය.

"එපා සර්! ඔය නාකි කාලකන්නි ගෑනිට ගහල පව් පුරව ගන්න. අපි යමු හෝටලේකට ගිහින්....."

"වැරදි අපේ නාත්තලගෙ. ගෙදර වැඩකාරකමට ගේන්නෙ, විල්ලුද ඇඳන් උඩ පස්සෙ නිදි කරවාගන්නවා. පස්සෙ උන් අපේ ඔළුවටම අත හෝදන්න එනවා. ඇහුනනේ දැන් කතාව."

සුදත් අනෝමා දෙස බලත්ම, ඇය හඬනු දැක මවිතයට පත්විය.

2

අනෝමාගේ ඒකාකාරී පාලු ජීවිතය මෙයේ ගෙවී යන අතර දෙමසකට පමණ පසු එක් සැන්දෑවක ඔයානන කුමන්ත්‍රණයක් ක්‍රියාවට පරිවර්තනය වෙමින් තිබින.

ඒ බියකරු සංධ්‍යාවේ නයහමාරට පමණ විටකෝටයේ රජමහා විහාර පාරෙන් හැරී යන පටු මාවතේ පිහිටි වීරසිංහ නිවස බලා සුදත් තම මෝටර් බයිසිකලයෙන් එමින් සිටියේය. ආමර් වීදියේ පිහිටි යකඩ බඩු කඩයේ වැඩ කිරීමෙන් පසු යතුරු සහ මුදල් රැගෙන වීරසිංහ නිවසට පැමිණීම මහුගේ රැකියාවේ දෛනික පිළිවෙතක් නොවේ.

වෙනදා යතුරු හා මුදල් රැගෙන මෝටර් රියෙන් පැමිණියේ අනෝමා වීරසිංහය. පෙරවරු එකොළහට පමණ සුදත්ගේ දිවා ආහාරය ද රැගෙන කඩයට යන ඇය ඔහුට සහාය වෙමින් මුළු වරුවම එහි ගතකර කඩය වැසීමෙන් පසු ආපසු නිවෙස කරා පැමිණීම සාමාන්‍ය පුරුදු පිලිවෙතය.

සෑහෙන මුදල් ප්‍රමාණයක් රැගෙන එන බැවින් ඇගේ මෝටර් රිය අනුගමනය කරමින් නිවසට පැමිණ රාත්‍රී ආහාර

වේලද රැගෙන තම නිවහන බලා යාම ඔහුගේ පුරුද්ද විය.

එහෙත් මෙදින වෙනසකි.

අනෝමාට පෙරදින තම ඉනාම හිතවත් මිතුරියකගෙන් ලැබුන ලිපියක් නිසා ඇය මුණ ගැසීම සඳහා කොටුවේ දුම්රිය පොළ වෙත ගියාය. මිතුරිය පැමිණෙන දුම්රිය බලාපොරොත්තුවෙන් ඇය ආපසු පැමිණෙන තෙක් ඔහුට නිවසේ නැවතී සිටීමට ද උපදෙස් ලැබී තිබිණ.

සුදත් යතුරු පැදියෙන් බැස යකඩ ගේට්ටුව වෙත ගොස් විදුලි සීණුවේ බොත්තමක් නාද කිරීමට සැරසෙද්දී ගේට්ටුව අඩක් විවර වී ඇති බව දුටුවේය.

එය ඔහුගේ නෙතට අමුතු දෙයකි.

ඔහු වසර ගණනක් තම දෛනික රාජකාරී පිළිවෙතක් වශයෙන්ද උදේ හවස මෙම නිවසට පැමිණ ඇත. මේ කිසිම දිනෙක ගේට්ටුව මෙසේ අඩක් විවෘත කර නොතිබුන බව ඔහුට හොඳට මතකය.

ඔහු ගේට්ටුව තවත් ටිකක් විවෘත කර යතුරුපැදිය කරා පිය නැගුවේය. විදුලිබල මණ්ඩලයේ වෑන් රියක් සේවකයින් සහ ඉණිමන් කිපයක් පාරේ අනික් පස තිබෙනු ඔහු නෙත ගැටිනි.

සුදත් යතුරුපැදිය ඇතුළට ගෙන ගේට්ටුව වසා දමා නිවසේ බාරකරු වශයෙන් වසර ගණනාවක් සේවය කළ ජේම්ස් අප්පු නිවසේ හැම දෙනාම ආදරයට ජේම්ස් අයියා යනුවෙන් ඇමතූ මෙහෙකරු සොයා ගරාජයට යාබදව පිහිටි ඔහුගේ කාමරය දෙසට යනවිට වීරසිංහ මුදලාලිගේ බෙන්ස් රිය ගරාජය තුළ තිබෙනු දුටුවේය.

වීරසිංහ මුදලාලි සති දෙකකට පසු නිවෙසට පැමිණ ඇත. මෝටර් රිය ඔහුගේ පැමිණීම සංකේතවත් කරන්නකි.

එය අමුත්තක් නොවූවද, ඔහු අවුරුදු හතරක්, පහක් තුළ එකම දිනයක් හෝ පිට කෝටටේ ගෙදර රාත්‍රිය ගතකර නැති බව සුදත් හොඳින් දැන සිටියේය. තම නිවසට පැමිණීමට, සිතැඟි පරිදි රාත්‍රිය ගත කිරීම හෝ නොකිරීම ගෙහිමියාගේ අයිතියක් බවත්, එයින් තමා කැළඹීමට පත්වීමට හෝ එවැන්නකට හේතු, සාධක සෙවීමට හෝ නමන්ට ඇති අයිතිය කුමක්ද? සුදත් යාන්තමට හිනැහෙමින් ජේම්ස් අයියාගේ කාමරය වෙත ගමන් කළේය.

එය අඟුලු දමා වසා තිබිණ.

සොපි අම්මා සොයා කුස්සිය දෙසට පිය නැඹීමට සැරසෙද්දී ඇය පෙරදින දියණියගෙන් ලැබුණ නදිසි විදුලි පුවතක් අනුව ගමේ ගිය බවත්, අද රාත්‍රි ආහාරය අනෝමා දුම්රිය පොළේ සිට ආපසු පැමිණි පසු දෙදෙනා එක්ව පිළියෙල කිරීමට කටිකා කරගත් අයුරුත් ඔහුට සිහිපත් විණි.

ගෙයි ඉදිරිපස ප්‍රධාන දොර විවරව තිබූ නිසා යතුරුපැදියේ තිබුනු හම් බෑගය අතට ගෙන ඔහු ගෙට ඇතුළුව මැද සාලයේ කනප්පුව මත තැබීය.

දින කීපයකින් වීරසිංහ මුදලාලි අනෝමා සමඟ විවාහයෙන් පසු යකඩ කඩය පැවරීමට පෙර තම භාණ්ඩාගාර නම් වී වචනයක් දෙකක් කතාකළ යුතුයයි සිතුවේය. අසුනෙන් නැගිටීමට සැරසෙද්දී ප්‍රතිමල්ලවයකු නඟුවීමට යාමට සූදානම් වන බවක් ඇති සිත ඉඟිකළ නිසා මඳක් පසුබා සිටියේය.

මනැස තුළ අනෝමාගේ රූබර මුහුණ, අවිඥිංසක සිනාව, ලයාන්විත කතාබහ, සෙනෙහස, ආදරය, කරුණාව, දයාව පිරී ඉතිරී පිටාර ගලන දෙනෙත රැදී කාන්තිමත් බැල්ම ඉස්මතු විණ.

වීරසිංහ මුදලාලි මුණ ගැසීමටත්, උදහසවෙන ඕනෑම ප්‍රශ්නයකට එඩිතරව මුහුණ දීමටත් ඔහු යටි සිතින් තීරණය කළේය. මේ තරම් ගැටලුව කුමක්ද? එය තමා විසින්ම සිතින් මවා ගත් එකක්ද?

නමුත් යටිසිත ඉඟිකළේ මෙය තීරණාත්මක සංධිස්ථානයකට, තමාගේ පමණක් නොව තිදෙනෙකුගේ එනම් වීරසිංහ මුදලාලි, අනෝමා සහ සුදත් යන මේ තිදෙනාගේම අනාගතය පිළිබඳ කේන්ද්‍රස්ථානයක තමා ප්‍රධාන අතර මැදියා සහ නළුවා බවට නිරායාසයෙන්ම පත්ව ඇති බවය.

ඔහු යටි සිතින් මුල හදවතින්ම අනෝමාට පෙම් කළේය. ඇයගේ දසුන දෙනෙතට රසඳුනක් විය. ඇය නොදැක, නොඅමතා, සිනා නොවී සිටීම ඔහුගේ සිතට මහත් වේදනාකාරී දෙයක්ම විය.

මෝඩ සුදත්

ඇයි තමා මෙතෙක් නම අවංක ආදරය පිළිබඳව ඇය දැනුවත් කිරීමට නියපත් බවක් පලකළේ, එයට ඇගේ ප්‍රතිචාරය කුමක් විය නැකිද?

ඇය රූමත්, ධනවත්, බලවත් විවාහක කාන්තාවකි.

තමා නිකම්ම නිකම් සුදත් පමණි. ඇගෙන් චේතනයක් ලබා ගෙන බඩවියන රැක ගන්නා හාල් මැස්සෙක් පමණි. වැඩි පැහිච්චකමට ආදරේ කරන බව කියන්න ගිහින් ලැබී තිබෙන දෙයින් සැහීමට පත්ව එන නත්ත්වයකට මුහුණ දී ජීවත්වීම ඇහට ගුණ බව වරෙක ඔහුට සිතෙයි.

හොඳයි කොහොම වුනත් දැන් ගිහින් මුණගැහෙනව.

මුදලාලි මහත්තය, බැරිවෙලාවත් මිනිහ මේ ගැන ඇහුවොත්?

'ඉටිගෙඩිය

ඒව මගේ හිතේ බයට මැවෙන දේවල්,

තමන්ගෙ හින හැර වෙන කිසිම කෙනෙක් නොදන්නා මේ රහස් ආදරේ ගැන වීරසිංහ කොහොම දැනගත්තද?

අඩු තරමින් අනෝමවත් හාන්කවිසියක් දන්නෙත් නැති කොට,

මෙසේ තමාටම සිනාසෙමින් ඔහු සිතන්නට ටිය.

සොල්දරය පාමුලට ගොස් ආපසු පැමිණ ඉදිරිපස දොර වසා දමා මුදල් හා ලිය කියවිලි සහිත බැගය කනප්පුව මත තිබියදී සොල්දරය නැග වීරසිංහ මුදලාලිගේ නිදන කාමරය වෙත ගොස් යාන්තමට ඇර තිබුනු දොර ලඟ නතර විය.

නිහැඩියාව රජයන්නට විණ.

ඔහු සේමින් දෙතුන් වරක් හෙමින් දොරට තට්ටු කරන්නට විය.

නැත කිසිම ශබ්දයක්!

"මුදලාලි! මම සුදත් කතා කරන්නේ"

මද අවසරයක්

කිසිදු ශබ්දයක් නැත. නිවෙස පුරා මල මූසල නිහැඩියාව රජයමින් තිබෙන විනාඩි කීපයක් මෙසේ ගෙවී ගිය නමුදු නිහැඩියාවේ වෙනසක් සිදුවුයේ නැත.

සුදත් විවෘතකර තිබුණු දොර හෙමින් සීරුවේ තල්ලු කළේය.

දොර විවෘත විය. අඩි දෙක තුනක් කාමරය තුළට නැඹූ සුදත් වැඩි නැතිව ගෙරවීමක් විදුලි කෙටීමක් නැති අකුණු සැරයක් වැදුනාක් මෙන් එක්වරම ගල්ගැසී නැවතිණි.

දෙවියන්ට ඔප්පුවෙච්චාවෙ, වීරසිංහ මුදලාලි නිදන කාමරය මැද සයනය අසල සිමෙන්ති පොලොවේ උඩුබැලි අතට වැටී සිටිනු පෙනිනි.

ඔහුගේ උඩුකය ආවරණය කර තිබුණු සුදු කමිසයේ පපු පෙදෙස රත් පැහැ ගැන්වී තිබිණ.

දකුණු අතේ ස්වයංක්‍රිය රිවෝල්වරයකි.

සුදත් මහත්සේ ගිනියට පත්ව, තම පරණ භාම්පුතා අල්ලා බැලීය.

වීරසිංහ මුදලාලි ප්‍රාණය නිරුද්ධවී මද වේලාවක් ගත වී ඇත.

තමා නොදැනුවත්වම පැටලී ඇත්තේ හරිම ජංජාලයක බව සුදත්ට දැන් අවබෝධවී නමාරය. එහෙත් දැන් මොනවා කරන්නද? ඔහුගේ නෙත් කලබලයෙන් කාමරය ඩිසාරා යැවුන නමුදු කලබලයක කිසිම ලකුණක් දක්නට නොවිය. හැම දෙයක්ම සුපුරුදු නැන්වල එලෙසම තිබිනි.

දසුනෙන් වික්ඛිප්තවූ සුදත් තමන් ගත යුතු ක්‍රියා මාර්ගය ගැන සිතන්නට විය.

ඉක්මන් වෙයන් කොයි දෙටත්, නැබැයි පුනා බොහොම කල්පනාවෙන් පොඩඩ වැරදුනොත් මේ, සේරම උඹේ කරපිටින් යන්නත් බැරි නෑ.

ඔහුගේ යටි සින අනතුරු ඇඟවූයේ ඒ අයුරිනි. මහා කාමරයෙන් පිටවූ සුදත් තරප්පු පෙළ බැස ඉදිරිපස දොර විවර කරගෙන ගෙවත්තට පැමිණ තරමක උස් හඬින් මෙහෙකරු අමතන්නට විය.

"ජේමිස් අයියේ! ජේමිස් අයියේ!!!

පිළිතුරක් නැත. ඔහු කලබලයෙන් කුස්සිය දෙසට පැමිණියද එහිද කිසිවෙක් පෙනෙන්නට නොවිය. මොහොතක් කල්පනා කරමින් සිටි ඔහු යළිත් ගෙට ඇතුළුව සාලය දක්වාම ගමන් කොට ටෙලිෆෝනය අතට ගෙන මිරිහාන පොලිසියේ අංක කරකවන්නට විය. මිරිහාන පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශයේ ඉන්ස්පෙක්ටර් ඩෙරික් තේනබදු, සාජන්ට් ආරියදාස හා උප පොලිස් පරීක්ෂක විකුම ජයවීරගේ මූලිකත්වයෙන් යුත් නිලධාරීන් කණ්ඩායමක් වහාම මරණය සිදුවූ ස්ථානයට පැමිණ මූලික පරීක්ෂණ ආරම්භ කළහ.

මරණ පරීක්ෂණයෙන් පසුව ගන්නා ලද තීරණය අනුව විරසිංහ නිවසේ සිටි එකම නැනැත්තා වූ සුදත් සිරබාරයට ගන්නා ලදී.

එහෙත් ඒ හේතු රහිතවය.

අනෝමා තමාට ලැබුන ලිපිය අනුව මිතුරිය හමුවීම සඳහා කොටුව දුම්රිය පොළ වෙත ගොස් බදුල්ල සිට පැමිණි දුම්රියේ අන්තිම මගියාද ඉවත්ව යන තෙක් දොරටුව අසල ගඳී සිට අවසාන දුම්රිය ස්ථානාධිපතිනැන වෙත ගියාය.

"බදුල්ලෙ ඉදල තව ට්‍රේන් එකක් එන්න තියෙනවද?"

"දුම්රිය ස්ථානාධිපතිතුමා ඇය දෙස බැලීය. "ඊලඟට තියෙන්නෙ නයිට් මේල් විතරයි. උදේට එන්නෙ"

"නානු ඔය ඉල ජන වෙන කෝච්චියක් නැද්ද?"

දුම්රිය ස්ථානාධිපති ඇය දෙස ඔරවා බැලීය.

"මට තියෙනව සැහෙන වැඩ. වෙන කෝච්චි නෑ. ඒ පැත්තේ ඉඳල එන"යි නොසතුටෙන් පවසමින් වෙනත් වැඩක නිරත විය.

අනෝමා කවුන්ටරයෙන් ඉවත්ව මදක් කල්පනාවේ යෙදී සිටියාය.

"මෙච්චර ලියුම එව්වෙ එතකොට අද එනවම කියල?" ඇය අත්බෑගයේ තිබූ ලිපිය හෙන පසෙකට ගොස් කියවන්නට වූවාය.

"හරි!"

"අද එන්න ඔන හවස බදුල්ල කෝච්චියෙ. දැන් බදුල්ල කෝච්චිය ආව. ආවෙ නැහැ ලියුම එවපු යාළුව."

ඇය ඉතා කල්පනාකාරීව තම මෝටර් රිය වෙත පිය නැගුවාය. නොඩෝ වේලාවකින් ඈ මෝටර් රිය නිවස බලා ධාවනය කරන්නට වූවාය.

මෝටර් රිය ගේට්ටුව ළඟ නැවතූ ඇය විදුලි සීනුව නාද කළාය.

දොර විවෘත විණ.

වෙනදා සිටින පේමිස් අයියා නොව විවර කළ දොර පිටුපස සිටියේ පොලිස් නිලධාරියෙකි.

ඇය පුදුමයට පත්වූවාය.

මෝටර් රියට ඇතුළු නොවී ඇය පොලිස් නිලධාරියා දෙස බැල්මක් හෙළුවාය.

පොලිස් නිලධාරී තැන ඇය නිරීක්ෂණය කළේය. දෙදෙනා මොහොතක් එකිනෙකා දෙස බලා සිටියහ.

"මොකද අද රාලහාමි කෙනෙක් ගේට්ටුවේ?"

අනෝමා එක එල්ලේම ප්‍රශ්න කළාය.

රාලහාමි යාන්තමට සිනාසෙන්නට විණ.

"ලොකු මහත්තය බලාගෙන ඉන්නෙ නෝන එනකල්. ගන්න වාහනේ ඇතුළට"

ඔහුගේ ප්‍රකාශයෙන් අනෝමා බියපත් වූවාය. "යෙදර පොලිසියෙන්? ස්ටේෂන් එකට ගිය යාළුවත් නැහැ. මොකක්ද මේ කරදරේ?"

ඇය තම රිය පෙණ ගන්වා ඇතුළට ගත් අතර රාලහාමි ගේට්ටුව වසා දැමුවේය. රියෙන් බැසගත් අනෝමා, ඉදිරි දොරටුව වෙත ගමන් කරන්නේ එය විවර කර ඇති බව දුටුවාය. විසිත්ත කාමරයේ පොලිස් නිලධාරීන් කිපදෙනෙක් වාඩිවී සිටිනු පෙනින.

සුදත් පසෙක හිටගෙනය. ඇය විසිත්ත කාමරයට ඇතුළු වූවාය. පොලිස් පරීක්ෂකවරයෙක් යයි සිතිය හැකි නිලධාරියෙක ඇය දෙස ගාම්භීර බැල්මක් හෙළීය.

"ගුඩ් ඒවිනින් මැඩම්. අපි ඔබ එනතුරු බලාපොරොත්තුවෙන් හිටියේ."

ඇය ඔහු ගැන එතරම් නැකීමක් කල සඟක් නොපෙනිනා. ඇය සුදත් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වූවාය.

"සුදත් මොකද හිටගෙන"

පොලිස් නිලධාරියා ඇය නියුණු ලෙස දෙනෙතින් නිරීක්ෂණය කරන්නට විය.

"මැඩම් කොහෙද ගියෙ හවස" ඒ ඔහුගේ පළමු ප්‍රශ්නයයි.

"මම කොටුවෙ ස්ටේෂන් එකට ගියෙ"

"තියෙන්න එපැයි හේතුවක්"

ඈ තම අත්බෑගය හැර ලිපියක් අතට ගත්තාය.

"මේ තියෙන්නෙ ලියුම. මගේ යාලුවා එනව කියල තිබුන ට්‍රේන් එකේ. මම ගියෙ ඒකට."

"කෝ යාලුව"

"මම පැය ගාණක් එනන රස්තියාදු වුණා. ඒත් එයා ආවෙ නැහැ."

ඉන්ස්පෙක්ටර් ලිපිය අතට ගෙන කියවා නැවතත් ඇය දෙස බැලීය.

"කවුද ජේම්ස්ට මරදාන ස්ටේෂන් එකට එන්න කියල කෝල් එක දුන්නෙ?"

ඇය පුදුමයට පත්ව පොලිස් පරීක්ෂකවරයා දෙස බලා සිටියාය.

"කවුද ජේම්ස් අයියට කෝල් එකක් දුන්නේ"

"මාත් අහන්නෙ ඒක නමයි"

අනෝමා වික්මිප්තව බියෙන් හා සැකයෙන් පොලිස් නිලධාරියා දෙස බැලුවාය. "ඉන්ස්පෙක්ටර්! මම දුන්න කෝල් එකක් නැහැ. මම කොටුවෙ ස්ටේෂන් එකට ගියෙ නිර්මලීගෙ ලියුමට. වෙනදත් මම නමයි ස්ටේෂන් එකට ගිහින් එයාව ගෙදරට එක්කන් එන්නෙ. එයාට කොළඹ ගැන වැඩිය දන්නෙ නැහැ. දැන් මට දැනගන්න ඕන මෙතන වෙලා තියෙන දේ"

ඉන්ස්පෙක්ටර් සිනාසෙන්නට විය.

"දන්නෙම නැතුව ඇති. තමන්ගෙ ස්වාමිපුරුෂයා මිස්ටර් වීරසිංහ, වීරසිංහ මුදලාලිට වෙච්ච දේ ගැන?"

අනෝමා ඇත්ත වශයෙන්ම පුදුමයට පත්වූ බව පොලිස් පරීක්ෂකවරයා තේරුම් ගත්තේය. නමුත් කොහොමද ගෑනු විශ්වාස කරන්නෙ? උන් මෙවැනි අවස්ථාවල රඟපෑමෙහිලා අනිදක්ෂය.

"මිස්ටර් වීරසිංහ, තමාගේ ස්වාමිපුරුෂයා මැරිල. වෙඩි වැදිල. නෝනා මේ කිසිම දෙයක් දන්නෙ නෑ. පුදුමයි. කවුද මේ සුදත් කියන හාදයා?"

"හාඩ්වෙයාර් ස්ටෝර්ස් එකේ මැනේජර්"

"එයා තමයි අපට මෙසේජ් එක දුන්නෙ. ඒ වුනාට මිස්ටර් වීරසිංහ ලක්ෂ දහයක් ඔෆීස් එකෙන් ගෙනත් තියෙනව. ඒ සල්ලි නැහැ."

විදුලි සැරයක් වැදුනාක් මෙන් අනෝමා ගල්ගැසී බලා සිට පුටුවකට බරවූවාය. අනතුරුව මඳ වේලාවක් කල්පනාවේ යෙදී සිටියාය.

"මේක මට හීනයක් වගෙයි. සුදත් හැමදාම උදේ හවස මෙහෙ එනව. හවසට එන්නෙ හාඩ්වෙයාර් එකේ සල්ලිත් අරගෙන යතුරු බාරදීල යන්න"

ඉන්ස්පෙක්ටර් ඇය සහ සුදත් දෙස පිළිවෙලින් බැලීය.

"කොහොම වුනත් වෙන්න ඕන දේ වෙලා ඉවරයි. දැන් අපි සුදත් සිරබාරයට ගන්නව. වැඩිදුර පරීක්ෂණ කෙරිගෙන යනකන් ඉතුරු හරිය පස්සෙ බලමු."

මේ කලබලය අස්සේම නිවසට පැමිණ සිටි මෙහෙකාර ජේම්ස් සමඟ පසෙක ගමන් කළ සාජන්ට වරයා මහුගේ ඉරියව් කෙරෙහි විමසිල්ලෙන් පසුවිය.

ඉන්ස්පෙක්ටර් හුනස්නෙන් නැඟිට අනෝමා අමතන්නට විය. "දැන් හුගාක් පරක්කු වුනා මිසිස් වීරසිංහ. මම හෙට එනව. ගෙදරින් පිට කොහේවත් යන්න බැහැ. තේරුණාද? මම අවුට් සයිඩ් ගාඩ් එකක් දාල යන්නෙ"

අනෝමා වික්මිප්තව බලා සිටියාය. "ඉන්ස්පෙක්ටර් එතකොට සුදත්?"

ඔහු සරදමට මෙන් සිනාසෙන්නට විය. "සම්පූර්ණ ආරක්ෂාව, ඇතුව පොලිසියෙ කුඩුවෙ ඉන්නව. මිණිමරල මගෙන් බැහැ බේරෙන්න, ගැලවෙන්න ලේසියෙන්. මගේ කෙස් පැහුනෙ කාකි කෝට් එකට.

"එතකොට එයාට කෑම බීම"

පොලිස් නිලධාරියා කෝප වූ බවක් පල කළේය.

"තමන්ගෙ ස්වාමිපුරුෂයා ගැන වචනයක් වත් ඇතුවෙ නැහැ. එහෙනම් සුදත් ගැන තමයි කැක්කුම. මම බලාගන්නම් සේරම. කෝ මිස්ටර් වීරසිංහගෙ මල්ලි වික්ටර්?"

අනෝමා නිහඬව නිලධාරියාගේ දෙස බැල්මක් හෙළුවාය.

"ඉන්ස්පෙක්ටර්! මේක කිසිම තේරුමක් නැති වැඩක්"

ඔහු අවා සිනාවක් පෑවේය.

"මම කිව්ව කලින්, මාව එහාට මෙහාට කරන්න ටිකක් අමාරුයි. සුදත් ඇතුලෙ. හෙට අනිද්දට අනින් දෙන්නත් ඇතුලෙ. මිණිමරන කොට පොලිසියක් නැතුව ඇති කියලයි හිතන්නෙ. රටක් වටින මිනිහෙක් මරලදාල තියෙන්නෙ"

නිලධාරියාගේ එම ප්‍රකාශයෙන් අනෝමා මදක් නොසන්සුන් වූවාය.

"මොනව කෙරුවටද අපි ඇතුළට ගත්තෙ?"

නිලධාරියාගේ දෙනොල් අතරට යළි උපහාසාත්මක සිනා රැල්ලක් එක්විණ.

"මැරිච්ච මිස්ටර් වීරසිංහගේ පුද්ගලික ලේකම්වරිය. මේ බංගලාවෙ කුස්සි අම්මා සොපි හාමි. මුරකාරයා ජේම්ස් මේ හැමෝම දන්නව තමන් අර සුදන් කියන ඉලන්දාරියත් එක්ක නටපු නැට්ටි."

අනෝමාගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියේය.

"ඉන්ස්පෙක්ටර්! සුදන් අහිංසකයෙක්. මම එයා ගැන හොඳ හැටි දන්න නිසයි එහෙම කියන්නෙ"

"නමුසෙලා තුන්දෙනාම හරිම අහිංසකයි. වීරසිංහගේ මල්ලි වික්ටර් එහෙම කොහොමද, ඔයාගේ ලව් එකට මිනිහ සපෝට් කරනව නේද?"

"ඉන්ස්පෙක්ටර්! මේ හැන නව ටිකක් හරියට හොයල බලන්න"

ඉන්ස්පෙක්ටර්වරයා උස් හඬින් සිනාසෙන්නට විය. "හොඳට ප්ලෑන් කරල මිණිරෙල. දැන් පොලිසියට උපදෙස් දෙන්න එනව. හැබැයි එක කාරණයක් මම කියනව. තමන්ට අයිනිය නියෙනව තමන්ගෙ ප්‍රේමවන්තයා පොලිසියට ගිහින් බලල කතා කරනවා. කන්න බොන්න දෙන්න. තමන් හිරබාරයට යන්න කල් තව දවසකින්, දෙකකින්" මෙසේ කී ඔහු අසුනෙන් නැඟී සිට සාජන්ට් වෙත හැරී "සාජන්ට් මේ බංගලාවට පැය විසිහතරෙම් ඒ කියන්නෙ, රවුන්ද ක්ලොක් ගාඩ් එකක් දාන්න. කාටවත් හෙදරින් එළියට යන්න බැහැ. ඇතුලට එන ඕන කෙනෙකුට එන්න ඉඩ දෙන්න"

මෙසේ කී ඔහු තම හිස් වැස්ම සහ නෝට් පොත ගෙන අනෝමා දෙස බලා උපහාසයෙන් මුසු ස්වරයෙන් "සුදන් නෝ-පිකුදු, නෝ බැදපු නෝර මාථ, අනේ පව්, නිකම්ම නිකම් පොලිස් රිමාන්ඩ් ඩයට් එක්ය කියමින් නිවසින් පිටවිය.

අනෝමා ඔහු දෙස බලා සිටියේ පිළිකුල් සහගතවය.

පිටකෝට්ටේ රජමහා විහාර පාරෙන් හැරුණු විට හමුවන කුඩා මාවතේ පිහිටි වීරසිංහ නිවසේ විසිත්ත කාමරය තුළ පිහිටි, අනෝමා සහ වික්ටර් මුහුණට මුහුණලා සෙට් දෙකක අසුන්ගෙන සිටියහ. දෙදෙනාම ඔවුනොවුන්ගේම කල්පනා ලොවය.

වීරසිංහ මුදලාලි සිය දිවි නසාගෙන හෝ සාහසිකයෙකුගේ වෙඩි පහරට ලක්ව මිය ගොස් ඇත. දැන් එය අතීතයට අයත්ය.

දැන් වර්ථමානය හා අනාගතය? මේ දෙදෙනාගේ කල්පනා සයුරේ ගිලී සිටියේ මියැදුන තැනැත්තා ගැන මෙතෙහි කරමින් නොව ඉදිරිය ගැන සිතමින්ය.

සුදන් පොලිස් අත් අඩංගුවට ගෙන ඇත.

හේතුව? අහේතුක සැකයක් පමණි. මේ දෙදෙනාම එය කිසිසේත් අනුමත නොකළහ. නමුත් බරපතල ප්‍රශ්නයක් ? වීරසංහගේ හදිසි මරණයට හේතුව කුමක්ද? ඊට ප්‍රබල හේතුවක් තිබිය යුතුමය.

පොලිසිය සැකයෙන් බලන විට සැකය ගනී බුල් නැන වීරසිංහ මුදලාලිගේ මරණයෙන් ලැබී වාසි ලබන කොටස කවුරුන්ද?

අනෝමා කසාද උරුමයෙන් සියලු වංචල නිශ්චල දේපළ ව්‍යාපාර සියල්ලකම බලධාරිනිය හා උරුමක්කාරිය ලෙස නියැකයෙන්, නීතැතින්ම පත්ව ඇත.

ඇය එවැනි අය කාරි නත්ත්වයකට පත්වීමෙන් ඵලහට වැඩි වාසි ලබන එකම තැනැත්තා සුදන්ය. ඔහු අනෝමාගේ අනියම් පෙම්වතා වන බැවිනි.

සැකය - පොලිසියේ නිගමනය අනුව නැවතුනේ සුදන් මතය. ඔහු දැන් පොලිස් හිර කුඩුවේ යකඩ කමිබි පිටුපසය. සැකය එතැනින් කෙළවර වූයේ නැත. කුස්සි අම්මා සොපිට විදුලි පුවත එවමෙ කවුද?

ජේම්ස් - මුරකරුට දුරකථන පණිවිඩය දුන්නේ කවුද?

'දුරකථන පණිවිඩය කෙළින්ම නෝනා මහත්තය දුන්න බවට ජේම්ස් දිවුරා කට උත්තරයක් පොලිසියට දී ඇත. සොපිට ලැබී ඇත්තේ ව්‍යාජ විදුලි පුවතකි.

අනෝමාට ලැබුන ලිපියද ව්‍යාජ එකක් විය හැක. එමුත් ලිපියේ අත් අකුරු දැනට නානුමය සිටින තම යෙහෙළිය නිර්මලීගේම බවට ඇයට සහතිකය.

එකම පාසැලේ එකට උගත් එකම පංතියේ ඔවුන් දෙදෙනාගේ අත් අකුරු දෙදෙනාටම හොඳට හුරුය; පුරුදුය. ඇය කොළඹට පැමිණෙන සෑම දිනෙකම අනෝමාට ලිපියකින් හෝ දුරකථනයෙන් දැනුම්දීම පුරුද්දක් විය. නිර්මලි නිහරම කොළඹ පැමිණියේ දුම්රියෙනි.

කොටුවේ දුම්රිය පොළට ගොස් ඇය, කැදවා ගෙන

පිටකෝට්ටේ පැමිණීමද නිරතුරුවම කෙරෙන දෙයකි.

ජේම්ස්ට මරදාන දුම්පිය පොළ වෙත පැමිණෙන ලෙස තමා දුරකථන පනිවිඩයක් නොදුන් බව දැන සිටියේ ඇය පමණි. සම්භරවිට උඩ ඉන්න දෙවිවරු දැනුවත්ව ඇත.

තමා දුරකථන පණිවිඩය දුන් බවට ජේම්ස් හිතාමතාම බොරු කිව්වාද? කාගේ හෝ ඉගැන්නුම් බහක් මත සුළු ලාභ ප්‍රයෝජනයක් අපේක්ෂාවෙන් ජේම්ස් මේ නින්දිත පාඨාදීම කරනවාද? මේ ත්‍රිවිධ සිදුවීම් ඇත්ත වශයෙන්ම ප්‍රහේලිකාවකි.

සොපීට ලැබුණ විදුලි පුවත, අනෝමාට ලැබුන ලිපිය, ජේම්ස්ට ලබුන දුරකථන ඇමතුම් එකිනෙකට කිට්ටු සබැඳියාවන් දක්වන සිදුවීමය.

විරසිංහ ඝාතනයේ පසුබිම සැකසුනේ මේ ත්‍රිත්ව ක්‍රියාදාමය මුල්කරගෙනය. අවශ්‍ය වන්නට ඇත්තේ මිණිමරුවාට විරසිංහ මුදලාලි හුදකලාව හැඹිමයි. විරසිංහ රුපියල් ලක්ෂ දහයක් දහවල් කන්තෝරුවෙන් ලබාගෙන ඇත. ඊට සාක්ෂි කියනුයේ ඔහුගේම පෞද්ගලික ලේකම්වරිය වශයෙන් කටයුතු කරන ලරින් දල්පදාදු සහ මුදල් අයකැම්වරයායි.

ඔහු මුදල් රැගෙන පස්වරු තුනහමාරට පමණ කාර්යාලයෙන් පිටව ගොස් ඇත. ඔහුගේ පිටවීම ප්‍රධාන දොරටුවේ ආරක්ෂක නිලධාරියාගේ සටහන් පොතේ විහන අංකයද සහිතව ඉතා පැහැදිලිව ලියැවී ඇත.

සුදන් සවස පහවන තෙක් තමන් සමග යකඩ කඩයේ සිටි බව අනෝමා ස්ථිර වශයෙන්ම දැන සිටියාය. විරසිංහ ලක්ෂ දහයක් රැගෙන පිටකෝට්ටේ නිවසට යන වගක් සුදන් නිකමට හෝ දැන නොසිටි බව ඇයට සහතිකය. මෙසේ හුදකලා කෝට්ටේ නිවසේ සිටි විරසිංහ මුණ ගැසීමට පැමිණි නැනැත්තා කවුද? කෝටියකට ලංසු තැබිය හැකි, එහෙත් හෝඩුවාවලින් තොර වර්තමාන පැණය එයයි. එය මොන අන්දමකින් හෝ විසඳිය යුතුව ඇත.

මිණිමරුවා, එය මිනීමැරුමක් නම් කෝට්ටේ නිවසට ඒ ගිය පුද්ගලයා විය යුතුය. විරසිංහ කාර්යාලයේ සිට රැගෙන ආ රුපියල් ලක්ෂ දහය අතුරුදහන් වී ඇත. විවෘත කර තිබුණු හම්බෑගය පමණි පොලිසියට හමුවී ඇත්තේ. ලක්ෂ දහය සුදන් අතට අසුවුනාවන්ද?

මහු මිනීමැරුම සිදු නොකළානම් වෙඩි වැදී බිම පතිතව සිටි විරසිංහ දුටු සැනින් තිගැස්සී පොලිසියට ඇතුම් දෙනු හැර බැග්, අල්මාරි, පෙට්ටගම, පිරික්සීමට යුහුසුලු නොවනු ඇත.

සුදන්ට පසු නිවසට පැමිණියේ පොලිසියයි. ඒ වන විට මුදල් අතුරුදහන් වී තිබිණ. පොලිසියට දුරකථනයෙන් දැනුම් දීමත් පොලිසියෙන් නිවසට පැමිණීමත් අතරතුර සුදන් නිවසින් බැහැර ගොස් නොමැත.

යකඩ කඩයේ එදා එකතු වූ මුදල් එක් ලක්ෂ අසූදහසක් පමණ මහු ලඟ තිබී අනෝමාට චාරදි ඇත. මෙම මිනීමැරුමට එකම හේතුව විරසිංහ කන්තෝරුවෙන් රැගෙන ආ රුපියල් ලක්ෂ දහයද? එසේනම් මේ මුදල් රැගෙන මහු පිටකෝට්ටේ නිවසට පැමිණෙන බැව් මිනීමරුවා සැක හැර දැන සිටිය යුතුය.

මහු රුපියල් ලක්ෂ දහයක් ලබාගත් බව කාර්යාලයේ අයකැමි සහ විරසිංහගේ පෞද්ගලික ලේකම්වරිය හෙළාකාරටම දැන සිටියහ. මේ දෙදෙනා හැර තුන්වැන්නෙකු මෙම රහස දැන සිටියාද? කෙසේ වෙතත් මිනීමැරුමට හේතුව ලක්ෂ දහය නම් මුදල් අයකැමි හෝ එරින් දල්පදාදු හෝ මෙතෙක් සොයාගෙන නැති නම්, ගම්, විස්තර නොදත් අනෙක් නැනැත්තා විය යුතුය. නමුත් පොලිසිය හිරබාරයට ගෙන ඇත්තේ සුදන්ය. ඊලඟට අනෝමා සහ වික්ටර් හිරබාරයට ගැනීමට නියමිතය.

වික්ටර් අනෝමා දෙස බැලිය. "මේක තෝරා බේරා ගන්න බැරි වැඩක්"ය කි අනෝමා වාඩිවී සිටි අසුනෙන් නැඟී සිටියාය. "යන යකා කොරහ බිඳගෙන යද්දෙන්. අපි මොනව හරි කන, බොන ගමන් කතා කරමු" වික්ටර් යෝජනා කළේය.

ඇය උඩුමහලට නැග මද අවසරයකින් ආපසු පැමිණියාය.

ඇගේ එක් අතක විස්කි බෝතලයකි. එය කනප්පුව මත තබා මුලුනැන් ගෙය දෙසට ගමන් කළාය.

වික්ටර් නිහඬව කල්පනාවේ යෙදී සිටින විට ඇය ආපසු පැමිණියේ විදුරුවක් සහ බයිට්ස් පිරිසියක් ද රැගෙනය. "දැන් අපි දෙන්නටත් ඇතුලට යන්න වෙනව. ප්‍රශ්නෙ ඒක නෙවේ. දැන් සුදතුත් නැහැ. අපිත් නැහැ. කවුද ඉනින් හාඩ්වෙයාර් එක කරන්නෙ?"

වික්ටර් විස්කි විදුරුව අතට ගෙන මදක් කල්පනාවේ නිමග්න විය. "අපි වැඩේ සුගතපාලට පවරමු. ඌ විශ්වාසවන්න

එකා. සුදත් මිස්නස් වැඩවලට එලියට ගියහම එයාගෙ මිස්නස් එක බලා කියා ගත්තේ, එහෙම නේද?"

අනෝමා තල්පනා සතුරේ කිම්දෙමින් සිටියාය.

"මේ තලඹල නිසා මිනිහා කැමති වෙයිද වැඩේට"

"අඩි දෙන්නම කිව්වොත් බැහැ කියන්නෙ නැහැ"

"මගෙ පළවන් එක්ක ගිනි අරගෙන වගෙයි. මල්ලිට කැමති දෙයක් කරන්න. අයියගේ මරණෙ ගැන මල්ලි මොකවද හිතන්නෙ"

වික්ටර් දුම්වැටියක් දල්වාගෙන මද වෙලාවක් බිම බලා ගෙන සිටියේය. "මේක හරිම ප්‍රහේලිකාවක්. ඒත් පොලිසිය කෙළින්ම සැක කරන්නෙ අපි තුන්දෙනා"යි මෙසේ පැවසූ වික්ටර් නිහඬව ඇය දෙස බලා සිටියේය.

"එකත් අසාධාරණ සීරණයක් නෙවී. එක පැත්තකින් බැලුවොත්."

"මොන දේවත්, සාක්ෂි නේතු තියෙන්න ඕන"

"සාක්ෂි කොහොම වුනත් සාධාරණ නේතු තියෙනවා. අයියගෙ හදිසි මරණයෙන් වැඩියෙන් ආර්ථික වශයෙන් බාසි නම්බුවෙන්නෙ කාටද?"

"මට. ඒකෙ සිසිම තර්කයක් නෑ. වාද විවාදයක් නැහැ. මිනින මැරුන. හැබැයි දේපොල අයිති වුනා. කතාව ඉවරයි."

වික්ටර් විස්කි වීදුරුව තොල තැන්නට ගිය. "එක සම්මතයි. මිනින සාමාන්‍ය විදියට මැරුණ නම්"

අනෝමා වහු දෙස සියුණු බැල්මක් හෙළුවාය.

"සියදිවි නතාගත් බවට ලියුමක් තියෙනවා, එයාගෙ අත් අකුරින්ම ලියපු. ඒකට මොකද කියන්නේ"

"නිසිය පැත්තෙන් ඒක පිළිගන්නෙ නැහැ. ඒකයි අපි තුන්දෙනා ඇතුලට ගත්තා නේද්ද්නෙ"

"කවුද එහෙනම් ඒ ලියුම ලියල මේසෙ උඩ තිබ්බෙ?"

"ඒකත් වැදගත් ප්‍රශ්නයක් තමයි. පිළිතුරු නැති"

"කන්තෝරුවෙන් උපක දහයක් ගෙනත් තියෙනවා. ඒ ඔල්ලින් නැහැ. ඒකත් හොහොම වැදගත් ප්‍රශ්නයක්. කවුද මේ මිස්ට මරදාන ස්ටේමන්ට් එකට එන්න කියල කෝල් එක දුන්නෙ?"

"මම කොහෙමද ඒක දන්නෙ. කෝල් එක දීල තියෙන වෙලාවෙ මම කඩේ. සුදත් එක්ක. ඒ වෙලාවෙ කඩේ කස්ටමර්ල

සිදෙනෙක් හිටියද?"

"කොහෙන්ද දැන් කෝල් එක දීල තියෙන්නෙ"

"පාරේ කෝල් බොක්ස් එකකින්"

"ඒත් පේමිස් සහනික කරල කියනව කතා කෙරුවෙ අපේ නෝනම, අනෝමා කියල"

"ඒ මිනින අන්ද කඩිප්පු කාල. විස්වාස කරන්න වික්ටර්, මේ කෝල් එකක් දුන්නෙත් නැහැ. දෙන්න උවමනෙවක්. හේතුවත් තිබුනෙත් නැහැ. කොච්චම් එදා විරසිංහ පිටකෝට්ටෙට හෙදුවත් එන එකවත් මම දැනගෙන හිටියෙත් නැහැ."

වික්ටර් යාන්තමට හිනාවත් පැවෙය. "නොයි දේ නොගොම කිව්වත් මේ මිනිමැරුම මාක්ටර් ප්ලැන් එකකට කරල තියෙන්නෙ. පොලිසිය දැන්නෙන් නොවෙයි"

අනෝමා වහු දෙස අළුතු ආකාරයේ බැල්මක් හෙලුවාය. "දැන් පොලිසියට මිනිමැරුවෙව අහුවෙලා. හේතු සාධක, සාක්ෂිත් එක්ක. ඊළඟෙන් කවි මාරු වෙන්නෙ සැන්නක අන්න මේ හැන කිසිම දෙයක් නොදන්න අහිංසකයන් හුන් දෙනෙක් අල්ලගෙන. වික්ටර් එදා කොළඹ හිටියෙත් නැහැ නේද?"

"මේ හිටිය දිහා අපිත දන්නව. මට එක පොලිසියට කියන්න බැහැ. සැන්නක අන්න නිමිමිවත් මේකට හැවෙනව."

"ඉතින් පොලිසිය ඇහුවම කොහේ හිටිය කිව්ලද කියන්නෙ"

"ඒකත් බරපතල ප්‍රශ්නයක් උනතර නැති. සොයිට වෙලිලුම එක එව්වෙක් එකාව නොවුවේ ස්ටේමන්ට් එකට එන්න ලියුම් එවීවෙත් මේමිස්ට කෝල් එක දුන්නෙත් එක්කෙනෙක්මයි"

"ඒ කවුද?"

"එයා තමයි මිනිමැරුව. සියදිවි නානිකරගත් බවට ලියුම් ලිව්වෙත්, සල්ලි ගත්තෙත් මේ මුළු සීන් එක සිවිපස්සෙ ඉන්නෙත් අන්න එයා, කවුද කියන එකයි හොයා ගන්නවත් හිනා ගන්නවත් බැරි."

"එරින් දල්පදාදු එහෙම කොහොමද?"

වික්ටර් සිහාසෙන්නට ගිය. "එරින්ට ගෙවල් නැහැ මේ වගේ වැඩකට. අනිත විරසිංහ මරල උපක දහය ගන්න එක එදාට පාඩුයි. ඒක මාස දෙක තුනෙන්ට එයාට නම්බු නෙනව"

"මම නැත්නම් සුදත් යය වැඩේ කරයි කියල හිතනවද?"

වින්ටර් විස්කි බීල දමන අතරම ඇය දෙස බලයි. "ඔය දෙන්නා මෝඩ ආදරවන්තයෝ දෙන්නෙක්. එක එක්කෙනාගෙ අදහස් කෙළින් කියාගන්න බැරිව. අහස පොළොව ගැටලන දෙන්නෙක් කොහොමද මේ වගෙ දක්ෂ මර්ඩර් එකක් ප්ලෑන් කරන්නෙ"

අනෝමා ලැජ්ජාවට පත්වූවා සේ බීම බලා ගත්තාය. "එහෙනම් ඒකයි අපි ගැන නක්සේරුව"

වික්ටර් අවඥාසහගත ලෙස සිනාවක් පෑවේය.

"ඇත්ත කිව්වට තරහ ගන්න එපා. දැන් බලාගමු ඊලඟ පියවර ගැන"

"ඕන හිරණයක් ගන්න. කැමති දෙයක් කරන්න මම සුදත්ට කෑම ගෙනියන්න ඕන"

"එහෙම දේවල් කරන කොට පොලිසිය සැක නොකරයිද? ඉතින් මිනිහා මරලා මිනීමැරුම්ට නිකමට හරි සැක කරන මිනිහා ඇතුලෙ. නෝන මහත්තයා කුඩුවෙ ඉන්න සැකකාරයාට කෑම අරගෙන යනව. අපූරු වැඩක්නෙ. මොනවද ඉතින් පොලිසිය නොහිතන්නෙ? බලා ඉන්න මිනිස්සු මොන මොන දේවල් නොකියාවිද?"

අනෝමා ඔහු දෙස තියුණු බැල්මක් හෙලුවාය.

"මොකා මොනව හිතුවත්, කිව්වත් ඒකෙන් මට කමක් නැහැ. ඕව මම තඹ දොසිතුවකට මායිම් කරන්නෙත් නැහැ. මම එළියෙ .ඉන්නකල් සුදත්ට තුන්වේලම කන්න බොන්න ගෙනියනව."

ඇගේ කටහඬට ස්ථිරත්වයක් කැටිව තිබිණ. එය වෙනස් නොකරන හිරණයක් බවට කටහඬ පමණක් නොව බැල්ම හා ඉරියවිද ඉඟි කලහ.

"තමන්ගෙ මට්ටම තම්මට්ටම කිව්ව වගේ ඔයාට කැමති දෙයක් කරන්න. එක දෙයක් කරල අනිකට යමු. හාඩ්වෙයාර් එක දවසක් හරි වහන්නෙ නැතිව දිගටම කරගෙන යන හැටියට සුගතපාලට කියමු."

"මව්, ඒක හොඳයි. සුගතපාල හාඩ්වෙයාර් බිස්නස් ගැන දන්නව. ඒ වගේම අවංකයි. අපට හොඳ විශ්වාසවන්ත කෙනෙක් එකන ඉන්නම ඕන. අපි රිමාන්ඩ කෙරුවොත්"

"කෙරුවොත් නෙව්, කරනව. ඒක ෂුවර් නෙට අන්ද්දට.

දැනටම එළියට පොලිස් ගාඩ් එකක් දාල.

"ඒ වැඩි ආරක්ෂාවට"

වික්ටර් වට පිට බැලීය.

"ඊලඟට ගෙදර ඉන්න නතුරො අයින් කරන්න"

අනෝමා නළල රැළි නංවා ඔහු දෙස බැල්මක් හෙලුවාය.

"මට නැහැ හරියට තේරුනේ"

"බබා වෙන්නද හදන්නෙ? සොපියි, ජේම්සුයි දෙන්නට මෙතන බාරදීලද යන්න හදන්නෙ?"

අනෝමා කල්පනා කරන්නට වූවාය.

"මම කියන්නාද ඒ දෙන්නට පඩි දිල ගෙවල්වලට යවල ප්‍රයිවට් සිකියුරිටි එකකින් ගේදරට රැකවල් දෙමු. අපි රිමාන්ඩ් කෙරුවොත් ඇපදීල එනකල් සිකියුරිටි එතෙන් වත් කියනව."

මේ කතාබහට ගෙතුල සිට සවන් දී සිටි සොපි විසින්න කාමරයට පැමිණියාය. ඇය පිලිකුලෙන් හා අවඥාවෙන් අනෝමා සහ වික්ටර් දෙස කෝප සහගත බැල්මක් හෙළුවාය.

ඇගේ රත් පැහැ ගැන්වුණු කෝපයෙන් දිලිසෙන දෙනෙත් යොමුව තිබුනේ වික්ටර් දෙසය.

"මාව ගෙදර යවන්න ඔන නැහැ කවුරුවත්. මම හෙට උදේම යනව" සොපි උස් හඬින් කෑ ගැසුවාය.

"තෝ පල දැන්මම. ඇයි හෙට උදේ වෙනකල් ඉන්නෙ. අහගෙන හිටියෙ දොර ලඟට වෙලා කතාබහ සේරම." කෝපයෙන් පැවසූ වික්ටර් සොපි දෙසට හැරිණි.

සොපීගේ පෙනුම වෙනස් විය. ඇය හිටියාටත් වඩා වයස්ගත වූවා සේය.

"මමයි, ජේම්සුයි ඵලව ගත්තම නොදට නාඩගන් නටන්න ඇහැකි. මොකාගෙ කරේ එල්ලීගෙන හරි."

"පලයන් කම්මුල කඩාගන්නෙ නැතුව මෙතනින් මගේ දැනැට නොපෙනී. මෙච්චරවත් සලකන්නෙ උඹේ ඩයසට." අනෝමා කෝපයෙන් වියරුවෙන් කීවාය.

"අනේ මගේ කට, වැදගත් නෝනා මහත්තය පනුගිය කාලෙ නටපු නෙයියාඩගන් මම නොදන්නව වගේ"

අනෝමා අසුනෙන් නැගිට්ටාය. සොපිහාමි උස් ස්වරයෙන් බැණ වදින්නට පටන් ගත්තාය.

"අර රත්නරන් කඳක් වගෙ සීදේවි මහත්තය නොපි

මක්කොම එකතුවෙලා මරාගත්ත. දැන් විස්කි, බ්‍රැන්ඩි ගහගෙන ජෝලියෙ ඉන්නව. තෑ නොදකින්"

අනෝමා ඇය කරා ලංවුවාය. "කටවහගෙන මෙතනින් තොලොංචි වෙනවද නැත්තන් මම හරවන්නද කට අනිත් පැත්තට?"

ඇය පසෙකට තල්ලු කරගෙනම අනෝමා මුළුතැන්ගෙය දෙසට ගමන් කරන්නට ඩුවාය. සොපී වික්ටර් දෙසට හැරුණාය.

"මුං මරාදැම්මෙ තමන්ගෙම අයිය කියල නිකමට හරි ගානක් නැහැ. මෙකිලත් එක්ක අන්ඩුඩි ගහ ගහ ඉන්න හැටි විතරක්. තෑ නොදකින්"

වික්ටර් ඇය දෙසට හැරුනේය. "සොපී! උඹ! උඹ! කරුණාකරල ජේම්සුත් එක්ක හෙට එලිවෙන කොට මෙහෙන් පලයන්. නැත්නම් බෙල්ල කෙටියෙන් අල්ලල එලියට තල්ලු කරනව."

සොපී සරුමට මෙන් සිනාසෙන්නට වූවාය. ඈ බිය වූ බවක් නොපෙන්වූවාය.

"මම යනව ගමට. ජේම්සුත් එහෙමයි. අනිත් නෝනල මහත්තුරු හිරගෙදරට, දැනටම ඒකෙක් ඇතුලෙ."

අනෝමා මුළුතැන්ගෙය දෙසින් ආපසු පැමිණෙන විට ජේම්ස් ඇය පසු පසින් එමින් සිටියේය.

"හෙට උදේම දෙන්නම මෙහෙන් යන්න ඕන." ජේම්ස් අයියගෙ මාස කීයක පඩි ඉතුරුද?"

"මාස හයක විතර ඇති. අනේ නෝන මා එක්ක හිත අමනාප කරගන්න එපා. මම කිව්වෙ ඇත්ත, නෝන මට මරදානට එන්න කියල ටැලිෆෝන් කරපු එක ගැන විතරයි මම කිව්වෙ"

"දැන් ඒව වැඩක් නැහැ. මිට පස්සෙ මේ පළාත පත්තුවෙ පස් පාගන්න බැහැ දෙන්නටම"

ජේම්ස් සොපී දෙස රවා බැලීය. "මම නෙවී නෝන මෙන්න මේකි තමයි කට දෙඩෙව්වෙ පොලිසියෙ මහත්තුරු ඉස්සරහ. සුදන් මහත්තය උදේට යතුරු ගෙනියන්න එන කොට බාගෙට හෙව්වැල්ලෙන් කොටට කොටේ නයිට් කැල්ලක් ඇඳගෙන එනව. මේසෙ වාඩිකර ගෙන ලඟ ඉඳගෙන කවනව"

සොපී ජේම්ස් දෙස කෝප සහගත බැල්මක් හෙලුවාය.

"බොරුද මම කිව්වේ. හැමදාම උදේට ඇඳගෙන එන්නෙ අර මදුරු දැල් රෙද්දෙන් මහපු බෲගෙට හෙළව පේන නයිට් කොටේ, ගැනියෙක් වෙලා මටත් ලැජ්ජයි බලන්න ඒක දිහා."

ජේම්ස් ඇයට බැණ වදින්නට විය.

"බොට මක්කටෙයි සොපී ඒවා. උයන්න, පිහන්න ආපු ඒකීට වැඩ තියෙන්නෙ කුස්සියෙ"

"ඒ වුනාට සුදත් ගෙදර ආවාම තියෙන අරුමෝසම් සුකුරුත්තන් එපායැ බලන්න. අඟර දඟර හුරතල් ලෝකයක්. හරියට අවුරුදු දහසයේ ලමිස්සී වගෙයි. උකුට මුකුළු කනාව. කතා කරන්නොත් නලවිල. මම හිතන්නෙ සුදත් වැඩිපුර උදේට යතුරු ගෙනියනවටත් වැඩිය නෝනා පොඩ්ඩිගෙ බයිස් කෝප් බලල යන්න වෙන්න ඇති."

මෙවර අනෝමාට එක්වරම සිනා පහල වුණි. "පේනව නේද මේකිලගෙ තරම. හැම එකම බලාගෙන මුදලාලිට කේලං කියල ඇති."

වික්ටර් ජේම්ස් දෙසට හැරී "ජේම්ස් හෙට ගමේ යනව දැ"යි ප්‍රශ්න කළේය.

"මට යන්න ඇති ගමක් නැහැ. කොහේහරි බංගලාවක වැඩ අල්ල ගන්න ඕන"

"කොහොම හරි ඔය නෝන මහත්තයට වැඳල පුදල මෙහෙ නැවතියන්. රෑට නූඩ්ලස්, බාස්මති බුරියානි ඉස්සො, පොකිරිස්සො කන්න බැරිය. සුදන්ට කවන්න හදන ඒවායින්" සොපී සරුම් ස්වරූපයෙන් කීවාය.

අනෝමා සොපී දෙස වෛරී සහගත වූ බැල්මක් හෙලුවාය.

"අන්තිම දවස හින්ද හොඳට කියවපන්. ඕනනං ඇවින් අඩියකුත් ගහපන්. හැබැයි තොලොංචිවෙලා ගියාට පස්සෙ මෙහේ පස් පාගනව නෙවී"

සොපී ඇය දෙස එක එල්ලේ බලා සිටියාය. ඒ කෝපය, ද්වේෂය, පිළිකුල කැටි බැල්මකින් යුතුව

"මට පඩි ඕන"

"තඹ සතයක් දෙන්නෙ නැහැ. පලයන් ඒකටත් ඕනනන් පොලිසි. උදේ නයට ගියෙ නැත්නන් කොහුපාර දිලයි එළියට දාන්නෙ. ජේම්ස් අයියට යන්න තැනක් නැත්නං හෙට ඉඳල යකඩ කඩේට ගිහින් ඉන්න. මේ පලහිලව්ව පිළිවෙලක්

වෙනකල්"

වික්ටර් එය අනුමත කරන්නාක් මෙන් හිස සලන්නට විය.

"හෙට ඉඳල සුගතපාල යකඩ කඩේ බාරට වැඩ කරනව. අඳුරනවනේ එයා?"

"මොකෝ මහත්තයා නොදන්නෙ. මම ඔය කඩේට කී වතාවක් ගිහින් තියෙනවද? මොකෝ මම මැරිල උපන්නයැ?"

"ජේම්ස් අයිය බොරු කිව්වේ නැහැ. ඇත්ත කිව්වෙ, ඒකට අපි නරහ නැහැ. මේකි නමයි එක දෙක කරල ලෝකෙම ගිනි තියල තියෙන්නෙ.

"දෙන්නෙ නැද්ද මට සල්ලි?"

"සිංහල භාෂාවෙන් කිව්ව තේරුනේ නැතිවුනාට"

ජේම්ස් සොපී දෙස බැලිය. "ඇයි උඹට එදා ලොකු මහත්තය පඩි දුන්නෙ දුව බලන්න ගමේ යනකොට"

සොපී ජේම්ස් දෙස කෝපය මුසු බැල්මක් හෙලුවාය.

"උඹ උඹේ වැඩක් බලා ගනින් ජේම්සෝ. දැක්කද මට පඩි දෙනව?"

"මොදක් සිද්ධ වෙන්නෙ නැහැ ඔය කටට. මගේ ඉස්සරහදිම් නේ ලොකු මහත්තය පඩි දුන්නෙ"

"මට දුන්නෙ මග වියදන් විතරයි"

"මොන වියදන් නරී මට කමක් නැහැ. මෙහෙ නැහැ සල්ලි පලයන් උදේට පොලිසි. වැඩිය කටගහගෙන ආවොත් මේ වෙලාවෙම ආපහු ඵලියට."

සොපී සටනින් පරාජයට පත්වූ බව පලකරමින් නිහඬව වීසින්න කාමරයේ සිටි නිදෙනා දෙස බලා හෙමින් සිරුවේ මුළුතැන් ගෙය දෙසට ඇදුනාය.

"මේකිගෙ කහාවෙන් නමයි වැඩි හරියක් සුදත් හිරබාරෙට ගත්තෙ. මේ ගෙදරින් එතුර උගුරක් දෙන්න වටින්නෙ නැහැ ඔය ගැනිට."

දෙබරයකට ගල් පහරක් වැදී ඇත. කුඩා එකක් නොව. ලොකු ගල් පහරකි. ගල් පහර වැදීමෙන් උරණවූ දෙබරුන් සී සී කඩය. හමුවුන හැම එකාටම පහරදීම දෙබරුන්ගේ එකම අරමුණය.

එරින් දල්පතාදු මියගිය වීරසිංහ මුදලාලි ගේ ව්‍යාපාර සමූහයේ ප්‍රධාන පාලිකාව අවිවාහකය. අවුරුදු තිසිපහක් පමණ ගෙවී ඇතත් ලස්සනද නැත. කැතක්ද නැත. අග පසග පිරිමියෙකු තමා වෙත නතුකර ගැනීමේ හැකියාවක් ඇති බව කියාපායි.

තිසපස් වියේදී එසේ නම්, තුරුණු විය ගැන කියනු කිමා. සාමාන්‍ය ගිණුම් ලිපිකාරිණියක වශයෙන් වීරසිංහ ව්‍යාපාරයට බැඳුන එරින් දල්පතාදු දැන් එම සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරියකි.

කැළණිය පෙදෙසින් ගෙයක් සහ ඉඩමක් තනි අයිතියට, නිවසට දැසි දසුන් ගෙවීම් සමාගමෙන්, තරමක් වයස්ගත රියදුරෙක් සමඟ මොටෝරියක්, නඩත්තුව සඳහා සමාගමෙන්

www.buddyalbums.net

හොඳ චේතනයක් සමග මාසික අමතර දීමනා සියල්ල ඇය සතු වරප්‍රසාදයන්ය. එහෙත් ඇය තවමත් අව්වාහකය.

ඉහත සඳහන් වරප්‍රසාද ලැබීමේ ප්‍රධාන සුදුසුකමද එයයි. වීරසිංහ මුදලාලි සතියේ දින දෙක තුනක් එම නිවසේ ගත කිරීම පුරුද්දක් වශයෙන් වසර ගණනාවක් කෙරිණි. දැන් ඔහු ජීවතුන් අතර නැත.

වීරසිංහ සමූහ ව්‍යාපාරයේ නිත්‍යානුකූල හිමිකාරිය බවට පත්ව ඇත්තේ අනෝමාය. එය පරණ පිනක් හිස මත කඩා වැටීමක් වැනි දෙයකි.

කඩා වැටුණද ඉඩෙම කඩා දාගත්තද සූක්ෂ්ම ලෙස? තමන්ගේ ස්ථාවරයේ අවසානය එරින්ට, මෙනෙහි වූයේ වීරසිංහගේ මලගමදාය. ඇගේ දැසින් වැගිරුන කඳුළු පිරුණු සෙනෙහසකින් වටපිටාව සෙමින් නිරීක්ෂණය කළාය.

අනෝමාගේ දෙනෙතින් එකම එක කඳුළු බිඳුවක් හෝ රුරා යනු ඇය දුටුවේ නැත. මියගිය සැමියා, මරා දැමූ සැමියා වෙනුවෙන් බැරිද මේකිට අඬන්න ලෝක මාන්නෙට හරි! ඇයට ඇත්ත ඇති සැටියෙන් පෙනුනේ එදා කනත්තේ දිය.

ඇයි අනෝමා අඬන්නේ, ලතවෙන්නේ?

අනෝමා ගෙදර කඳුළු සලමින් හුදකලාව සිටියදී තමා වීරසිංහ සමඟ රිසිසේ කමින් බොමින් සංතර්පණය වූ අයුරු ඇයට එතැනදී මැවී පෙනිණ.

ශෝකය පල කිරීමට අනෝමා වෙත ලංවීමට පවා ඇය බිය වූයේ අතීත මතක සටහන්වල පව්කාර සෙවනැලි තමන් වසා සිටි නිසාය.

වික්ටර්ගේ දර්ශනයෙන් ඇය වඩාත් බියපත් වූවාය. දිනක් වික්ටර් කාර්යාලයට පැමිණ තම සොහොයුරු වීරසිංහට තර්ජනය කළ ආකාරය ඇයට සිහියට නැඟිණ.

"ඉන්නවනේ ජොලියෙ. අපි මතක් වෙන්නෙත් නැහැ."

"ඇයි මදිද, අක්කර විසිපහක්ම දීල තියෙනව"

"මේව කාගෙද?"

"තාත්තගෙ මේ තත්ත්වෙට ගෙනාවෙ මම"

වික්ටර් උස් හඬින් සරදම් ලෙස සිනාසෙන්නට විය.

"ඇයි එරින් දල්පතාදු ගැන කියන්නෙ නැත්තෙ. එයත් කොටස් කාරියක් කරගත්තම තව නැගල යයි කොම්පැනිය"

"උඹ මොකාටද එන්න හදන්නෙ"

වික්ටර් පෙර ලෙසම සිනාසුනි."යකාට, කල්‍යානි අක්කයි ළමයි දෙන්නයි පැත්තක, අර අහිංසක දුප්පත් කෙල්ල අනෝමා තවත් පැත්තක තමුසෙ මෙහෙ රජ කෙළි. හරියට පාරුක් රජ්ජුරුවො වගෙ"

වීරසිංහ අසුනෙන් නැගී සිට සොහොයුරාට ලංවිය.

"උඹට මෙහෙ නැහැ කිසි අයිතිවාසිකමක්. මේ පළාත පත්තුවෙ එන්නත් එපා."

වික්ටර් මද වේලාවක් බලා සිටියේය. "හරි සහෝදරයා! මම නැහැ එන්නෙ මීට පස්සෙ. ලඟට ගෙන්න ගන්න ඉඩ නියා ගන්නත් එපා. මේවා අපේ තාත්තගෙ, මටත් තියෙනවා අයිතියක්. කවදාහරි හොඳින් බැරිවුනොත් නරකින් හරි මගේ දේවල් මම ගන්නව"

"උඹ මොනව කරන්නද මට?"

"කරන දේ කෙරුවට පස්සෙ බලාගන්න පුලුවනි"

"මම ටෙලිෆෝන් කරනව ආමි කැප්ටන්ට උගෙ ගෑනිත් එක්ක රවුන් ගහන හැටි කියල"

වික්ටර් සිනාසෙන්නට විය.

"නෝ ප්‍රොබලම, අපි දික්කසාද නඩු දාල ඉන්නෙන්නෙ. නමුසෙ වගෙ පඩන්තර වැඩ කරන්නෙ නැහැ"

මේ අතර ගනුදෙනු කරුවන් දෙදෙනෙකු කාර්යාලය තුළට පැමිණියහ.

"මට ලක්ෂයක් ඕන." ඒ වික්ටර්ය.

වීරසිංහ ගනුදෙනු කරුවන් දෙදෙනා මුණගැසීමට පෙර එරින් කෑදවීය.

"මෙයාට පනස්දාහක....." වීරසිංහට කියාගන්නට ලැබුනේ එපමණකි.

"පනස්දාහක් නෙවි, හරියටම ලක්ෂයක් මුදලින්. වෙක් ගනු දෙනු නැහැ. ඒවට මන් කැමතින් නැහැ." ඔහු තියුණු ස්වරයෙන් කීය.

වීරසිංහ නැවත රුදුරු බැල්මක් හෙලීය.

"ඕ කේ, කැශියර්ට ලක්ෂයක වෙක් එකක් දාල කෑම් කරල මෙයාට සල්ලිවලින් ගෙවන්න"

ඒ අතීත සිදුවීමකි.

වික්ටර් ජේම්ස් ලඟට කැඳවා "ගිහිල්ල සොපිට මේ පැත්තට එන්න බැරිවෙන්න දොරවල් වහල දානව"යි දැන්විය. අනකුරුව අනෝමා දෙස උනන්දුවෙන් බැලීය.

"මේක සෙල්ලන් වැඩක් නෙවී. කාගෙහරි හොඳ මොළකාරයෙකුගෙ ප්ලෑන් එකකට අපි තුන්දෙනා ගොදුරු වෙන්න යන්නෙ. අපිත් කරමු මේ මර උගුලෙන් ගැලවෙන්න වැඩක්"

අනෝමා වික්ෂිප්තව ඔහු දෙස බලා සිටියාය.

"අපි මොනව කියල කරන්නද? පොලිසියට කෙළින්ම සැක අපි"

"අපි නිකම්ම හිටියොත් පොලිසිය අපිව එල්ලුම් ගස් අරිවී. පොලිසිය කරන්නෙ ලඟම ඉන්න එකාගෙ බෙල්ලට තොන්ඩුව දාල අත හෝද ගන්න එක."

"ඒක සම්පූර්ණ බොරුවක්. මට පස්සෙ කතාව ආරංචි වුණා. ඒතකොට වැඩ ඔක්කොම සිද්ධවෙලා ඉවරයි."

ව්‍යාජ අරාබි කාරයෙකු තරු පහේ හෝටලයක කාමරයක නවත්වා අනෝමාගේ පියා ගෙන ආ මැණික් ගල් සහ වීරසිංහ මුදලාලි ලඟ තිබූ පාට වීදුරු කැබලි ඔහුට දී ඇත. පසුව නියම මැණික් ගල් වීරසිංහ සහ ව්‍යාජ අරාබිකාරයා නියම මිලට විකුණා ඇත.

මෙය හුදෙක්ම වීරසිංහ සැලසුම් කර ඇත්තේ අනෝමා අරමුණු කරගෙනය. ඔහු සිතූ පරිදි සියල්ල සිදුවිය. මෙම ව්‍යාජ අරාබිකාරයා සමඟ වීරසිංහ හොර ජාවාරම් වල යෙදුණ බැව් වික්ටර්ට මතක් විය. එවැනි මගඩි ජාවාරමක් වෙන්කර ගෙදා ගැනීමේදී සිදි වූ පලගිලවිටක් මෙම හදිසි මිනීමැරුමට හේතුවිය නොහැකිද?

අනෝමාද එය අනුමත කලද මේ ගැන උසස් පොලිස් නිලධාරින් දැනුවත් කිරීමටත් ව්‍යාජ අරාබිකාරයාගේ නියම වතගොත, පදිංචිය ඇතුළු විස්තර සැපයීමටත් තීරණය කර ගත්හ.

4

සුදත් පොලිසියේ හිරකුඩුව තුළය

නුහුරු නුපුරුදු තැනකට, දෛවයේ සරදමකින් මෙතනට පැමිනීම සුදත්ට එක් අතකින් පුදුමයක් විය. අනෙක් අතින් හාස්‍යයටද කරුණක් විය.

හිරකුඩුව ඇතුලේදී හඳුනාගත්, හඳුනාගැනීමට සිදුවූ ගජ මිතුරකු විසින් පරිත්‍යාග කරන ලද දුම්වැටිය දල්වාගෙන සිමෙන්ති බැම්ම උඩ වාඩි වී පසුගිය දිනවල සිදුවීම් දෙස මනැස යොමු කරන්නට විණ.

ඉවරවුණා හාඩ්වෙයාර් එකේ වැඩ, මැඩම් ගියා මරදාන ස්ටේෂන් එකට නිර්මලී එක්ක ගෙදර එනව කියල, ඒක කිව්ව එච්චරයි. වැඩ ඉවර වුන හැමෝම යන්න ගියා. තමන්ගෙ ගෙවල් දොරවල් බෝඩින්වලට, කඩේ වැහුව, සල්ලි ගත්ත, දවසෙ ආදායම එක් ලක්ෂ අසූදහක් විතර. වෙනද වගේ ගියේ පිටකෝට්ටෙ ගෙදරට, හැබැයි එදා එක වෙනසක්.

වෙනද සල්ලි ගෙනියන්නෙ මැඩම්, එයාගෙ කාර් එකෙන්. බයික් එකේ ෆලෝ කරල මම එනව වැඩි ආරක්ෂාවට. කියන්න

බැහැ කොළඹ නැටී. නැමදාම මේ විදියට කරනවා කියල ටිප් එකක් ගියොත් ඒත් කවුද ටිප් දෙන්නෙ? මේක ඒ තරම් ප්‍රසිද්ධ රහසක්. මැඩම් ස්ටේමන් එකට ගිය හින්ද සල්ලියි යනුරුයි මම ගෙදර අරගෙන ගියා. වෙනද වගේ ගේට්ටුව අරින්න ජේම්ස් අයිය ආවේ නැහැ. ගියා ඇතුලට. කනා කෙරුව ජේම්ස් අයියට මිනිහ නැහැ. ගියා කුස්සිය පැත්තට කනා කෙරුව කුස්සි අම්මට එයත් නැහැ. ආව ඉස්සරහට දොර ඇරල ඇතුල්වුණා ගෙට, ඒත් කිසිම කෙනෙක් නැහැ පේන්න.

සල්ලි බෑග් එක ගෙනල්ල තියල වට පිට බැලුව. නැහැ කිසිම සද්දයක්.

ගියා සොල්දරේ නැගල උඩට, එතැනත් නැහැ කවුරුහිත් පේන කියන නැනක කිසිම සද්ද බද්දයකුත් නැහැ. බොස්ගේ බෙන්ස් කාර් එක තිබුන පහල නවත්තල.සමහර වෙලාවට බොස් ගෙදර ඇවිත් කාමරේ. නිදි ඇති හොඳට පදම්වෙලා. බලමු කොයි එකටත් කාමරේ දොර ඇරියෙ ඒකට, වහට හිටියෙත් ඒක.

දැන් මේ කුඩුව ඇතුලෙ සිමෙන්ති බැම්ම උඩ අනුන්ගෙ සිගරට් එකක් බීගෙන වාඩිවෙලා කල්පනා කරන්නෙත්, ඒක නිසා බොස් මැරිල බිම වැටිල ඉන්නව, වැරදිද පොලිසියට ටෙලිෆෝන් කරපු එක? ඇයි මොකුත් නොදැක්ක, නොදන්නව, වගේ ආපහු නොගියේ? දැන් කාලේ හැම කෙනෙක්ම කරන්නෙ ඒ විදියට තමන්ගෙ ඇඟ බේරා ගන්න එකනේ?

ඒක කොහෙත්ම කරන්න බැරි වැඩක්, දවසක් හරි හාම පුතා. එයාගෙන්, එයාගෙ ලඟ වැඩ කරල ගත්ත පඩි සල්ලි වලින් බත් වේලක් හරි කාල තියෙනව. තියන්න ඔන ඒකෙ කෙලෙහි ගුණ අනික සේල්ස්මන් කම්කරුවෙක් හැටියට රස්සාවට ගත්තෙ බොස් දැන් මොන තත්ත්වෙ හිටියත්,

බයිසිකල් කටුව අරන් දුන්නෙත් බොස්, ටික ටික පඩියෙන් කපනව කිව්වට සතයක්වත් කැපුවෙ නැහැ. මතකයට නැගුන දවසක් බොස්ගෙ කතාවක්.

මම හිතුවෙ බයිසිකල් එකට සල්ලි කපා ගන්න. සුදත් සැහෙන්න මහන්සිවෙලා හොර බොරු නැතුව වැඩ කරනව-මම ගත්තෙ නැහැ සතයක්වත්.

ඔහු තම හාම පුතා දෙස කෘතඥපූර්වක බැල්මක් හෙලූ ආකාරය මතකය තුලට සිත්තමක් ලෙස නැඟිනි.

ඒ කාලෙ මැඩම් හිටියෙත් නැහැ. ගෙදර හිටියෙ කල්‍යානි නෝන. මැඩම් වගෙ ලස්සන නැති වුනාට චරදකුත් නැහැ, ඒත් හිටපු ගමන් වෙනස් වුණා. බොස් වෙනුවට යකඩ කඩේට බොක් වුනේ මැඩම්. ඊට පස්සෙ බයිසිකල් කටුව අලුත්ම පත්තයේ 125 මෝටර් බයික් එකක් වුණා. සේල්ස්මන් මැනේජර් වුණා.

සුදත් ගේ දෙතොල් අතරට සිහින් සිනා රැල්ලක් ද එක්වනු පෙනිනි.

ආදරේ, සෙනෙහස කියන්නේ මොනවද කියලා හොඳට හිටපු මිනිහ මාර ප්‍රේමවන්තයෙක් වුණා. හැබැයි හැබැහින් නොවෙයි. සිහින ලෝකෙදි විතරයි. ඒව අහිනෙ. වැඩක් නැහැ. සිහින ලෝකෙදි විතරයි. ඒව අහිනෙ වැඩක් නැහැ. මේතෙන්ට කවුද බොස් මරා දැම්මෙ ඇයි මැරුවෙ? ඇය මැඩම් කොටුවේ ස්ටේමන් එකට ගියේ?

ලස්සන හැමදේ මොහොතින් නැතිවේ. මේ ගැනි ගිහින් බොස්ට වෙඩි තියල මරු වුණාද? කවුද දන්නෙ? කාටද කියන්න පුලුවන්? හෙවනැල්ලවත් විශ්වාස කරන්න බැරි කාලයක් දැක.

කවුද දන්නෙ කොටුවේ ස්ටේමන් එකට ගියාද? ගෙදර ගිහින් බොස්ට වෙඩි තියල මරල දාල කොටුවේ ස්ටේමන් එකට ගියෙද කියල. අහල පහල තියෙන්නේ ඔක්කොම ලොකු මහවල්. අල්ලපු ගෙදර මොනව වෙනවද කියල එකෙක්වත් නොයන්නෙ බලන්නෙ නැහැ. ඒ වැදගත් මිනිස්සුන්ගෙ පුරුද්ද. මේ දෙරට යන, එන එකා. කරන කියන දේවල් අල්ලපු ගෙදර මිනිස්සුනට ප්‍රශ්නයක් නැහැ. ඒ මිනිස්සුන්ට ඒ උදව්යගෙ දේවල් තියෙනව බලාකියා ගන්න.

ඇහුනෙ නැද්ද වෙඩි ශබ්දෙ එකෙකුටවත්? කොහොම ඇහෙන්නද? දොර ජනේල් නැතිව තිබුනෙ සේවකයින්ගේ කාමර විතරයි. සමහර ගෙවල්වල සුද්දෝ උදේට ගියාම එන්නේ හවසට. ගෙවල්වල ඉන්න සේවකයො විතරයි. බෝම්බයක් ගෙවල් බිමට සමතලා වුනොත් විතරයි ඒ හැමෝම එළියට පහලියට එන්නෙ.

ඒ නීති රීති අකුරටම පිලිපැදිය යුතු රීතියකි. වික්ටර් ගැන මොනවද හිතන්නෙ?

හැමදාමත් අයිය එක්ක රන්ඩු දේපලවලට. වික්ටර් මැඩම් තකට තක. ඒ තරම්ම කිට්ටු හිනවත් නමන්ගෙ එකකුසේ උපන්

අයියට වැඩිය පිටින් ආ තැනැත්තියට ලෙන්ගතුයි. මේක දෙන්නගෙ කුමන්ත්‍රණයක් වෙන්න බැරිද? තව පැත්තකින් ඉන්නව වීරසිංහ මුදලාලිගෙ කලින් සිටිය නෝනා කල්‍යාණි, ළමයි දෙන්නෙකුත් එක්ක දික්කසාද කරල එයත් ඉන්නෙ බොස් එක්ක තරහෙන් මරාගෙන කන්න දුන්නොත් එහෙම කරන ලෙවල් එකට.

රුපියල් සීය, දෙසීය නෙවි, දහ දාහ, පහලොස් දාහ- මල සල්ලි දෙන්න අදිමදි කරන කොට මැඩම් හැම අවස්ථාවකම වගකීම බාරගත්ත. සල්ලි දෙන්න. සල්ලි දෙන්න. චෙක් නෙවී- කෑෂ්. මගේ වියදම් එකවුන්ට් එකට ක්‍රෙඩිට් කරන්න. ඒ හැම අවස්ථාවකම වික්ටර් මහත්තය සල්ලි අරගෙන ගියා. මාඩම් කොහොම හරි ඒ සල්ලි පියෙව්වා. එයා සල්ලි දිලද? නැත්නම් ඒ මැඩම්ගෙම සල්ලිද දන්නෙ නෑ.

මම දවසක් මැඩම්ගෙන් මේ ගැන ඇහුව මතකයි. හැමදාම වික්ටර් මහත්තය ඇවිත් සල්ලි ගෙනියන්නෙ මොකද කියල, එහෙම සල්ලි ඉල්ලන්නෙ වත්තෙ එළාටත් අයිතියක් තියෙන හින්ද. මැඩම් කිව්වා.

ඇය එදා නිරීක්ෂණය කළ ආකාරය දැනුදු මතකයට නැගෙයි. මෙය සිනාව යටපත්ව ඇය කෙරෙන් නියම පාලිකාව ඉස්මතු වූ අවස්ථාවයි.

මිස්ටර් සුදත් ඒ මගේ මහත්තයගෙ මල්ලි, එකම මල්ලි මට හරිම හිතවත්. අයිය මට නිරිසන් විදියට සලකන එක ගැන අවංකවම සහෝදරය එක්ක කෙලින් දන්වල මගේ පැත්තට කතා කරන්නෙ. මටත් ජීවත් වෙන්න ඉදිරි ජීවිතේ සතුටින් සමාදානෙන් ගතකරන්න අවස්ථාවත් සලසල දෙන්න සටන් කරන්නෙ එයා විතරයි.

යන්න හැම සතේම එයා ආපහු දෙනව. පොල් අක්කර විසිපහක් තියෙනව තනි අයිතියට. තාම කසාද බැඳලත් නැහැ. කතා කරන්න එපා එයාට විරුද්ධව එක වචනයක් හරි."

එම කතාවෙන් පසු තමා ගොළු බෙලි කටුව තුළට රිංගාගත් ආකාරය හොඳට මතකය. නමුත් යට ගියාව - වර්තමානය සහ අනාගතය? ඊයේ? අද? හෙට? සිහියට නැගෙන විට යටගියාවේ මතකයන් අලුත් වෙයි. වරෙක සොම්නස ඇත්වෙයි. තවත් වරෙක දුක පසුනැවිල්ල හා සංතාපයයි. ඒ සමඟම කැවිවින ආත්මීය පරාජය හිටිහැටි පටන් ගෙන තැති නමුත් සිතින් මවා ගෙන සිටි හොඳුරු සිතුවම් සිරකුඩුව තුළ බොඳව යනු පෙනින. ජීවිතයේ කවරදාකවත් නැහැ ගිහින් පොලිසියකට. යන්න හේතුවක් තිබුනෙත් නැහැ. නමුත් අද? මිනිමරුවෙකු ලෙස සැක කොට සිරකුඩුවක් තුළය.

මෙම මිනිමැරුම මොනම ආකාරයකින් හෝ සම්බන්ධයක් නැති තමා අද චූදිතයා ලෙස හිරකුඩුවෙය. භයානක මිනිමරුවන් සමඟ විට බොස් මරා දමා ගත් ලක්ෂ දහය බෙදා ගෙන කමින්, බොමින්, ප්‍රීතිවෙමින් සිටිනවා විය හැක. ඔවුන් බාර් එකක් නැත්නම් සුඛෝපබෝගී අවන්හලක විනෝදයෙන් කාලය ගෙවනවාට කිසිම සැකයක් නැත. එරින් දල්පනාදු ඔහුගේ මතකයට නැගුනේ මේ අවස්ථාවේදීය. ඇය තම ජීවිතයම බොස් වෙනුවෙන් කැප කළ තැනැත්තියකි. සුදු සේවාවක් වශයෙන් මෙම ආයතනයට බැඳී අද ඉහලම තනතුරක් දරන ඇයට විරසිංහ නිසා හැම සැප සම්පතෙක්ම ගිම් ටී පැත. එම නිසා ඇය විලිබඳ සැකය පැත්තට කලයුතුය.

මේ අතර සිර කුඩුවේ සපත මිතුරා ඔහු ළඟට පැමිණියි.

"ඔව අල්ලල දාන්න බොසා. කල්පනා කරල වැඩක් නැහැ. දැමුද? දුමක්"ය මිතුරා යෝජනා කළේය.

සිමින්ති බැම්ම උඩ වාඩිවී සප සුදත් දත් නොපෙන්වා, යාන්තමට සිනාසුනි. "අනේ මන්ද මෝමේ අයියා. මට මේක හරිම-"

සෝමේ කොළඹ මරදානේ මරිය කඩේ ප්‍රදේශයේ ප්‍රසිද්ධ නමකි. තරුණ නව යෞවනයකව සිටියදී මුළු මරදාන නගරයම තම අණසකට යටත් කරගෙන සිටියෙකි. ගයිකාරයෙකි. එහෙත් ඔහුගෙන් කිසිවෙකුටත් කරදරයක් වූයේ නැත.

සෝමෙගේ මිරිඳ ඔහුටත් වඩා ප්‍රසිද්ධය. ඇය ගැන නොදත් නැසූ කෙනෙක් මුළු කොළඹ නගරයේ සිටියානම් සුදුමයට කරුණකි.

පේමා නොහොත් පෙම්මා! 'ඇගේ නම ඇසූ පමණින් ඕනෑම බලපුළුවන්කාරයෙකු නිහඬ කරවීමට සමත් වෙයි. හැමතැනම - හැමදේකදීම පෙරමුණ ගත් එධිතර ගැහැණියකි පේමා.

මේ තරම් ප්‍රසිද්ධියක් ලැබීමට හා ජනප්‍රියත්වයක්, නැනක්,

පාතාල ලෝකයේ කිරුළු පලන් රැජිනක් වීමට ඇයට සුදුසුකම් සියයක් ම නිබුණි.

"මොනව කියනවද වීත්ත රෙද්ද ඇඳල, ටිකක් බඩ පේන්න බෙසියර් එත ගහල දන්නෙ නැද්ද ඉතින් ගස්සල පද්දල පාරේ යන කොට සුවඳ වීටක් එහෙම හප නපා බජාර් එකේ හැම යන කොට සුවඳ වීටක් එහෙම හප නපා බජාර් එකේ හැම අයියම පස්සෙන් යන්නෙ. බයත් නැහැ යකෙකුටවත්. පොලිසියට නෝ කෙයාර්."

කලින් දිනා තම බිරිඳ ගැන සෝමේ කල විස්තරය සුදත්ට සිහිපත් විණ.

"එතකොට සෝමේ අයියත් හොඳ බජාර් කාරෙක් වෙන්න ඇති?" ඔහුගේ සිනාව දැනුදු මැවී පෙනෙන්නා සේය.

"මොනවද බොස් කියන්නෙ? පට සරම අඳල, සාක්කු හතරේ හම්පටිය බැඳල. "නැබැයි පටියෙ සාක්කු හතරෙම නෝට්ටු. යනකොට බජාර් එකම නෝ ටෝක්. ගියාද බාර් එකට නැගිටිනව මේසවල ඉන්න ලොකු ලොකු කෙලිකාරයො. අපි තුන් හතර දෙනයි හිටියෙ ඔරිජිනල් විනාඩි කාරයො. දැම්මද මොකා හරි වචනයක්, පැන්න හතර මුල්ල. වැනුව දෙක තුනක්- මුළු බජාර් එකම සරෙන්ඩර්, මට හා තියල තිබුනෙ විනාඩි සෝමේ කියල. ඒ කාලෙ අපි මේ සෙල්ලම හැදි වැඩි ගෙන එන ඉලන්දාරින්ට පුරුදු කලා. ඉස්සර වෙලාම රාග බෝලෙන්. ඒ කියන්නෙ ලොකුවට හඳාපු වෙවැල් බෝලෙකින් මය මාලිගාතන්ද පන්සලට මෙහා තියෙන පොඩි පිටිටනියෙ හැඳෑම් හැන්දෑවට අපි මේව පුරුදු කලා. ඒ කාලෙ මරදානෙ හිටපු හැම චන්ඩියෙක්ම මේ සෙල්ලන් පුරුදු වෙන්න ආව. කවුරුත් ඒ දවස්වල මට හරියට සැලකුව.

ඒ යහු තමා ගැනම කල විස්තරයකි. "එතකොට දෙන්නම චන්ඩි?"

"එහෙම නෙවි. මම නැහැ කාටවත් සරෙන්ඩර්- ප්‍රේමා එනකොට හොඳ ලස්සන එකී. දන්නෙ නැද්ද ඉතින් බජාර් එකේ හැටි?"

"හරි, හරි කියන්නකො ඉතින්?"

"මම දවසක් තෙලෙන් කාමරේ ඉඳල මොට දෙකක් ඇදල් එනකොට ප්‍රේම ඕටි වුන පාරෙදි"

සුදත් සිනාසෙන ගමන්ය. "එයා රැටත් පාදෙ හිටියෙ"

සෝමේ අමුතු ආකාරයට ටික වෙලාවක් ඔහු දෙස බලා සිටියේය. "එයාගෙ ජොබ් එකේ හැටියට ගෙදර කාමරේට යන්නෙ රැවෙලා. සමහර දවස්වලට හොඳ බර හියෙන කාරෙක් සැටවුනොත්- එළිවෙලා නැත්නම් පනුවදා, එදා හොඳ වෙලාවට මගේ අතේ නියමෙට බර, මිටි වෙයන් ගැනි"

"සෝමේ අයියා කියන විදියට මෙයා තරක ගැනියෙක්?"

"කොයි ගැනිද මහත්තයො නොඳ? කොයි ගැනිද නරක? හැම ගැහැනියෙක්ම බලන්නෙ කොහොමහරි ජීවත්වෙන්න"

"ඒක වෙනම කතාවක්, මය ජීවිතේ ගත කෙරුවෙ,"

සෝමේ දුම් වැටියක් දල්වාගෙන සුදත්ට එකක් දෙයි.

"මට එපා. දැන් මයාගෙ සිගරැට් දෙ තුනක්ම බිව්ව"

"ගන්න බොසා මේක. සිගරැට් එකක් තියෙන්නෙ පත්තු කෙරුව දුම් ඇරිය. අපි දෙන්න හොඳට කතා කරනව. ප්‍රේමා හරිම ලස්සනයි. ගමේ කෙල්ලෙක්. ආව වැඩට බංගලාවක. මහත්තය දුන්න බබෙක් බඩව. නෝන ඔරොප්පු වෙලා දැම්ම කෙල්ල එළියට. වැටියන් ඊළඟට බජාර් එකට. ළමය හම්බවුනා. දුන්න අනාථ මඩමකට. බැහැ ගමරට යන්න. වැටුන බජාර් එකට. හැබැයි තියා ගන්න ග්‍රේඩ් එක"

"ඒ කාලෙද අයියට සෙට වුනේ"

"මොනවද මේ කතා. එදා මෙදා ප්‍රේම නොවෙයි එළියට බැස්සෙ. ඇයි ගෙදර නෑ අඩුපාඩු. මම මාලු, පීකුදු, සම්බ නාල්, වීස්, බටර් ඔන දෙයක් ගෙදර. ගැනිට තිබුනෙ උයල කන එක විතරයි. කන්න හොයන්න පාරට යන්න ඕන නැහැ"

සුදත් දුම්වැටිය උරමින් සිනාසෙන්නට විය. "නියම පොරක්නෙ ඔයත්. ඒ වගේ ගැනියෙක් හදල ගත්ත තිව්වම"

සෝමේ ආඩම්බරයෙන් බැල්මක් හෙලා සිනාසෙන්නට විය. "එන්නකො මගෙ රත්තරන් මහත්තය මරිය කඩේ මගේ ගෙදරට වෙලාවක. දැන් මගේ ගැනි පොඩි පොඩි සයිඩ බිස්නසුත් කරනව. සල්ලි පොලියට දෙනව. උගස් බඩු ගන්නව. සිට්ටු දානව. එයාට හොඳ බර"

සුදත් සෝමේ දෙස බලා කල්පනා කරන්නට විය. "එතකොට ඔයා ගංජා ගහල ඇතුලෙ ඉන්නෙ?"

"ඒක තමයි කියන්නෙ ආරේ ගුණ නෑරේ, මල්ල කිහිල්ලෙන් නෑරේ ඔය අපේ ආත්තල. මුත්තල කියපු ඒව. රජ මාලිගාවෙ රාජ

හෝජන කාල හිටියත් මට ඉඳල හිටල හරි ගංජා මිටියක් හොන්න ඕන හොත්තය. මගේ ගැනින් ඒක දන්නව"

"බැරිද ඔය ජරා පුරුද්ද නවත්තන්න?"

"ඒක නේන්නම් මහත්තය. මේ කැන පුරුද්ද අත් ඇර ගන්න බැරි හින්ද නේන්නං අද මට මේ බලු කුඩුවේ ලඟින්නෝ. මට රජාට වගෙ කන්න බොන්න තියෙනව. ඒ ගැනි මම ඕන කරන හැම දෙයක්ම ලඟට ගෙනත් දෙනව. තරුමේ මහත. ඉඳල හිටල පරණ වැසියෝ මූණගැහුනම ඒ කාලෙ මනක් වෙන්නත් එක්ක දුමක් දාගන්න හිතෙනව. ඒ දාගන්නම ඕන් හිතෙන් ආයිමත් තරුණ කාලෙට යනව. එතකොට හිනට තියෙන සැනසීම කියන්න බෑ බොසා."

සෝමේ ශෝක හරින දිග සුසුමක් හෙලීය.

5

විරසිංහ සමූහ ව්‍යාපාරයේ අධිකරු පිටකෝට්ටේ රණ්ඩිනා විහාර පාරේ නිවස තුළ වෙඩි තබා මරා දැමීම සම්බන්ධයෙන් සුදත් රෝහන. ඔහුගේ යකඩ කවයේ සිටි තරුණ කළමනාකරු සැකපිට අත්අඩංගුවට ගෙන දැන් මිරිහාන පොලිසියේ සිර කුඩුව තුළය.

මියගිය විරසිංහගේ සුරුවී තරුණ බිරිඳ සහ එකම සොහොයුරු වික්ටර් දෙදෙනා යකඩ කඩයට යාමට සූදානම්ව, දොරටුව අසල රැකවල සඳහා යොදවා සිටි පොලිස් නිලධාරීන් දෙසට ගමන් කලහ.

"අපි දෙන්න යනව නාඩවෙයාර් එකට. වැඩ කරන කට්ටිය දැන් ඇවිල්ලත් ඇති"

පොලිස් නිලධාරියා සටහන් පොතක් පෙන්වමින් "දෙදෙරින් පිටවෙලා යන වෙලාව, වාහන නොම්බරේ, යන නැන ලියල දෙන්නම අත්සන් කරන්න"යි ඔහු තරමක් බයාදු ලෙස කියමින් සිනාසෙන අතරම "මේක අපට දීල තියෙන ඕඩර් එකක්"යි

Buddyalbums
www.buddyalbums.net

වැඩිදුරටත් සඳහන් කළේය.

අනෝමා සහ වික්ටර් එයට සිහාසුනා පමණි. "ම කරන්නෙ රාජකාරියක්. අපේ කිසිම තරහක් නැහැ."යි වික් සටහන තබා අත්සන් කර පොත අනෝමාට දෙන අතර "ම වැඩකාරයන්ට කියල තියෙන්නෙ මය දෙන්නගෙ අඩුපාඩු බලන්න. නැම. බීම. තේවලට කොහාටවත් යන්න එපා. මේ ළඟපාත නඩ."

ඔහු වැකිය අවසන් කරන්නටත් පෙර පොලිස් නිලධාරියා "බොහොම ස්තුතියි - අපිව කඩේට යවාගන්න මිනිහෙක් හිටියොත් ඇති"යි කීය.

අනෝමා තම අත්සන තබා නිලධාරීන් දෙසට හැරුණාය. "මේ වගේ නැනක ඉඳගෙන හෝටල්වලින් කෑම බීම ගෙන්නව ගන්න එක අපිට මදිකමක්. ඒව සේරම පිළියෙල කරල තියෙන්නෙ. අපි ආපසු එනකොට ටිකක් රෑ වේවි. සුදත්ට කෑම ගෙනියන්න ඕන පොලිසියට"

"අපි හයට ඩියුටී මාරුවෙනව. වෙන දෙන්නෙක් එනව. කොයි වෙලාවට ආපහු ආවත් වෙලාව විතරක් ලියන්න"

ඔවුන් දෙදෙනා මෝටර් රියට නැඟී යකඩ කඩය බලා පිටත්ව යන අතර රියදුරු අසුනේ සිටි වික්ටර් අනෝමා දෙස සම්වචලයට මෙන් බලා සිනාසෙන්නට විය. "මොකෝ නිකන් ලක්සෙට අරගෙන තුට්ටුවට දුන්න වගේ මූණ මලානික වෙලා..... සිනාවක් දකින්නත් ආසයි. මම කාරනේ නොදන්නව නෙවෙයි. සුදත් ගැන හිත හිත දුක්වෙනවට වැඩිය, මොනාව හරි පිළිවෙලක් යොදා ගන්න ඕන මේ මර උගුලෙන් බේරෙන්න"

අනෝමා ඔහු දෙස සානුකම්පිත බැල්මක් හෙලුවාය.

"සුදත් මිනිහෙක් තියා මැස්සෙක් හරි මරන්න හිත දරුදඬු කෙනෙක්ද?" යි ඇය එක එල්ලේ ප්‍රශ්න කළාය.

"කවුද එහෙම කිව්වෙ?"

"මිනිහ රිවෝල්වර් එකක් දැකලවත් නැතුව ඇති. පොලිසියෙන් මොනවද මේ කරන්නෙ?"

"මම ඒ ගැන සොයල බැලුව. ඔය සිද්ධිය වෙන දවසෙ මිරිහාන පොලිසියෙ ක්‍රයිම් ඕ. අයි. සී. මන්කොල්ලකෑමක පරීක්ෂණයකට පිටපලාතක ගිහින්"

"ඒක රෙනම කතාවක්. සුදත් හිරබාරයට ගත්තෙ

පොලිසියෙන්"

"ගේ ඔළුවත් එක්ක ඇල්ල්වේලා. මොනව කරන්නද?.....කාට කියන්නද?"

"කියන්න කරන්න ඕන හැම්දේම මේ කරල ඉවරයි. ඇන් එන බෝලෙට කොහොම හරි ගහල ගැලවෙන එක විතරයි තියෙන්නෙ. සුදත් උසාවි දාන්කල් කරදරයක් නැතිව ස්පෙෂල් සෙල් එක්කත් ඉන්නෙ. අලුත් යාලුවෙකුත් එක්ක."

අනෝමාගේ පෙනුම යාන්තමින් ඔළුවනු වික්ටර්ට පෙනිණි.

"ඒකත් වෙලාවෙ හැටියට ලොකු දෙයක්"

විනාඩි විස්සකින් පමණ යකඩ කඩයට පිවිසි දෙදෙන දවසේ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍යතා සියල්ල අඩුපාඩු නැතිව සපුරාලීමට කටයුතු පිළියෙල කළහ.

අනෝමා කලකිරුනු ස්වභාවයෙන් අසුන්ගෙනය. වික්ටර් උපදෙස් හා සේවකයනව අණ දෙමින්ය.

"අද ඉයෙනව ලොකු ඔඩර්ස් කීපයක්ම. නැම්දාමත් අපෙන් බඩු ගන්න කස්ටමස්ලා, අඩුපාඩු නැතිව ඔඩර්ස්වලට හරියට සප්ලයි කරන්න ඕන. සුගතපාල නැම දෙයක්ම ඔගොල්ලන්ට කියල දේවි..... සුදත් මහත්තය එනකන් හාඩවෙයාර් එක බලා හදා ගන්නෙ සුගතපාල..... එයා කියන විදියට වැඩකරන්න ඕන."

එම උපදෙස් සුගතපාල යටතේ සේවය කළ සුලු සේවකයන් සඳහාය. වික්ටර් මොහොතක් නිහඬව කල්පනාකාරීව සිට අනෝමා දෙසට හැරුනි.

"මට දැනගන්න දේවල් කීපයක් තියෙනව අක්කගෙන්?

අනෝමා කුතුහලයෙන් යුතුව ඔහු දෙස බැල්මක් හෙලුවාය.

"මගෙන්ද?"

"නැතුව? වෙන කාගෙන්ද"

"සුදත් ගැන අක්කගෙ අවංක අදහස කියන්න"

අනෝමා ඔහු දෙස නිහඬව මඳ වේලාවක් බලා සිටියාය.

"සුදත් ගැන විතරක් ද දැන ගන්න ඕන"

වික්ටර් ඇය නිරීක්ෂණයේය.

"දෙන්න ගැනම කිව්වොත් හරිද?"

අනෝමා ඔහු දෙස එක එල්ලේ බලා ගෙනය.

"හිතාගෙන ඉන්නවද අපි දෙන්න එකතුවෙලා ඔයාගෙ

අයියට වෙඩි තියල මැරුව විදියට?"

වික්ටර් යාන්තමට සිනාසුනි.

"කේන්ති ගියාම යක්ෂනියක් වගෙයි. මම අහුවෙ සුදත් ගැන. මට වැඩිය නමා දන්න නිසා. මම නාටවත් චෝදනා කරනව නෙව්."

ඌන් අනෝමා නරමක් සන්සුන්ය. "එහෙම එන්න. මම දන්න හැටියට සුදත් හරිම අහිංසකයි. අවංකයි. භය, ලැජ්ජාකාරයෙක්"

වික්ටර් දුම්වැටියක් දල්වා දුම්රොටු කිපයක් ඉවතට මුසු කරන්නට විය. නැවත අනෝමා වෙත අවධානය යොමු කළේය.

"මේ ලෝකෙ ජීවත්වෙන හැම කෙනෙක්ම හරිම හොඳයි. අවංකයි. අහිංසකයි. වරදකට අහුනොවී ඉන්නකල්. මොනව හරි දේකට මාට්ටු වෙච්චදාට නමයි ඉබිකට්ට ගැලවිල්ල නියම මිනිහ සමාමේට පේනනෙ. එදාට ආධාර, උපකාර කල හැරමාමත් කොට්ටු වෙනව"

ඒ ප්‍රකාශයෙන් අනෝමාට ඉබේම සිනාඉහල විණ.

ඔය කියන දේවල් නමන්ටත් බලපානව නේද?"ය ඇය සරදම් ස්වරයෙන් ප්‍රශ්න කළාය.

"එහෙම වෙන්නත් ඉඩ තියෙනව"

"නමන් තෙරුවෙ පොදු සම්මාජ විග්‍රහයක්. ඒකට හැමෝම අයිතියි"

මේ අවස්ථාවේ ගනුදෙනු කරුවෙකු පැමිණෙත්ම වික්ටර් අසුනෙන් නැඟී සිටි අතර අනෝමා කෝපය මැඩපවත්වා ගනිමින් කිසියම් කාර්යයක නියැලුනාය.

කෙසේ වෙතත් අනෝමාගේ හිස යකාගේ කම්මලට නොදෙවෙනිය. සුදත්, තමාටත්, තමා සුදත්ටත් යටිසිතින් අවංකවම පෙම්කල බව ඇත්තකි. එය දෙදෙනාටම පමණක් සීමිත රහසකි. නමුත් අද සමාජයේ නැටියට කවුරුන් කෙරෙහි කාට විශ්වාසය තැබිය හැකිද?

පාතාලයේ නිතිපනා සිදුවන නෙත්කත් නොඇදහිය හැකි මැරකම්, මිනීමැරුම් ! සුදත් පමණක් නොව වික්ටර්?

මේ දෙදෙනාගෙන් කෙනෙකු පාතාල ඝාතකයකුගේ සහායයෙන් විරසිංහ ඝාතනය කර රුපියල් දස ලක්ෂය පැහැර ගත්තාද? එයටද හොඳටම ඉඩ ප්‍රස්ථා ඇත. එලෙසම මවුන්

දෙදෙනා නමා ගැනත් එවැනි හැඟීමක් ඇතිකර ගතහොත්? එසේ සිතීමද අසාධාරණයෙන් තොරය. ජීවතුන් අතර සිටි විරසිංහ ගේ ප්‍රධානතම සතුරාද ඇයය.

ඇය මේසය මත හිස තබා ගත්තාය. වික්ටර් ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයන් සපුරා මේසය කරා පැමිණ "මොකද නිදිද?"යි ප්‍රශ්න කළේය.

"නින්ද කියන එකක් නොගේද. සුදත් හිරඛාරයට ගත්ත දවසෙ ඉඳල. අපි රිමාන්ඩ් එකට යමු නේ එයාට ඕන කරන කියන දේවල් අරගෙන. මග බලාගෙන ඇති."

වික්ටර්ගේ සින දයාවෙන් හා අනුකම්පාවෙන් පිරී ගියේය. තමා කළින් කල කතාව ගැනද ඌන් පසුතැවිල්ලේය.

"මම නිකමට කිව්ව ඒව අත්ක ගන්නද මල්ලට? අපි යමු සුදත් බලන්න. කොහෙන්ද කෑම ගෙන්නව ගන්නෙ?"

"යවමු පීටර් කොට්ටට"

"නතියම්?"

"වාහනේක - ඉන්නවනේ ඩ්‍රයිවර්ල"

"මොනවද ගෙනියන්නෙ"

"කතාකරන්න පීටර්ට මොහොට"

වික්ටර් කාර්යාල සහායක පීටර් කැඳවන අතරතුර අනෝමා කොලයක් ගෙන යමක් ලියමින් ඉන්නා අතර පීටර් එතැනට ලඟාවිය.

අනෝමා ලිවීම අවසන් කොලය දෙස නැවත වරක් බලා වික්ටර් අතට දුන්නාය. "බලන්න තියෙනවද කියල අඩුපාඩු මොකුත්"යි ඇ දැඩි උනන්දුවකින් ඇසුවාය.

වික්ටර් ලැයිස්තුව කියවා සිනාසෙමින් "අපෝ තව ගොඩාක් දේවල් තියෙනව පිරිමින්ට අවශ්‍ය දේවල්. කොහොමද ගැහැනු දන්නෙ? අසමින් නවත් දේවල් රැසක් කුන්ඩුවට එක්කළේය.

"කතා කරන්න ඩයිවර් නාදන්ට මෙහාට"යි අනෝමා කී විට පීටර් ඉවත්ව යනු පෙනිනි.

"බෙඩ්ශීට් එකක්, සරමක්, කොට්ටයක්, කොහෙන්ද ගන්නෙ?

අනෝමා සිනාසෙන්නට වූවාය.

"ඔව හිංකුඩුව ඇතුලට ගන්න දේවිද?"

"මම ලොකු අතු ගණනක් ටැප් කරල ඕන කරන තැනට

මෙසේජ් දීල තියෙන්නෙ. අරගෙන යමු ඇතුලට ගන්න නොදුන්නොත් බැරිය ආපහු ගෙදර ගේන්න"

"ඒ ටික ගමු ගෙදරින්"

පීටර් රියදුරු නාදන් කැඳවාගෙන ඔවුන් අඹියසට නැවතත් පැමිණියේය. අනෝමා තුන්ඩුව සහ මුදල් නෝට්ටු කීපයක් පීටර් අතට දුන්නාය. අනතුරුව නාදන්ගේ අවධානයට යොමු කරමින් "දන්නවනේ අපිට ගෙදරින් කෑම නොගෙනෙන දවසට කෑම ගේන කොටුවෙ හොටෙල් එක. මේ තුන්ඩුව දෙනව මැනේජර් අතට. සල්ලි තෙවල බිලත් අරගෙන එනව. මම දෙනව කෝල් එකකුත්"

පීටර් හා නාදන් විනාඩි විස්සකින් පමණ කොළඹ කොටුවේ පිහිටි තරු පහේ හෝටලයක් අභියසය.

"ඔකනේ පීටර් අයිය කියන්නෙ. බොස්ට වෙඩි තියල මැරුව. මැනේජර් ලොක්අප් එකේ. බොස්ගෙම සල්ලිවලින් මිනීමරුවට තරුපනේ හෝටලේකින් දාස් ගානක කෑම ඩීම, අඩෙ අප්පා"

පීටර් මහු දෙස පිළිකුල් සහගත බැල්මක් හෙලුවේය. "කට පරිස්සම් කර ගත්තොත් හොඳයි නාදන්. තමුසෙ කොහොමද කියන්න දන්නෙ සුදත් මහත්තය බොස්ට වෙඩි තිබ්බ එක?"

නාදන් විශ්මයට පත්වූවාක් මෙනි. "හරි කතාවක්නේ ඔයි. එහෙනත් මොන එහෙකටද මිනිහ ලොක්අප් කෙරුවෙ"

පීටර් කෝපයට පත්වී ඇත. "තමුසෙ ඩ්‍රයිවර් වැඩේ අතඇරලඳාල බැඳෙනව පොලිසියට. නෝන මහත්තුරු කිව්ව වැඩේ කරනව කට වහගෙන"

පීටගේ ඝර්ජනයෙන් නාදන් නිහඬවූවාක් මෙන්ම පුදුමයටද පත්විය. ඔහු පීටර් ගැන කල්පනා කරන්නට විණ.

"හරි නමයි. මූ කටුකන එකා. කිසිම කැක්කුමක් නියෙනවද බොසා මැරුවට? හිතේ අමාරුව තියෙන්නෙ මිනීමරුව ඇල්ලුවට. වැඩිය කතාවට ගියොත් මූ උන්ට පන්දම අල්ලල මගේ ජොබ් එකත් ගහල යනව. ෂේප් එකේ ඉන්න එක නමයි නුවනට හුරු"යි සිතමින් නාදන් පීටර් දෙස බැලීය.

"මම නිකමට, විගිරුවට වගෙ කිව්වෙ පව් සුදත් මහත්තය සැකේටදෙන් අල්ලල තියෙන්නෙ. යන්න ඔන හෙට දිහාවට බලල එන්න. කොයි පොලිසියෙද ඉන්නෙ?"

පීටර් තවමත් පදාවන්නේ කෝපයෙනි. "ඒක අනගෙන්නව නෝනල, මහත්තයලගෙන්, ඔහින් අපට කිව්ව වැඩේ කරමු"

නාදන් පීටර් ගැන මෙනෙහි කරමින් තවමත් කල්පනාවේය.

"පීටර් අයියා! සුදත් මහත්තය මෙහෙ මැනේජර්, අධිනිකාර නෝනගෙයි, බොස්ගෙ මල්ලිගෙයි හොදම අත්ගෙඩිය. අපි වගේ එකෙක් ඔය වැඩේට මාට්ටු වෙල නිබුනද, කොහොමට හිටිවිද?"

පීටර් නුගතෙයි. වසර ගනනාවක් තිස්සේ කාර්යාල සහායකයෙකු වශයෙන් සේවය කරන්නෙකි.

"අපි මොනවටද වැඩක් නැති දේවල් ගැන කතා කරන්නේ? අපි සුළු පඩියකට වැඩ කරන්නෙ. කියන දේ කරනව. මාසෙ පඩිය ගන්නව. ඒච්චරයි. ඔන එකෙක් ඔන කුදයක් වත ගත්තාදෙන්. අපි දෙන්නාටම පාඩුද?"

"මම කියන දේ අහනව. තමුසෙ කිව්ව සුදත් මහත්තය හිරබාරෙට අරගෙන තියෙන්නෙ සැකෙට. අපිව සැකේව ගත්තද හිරබාරෙට. අපිට ඇත්ත කියන කල්ම ගහන්නෙ කුදු තුනුලන් වගෙ උඩ එල්ලල. වැඩේ කෙරුවත්, නැතත් ගුවිබැට කන්න බැරිකමට වරද පිළිගන්නව."

පීටර් දිග සුසුමක් හෙලීය.

"බලාගෙන යනකොට ඒකත් ඇත්ත. අපි බලන්න හාරෙ යන බලු කුක්කෙක්වත් පැත්ත පලාතට එයිද?"

නාදන් සිනාසෙමින් හෝටලයේ දොරටුව අසල සිටි ආරක්ෂක නිලධාරින්ට යමක් පවසා සැනෙකින් වාහනය හෝටලයේ ආංගනය තුළට පැදවීය.

එය පසෙක නතරකල නාදන් පීටර් නැවිව තරුණියක් සේවයේ යෙදී සිටි කවුන්ටරයක් කරා ගොස් අනෝමා දුන් තුන්ඩුව ඇය අත තැබීය.

"ඕ....හ්ම්.....පාටියද.....මිස් අනෝමා. ටිකකට කළින් දුන්න අපේ කේටරින් මැනේජර්ට කෝල් එකක්. වාඩිවෙන්න දෙන්නම් ඔහොම, විනාඩි දහයෙන් ඔඩර් එක රෙඩි."

පීටර් සහ නාදන් පසෙක තිබූ සුවපහසු දෙන අසුන්වලට බරවූයේ නරමක චකිතයකින් හා අපහසුතාවයකින් යුතුවය.

පැය භාගයකට පමණ පසු පීටර් සහ නාදන් අනෝමා සහ වික්ටර් කිසියම් කතාබහක නියැලී සිටි කාර්යාලය තුළට පිවිසුනහ. දෙදෙනම හිස් ඔසොවා ඔවුන් දෙස බැලුන.

"අපි බලාගෙන හිටියෙ. හරිද සේරම?"

නාදන් බිලක් අතට ගෙන ඉනිරි මුදල් සමඟ අනෝමා අතට දෙයි. ඈ බිල්පත පරීක්ෂා කරන්නට වූවාය. අනතුරුව "ඔන් ඔඩර් එක හරියට එවල. ඔයත් චෙක් කරල බලන්න"යි කියමින් බිල්පත වික්ටර් අත තැබුවාය.

අනෝමා දුන් බිල්පත උඩින් පල්ලෙන් කියවාගෙන ගිය වික්ටර් සේවකයන් දෙදෙනා දෙසටම හැරුනි.

"දානව පාර්සල් ඔක්කොම පැජරෝ එකට. මේ දෙක ඉතරු කරල."

ඉතුරු කිරීමට අණකල පාර්සල් දෙක දෙදෙනාගේ දිවා ආහාරයයි. පීටර් සහ නාදන් ගොස් පාර්සල් සියල්ල වාහනයේ තැන්පත් කලහ. ඉන්පසු නාදන් පීටර් දෙස හෙල්ලූ බැල්ම පිළිකුල. සමව්වලය හා අවඥාව මුසුය.

"එතකොට පීටර් උඹටත් අද තරුපහේ හෝටල් ඩයට් එක?"

ඒය එසේය, එහෙත් පීටර් නාදන්ගේ වදන් ගණනකට නොගත්නාක් මෙන් "ඒ කෑම කනවට වැඩිය හොඳයි බඩගින්නෙ මැරෙන එක. ඔය දෙන්න දැන් සුදත් මහත්තය බලල හැම දිපන්කරේම ගිහින් කියට ඒවිද? මට බඩගිනියි, වෙලාවට කාල පුරුදු මිනිහෙක්. කඩෙට ගිහින් හැමදාම කන පාන් බාගෙයි, පරිප්පු එකයි කනව"

නාදන් සිනාසෙන්නට විය. "මෙත් මෙතෙන්ට අද ඊයේ ද ආවේ?" ඒ කිව්වේ අපි දවාලට කන කෑම තමුසෙ හැමදාම එක්කො බංගලාවේ ඩත්, එහෙ මිස්වුනොත් තරුපහේ හෝටල් කෑම. මටද කියන්නෙ?" යි නාදන් සරදම් හඬකින් කිය.

"මූන් හැමෝටම නියන්නෙ මාර ඉරිසියාවක්. උන් මාසෙ පඩිය ගන්නෙ අත පුරවල. මට හම්බවෙන්නෙ සොච්චමයි පියුන්, වැඩේ කරල. මොනව හරි කටට රහට දවල් වේල කන එක හැබැව. ඒත් නිකන්ද? හැම පරවැඩක්ම කරල"

වික්ටර් පැජරෝ රථයට ඇතුළුවෙද්දී අනෝමා පීටර් අමතා "පීටර් එන්න අපිත් එක්ක.....මේ පාර්සල් ටික එහාට මෙහාට ගෙනියන්නත් කවුරුත් ඉන්න එපායැ"ය සඳහන් කළාය.

අනෝමා සහ පීටර් රියට ඇතුළුවනවාත් සමඟම රිය ප්‍රාණවත් කල වික්ටර් මිරිහාන පොලිස් ස්ථානය කරා පදවන්නට විය.

මිරිහාන පොලිස් ස්ථානය වෙත ලගාවූ අනෝමා සහ වික්ටර් ඔවුන් සුදන්ට දීමට රැගෙන ආ සියල්ල කාර්යභාර නිලධාරීන්ට පරීක්ෂාකර බැලීම සඳහා ඉදිරිපත් කළහ.

"මේ මිස්ටර් වික්ටර් විරසිංහ. මිස් අනෝමා දෙන්න නේද?"යි ඒ විමසුම රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරිනියයි.

"ඔව්, අපි ආවේ සුදත් බලන්න"

ඇය ඔවුන් සාජන්වරයෙකු වෙත යොමු කළාය.

"සර්ල හොඳට සලකන්න කියල මෙහාට ඉහළින් ඔඩර් ලැබිල තියෙනව"ය කී සාජන්වරයා යන්න ඇතුළට සුදන් ඉන්නෙ එහා පැත්තෙ සෙල් එකේ"යි වැඩිදුරටත් සඳහන් කළේය.

"ගෙනැත් තියෙන දේවල් ඇතුලට ගෙනියන්න ඉඩ දෙනවද?"

සාජන්ට මදක් පැකිලෙනු පෙනින. "කොටිටෙ ඇර අනිත් ඔක්කොම ගෙනියන්න පුළුවනි"

අනෝමා වික්ටර් දෙස බලා සිනාසෙන්නට වූවාය.

"මම කිව්වෙ නැද්ද?"

"හරි අපි කොටටෙ තියල යමු. නැද්ද සාපත් මහත්තයා?

සාජන්ට් තැනද සිනාවට හවුල් විය. "අනිත් බඩු ඔක්කොම අරගෙන යන්න"

"තැන්ක් යූ වෙරි මච්"

සාජන් වෙනත් පොලිස් නිලධාරියකු කැඳවා "මේ නෝනයි මහත්තයයි එක්ක යන්න ලොක් අප් ලඟට, නැබැයි මිනිහ එළියට ගන්න බැහැ. කෑම බීම දීල යන්න කියන්න. වැඩිවේලා තියා ගන්නත් එපා. ලොක්ක එනව තව පැය දෙකකින් විතර."

අනෝමා සාජන්වරයා දෙස බලා සිනාසුනාහ. "පැය ගණන් මොනවටද? ගියා කෑම ටික දුන්, ටිකක් කතා බහ කෙරුව, අපි ගියා"

ඈ එය උච්චාරනය කල ආකාරයට සාජන්වරයාට ඉබේම සිනා පහල විය. "මම නොදන්නවද මගේ කෙස් පැහැනෙ පොලිසියෙ ජොබ් එකම කරල. හරි- හරි ගිහින් කතා කරල එන්නකෝ."යි කී ඔහු තමා අසල සිටි පොලිස් කොස්තාපල් දෙස බැලීය." ඔනවට වැඩිය වෙලා තියාගත්තොත් තමා වගකියන්න

ඔන. මම දැන් යනව කැමට"ය පවසමින් අසුනින් නැඟිට හෙමින් සිරුවේ එතැනින් ඉවතට ගියේය.

සුදත් සහ සෝමේ නිවී සැනසිල්ලේ කතා බස් කරමින් සිටිද්දී සුරුපී අනෝමා ගිර කුඩුව අසලට පැමිණියාය. ඇය පසුපස පාර්සල් කිහිපයක් අතැතිව සිටී සේවක පීටර්ය. වික්ටර් නැමටම පිටුපසින්ය.

"සුදත් එන්න මම ආව ඔයාට බලන්න"

ඒ කටහඬ ඇසෙන්ම සුදත් ඊගසක් මෙන් නව ජීවයක් ලද්දෙකු මෙන් එක්වරම හුන් තැනින් නැඟිට හිරකුඩුවේ දොරටුව ලඟට පැමිණියේය. ඔහු ඇය දුටුවේ එවිටය.

ඇය ඔහු දෙස බලා සිටියේ දුක් මුසුව මේ අතර වික්ටර් කුඩුව අසලට පැමිණියේය.

"හලෝ සුදත්, හොඳයිද ඉන්න තැන?"

සුදත් යාන්තමට සිනාසුනි. "වරදක්, නරකක් නැහැ. වෙලාවේ හැටියට, ඉතින් කොහොමද සර්?"

අනෝමාගේ දෙනෙත් කඳුළින් පිරී ඇත. "මා එක්ක තරහද සුදත්" යි ඇය ආයාසයෙන් දෙතොල් අතරින් මිමිණුවාය.

සුදත් ඇය දෙස බැලීය. ඒ බැල්ම විශ්‍රහ කල නොහැකිය. තම පෙම්වතිය දෙස බලනවාද? නමා කිසිම සම්බන්ධයක් නොමැති මිනීමැරුමකට කොටුකර, හිර අඩස්සියේ තැබීමට මග පාදූ පරම හැතිරියක දෙස හෙලන බැල්මක්ද?

එසේත් නැත්නම්, තිරණයක් ගත නොහැකිව මංමුලාව විසඳුම් සොයන මිකනෙකු දෙස හෙලන බැල්මක්ද?

"ඇයි සුදත් අමුතු විදියට බලන්නෙ, ඔයාට සැකද අපි දෙන්නත්?"

සුදත්ගේ කෙට සිනාරැල්ල යළි මුවඟට නැඟිනි. "දැන් අපි එක එක්කෙනා සැක කරන එක නෙවි. මේකෙ අගක් මුලක් නොයල තේරුමක් බෙරුමක් කරගන්නයි නියෙන්නෙ"යි ඔහු කල්පනාකාරීව කීය.

අනෝමා ඔහුට තවත් ලංවූවාය. "ආරංචියෙ හැටියට හෙට ඉඳල අපි දෙන්නත් හිරබාරෙට ගන්නව"

සුදත් එක එල්ලේම ඇය දෙස බැලීය. "එතකොට කඩේට මොකද වෙන්නෙ"යි ප්‍රශ්ණ කළේය.

වික්ටර් උපහාසාත්මක මුසු සිනාවක් පෑවේය. "තුන්දෙනාම

මිණිමැරුමකට් කොටුවෙන්න යන්නෙ. ඒ අස්සෙ සුදත්ට ඔක කඩේ බිස්නස්"

සුදත් දෙදෙනා දෙසම නෙත් සිය නොහෙලා බලා සිටී. "මේක අපි දන්නෙ නැති දෙයක්. මහත්තය හිටියෙත් නැහැ පළාතකවත්. නෝන දන්නෙත් නැහැ කියිම දෙයක්. මම කෙරුවෙත් නැහැ"

වික්ටර් ඔහු දෙස සැකමුසු බැල්මක් හෙලීය. "අධිය ලකෘ දහයක් ඔහිස් එකෙන් අරන් ඇවිල්ල. සාක්කි තියෙනව. එරින් දල්පනාදූ සමාගමේ කැමියර් දෙත්නගෙම - ඒත් සල්ලි අතුරුදහන් වෙලා"

සුදත් ඔහු දෙස ගුප්තාර්ථ බැල්මක් හෙලීය. "මම මහත්තය මරල සල්ලි ගත්ත කියලද හිතන්නෙ?"

වික්ටර් ඔහු දෙස නියුණු බැල්මක් හෙලීය. "එහෙම කරල නිබුනනත් කමක් නැහැ. ඔයා විතරයි ඇතුලට යන්නෙ. දැන් අපි දෙන්නත් ආධාර අනුබල දුන්නව හෙට අනිද්ද ඉඳල ඇතුලේ"

සුදත් කුඩුවේ යකඩ කම්බි අල්ලා ගෙන දෙදෙනා දෙස බලා සිටී අතර ඔහුගේ යටි සිත වේගයෙන් ක්‍රියාත්මක වෙමින් පැවතිනි.

මම හිතුව හරි, මුන් දෙන්න මොන උප්පරවැට්ටියක් හරි ඇල බොසා මරල සල්ලි ගත්ත ඇති. අන්තිමට මොකුර මම, කරන්න දෙයක් නැහැ. ඒත් වෙන දෙයක් වෙච්ච දෙන්, වෙන් වෙනුවෙන් අඩන්න ඉන්නෙ මම විතරයි. මෙත් ද, යන්නෙ නැතුව වෙන දේකට එන දේකට කෙළින් මූණ දුන්නම ඉවරයි.

මෙතෙක් නිහඬව සිටී අනෝමා කටහඬ අවදි කළාය. "කැමි ගෙනාව සුදත්, දෙතුන් දෙනෙකුට සෑහෙන්න. වෙන මොනවද ඕන කරන්නෙ?

ඔහු කුඩුවේ යකඩ කම්බි අතරින් ඇය දෙස නා වික්ටර් දෙස බැලීය.

පුදුම ස්ත්‍රීත්වයක්!

සේවකයෙක්!

ගේ දොර, වතු පිටි . කඩ සාප්පු ව්‍යාපාර හිමිකාරියක්, කෝටිපතිනියක් හිටිහැටියේ හිසමත කඩා වැටුන මේ සියල්ල නිසා හිස උදුම්මා නොගත් ස්වාමිදුවක්, මියගොස් ඇත්තේ ඇගේ විවාහක ස්වාමිපුරුෂයෙයි. ඒ මරණයෙන් සකල

සම්භාරයටම එකම හිමිකාරිය ඇයයි.

වික්ටර් මියගිය තැනැත්තාගේ එකම සොහොයුරා ජීවත්ව සිටියදී තම අයිතිවාසිකම් වෙනුවෙන් නිරතුරුව සටන් කළ තැනැත්තෙකි. එහෙත් දෛවයෙ සරදමකින් සියල්ල කණපිට පෙරළී ඇත. සොයුරා, සැමියා හා පරණ හාම්පුතා දැන් කනත්තේය. පසෙක සිටි අහිංසකයෙක්, හිතට එකඟව එහෙත් කිව නොහැකි පුද්ගලයෙක් ඒ අබිරහස් මරණය ගැන සැකපිට සිරකුඩුව තුළය. මියගිය හාම්පුතාගේ තරුණ රූමත් බිරිඳට අවංකවම යටි සිතින් පෙමකල නමුත්, තමාට පමණක් ආවේනිකවූ සදානනික රහසක් සේ තබාගෙන සිටි තමා දැන් සිරකුඩුවේ මිනිමරුවෙකු ලෙසින් පිළිගෙන ඇත. දැන් ගෙනවිත් තිබෙන කෑම ටික සතුටු සිතින් බාරගෙන මේ ගැන රාත්‍රී කාලයේ දී සෝමේ අයියා සමග දීර්ඝ ලෙස සාකච්ඡා කර කිසියම් නිරණයක් ගත යුතු බැව් සුදන්ට සිතින.

සෝමේ තුගතෙකි. නමුත් නීතිය, පොලිසිය, හිරගෙදර, උසාවිය ආදී ස්ථාන ගැන ඔහු නිපුණත්වයට පැමිණි විෂය ක්ෂේත්‍රයන් ය. මෙම විෂයයන් ගැන ඔහු අභිබවා යාමට කිසිම කෙනෙකු නැතැයි සුදන් සිතුන වාර බොහෝය. ඒ ඔහු මීට පෙර මෙවැනි තැනකට නොපැමිණිමත් සෝමේ වැනි අයකු සමග ඇසුරත් නිසා විය හැක.

සුදන් නිහඬව විනාඩි කිපයක් හිස බිමට නැඹුරුකොට, සිරමැදිරිය තුළ පැවැති දැඩි නිහැඩියාවම සවන් යොමු කළේය. මේ මොහොතේ අතීතය, වර්තමානය හා අනාගතය එක්කල අපුරු චිත්ත දහරාවක් සිතමා පටලයකින්මෙන් ඔහු ඉදිරියේ මැවී පෙනෙන්නට විය.

සිත එක් අරමුණක් කරා යොමුකරගත් සුදත් ස්ථිරසාර නිගමනයකට එළඹියාක් මෙන් බිමට නැඹුරුකොට ගත් හිස යළි එසවීය.

කිසිම දෙයක් නොකරපු, නොදන්න මම මේ ම්නීමැරුමට වැරදිකරුවි එල්ලුම් ගස් ගියොත් ? එහෙම උනොත් එකම එක දෙයක් තියෙනව උඹට කරන්න? මොකක්ද ඒ? කරපුදෙන් ඔන දෙයක් පොලීසිය. මම කීයටවත් පාවල දෙන්නෙ නැහැ මේ දෙන්න, යන අන්තිම ගමන යනව තනියම, බැරිම තැනට ආවොත් කියනව මම තමයි වෙඩි තිබ්බේ කියල"

සුදත්ගේ මනස තවත් අවදිවෙයි.

කෝ එතකොට සල්ලි?

දුන්න බඳින්න ඉන්න කෙල්ලට. පොලීසියෙන් සොයාවී සල්ලි. කවුද බඳින්න ඉන්න කෙල්ල? ඉනින් තම කියන්න ඉන්න උපාය. එහෙම කෙල්ලෙක්? එතකොට ගහට පොලීසියෙන්. එල්ලුම්ගස් යන්න ඉන්න එකාට පොලීසියෙන් නෙවී මොකා ගැනුවම මොකද? කඩාදාවිද අතපය. දේවී දසවද, ඒත් අවසානෙ එල්ලුම ගහ, මේක ආත්ම පරිත්‍යාගයක්. තව දෙන්නෙක් බේරා ගන්න කරන. එයා දැනගෙන නොහිටියට තමන් ඉන සිතින් පෙම් කල තැනැත්තිය, තමා පැදුරෙන් සුවපහස් දෙන ඇඳට ගෙනඒමට හැමවිටම සහාය දුන් දෙවැනි ලොක්කා මෙම කුණු ගොඩෙන් ඉවත් කිරීම පරම යුතුකමකි.

සුදත් දෙදෙනා දෙස බලා ඉතා අවිහිංසක ලෙස සිනාසුනේය. "නෝනල කෑම දීල යන්න. මම දැන්. මේ දැන් ඔය දෙන්න හිර බාරෙට ගන්න කලින් කරනව පාපොච්චාරණයක්"

අනෝමා සහ වික්ටර් වික්මිත්තව ඔහු දෙස බලා සිටියහ.

"මම කියනව ඇත්ත"යි සුදත් ස්ථිරසාර හඬකින් කිය.

අනෝමා ගල්රූපයක් මෙනි. සුදත් නැඟිම්බරව කතාකරන්නට විය.

"මම බොස් මැරුව. ලක්ෂ දහයක් ගත්ත. බඳින්න හිටිය කෙල්ලට සල්ලි දුන්න. එතනින් ඉවරයිනේ කතාව. ඔය දෙන්න මේකට සම්බන්ධ නෑ"

වික්ටර් සහ අනෝමා පුදුමයෙනුත්, පුදුමව අදහා ගත නොහැකිවාක් මෙන් සුදත් දෙස බලා සිටියහ.

ඔහු ඇත්ත වශයෙන්ම ආත්ම පරිත්‍යාගයකට සූදානම් වෙන බැව් වික්ටර්ට ඉවෙන් මෙන් දැනින.

"මෝඩය වෙන්න එපා, සුදත්! ඔයා හදන්නෙ අපි දෙන්න බේරන්න ඔයා කන්ෆෙසන් එකක් කෙරුවොතින් මම කියනව ඒ බොරු කියල. කන පරිප්පුව කමු තුන්දෙනාම. ඇයි අපි දෙන්න බේරන්න හදන්නෙ?"

සුදත් හිරකුඩුවේ කම්බියට හිස තබා ගත්තේය. ඔහුගේ දෙනෙතට කඳුළු එක්වූයේ ඔහුටම නොදැනුවත්වය.

අනෝමා කුඩුවට ලංව සුදත්ගේ දැන් තරයේ අල්ලා ගත්තාය. දැනට මුව තබා නඩන්නට වූවාය. වික්ටර් නැවතත්

සුදන්ට අවවාද කරන්නට විය.

එපා සුදන්... මෝඩ... විකාර කතා කියන්න. අපි තුන්දෙනාම මේ ගැන දන්නෙ නැහැ. බලමු උගුලෙන් බේරෙන්න එකට එකතුවෙලා.

සුදන ප්‍රශ්නාර්ථයෙන් යුතුව ඔවුන් දෙසබලා "එහෙකොට ඔය දෙන්නා හෙට අනිද්ද හිරබාරෙට ගන්නව කිව්වෙ?" උනන්දුවෙන් විචිසියේය.

"නීතිය කියන්නෙ නීතියට. ඒක හැමෝටම එකයි.

වීරසිංහ මුදලාලි ගේ මිනීමැරුමට තුන් දෙනෙක් සැකපිට හිරබාරවේ."

වීරසිංහගේ එකම මල්ලි ඔහුගේ රෑමත් තරුණ බිරිඳ සහ බිරිඳගෙ ළඟම තරුණ හිතවතා නැතිනම් පෙම්වතා. මේ සියල්ල පුවත්පත්වල විශාල ශීර්ෂ පාඨ සහිතව පලවූ නිරනුමානය.

සුදන් නැවත වරක් පලමු කල ඉල්ලීම නැවත වරක් ආයාචනාත්මකව අයැදිය.

"ඔය දෙන්නා බේරිලා ගෙදර යන්න. මම කියනව ඇත්ත"

අනෝමා ඔහුගේ දෑත් අල්ලාගෙන හඬමින් හිස එසෙව්වාය. "හොඳයි, එහෙනම් ඔයා වීරසිංහ මරල සල්ලි අරගෙන ගිහින් දුන්න. කෙල්ලගෙ නම, ගම, ඇඩ්‍රස් එක කිව්වොත් අපි පිලිගන්නව කතාව"

සුදන් නිහඬව ඇය දෙසම නෙත් රඳවාගෙන අනතුරුව "මම කැමති නැහැ නව අහිංසක කෙල්ලෙක් පාවල දිල අමාරුවේ දාන්න. අනික මම කෙරුවෙ උදව්වක්"

ඔහු බොරු කියන බවත්, තමන් දෙදෙනා අවමානයට ලක්වීම, ලෝකයා හමුවේ අප්‍රසන්න තත්ත්වයකට පත්වීම, නම කෙලෙසීම වැලැක්වීමට ඔහු මෙවැනි අවදානම් තත්ත්වයක පත්ව සිටියදීත් උත්සාහ දරණ බැව් මොනවට පැහැදිලිය. ඇත්ත වශයෙන්ම' මින් සුදන් පිළිබඳ වික්ටර් තුල තිබූ ලෙන්ගතුකම දෙගුණ, තෙගුණ විණ. "මම කියන්නද ඔයාට එකක්. කට වහගෙන පාඩුවේ ඉන්න. මේ පොලිසි, හිරගෙවල්, හිරකුඩු තියෙන්නෙ මිනිස්සුන්ට"

සුදන් ඊට විරුද්ධ විය. "වැරදි කරපු මිනිස්සුන්ට නැතුව අහිංසකයන්ට නොවෙයි"

අනෝමා මනුගේ දෑත් තදින් මිරිකාගත්තාය.

"දැන් ඔයා ඇතුලට වෙලා ඉන්නෙ වැරදි කරලද?"

සුදන් අවිගිංසක ලෙස ඇය දෙස බැල්මක් හෙලීය.

"හෙට ඔය දෙන්නත් ඇතුලට එන්න හදන්නෙ වැරදි කරලද?"

ඇසූ වික්ටර් සිනාසෙන්නට විය "අපි දෙන්නත් කියනව. අපි ප්ලෑන්කරල වීරසිංහ මැරුව සල්ලිගත්ත කියල. එතකොට කොහොමද?"

සුදන් නොදැනුවත්වම අනෝමාගේ දෑත් තරයේ අල්ලාගෙන ඇත.

මෙය පසෙක සිටි සේවක පීටර් ද නොදුටුවා නොවේ. මොවුන් අතර වූ කතාබහ සියල්ල පීටර්ගේ සවන්තුල දේංකාර නංවමින් තිබේ. සුදන් සදහා ගෙනැවිත් තිබූ කෑම වීම සියල්ල පීටර් සෙන විට සෝමේ අයියා නැගිට සියල්ල ගෙන ඩිමෙන්ති පඩිය මත තැන්පත් කළේය.

මෙසේ කතාබහ කරමින් ඉන්නා අතර පොලිස් නිලධාරියෙක් එහි පැමිණ "ඉවරද කතාබහ. දැන් හුගාක් වෙලා ගියා. දෙන දෙයක් දිල යන්න. වෙන කට්ටියට කුදුව ලඟට එන්න දෙන්නෙවත් නැහැ"යි සඳහන් කළේය.

සුදන් වික්ටර් අමතන්නට විය. "වික්ටර් මහත්තය අපි දෙන්නට මොනව වුනත් නෝන කොහෙමද රිමාන්ඩ එකේ ඉන්නෙ?"

වික්ටර් සුදන් දෙස යටැසින් බැල්මක් හෙලීය. "දැන් මෙ ගැන නෙවි නෝන ගැන දුක. ඒවට තියෙනව ක්‍රම සහ විධි. මෙ ඔක්කොම සෙට් කරල තියෙන්නෙ. නෝන ඇතුලට ආ හැටියෙ පැයෙන් හොස්පිට්ල්. දෙන්න ඕන හැම නැනටම ජරාව දිල තියෙන්නෙ. උසාවිදාල රිමාන්ඩ කෙරුවත් හොස්පිට්ල් ට්‍රාන්ස්ෆර් එකක් විතරයි. ඇප දෙනකල් හිරගෙදර හොස්පිට්ල් බරපතල ආබාධිත ලෙඩෙක් විදියට"

සුදන් ඔහු දෙස කෘතඥපූර්වක බැල්මක් හෙලීය.

දැන් නමයි නමුසෙගෙ මූණට ලේ ඉනුවෙ. පෙනුම වෙනස් වුනෙ නෝන සැපෙන්. අපි දුකේ"

සුදන් ප්‍රථමවරට අවංකව දසන් දක්වා සිනාසෙන්නට විය.

පීටර් දෙනෙන් අයාගෙන මේ සියල්ල බලාගෙනය. අසාගෙනය.ඔවුනොවුන් වෙන්වන මොහොත ආසන්න වන

බැවින් අනෝමාගේ දෙනෙත්වල කඳුළු පිරී ඇත. සුදත් වචන සියදහස් ගණනකින් පිටතල නොහැකි අදහස් එකම ශෝක ඔරින බැල්මකින් ද්‍රවනිත කළේ නොයිදුල්. නොකැළැල් ප්‍රේමවන්තයෙකුගේ විලාශයෙනි. පීටර් මේ සියල්ල නිශ්ශබ්දව බලා සිටිනු පෙනිණ.

"මූ කියනව බොසා මැරුව, සල්ලි ගත්ත, බදින්න ඉන්න කෙල්ලට දුන්න කියල. මුන් දෙන්න කියනව ඒ බොරු කියල. හැබැයි නෝනයි මෙයයි යකඩ් කඩෙදි නටපු නැටිලි දන්නෙ අපි. බඩ රස්සාවට ගහල යයි කියල බයට අපි කට වහගෙන ඕන කොට් නැට්ටමක් නටපුදෙන් අපේ මොකෝ කියල ඉන්නව. දැන් තමයි මේවායේ පල විපාක තේරෙන්නෙ.

මට මතකයි දවසක් මම පියුන්නෙ. හිටපු ගමන් නෝත කියාපි සුදන් මට නිකන් ක්ලාන්තෙ වගෙයි කියල. මිනිහ පැනල නැගිටිටෙ. උස්සගත්ත මැඩම්ව අත් දෙකට. අරන් ගියා කාමරේ ඇතුලට. ටික වේලාවකට පස්සෙ ඇහෙනව හීන් කෙදිරියක්. "අනේ සුදන් මගේ සුදන්"... මම දැම්ම නිකමට වගෙ ඔළුව ඇතුලට"

"දෙවියන්ටම ඔප්පු වෙච්චාවෙ. ඇවිටෙ කටු ගලවල. බ්‍රෙසියර් එකත් බුරුල් කරල. මූණට එතුර ටිකක් ඉහල මේ අතගාන්නෙ නෝනගෙ පපුව හරිය. ආදරෙන් අනුකම්පාවෙන්. නෝනත් ඔහෙ ඉන්නව. බොරුවට හරි ඇත්තට හරි කෙදිරි ගගා අයියෝ සුදන් මගේ සුදන් හොඳට අතගාන්න සුදන් ටිකක් පවන් ගහන්න සුදා"

"මේ එයාර් කන්ඩිෂන් දාල තියෙන කාමරේ ඇතුලෙ මොන ශිරිස්මෙද? ඔන්න ඔහොමයි වැඩ. ඊට පස්සෙ බලන කොට මේ කොට්ට දෙකක් හේත්තු කරල හාන්සි කරල ඇදේ වාඩිවෙලා කවන්නෙ බත්. හබුන් කටයි, බත් දෙකටයි, මෙයා එයාට කවනව. එයත් මෙයාට කවනව. සිංහල පිළැර් එකකට ගත්ත නම් කෙල්ලො කොල්ලො පෝළිමේ ඒවී බලන්න. දැන් කෙහොමද වැඩේ. එයත් අඩනව. මෙයත් අඩනව. මල්ලී බයවෙලා. මමත් මේව පොලිසියට කිව්වොත්?

ඒව කැන වැඩ. එකම එක දවසක් හරි ජීවත්වෙලාතියෙනව. මේ මිනිස්සුන්ගෙන්. අනික මට මොකක්ද කරල තියෙන වැරැද්ද?

නැමදාම දවල්ට සුදත් මහත්තයයි නෝනයි කන්නෙ මගේ

පංගුව තියල. කවදාවත් ඉඳුල්බත්, ඉතුරුබත් දීල නැහැ. කනව මම ඒවත්, ඒ මගේ බඩජාරිකමට ගේන්නෙත් තියම ඩයිඩ්. නූඩල්ස්ද, බුරියානිද, ෆ්‍රන්තෙල් බත්ද, පුඩින්, වටලප්පන්, අයිස්ක්‍රීම්. සුප් හම්බවෙනවද ජීවිතේට මේව කන්න මේ පට්ටට. මම පිගන් සැට එක හෝදන්නෙ ෆුල් සුද්දෙ දීල. වැඩි නරිය සීන දවසක් කඩේ එවුන්ට දීල මම අහපු කතා මතකයි.

"අපිට දිපන්කොං ඔය පියුන් වැඩේ. පඩි නැතිව ඔය ඩයිට එකට විතරක් වැඩ කරනව"

"මොකක්ද අඩු.. කෑම විතරද වටලප්පන්, උඩින් පුඩින්, ආනමාලු, කෝල්කුට්ටු, මස්කට්, බිස්කට්, හැමදේම"

"නොපි ඉරිසියාවෙ දොඩවන්නෙ. මීට පස්සෙ බල්ලන්ට දැම්මත් එකෙකුට හරි බත් කටක් දෙන්නෙ නැහැ."

"අපි විහිළු කෙරුවේ පිටර් මාමා"

ඒ ඵදාය. දැන් තත්ත්වය වෙනස් වී ඇත. පීටර් කෑම දීමෙන් පසු කුඩුව වෙත ගොස් සුදන්ගේ අත අල්ලා ගත්තේය.

"මටත් හරිම කණගාටුයි සර්, මොනව කරන්නද?"

සුදත් නම සේවකයා දෙස බැලීය. "ඕන දෙයක් වෙච්චාවෙ පිටර් අයියා. මම කියනව ඇත්ත"

පීටර් ප්‍රදුම්යට පත්විය. බියපත් බවක් පලකරමින් පසුබා සිටියේය. "මට නැහැ තේරෙන්නෙ සර් කියන දේ"

සුදත් මද වේලාවක් ඔහු දෙස බලා සිටින්යේය. "මීට පස්සෙ එපා ඔය කෑම ගේන්න. මම බොස් මැරුව. සල්ලිත් ගත්ත. එච්චරයි. අපි දෙන්නම පිරිමි. අපට මොනව වුනත් කමක් නැහැ. මේ නිකන් රෝස මලක් වගේ....."

"මෙයාට රොස මලෙයි කිව්වොත් රෝස මලට එතකොට මොනවද කියන්නෙ"

මේ අතර් පොලිස් නිලධාරියා නැවතත් එතැනට පැමිණෙයි. දැන් හුගාක් වෙලා ගත්ත වැඩියි.' ඔහු නරමක නිල මට්ටමකින් කීය. වික්ටර් ඔහු දෙසට හැරුනි.

"අර කුඩුව ඇතුලෙ ඉන්න එක්කෙනා අපේ අත්තගෙ අත්දෙක අල්ලගෙන. අත අරින්නෙම නැහැ."

පොලිස් නිලධාරියාටද සිනහ පහල විය. "ගේන්නද බැටන් පොල්ලක්. ඉබේම අත් ඇරෙයි"

සුදත් සිනාසෙන්නට විය. "මේ බොරු රාළහාමි, දැන් යනව

මේ කට්ටිය තව ටිනාඩි පහෙන්"

රාළහාමි සුදත් සහ අනෝමා දෙස බැලීය. "මමත් බැන්දෙ ලඟදි. ගෙදර ගියාම එන්න දෙන්නෙම නැහැ. කමක් නැහැ. තව ටිනාඩි පහළොවක් දෙනව. එච්චරයි. මගේ ඩියුටි එක අකුරටම කරන්න ඕන. දැන් පැයකට වැඩිය වෙලාව දුන්න"

වික්ටර් ඔහු අත සිගරට් පැකට්ටුවක් නැබුවෙන් රාළහාමි එය රැගෙන ඉවත්ව ගියේය. "හැබැයි මම ආපහු එනවා. එතකොට හිටියොත් බලාගෙන."

සෝමේ මේ සියල්ල ඇතුලේ සිට බලාගෙනය.

"දැක්කනේ සර් ජරාවට ඔරලෝසුවත් ආපස්සට කැරකෙනවා" සෝමේ සරදම් ස්වරයෙන් කීවේය.

සුදත් ඔහු දෙස බලා "කෑගහන්න එපා මනුස්සයෝ. ඇහුනොත් ඔක්කොම ඉවරයි. කඩේ වැඩ කොහොමද නෝන?

"සුගතපාල හොඳට කරගෙන යනව. පිටරටින් ගෙන්නන බඩු ගැන තමයි ප්‍රශ්නෙ"

සුදත් කල්පනා කරන්නට විණ.

"කන්ටේනර් හතරක් එන්න තියෙනව. තව සති හතරකින් "

වික්ටර් උනන්දුවෙන් මෙන් "හොඳට මතකද"ය විමැසීය.

"නැතුව මමනේ බැන්ක් ගැරන්ටි, ක්‍රෙඩිට් නෝට් ඔක්කොම සෙට් කරල ඔඩර්ස් දැම්මෙ"

"ඔයාගෙ මැනේජර් නම් ෆුල් තදයෙක් වගෙයි."යි වික්ටර් සිනාසෙමින් කී විට අනෝමාද ඊට නවුල් වූවාය.

"ඔයාගෙ අර ගෘහ නිර්මාණ ශිල්පී නෝනා ලොකු කාර් එකකින් එන්නෙ. මාව ගතන් ගන්නෙ නැති එක්කෙනා. ටිකක් ලස්සනයි. හැබැයි තරමක් වයසයි."

සුදත් කෝපවූ බවක් පලකළේය.

"ගෘහයෙක් ගැන විස්තරයක් කියනවද, නැත්නම් බිස්නස් ගැනද?"

"ඒ ගැනි ආව කඩේට. බිල්ඩින් හතරකට මෙයාට ඔඩර්ස් දීල. හෙව්වෙ බඩු නෙවී, සුදත්. අහපන්කො මගෙන්! ඒත් නැහැ. ගනන් ගත්තෙත් නැහැ මාව. ස්ටෝර් කීපර් එක්ක කතා කෙරුව. ඔඩර්ස් දැම්ම, ගියා.

සුදත් නැවතත් සිනාසෙන්නට විය. "ලංකාවෙ දැනට ඉන්න හොඳම ප්‍රසිද්ධ, දක්ෂ ගෘහනිර්මාණ ශිල්පිනිය තමයි ඒ ඇවිත්

තියෙන්නෙ"

අනෝමා නොරිස්සුම් ස්වරයෙන් "නැද්ද බඩු ගන්න වෙන තැනක් ඒ ඉස්කුරුප්පුවට? වයස උනත් බලන්න එපායැ තිබුන උජාරුව"යි සඳහන් කළාය.

සුදත්, වික්ටර්, පීටර් පමණක් නොව සෝමේද සියලු දුක් කම්කටොලු අමතක කර සිනාසුනහ. අනෝමා ඉන් වඩාත් කෝපයට පත්වූවාය.

"හැමෝටම හිනා, මම කිව්වෙ ඇත්ත. පීටර් හිටියනේ ඒකි එන වෙලාවේ?

"හිටිය නෝන"

"දැන් බොරුද මම කිව්වේ"

පීටර් නිහඬව සිටිනු දුටු අනෝමා "ඇයි කතා නැත්තෙ. කියනව ඇත්ත"

පීටර් බියපත්ව සිටියද ඔහුට යාන්තම් සිනා ගියේය. "මිනිමැරුම් නඩුවකට අහුවෙලා බේරෙන්න බැරුව තඩබාරු වෙනව. ඒ පාර කොහේද යන ගැනියෙකුගෙ ඇහේ එල්බිල"

අනෝමා නොසතුටෙන් ඔහු දෙස බැලුවාය. "ඔය වැඩේ කෙරිගෙන ගියෙ දැන් මාස ගානක ඉදල. මම දවාලට බත් අරන් යනව. සමහර දවස්වලට ඒකිත් එක්ක කාල බීල එනව."

වික්ටර් සුදත් වෙත ලංවිය.

"දැන් මානෑකාව වෙනස් වුණා. අපි යනව යන්න. මම දෙන්නම් මැසේජ් එකක් ඔය ගෘහ නිර්මාණ ශිල්පී නෝනට මෙහාට එන්න කියල."

අනෝමා දෙදෙනා දෙසම තරහෙන් බලා "ඒකින් එපා. ඒකිගෙ ඔඩරුත් එපා. ගත්තුදෙන් බඩු ඕන තැනකින්"

සුදත් යන්තමට සිනාසුනි. "මම මාස ගණනක් කැන්වස් කරල ඉන්ප්ලූවන්ස් දාල අල්ල ගත්ත ලොකුම ඔඩර් එක. අවුරුදු ගණනකට බඩු දෙන්න වැඩ තියෙනව. ලොකු ලොකු බිල්ඩින්"

වික්ටර් කෝපයට පත්වූයේ මේ අවස්ථාවේදිය. "අත අරිනවකො ඔය ගෑනු හුටපටෙ. සුදත් අපි යනව. හෙට උදේට එනව. අපි දෙන්නට හුගාක් දේවල් තියෙනව කතා කරගන්න. කොටපෙ ඇතුලට ගන්න දුන්නෙ නැහැ. බෙඩ් සීට් එක්කොම ඇති. ආ..... ඔන්න සිගරට් - ගිණිපෙට්ටිය"

"මෙයා සුදත්ට හරි සපෝට් වගෙයි. ඕන කරන නැම දේම

ගෙනැල්ල. මම ගෙනාවෙ කෑම බීම විතරයි."

"මෙයාගෙ යාලුවන් එක්ක පොලිසියෙ විශේෂ සිරමැදිරියකට දාන්න. ඩී. අයි. ජීට ඕඩර් එකක් ගත්තෙ කොච්චර අමාරුවෙන්ද කියල දන්නවද. මාත් හෙට එන්නෙ ඒකට."

අනෝමා සිනාසෙන්නට ගුවාය. "මම ලෙඩා. කෙළින්ම ඉස්පිරිතාලෙ"

ටික්ටර් සුදත් දෙස බලා ඇසක් ඉහි කරයි. "ලෙඩෙක් නොවෙයි. සම්පූර්ණ ධාට්ටුවක්. දන්නෙ නැද්ද දැන් ටිකකට කලින් ගාන නිර්මාණ ශිල්පී ගැනියෙක් අල්ලගෙන, හැබැයි සුදත් උඹ එළියට ආවම මෙයා ඇර හැම ගැනියෙකුගෙන්ම ඇත්වෙල හිටපන්. මන් කියන්නෙ උඹේ නොඳට"

ටික්ටර් තම බලතල හා මුදල් වැය කොට පොලිසියේ ටිමාන්ඩ බාරයේ සිටින සුදත්ට විශේෂ සිර මැදිරියක් ලබා දී ඇත. කුඩුව තුළ හමුවූ මිතුරෙක් නමුත් ආදෙක් නොව ඔනෑම නැනකින් ලිස්සා ගිය හැකි ගල් ආදෙකි, සෝමේ අයියා.

ඔහු කෙරෙහි මිනිස්සු ගතිගුණ තිබුණි. ඔහුට කෑම රැගෙන පැමිණි ප්‍රේමා හරිම ප්‍රකට චරිතයක් පානාල ලෝකයේ. දැන් යමක් කතේ අනේ ඇතිව දැහැමින් සෙමින් ජීවිතේ ගෙවනව. තමා අසරණව එහෙත් එක්තරා කොටසකට චන්ඩිකම් කරමින් පානාලයේ කොටසක් මෙහෙය වූ ඇයට රුකුලක් දී පතුරුවා ගත් අණසක පැතිරවීමට රුකුල් දුන්, එපමණක් ද නොවේ, ඇයට ජීවිතයේ යථාර්ථය අවබෝධ කරදී යහමග මෙයයි යන්න අදුන්වා දී පල්ලිය. පන්සල, කෝවිල තමා නොදැන සිටි එහෙත් පා නොතැබූ තැන්වලට මග පෙන්වූ ජේමට ජීවිතයෙන් තමා මග හැරවූ එවකට නම් දරා සිටි චන්ඩයෙක්, කප්පම්කාරයෙක් හිතුනොත් මරදාන පෙදෙසේ නොව මුළු කොළඹම ඔනෑම දෙයක් කිරීමට හැකියාවක් තිබූ කීර්තියක් ඇතිව සිටි කෙනෙකු පරණ කැත පුරුදුවලට ඕපුවීම වැලැක්වීමට නොහැකිවිණි.

ගංජා විකිණීම ඔහු ඒ කාලයේ රැකියාවක් වශයෙන් කල දෙයකි. එයටම අලුතෙන් එක්වූ අංශය මත් කුඩුය.

"මය රස්සාව අත් අරින්න බැරිද සෝමේ අයියට?" ය සුදත් විමසුවේ ඔහුගේ අතීත පුරාවෘතයට සවන්දීමෙන් පසුවය.

සෝමේ කහටගැසුණු දත් පෙන්නා සිනාසෙන්නට විය.

"ඒ හින්ද නමයි මහත්තය අවුරුද්දෙන් වැඩි කාලයක්

ඇතුලෙ ඉන්නෙ. කොච්චර කන්න බොන්න හිතිල හිටියත් මේ හිටපු ගමන් එතව යකා ඔලුවට, පටන් ගත්තව පරණ පුරුදු, පොලිසියට කොටුවෙනව, එතව ඇතුළට."

"පවුල සලකනව කිව්ව නේද නොඳට?"

"මට ඒවා වැඩක් නැහැ මම සම්බිං එක නොයන්න බලන්නෙ"

මේවිට පොලිස් නිලධාරියෙක් එතැනට ලඟාවෙයි. "සෝමේ බලන්න පවුල ඇවිල්ල. අද ඉන්නෙ නොඳ මහත්තයෙකුට කොක්ක ගහගෙන"

ඔහුගේ බිරිඳ ප්‍රේමා නොහොත් පෙට්ටා පාර්සල් කිහිපයක් රැගෙන හිරකුඩුව අසලට පැමිණියාය. ඈ තම සැමියා දෙස නෝක්කඩුවෙන් මෙන් බැලුවාය. "තමුසෙට ගෙදර කාල බීල ඉන්න බැරි විසේ. දැන් ඉන්නව ඇතුලෙ. උසාවි දාන්මෙ ඇප නියල ගන්න කල්"

සෝමේ දින, නැමෙන සුලු පුද්ගලයකු නොවිය. "තමුසෙ මාව බලන්න ආවත්, නාවත් දෙකම එකයි. රත්තරන් මහත්තයෙක් මට මාට්ටු වෙලා ඉන්නේ"

ප්‍රේමා සුදත් දෙස තියුණු බැල්මක් හෙලුවාය.

"මහත්තයත් කුඩුද?" ඇය ඇසූ විලාශයට සෝමේට උස්නඩින් සිනා ගියේය.

"නැහැ. කැලි. එයා ඉන්නෙ මර්ඩර් එකකට. බොරුවට මාට්ටු කරල"

"මම කෑම ගෙනැත් නියෙන්නෙ දෙකුන් දෙනාටම. කියන්න මහත්තය ඔන උදව්වක්. අපි හින හොඳ මිනිස්සු"

සුදත් ඇය දෙස බැලිය. සෝමේ ඇය පිළිබඳව ඔහු තුල ජනිත කළ ප්‍රතිරූපය මෙම ගැහැනිය තුළ නැත. ඇය තනා තබේ විනිතවය. ඔහු දෙස බැලුවේ සානුනම්බිනවය.

"සර්, අපි බජාර් එකේ මරියකඩේ. බොරු කේස් වලට හෙව්වු කරන්න හදනවානම් කියන්න. දෙන්නත් සාක්ෂිකාරයින්ගෙ ඇඩ්‍රස් නැති වෙන්නම්. මය අලුත් කඩේ, මාලිගාකන්ද අම්ට ගම් වගෙයි"

සුදත් ඇය සමඟ සිනාසෙයි. "උදව් කරනවට කොහොම ස්තුතියි. උවමනාවක් උනොත්....."

"උවමනා වුනොත් නෙවි මහත්තය, මර්ඩර් එකකට සාක්ෂි

මුන. අපි දෙන්නත් සාක්කි දෙන්න එන එවුන්ට පාර ආපහු මේ පැත්තෙ පලාත නොඑන්න. ඒ ගොල්ලො තාම අපිව දන්නෙ නෑ"

සුදත් මදක් කල්පනාවේය.

ප්‍රේමා හැට්ටය අස්සට අත දමා යමක් ගෙන සෝමේ අතට දුන්නාය. "ඔතන පැකට් පහක් ඇති. කකුළුවෝ කරි එකේ දහයක් ඇති. හෙට මම එන්නේ නැහැ. ෂේප වෙලා ඉන්නව"

සුදත් මේ කතාව අසා සිටියේ පුදුමයෙනි. ඔහු තනිවම කල්පනාවට වැටුනි. මොනවද මේ පැකට්?

"ගෙනාවද? සිගරට්?"

"විස්සෙ පැකට් එකක් ඇති"

පොලිස් නිලධාරියා ඔවුන් අසලට පැමිණ "දැන් යනව, වෙලාව හරි"ය දැන්වීය.

ප්‍රේමා නිහඬව ඉවත්ව යන විට පොලිස් නිලධාරියා ඇය අනුගමනය කරද්දී සුදත් සැක සහිතව සෝමේ දෙස බැල්මක් හෙලීය.

"මොනවද අර ගෙනාපු පැකට්?"ය ඔහු ප්‍රශ්නයක් නැඟුවේය.

සෝමේ බයාදු සිනාවක් මුව'ගට නගා ගනී. "සර්! කොහෙද මන්ද ජීවත්වෙන්නෙ? මේ තියෙන්නෙ අවුසදේ, කුඩු, මේක තියෙනවනන් වෙන මොනව නැතිවුනත් කමක් නෑ සර්"

සුදත් බියපත් වෙයි. මිනීමැරුම් චෝදනාවකට ඇතුලේ. වික්ටර්ට පින්සිද්ධ වෙන්න විශේෂ මැදිරියක. මිතුරෙක් කියා උගහටය. නිලධාරීන්ගේ විරෝධතා මැද්දේ ඔහුගේ තනි කැමැත්ත පිට මොහු මෙම කුටිය තුළට ගෙන්වා ගත්තේ.

"ඔකා ලෝකයා, ගෑනි ඉන්ටර්නැෂනල් හාණ්ඩයක්, අපිට කමක් නැහැ තමන්ගෙ කැමැත්ත. ස්පෙෂල් එක දෙන්නෙ ඩී. අයි. ජී. ගෙ ඕඩර්ස් නිසා"

ඒ පොලිස් පරීක්ෂක තැන සෝමේ සාමාන්‍ය සිරකුඩුවෙන් ඉවත් කරද්දී කල ප්‍රකාශයකි.

"දැන් බලනවකො ඕ. අයි. සී. හරි. මූ ලෝක අන්ඩපාලයෙක්. ඒත් කමක් නැහැ. මන් ඉදිරියට ජීවත්වෙන්න තියෙන්නෙ මුංගෙ සනුහරේ එක්ක. ඔහෙ හිටපුදෙන් කුඩු

බැරිනත් ඔන දෙයක් ගහපුදෙන්" සුදත් මහු සමඟ සිනාසෙන්නට විය.

"හැදෙනව සර් සික් එක, බඩු නැතිවුනොත්, ඒ වෙලාවට යකාගෙ කටේ තියෙන දේ හරි අරගෙන තමයි පස්ස බලන්නෙ"

"හොඳයි සල්ලි නැතුවම ගියොත්?"

"අතේ නැතිවුනාට රටේ සල්ලි තියෙනව. මොන උප්පරවැට්ටියක් දාල හරි සම්තිං එක කොහොම හරි හොයනව"

සුදත් ඇත්තටම ඔහු දෙස අනුකම්පා සහගතව බැලුවේය. නීතිය, යකාගේ නීතිය?

"මේ පොලිසිය කුඩුව ඇතුළට තමන්ගෙ දෑස් ඉදිරිපිට කුඩු ගෙනාව. ඒත් රාජකාරිය කෙරුනද? දැන් සෝමේ මුල්ලකට වී කුඩු බොනව පොලිසිය ඇතුලෙ, හිරකුඩුවෙ. තමන් කිසිම දෙයක් නොදන්න මිනීමැරුමකට පවලවල දැන් හිරකුඩුවෙ. නීතිය නියම විදියට ක්‍රියාත්මක වෙන රටක් ශ්‍රී ලංකාව. අපරාදෙ කියන්න බැහැ."

සුදත් මේ අයුරින් කල්පනා කරමින් කාලය ගෙවන විට සෝමේ ඔහු අසලට පැමිණියේය. "සර්! මම කේස් එක ගැන හොඳට කල්පනා කලා. සර්, අවුට්"

සුදත් තරමක් උස්හඬින් සිනාසෙන්නට විය'ඇයි මොකද වැදුනද කුඩු පාර හොඳට?"

සෝමේ උරමින් සිටි සිගරට්ටුවෙන් දුම් උගුරු කිපයක් පිටකරයි. "මේ සර්, කෝ සර්ට විරුද්ධ සාක්කි. මය කොපී. පේමිස් නිකන් බොරු කාරයො. කවිද දැක්කෙ සර් බොසාට වෙඩි තියනව"

"කවුද වෙඩි තිබ්බෙ?"

"මම කියන්නෙත් ඒක. ඔය මනස්ගාත අතඇරල අල්ලමු සුපර් මහත්තයෙක්. නෝ කේස් එනකොට"

"මහත්තයෙක් කිව්වෙ?"

"හොඳ ඇඩිවකේට් මහත්තයෙක්. අපේ පවුලට කිව්වම වැඩේ ෆිනිෂ්. ඒකිට බයයි අලුත්කඩේ හැමෝම"

සුදත් නැවත ඔහු දෙස බලාසිට ඇත්ත වශයෙන්ම මෙම මිනිසා තුළ හොඳ මිනිස් ගුණ තිබෙන බවද තේරුම් ගත්තේය. එසේ නොමැති නම් මෙවැනි යෝජනාවක් කිරීමට ඔහුට කිසිම අවශ්‍යතාවයක් නැත. නරක මිනිසුන් අතරත් හොඳ

මිනිසුන් සිටින බවට මෙය කදිම නිදසුනකි. සෝමේ කතාකළේ අවංකවම හඳවනට එකඟවය.

"බලමු සෝමේ අයිය මොනව හරි කරන්න ටිකක්, පහුවෙල බලමු අපි පොලිසිය කරන දේ?"

සෝමේ නිහඬසෙන්නට විය. "මොනවද ඉතින්? මහත්තය කොහෙම හරි මාට්ටු කරන්න ට්‍රයි එක දේවි. එච්චරයි" කී සෝමේ සුදන්ට ලංවිය. "අනිද්දට අපේ පවුල ආවම කියමු කේස් එක. ඒකි දෙයි හොඳ මහන්තයෙක් අල්ලල. නියම ඔපීනියන් එක. සල්ලි ඕනම නැහැ."

සුදන් සෝමේ දෙස කෘතවේදී බැල්මක් හෙලීය. "අපි ටිකක් ඉවසල බලමු. මටත් සොයා ගන්න ඕන මේකෙ අගමුල, හරියට දැනගන්න දවසට හැමෝටම තේරෙයි කවුද සුදන් කියල"

* * * *

මේවා මේසේ සිදුවන අතර පිටකෝට්ටේ අනෝමාගේ නිවසේ සේවකයන් අතරවූ කලබැගෑනිය තවම අවසන් වී නැත. වික්ටර් නැවතත් ජේම්ස් කැඳවා "සොපී යනවද හෙට උදේට?" තරහෙන් විමැසුවේය.

"ඔව් සර්! බඩු මුට්ටු ලෑස්ති කරන්නෙ. උදෙන්ම යනවයි කිව්වේ"

"උස්සගෙන යාවිද දන්නෙ නැහැ ගෙදර බඩුත්. ගිහින් බලනව, මොනවද ගෙනියන්නෙ කියල. කැඩිච්ච වළන් කබලක් හරි ගෙනියන්න දෙන්න එපා. ඒ තරමට එපා කරපු හැතිරියක්"

"මමත් කිව්ව සැර් ගෙදර මොන වැරදි අඩුපාඩු තිබුනත් එකපාරටම පිටට වැඩිමනක් පොලිසියට කියන්න එටින්නෙ නැහැ කොහෙත්ම"

වික්ටර් හිස සලන්නට විය. "අපි සල්ලි වියදන් කරල කොහොම හරි නඩුව කඩාගෙන ඔකිගෙ හිඟන පරම්පරාවම ඉතුරු කරන්නෙ නැහැ. අවුරුදු කීයක් අපෙන් බඩකට පුරවගෙනද ඔහොම කෙරුවෙ? ජේම්ස් කිව්වෙ ඇත්ත. මොන යකා හරි නෝන වගෙ, ඒ කට හඬෙන් කතා කෙරුවෙ"

"එහෙනත් නෝන නෙවෙයිද ටෙලිෆෝන් කරල තියෙන්නෙ?"

මෙසේ ඇසූ ජේම්ස් කල්පනාවට වැටුනි.

"ඒක නමයි ඇහුවෙ ඒ කතා කෙරුවෙ නෝනමද කියල. කටහඬ එක වෙන්න පුළුවන්"

ජේම්ස් බියෙන් මෙන් "මේක මට මහ අප්පරඛංසයක්"යි කිය. "නෝනගෙ කටහඬ මට බැරිද සර් අඳුනගන්න. අවුරුදු පහයක් තිස්සෙ එක ගෙදර ඉන්න කොට"

වික්ටර් කතාව එතැනින් නවතා දැම්මේය. "දැන් ගිහිල්ල සොපීගෙ බඩු මලු ඔක්කොම චෙක් කරනව හරිද?"

"බංගලාවේ කිසිම දෙයක් එයාට ගෙනියන්න දෙන්නෙ නැහැ සැර්, මම ජේම්ස්, එයා සොපී" ඔහු හිනැහෙමින් ඉවත්ව යාමට සැරසෙත්ම වික්ටර් ඔහු මඳකට නවතා ලීය.

"හෙට ඉඳල කොහොමද ගෙදර වැඩ? කුස්සිය පැත්තෙ වැඩ කෙරෙන්නෙ? නෝනත් නැතිවෙයි හවස වෙනකොට. අනික මෙහෙට ඒවි යකඩ කඩේ වැඩකරන දෙතුන් දෙනෙක් අපි ආපහු එනකල් නවතින්න"

ජේම්ස් කල්පනාවේ යෙදෙනු පෙනින. "ඒ ගොල්ලන්ටත් දෙන්න ඔනද සර් කෑම බීම?"

"නැතුව, රෑටයි, උදේටයි දෙකටම. අපි තුන්දෙනාටත් කෑම ඔන. බැරිද සොයා ගන්න හොඳ කෝකියෙක් ටික දවසකට?"

ජේම්ස් නිහඬව මඳ වේලාවක් කල්පනාවේ යෙදී සිටියේය. "නුගේගොඩ ඉන්නව කෝකියෙක්, ටැම්පරියට නමයි හත්න වෙන්නෙ. මිනිහට එක නැනක දිගටම වැඩ කරගෙන ඉන්න බැරි ලෙඩක් තියෙනව"

එයට සිනහ පහල කල වික්ටර් "ඉන්න නෝන, උඩට ගියා. ආවහම අහල බලමු. ජේම්ස්ට පුලුවන් නේද බංගලාව බලා කියාගෙන ඉන්න පොලිසියෙනුත් රෑට මුර කරනව"

"දැන් අවුරුදු කීයක් මම් තනියම මුර වැඩෙයි, එත්ත විටියෙ වැඩයි කෙරුවද?"

අනෝමා උඩුමහලේ සිට විසින්න කාමරයට පැමිණියාය. වික්ටර් කෝකියා පිළිබඳ විස්තරය ඇයට දැන්වීමෙන් පසු එයට එකඟත්වය පලකළාය.

"හැබැයි ජේම්ස් අයිය ! කල්පනාවෙන් ඉන්න ඕන. ගොඩ් එකේ කාමරයක් දෙන්න රෑට නිදාගන්න. සමහර ටැම්පරිකාරයො ගේ දොරත් අතපතගාගෙන පැදුරටත් නොකිය පාතින්නෙ"

එයට සැවොම සිනාසුනහ.

"මම කාලයක් තිස්සෙ අඳුරන කෙනෙක්. හොර බොරු නැහැ"

"කොයි එකටත් ආරක්ෂාව තියාගන්න එක හොඳයි. පඩිය එදා එදාට"

"යන දවසට දුන්නම ඇති"

"ගිහින් කතා කරල එක්කරගෙනම එන්න. මල්ලි මෙයාට බස් එකට සල්ලි දෙන්න" ය අනෝමා කී විට වික්ටර් ජේමිස්ට බස් ගාස්තුව සඳහා මුදල් දුන්නේය. ජේමිස් මුදලුත් රැගෙන එතැනින් ඉවත්ව ගියේය.

අනෝමාගේ මුහුණේ දුක්බර පෙනුමක් විද්‍යමාන විය. "සුදත් අහිංසකය. පව්! අපරාදෙ අමාරුවෙ වැටිල දුක් විඳිනව මම හින්ද"

"ඒ මදිවට අපි දෙන්න බෙරන්න වරද පිළිගන්නත් හදනව" එසේ කිවේ වික්ටර්ය.

අනෝමාගේ දෙනෙතට කඳුළු ගලන්නට විය. "මම දැනගෙන හිටියෙ නැහැ සුදත් ඔය තරම්ම ආදරේ බවක්. තරුණ වයස, ලස්සන කොල්ල, කෙල්ලො වැලක් එල්ලගෙන ඇති කියල ඔන කෙනෙක් හිතනව."

වික්ටර් සැහැල්ලු ලෙස සිනාසෙන්නට විය. "මම එදා කිව්වම අක්ක පිළිගත්තෙ වෙන විදියකට, සුදත් හිටියෙ ඔනවැට්ල."

"කාටද?"

"කාටද අහන්නෙ, මටද?"

දෙදෙනාම සිනාසෙන්නට වූහ.

"මේ කිසිදෙයක් වෙන්නෙත් නැහැ. විරසිංහ ජීවතුන් අතර අදත්, මම සුදත් ගැන හරියට දැනගෙන සුදත්ගෙ අදහස් තේරුම් ගත්තනන්"

"ඒව අතීත සිද්ධි. වෙච්ච දේට මූණ දීල එගොඩ මෙගොඩ ඒ ගන්න එකයි නුවණට හුරු" වික්ටර් කිවේ අනාගතයට එඩිතරව මුහුණ දීමේ අධිෂ්ඨානයකින් යුතුවය.

තාවකාලික කෝකියෙකු කැඳවාගෙන ඒම සඳහා පිටත්ව ගිය ජේමිස් ඔහු කැටුව එන විට පැයක් පමණ ගතවිය. අනෝමා ඔහු තරයේ නිරීක්ෂණය කළාය. අනතුරුව තමන්ට අවශ්‍ය කෑම පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කළේය. ජේමිස් මොහු ගැන

කොතෙක් වර්ණනා කළාද. මොහුගේ දක්ෂකම් ගැන ජේම්ස් කොතෙක් වර්ණනා කළද පළමු දර්ශනයෙන්ම හදු පිළිබඳ හැඟීම් ප්‍රසන්න නොවීය.

"රෑට නෙව්, හැන්දෑවට කන්න. දැන්ම වැඩේ පටන් ගත්තව. පැයෙන් මම ආපහු එනව. රෙඩි කරල තියෙන්න ඔන මගේ ඔඩර් එකේ හැටියට."

කෝකියා ඇය දෙස නෙලූ බැල්ම වික්ටර්ගේ සිත් නොගත්තේය.

"තමා මොකද කියන්නෙ? පුළුවන්ද වැඩේ කරන්න?"

"මෙහාට එයිද සර් වැඩ බැරුව? සර්ල එනකොට කෑම රෙඩි"

වික්ටර් සහ අනෝමා විසින්න කාමරය හරහා මෝටර් රිය වෙත ගමන් කළහ.

"අක්ක මම යනව දැන් නාවලපිටි බෙන්ස් එකෙන්. නිමල් මග බලාගෙන ඇති. හෙට උදේම මම ආපහු එනව. මට නිතන් පොඩි සැකයක් තියෙනව මේ ජේම්සුයි කෝකියයි දෙන්න ගැන. රෑට උයන කෑම බෙදුවට පස්සෙ ඒ දෙන්නටම කන්න දෙන්න. එට පස්සෙ ගෙනියන්න"

අනෝමා පුදුමයට පත්ව ඔහු දෙසබලා සිටියාය.

"ඇයි මල්ලි එහෙම කිව්වෙ" ඇ ප්‍රශ්න කළාය.

"මම කියන දේ කරන්නකෝ, මට මේ දෙන්නම් අල්ලන්නෙ නෑ. ටෙම්පරි ජොබ් එකට ආපු මිනිහ එකපාරටම ජීවිතේ තියෙන කල් ඉන්නවලු. ජේමිස් මිනිහව තියන්නෙ මුරුංඟ අත්තේ"

"විශ්වාස කරන්න එපා ලඟින් යන මැස්සෙක් නරි මේ දවස් ටිකේ. මොන ගිනිගෙඩිද දන්නෙ නැහැ. මම වෙම්පරි කුක් කෙනෙක් ඉල්ලල ඒජන්සි කිපයකටම දැන්නුව"

අනෝමා කිසිවක් තේරුම් ගත නොහැකිවාක් මෙන් ඔහු දෙස බැල්මක් හෙලුවාය. "ඇයි මේ දෙන්න හොඳ නැද්ද?"

වික්ටර් සිනාසෙන්නට විය. "කල්පනාවෙන් වැඩ කරන එක ඇඟට ගුණයි"කී ඔහු තම මියගිය සොහොයුරාගේ බෙන්ස් රථය කරා පියනගන්නට වූ අතර ජේම්ස් ගේට්ටුව විවෘත කිරීම සඳහා ඉදිරියට යනු පෙනින.

කෝකියාද එළියට පැමිණ වළඳක් පිටත පයිප්පයකින් සෝදමින් සිටිනු පෙනින. කුස්සිය ඇතුලේ සියලුම තවීන

උපකරණ ටොඹින් බෙඹින් ද පසිඳ්පද. මේ ආදී සෑම දෙයක්ම නිබියදී කෝකියා එළියට පැමිණ සෝස්පෑන් එක සේදීම වික්ටර්ගේ සැකයට තුඩුදුන් කටත් හේතුවත් විය.

වික්ටර් මෙය නොදුටුවා සේ රිය පණ ගන්වා ගෙන ගේට්ටුවෙන් පිටවූ අතර අනෝමා ද ඇගේ රිය වික්ටර්ගේ රථය පසුපසින් ධාවනය කළාය. අතර මැදි රට දෙක නතර කල ඔවුන් සිසිල් බීම හලක් කරා ගමන් කළහ.

සිසිල් බීම බෝතල් දෙකක් ගෙන අසුන් ගත් දෙදෙනා පහත් හඬින් කතා කරන්නට වූහ.

"අක්ක මට පේන විදියට මේ ජේම්ස් හරි කපටියෙක්. ඒක වෙන දෙයක්. අපි ඉඳිමු නොද සිහි කල්පනාවෙන්. අයියගෙ වෙන මිනීමැරුම් ගැන අපිට චෑඩිය යමක් දන්නව ජේම්ස්. මිනිහ ගෙනියන්නෙ අමූලික බොරුව. උන් උයන පිහන කෑම මොකුත්ම කන්න හෙම එපා."

"අපරාදෙ චියදමක් කෙරුවෙ"

ඔහු සිනාසෙන්නට විය. "ගෑනුන්ට වෙලා තියෙන්නෙ සල්ලි ටිකක් යන කොට නාහෙන් අඬන එක. අපි මේ වෙලාවෙ කොයිම ටකෙක් හරි විශ්වාස කරන්න ගියොත් අමාරුවෙ"

අනෝමා පුදුමයට පත්ව ඔහු දෙස බලා සිටියාය.

"මට පේන්නෙ කෝකිය හරිම හොඳ කෙනෙක් වගෙ"

"බැලූ බැල්මට එහෙම වෙන්න ඇති. කාගෙ කවුද, කොහෙද කළින් හිටියෙ. අඩු පඩියට තද වැඩකාරය ජොබ් එක බාරගත්ත. ජේම්ස් ෆුල් රෙකමන්ඩ්"

අනෝමා ඔහු දෙස දුක් මුසු බැල්මක් හෙලුවාය.

"ඇයි එවලෙ මේව නොකිය කට වහගෙන හිටියෙ? මේ විස්තරය කියන්න තිබුනෙ මුලදිම"

"මේ දැන් වැඩ කරන්නෙ රහස් පරීක්ෂකයෙක් වගෙ. වෙන දේ වෙන්න ඇරල බලාගෙන ඉන්නව. අන්තිමට ගහන්න ඕන තැනට නියම ඇණේ ගහනව."

අනෝමා බිය පත් වූ සේය.

"මල්ලි ඉන්න අද ගෙදර. මේ යනව තනියම සුදත් බලන්න"

"බයවෙන්න එපා කිසිම දේකට. ඉන්නව පොලිසියෙ රාළහාමිල දෙන්නෙක් පැය විසිහතරෙම ගේට්ටුව ලඟ"

අනෝමාගේ පෙනුම දැන් සම්පූර්ණයෙන්ම වෙනස්ය. ඇය නම මෙස්සිනාගේ සතය පතන බැල්මක් හෙළුවාය.

"දැන් ගිය ගමන් සුදත් මයා නොයාව්"

වික්ටර් නැවතත් සිනාසෙයි. "මම නොගියව් එයාට හෙට මන් ඵනකල් අනිත් නැමදේම තියෙනව. කිසිම කෙනෙක් වෙක් කරන්නෙ නැහැ. ස්පෙලේ සෙල් එකේ ඉන්නෙ. ඩී. අයි. ජී. ඔෆිසර්ස්"

"දැන් මග බලාගෙන ඇති අපි දෙන්න එනකල්"

වික්ටර් මුදල් ගෙවීමට යන අතර සිනාසෙයි. "බොරු එපා අක්කා. ඔයා එනකල් බලාගෙනයි ඇත්තෙ ඇස් රිදෙනකල්. මේ අහන්න ඔය උයන කෑම කන්න එපා. සුදත්ට ගෙනියන්නත් එපා."

"එතකොට?"

"ගෙනියන්න පිටින් කෑම පැකට් දෙකක්. දාන්න මෙරුවක. මට ලොකු සැකයක් තියෙනව"

අනෝමා දසන් දක්වා සිනාසුනාය. "බොරුවට මිනිහට සැක කරනව. මම ඒ කෑම කනව. සුදත්ටත් ගෙනියනව."

වික්ටර් මෙක් කල්පනාවේ යෙදී සිටියේය. "මේ හෝඩ ඇති. මම කියන දේ කරන්නෙ නැහැ. නිමිටිව කෝල් එකක් දිල්ල හෙට අද එන්නෙ නැහැ කියල. රිට පස්සෙ බලමු"

වික්ටර් මුදල් ගෙවා පැමිණි විට අනෝමාගේ දෙතොල් අඩ සිනාවකින් සැරසී තිබින.

"එහෙම කියන්න තනිකරල යන්න හදන්නෙ නෑ. මේ නිමිති නංගි එක්ක පැයක් විතර කතා කෙරුව ටෙලිෆෝන් එකෙන්. එයා ලබන සතියෙ කොළඹ එනව කිව්ව දික්කසාද නඩුව ඉවරවෙනකල් අපේ ගෙදර නවතිනවයි කිව්ව"

වික්ටර් පුදුමයට පත්විය. "ගෑනු දෙන්න ඇකල නැතුවට ටෙලිෆෝන් එකෙන් අඳුරගෙන, දෙන්නන් එයාට හම්"

අනෝමා සරදම් සිනාවක් පෑවාය. "දිවු ඒවා දිගට ගන්න බැරුව නමයි ඒ නංගිත් දුක් විඳින්නෙ. ක්ලිනික් යන්නත් ඕනෙයි කිව්වෙ මෙහෙ ආපු ගමන්"

වික්ටර් මද සිනාවක් පෑවේය. "නමන් දැන් යනවද සුදත් බලන්න මම යන්නද?"

ඔවුන් එකිනෙකා දෙස බලමින් සිට මෝටර් රථ කරා ගමන් කළහ.

6

සොපී නිවෙසින් පිටවී ගියේ ඉතාමත්ම සාධාරණ කෝපයකින්, තලකිරීමකින් හා පසුතැවිල්ලකින් බව අනෝමාට කෙසේ වෙතත් වික්ටර්ට අවබෝධ විය. ඔහු ඒ වගක් තම නෑනන්ඩියට නොපෙන්වීය.

තමන්ගේ ගෙදරින් පිටව මුළු ජීවිතයම කැපකරල දඟඩිය මුඟුරු නෙලූ ගෙදරින් ආත්ම පරාජයකින් පිටව යනු බලා සිටි වික්ටර් ඇය දුටුවේ අනෝමා ඇය දෙස බලන දෘෂ්ටි කෝණයෙන් නොවේ.

මේ ගැනි අපි පොඩි කාලෙ ඉඳල මේ ගෙදර හිටියෙ අපි හැදුවෙ, උස්සගෙන එහාට මෙහාට දුවල කැව්වෙ, පෙව්වෙ අන්තිමේදි අපෙන්ම ගුටි කෑවෙ මේ ගැනි.

අම්ම නාත්ත දෙන්නම නැති වුන. මේ ගැනි අපි දාල ගියේම නැහැ. හිටිය අපිත් එක්කම. කල්‍යාණි අක්ක ආව ගෙදරට අයිය කසාද බැඳල හිටිය හොඳට එයත් එක්කත්. දික්කසාද කෙරුව. හිටිය ටික කාලයක් කසාද නොබැඳ. මෙයා තමයි හැමදේම බලා සොයා ගෙන හිටියෙ. ඊළඟට ගෙදරට ආවෙ අනෝමා. තාම අද

වෙනකල්ම නැහැ. ඊයේ වෙනකල්ම එයත් එක්කත් නොදින් හිටිය.

සොපිට අනෝමා දැනුට පේන්න බැහැ. හේතුවක් නියෙන්න ඕන හැම දේකටම. අපේ අයිය මොනව කෙරුවත් වැඩේ අන්තිම නොසන්ඩාල. ඒත් සොපී නිතරම ගන්නෙ පොලිසියෙන් ආවම අම්ම කියන්නෙ 'අනේ මගේ පුතා හරි අහිංසකයි. කරන්නෙ නැහැ ඔය වගේ නරක වැඩ' සොපිගෙ ආකල්පයත් ඒක. මොන දඟකාරා වැඩ කරල ගෙදර ආවත් සොපී නිතරම ගන්නෙ අපේ පැත්ත. ඒත් ඊතල් වෙනස් වුනෙ මෙතෙන්දි. ඒකවත් ඇති හේතු සාධක. අපි බැලුවෙ අපේ පැත්ත විතරයි. මුළු ජීවිත කාලයම බැල මේනෙවර කරමින් සිට කුඩා බෑග් දෙක පමණක් ගෙන කල්පනාවේ යෙදී ප්‍රියනගන සොපී නවතා තිබූ බස් රියක් අසල මොහොතක් නැවතුනාය.

වික්ටර්ගේ මෝටර් රථය ඇය ඉදිරිපස පාර අයිනේ නැවතිනි. වික්ටර් රියෙන් බැස ගත්තේය.

"සොපී අම්ම සොයාගෙන ආවෙ, නගින්න කාර් එකට"

ඇය පුදුම වී ඔහු දෙස බැලුවාය. ඇගේ දෙනෙත් ඉබේම කඳුළින් බරවිණ.

"මේ මගේ පුංචි මහත්තය. මම ගෙදර යනව මහත්තයෝ"

"නගින්න කාර් එකට. බස් තියෙනව ඕන තරන්. නැත්නන් මම කාර් එකෙන් ගෙදර එක්ක යනව"

සොපීගේ මුහුණට, පෙනුමට, දැසට අමුතු ප්‍රසන්න බවක් එක්විත. පුතෙකු දෙස අසරණ මවක් බලන ආකාරයකි එය. හදිස්සියේ තම පිහිටට පැමිණි පුතෙකු දෙස අහිංසක මවක හෙලන බැල්මකි එය.

සොපී බෑග් දෙකත් සමග මෝටර් රියට නැංගාය. සැතපුමක් පමණ දුර ගිය පසු රිය නැවතූ වික්ටර් ඉන් බැස පිටුපස දොර විවෘත කළේය.

"යමු මොනව හරි කන්න, බොන්න හුගාක් දුර යන්නත් තියෙනව"

සොපී ඊට අදිමදි කළාය. "එපා මොකුත් පුංචි මහත්තය"

"ඔහේන්න කියන එක අහල. මිනිස්සු බලාගෙන ඉන්නව"

සොපි රියෙන් බිමට බැස්සාය. එවුහු අසලවූ උපස්ථ පෙලේ අවන්හලක් කරා ගමන් ගත්හ.

වික්ටර් සහ සොපි වාඩිවී සිටියේ අවන්හලේ ඈත කෙළවරේ මේසයකය. වේටර් පැමිණ ඇණවුම් රැගෙන ඉවත්ව ගිය පසු වික්ටර් දොඩමළු විය.

"දැන් සොපි අම්ම යනව අපි තනිකරල"

සොපිගේ දෙතොලට උපහාසාත්මක සිනාවක් නැගින."මම කොස්සෙන් ගහල එළියට දානකල් ඉන්නෙ නැහැ මහත්තයා. අවුරුදු හිස් ගණනාවක්ම මය කොස්ස තිබුනෙ මගේ අතේ"

වික්ටර් ඇය දෙස අනුකම්පා සහගත බැල්මක් හෙලීය.

"ඇයි අනෝමා අක්ක එක්ක තරහ මය හැටි. එයා කාටවත් වරදක් කරන්නෙ නැහැ. එයාගෙ පාඩුවේ ඉන්නෙ."

"මහත්තය එහා කතා කරන්න එයා ගැන. එයා හරි මෝඩයි. හැම තිස්සෙම සුදන්. සුදන්. සුදන් මොකන්ද හැබෑවම මය හිස්සුව?"

වික්ටර් ඇය දෙස බලා ඇඟේ යටි සිත ගැන මෙනෙහි කරන අතරම, ඇගේ වචන විග්‍රහයක යෙදුනේය.

"හොඳයි එහෙම දුනයි කියමු. මොකක්ද සොපි අම්මට ඒකෙන් වෙච්ච පාඩුව. ඒක ඒ දෙන්නගෙ ලෝකෙ"

සොපි විලිකුලෙන් යුතු දෙස බැලුවාය. "ලොකු හෙන්නය මැරෙනකල් තව සතේකට ගණන් ගන්නෙ නැහැ. මය හැති ජීවත්වෙන්නෙ යකඩ කඩෙන්. ඒත් අම්මගෙ අප්පච්චිගෙ ළඳලේ වෙන්නැති"

වික්ටර් ඇය දෙස සානුකම්පිත බැල්මක හෙලීය.

"අනෝමා අම්ම හිතන විදියට නරීම හොඳ හැතු ළමයෙක්. එයාගෙ නැහැ වරදක් කාටවත්. ඒ වගේම ඒ කෙල්ලගෙ මුළු ජීවිතේම අපේ අයිය විනාශ කෙරුව සල්ලි තිබුන හින්ද. සොපි අම්ම දන්නෙ නැහැ ඒ වගේ රූප රැජිණියක් වගේ කෙල්ලෙකුට අපේ අයිය වගේ ලොට හැහිච්ච හද්ද නාකියෙක් එක්ක දිග කන්න"

සොපි ඊට හරස් කැපුවාය. "ඒත් සල්ලි දැකල ලොකු මහත්තයට දැලේ දාගත්ත. දැන් කොහෙමද?"

වේටර් සුප් බඳුන් දෙකක් ගෙනවිත් මේසය මත තබා ඉවත්ව ගියේය.

"බොන්න සුප් ටිකක්"

සොපිට බඳෙලාවේ කෑම බීම හොඳට සුරුදු ය. ඇය සුප් ටිකක් බොන අතර වික්ටර් දෙස බැලුවාය.

"හැබැයි මහත්තයො අනෝම නෝනයි. සුදුයි හරිම මෝඩයි. එයාට මෙයා ඕන. මෙයාට එයා ඕන. හැබැයි තිහවට නවී අගවන්නෙ නැහැ නෝන සුදත් ලග කියාගෙන කවනව. ඇඟේ පතේ දවටගෙන ඉන්නව. එච්චරයි."

"ඔය කත. වැඩක් නැහැ. ඒ දෙන්න ඕන දෙයක් කරගත්නාවෙ. මම ඇහුවෙ අයියගෙ ඉරනෙ ගැන"

සොපි සුප් බඳුන පී අවසන් කළාය. "හොඳට තියෙනව සුප් එක"

"තව ඕනද"

"බන් කනකොට ටිකක් තිබුනොත් හොඳයි. මේ හෙන්නයලට බාල්දි ගහන් හදල හොයාවත් කියන්නෙ රාත්තලේ බොන්නෙ"

අවසානය සිහිපත්වූ වික්ටර්ට සිනහ පහළ විය.

"සුප්. සැලඩ්. පුඩින්. වටලප්පන්. තිවිටැණි. මොනව නොපිනගේ තිබුනත් අයියටයි වටේ වදි. ඒ නැති අඩුපාඩු හාලාන් කරල අඩි නොකර දුන්නෙ මේ සෙම අම්ම නෙව.

කටලට්ස්. පැටිස්. වඩේ. හඳුන දවසට නැහැ ඉරියන් බැල්ල පැත්තක තියෙනව ඒව. ටිකක් අහක බලන හොරෙ දෙන්න උස්සල. ඔන් එනව සොපි අම්ම නෙල් නැන්දත් අපේ තියාගෙන දෙන්න හොයාගෙන. නොනොමේ නවී නැයිලා බලාගෙන ඉන්නව ඊලඟටීක ලිපෙන් ඔතකල්.

"ඒත් ඒ ටිකමයි. බඩු තිබෙ බැව. කාපු කෙනෙකුත් නැහැ. ගත්තු කෙනෙකුත් නැහැ.

අනෝමා, සුදත්ගෙ ප්‍රශ්නෙ වෙන එකක්. මේ මොහොත හොඳටම සලකල අතට සෑහෙන ගණනකුත් දීල හෙව ඇරලනව. ඉඳල හිටල යනව ගමට බලන්නක්. හිඟන් කෑලත් එනව. ඒ එල්ලුම ගහෙන් බේරුනොත්.

"බේබි මහත්තයා මම යනවා ඒත් දේශීස් නැති ටිකක් කල්පනාවෙන් හිටියොත් හොඳයි නැතෙව්ම" සොපි සද

වෙලාවක් නිහඬව කල්පනා කර පැවසුවාය.

වික්ටර් නැවත ඇය නිරීක්ෂණය කළේය. "තරහද ජේම්ස් එක්ක ඊයේ බැන්නට?"

සොපී සරදමට මෙන් සිනාසුනාය "මහත්තයල ජේම්ස් ගැන මොකුත්ම දන්නෙ නැහැ. හරිම හරි ලෝක අංඩපාලයෙක්."

වික්ටර් වේටර් කැදවා සුප් දෙකක් ඇනවුම් කළේය.

"දැන්ද මතක්වුනේ ඔව කියන්න"

"ඌට මම අනුකම්පා කෙරුව වැඩියි. අනෝම නෝනට මා ගැන බොරු කේලම් කිව්වෙ ඕක"

වේටර් සුප් බඳුන් දෙක රැගෙන මෙසය මත තබා යන විට වික්ටර් සොපී දෙස බැල්මක් හෙලීය.

"මම ටිකක් නැඟිටලා ගියොත් සුප් දෙකම නැතිවෙයිද?"

ඔහු සිනාසෙමින් සොපීගෙන් විමසීය.

මුල් වතාවට සොපී අවංකවම හඳවනින් සිනාසුනාය.

"කරල තියෙනවද මම එහෙම වැඩක් මෙච්චර කාලෙකට, ගිහින් එන්න ඕන නැනක"

වික්ටර් විනාඩි කිහිපයක් දයානුකම්පිතව ඇය දෙස බලා සිටියේය. "මම ටිහිළුවක් කෙරුවෙ. කියන්න බලන්න ජේම්ස් ගැන"

සොපී දෙවන සුප් බඳුන ලඟට ගෙන ටිකක් බීවාය. "ජේම්ස් කරන්නෙ කියන්නෙ ඔක්කොම ලෝක බොරු. කාත් කවුරුත් නැහැ කිව්වව ගැනි ළමයි ඔක්කොම ඉන්නව"

ඇගේ එම ප්‍රකාශයෙන් වික්ටර් වික්ෂිප්තභාවයට පත්විය.

"එහෙනන් යන්න එන්න නැනක් නැහැ කිව්වෙ?"

"මොකද නැත්තෙ. ගැනි ඉන්නව. ඉලන්දාරි පුතෙක් ඉන්නව. ඉඩම්. කුඹුරු තියෙනව. මිනිහෙකුට වෙන මොනවද ඕන?"

"කවුද මට දන්නෙ"

"මහත්තයයි. අනෝම නෝනයි ඇර හැමෝම දන්නව ඔය කතන්දරේ"

"එතකොට කල්‍යාණි නෝනත් දන්නවද?"

"එයත් දැනගත්තෙ කාලෙකට පස්සෙ මගෙන්"

වික්ටර් පුදුම වූවාක් මෙනි. "මෙක පුදුම අසාධාරණ

කතාවක්. ජේම්ස් පිරිමියෙක්, තාමත් හොඳට ඇඟ පත බඳින එක සාධාරණයි. ඒකෙ අමුත්තක්, වෙනසක් මට නම් පේන්නෙ නෑ"

මේවර සොපී සිනාසුනේ එම අදහස සමච්චලයකට ලක්කිරීමේ ආකාරයටය.

"මහත්තය අනාගත්ත කතාව. ඔය ජේම්ස්ගෙ පවුල කලින් රස්සාවට ආවේ මේ බංගලාවට, අම්ම නාත්ත ජවතුන් අතර සිටිද්දි"

"මම හිටිය ඒ කාලෙ"

"නැතුව, මහත්තය නුවර කොලිජියක බෝඩින් තෙරුව අයිය ඉස්කෝලෙ ගියෙ ගෙදරම ඉඳල. දෙන්න වෙන්කෙරුවෙ හැම තිස්සෙම රංඩු, මහත්තය ගෙදර ආවෙ නිවාඩුවට විතරයි"

වික්ටර් කුතුහලයෙන් සවන් දිගෙන සිටී.

"ඔහොම ඉන්නකොට මේ කෙල්ලට බබෙක් හිටිය, වීරසිංහ මහත්තය ගානෙ. අයිය ගානෙ, ලොකු නෝන හොඳටම බයවුනා. මහත්තයගෙ අම්ම ලොකු නෝන හැම වැඩක්ම කෙරුවෙ නිතියට. උදේ සවස බුදුන් වඳිනව"

"අපිටත් පුරුදු කෙරුවෙ ඒව. අතරමැදි නැතුනාට. වික්ටර් හිස සලමින් ඇගේ කිම අනුමත කළේය.

"බැරි වෙලාවත් මේක කතේ වැටුනොත් නැමෝම ඉවරයි. මාත් එක්කම. ඒකි බලාගන්න කියල තිබුනෙ මට"

වික්ටර් දසන් දක්වා සිනාසෙන්නට විය. "ඒ විශ්වීයත් ලස්සනට කරල තියෙනව. අපරාදෙ කියන්න බැහැ"

සොපී තරමක් කෝපයට පත්වූ බවක් හැඟවුවාය."ඒක විකාර කතාවක්. මම උදේ ඉඳල රෑ වෙනකල්ම කුස්සියෙ වැඩ. මේකි ගෙදර දොරේ වැඩ. නිවාඩු වෙලාවට මටත් උදව් වෙනව. රෑට නිදාගන්නෙ මාත් එක්ක. එත කාමරේ."

"එතකොට් කොහොමද මේ වැඩේ කෙරුනෙ?"

"දවල් තිස්සෙ බංගලාම ඇතුලෙ. උඩ, යට දෙකේම වැඩ. කාමර අස්පස්කරල, අතුපතු ගෑව, ඔය වගෙ වැඩ"

වික්ටර් හිස සලන්නට විය.

"දැන් තේරෙනවාද වැඩේ කෙරිච්ච හැටි. අයිය ඒ කාලෙ ඉඳලම මේ පුරුද්දට ඇබ්බැහි වෙලා ඉඳල තියෙන්නෙ"

සොපී උපහාසයෙන් මුසු සිනාවක් පෑවේය. "ආයෙත් අහල. ලොකු නෝන කාටත් නොරෙන් මේ ශකල්ල එල්ලුව පේමිස්ගෙ කරේ. බොරු කියල නෙවි. ඇත්තම සිද්ධිය කියල" ඒත් පේමිස් කැමති වුනේ නැහැ. පොඩිකාලෙ ගෙදරින් පැනල ඇවිත් ගමරටක් දන්නෙ නැහැ. ලොකු නෝනව කවුද කෙනෙක් බාරදීල. එදා ඉඳලම පේමිස් බංගලාවෙ වැඩ."

"එතකොට ගැනි අරගෙන ගියෙ කොහාටමද?"

"ලොකු නෝන කොහොමහරි පේමිස්ව කැමති කරවගෙන කෙල්ලව උගේ ඇඟේ එල්ලුව. ඊට පස්සෙ කුරුණෑගල පැත්තෙ ලොකු නෝනට අයිති පොල් අක්කර පනස් විතර කුඹුරක්, ගෙයක්, කෙල්ලගෙ නමට සින්නක්කරම ලියල දුන්න. සැහෙන ගානක් සල්ලිත් එක්ක"

වික්ටර් දිග සුසුමක් හෙළීය.

"ඊට පස්සෙ ඒ ගැනිත් එක්ක පේමිස් සාමෙන් සාමදානෙන් සතුටෙන් ජීවත්වුනා. කිසිම වෙනස්කමක් ශකරුවෙ නැහැ. ගැනිට ඇයි දෙයියනේ පොල් අක්කර පහෙන් බැරියැ රජ පැටව් වගේ ජීවිතේ ගෙනියන්න. කුඹුරත් කරගෙන අවුරුද්දටම වී ගෙට එනට කන්න දෙක කරගත්තම අනාථයෙක් වගේ හිටිය පේමිසාට නියානයක් පහලවුණා වගෙයි."

"ඇයි තාත්ත කියන්න බබෙකුත් බඩේ නියාගෙන ආවෙ? ඒකම කොච්චර විවිනවද?" වික්ටර් සරදමට මෙහ් කිය. සොපි නොරිස්සුම් සහගත බැල්මක් හෙළුවාය. "ඔයවගේ දේවල් අනන්තවත් අහන්න සිද්ධවෙනව. අපේ ලොකු නෝන සරුව සාධාරණේට වැඩ කෙරුවට සමහර අම්මල කෙල්ලන්ට, ගෑනුන්ට ගහල බැනල ගෙවල්වලින් එළියට දානව. තමන්ගෙ පුන්කු, මිනිස්සු ලොකු කරගෙන"

වික්ටර්ගේ ඇහිබැම ඉහළට නැගින. "මේ නුගත් ගැනි කුස්සි අම්ම. ඒත් රටේ ලෝකෙ වෙන දේවල් ගැනත් තියෙන්නෙ හොඳ අවබෝධයක්. දැන් පටන් නාට්‍යයේ පළමුවන කොටස ඉවරයි. බලමු ඊළඟට දෙවැනි අදියර"

"කියන්න අපි නොදන්න, අපේ ගෙදර වෙච්ච දේවල්"

"පේමිස් සුමානෙකට සැරයක් ගෙදර යනව, එනවු. ගැනිගෙ මුළු පවුලම ඇවිත් වත්තෙ පදිංචි වුනා. පිරිමි ළමයෙක් හම්බවුණා. වීරසිංහ මහත්තයගෙ කපාපු පලුව.

"අයිය ඊට පස්සෙන් එහෙ ආව ගියාද?"

"ඒක එහෙමම මතක නැතිව ගියා. ලොකු නෝනටයි, නාත්තටයි තිබුන බයට. පේමිස්ගෙ ගමන බිමන ටික ටික අඩුවුනා. ඒකි පෑහුනේ ඒ පැත්තෙම උන්ගෙම වත්තෙ කුඹුරුවැඩ කරපු එකෙකුට. දැන් ළමයි හතර පස් දෙනෙක් ඉන්නව."

"පව් වැඩේ පේමිස්ට වුනේ?"

සොපී උපහාසය මුසු සමච්චල් සිනාවක් පෑවාය.

"පේමිස් ඒක ගණන් ගත්තෙ නැහැ. ඉඳල හිටල ගෙදර ගිහින් එනව. ගෑනිට ළමයින්ට කෑගි බෝග එහෙමත් අරගෙන"

"ලෝකෙ කියන්නෙ මහ පුදුම තැනක්. පුදුම දේවල් ඔිද්ධවෙන්නෙ. පුදුම දේවල් අහන්න බලන්න වෙන්නෙ. මේකත් ඒ වගේ දෙයක්"

"ළමයෙකුත් එක්ක ගැනියොත් බාරගත්තම, ඒ ගැනි යථාකාලයේදි තව මිනිහෙක් එක්ක යාලුවෙලා එකතු වෙනව. ළමයි ලපටිත් ඇතිවෙනම. පේමිසුත් එහාට යනව, එනව. ඉඳල හිටල පවුලවයි ළමයින්වයි කෑගි බෝග එහෙමත් අත පුරවල අරගෙන"

"මහත්තය එක පාරටම මොකද කල්පනාවට වැටුනේ?" සොපී අසන්ම වික්ටර් එක්වරම කල්පනා ලොවින් පියවී ලොවට පිවිසියේය.

"ආ..... නැහැ. එහෙම මොකුත්. මම කතාව අහගෙන ඉන්නෙ."

"ඔය ගැනිගෙ ණුටසටෙන් පස්සෙ එදා ඉඳලම පේමිස්ගෙ හිතේ ලොකු වෛරයක් තිබුන වීරසිංහ නෙන්නයත් එක්ක කරන්න දෙයක් නැතිකමට බලාගෙන ඉවසගෙන හිටිය."

"ඒක බොරු. පේමිස් හොඳයි. හිතවත්, කාටත් ආදරෙයි"

"පෙන්නුවෙ එහෙම පහුවෙන්න මිනිහ බොන්න පටන් ගත්ත. අතට අනුවුන දේ කුස්සියෙනුත් බඩු මුට්ටු නොරෙන් ගෙනිච්ච මට අනථම අනුවෙලා කී දවසක් බැන්නද?"

වීරසිංහ මහත්තයට සල්ලි ගණනක් නැහැ. නිදහස්න කාමරේ හැම තැනම සල්ලි. කහමදය වගේ බිල ඒන්නෙත්. එතකොට පේමිස්ට පොංගල්. සීයෙන් දෙසීයෙන් පටන් අරගෙන දාස් ගණන්වලට බැස්ස දවසක අනුවෙලා කාමරේ ඇතුලෙම දාගෙන ගැහුව"

"එලවල දැම්මෙ නැත්තෙ ඇයි?"

"වීරසිංහ මහත්තය ජේම්ස්ට බයෙන් හිටියෙ. අර කාරණාව හින්ද. වෙන්න ඇති. තියාගත්තෙ එලවල දාන්නෙ නැතුව. වැඩේ නරක අතටම හැරුනෙ ඔය සිද්ධියෙන් සුමාන දෙක තුනකට පස්සෙ. මම ඒ වෙලාවෙ හිටියෙ කුස්සියේ"

"හිටපු ගමන් වරෙන් ජේම්ස්ගෙ පවුලයි. පුතයි දෙන්නම බංගලාවට. නරක වෙලාවට වීරසිංහ මහත්තයත් එදා ගෙදර"

"තුන්දෙනාම ගියා මහත්තය ලඟට. මහත්තය බය වුනා. ජේම්ස් මහත්තයා දිහා බලාගෙනම හිටියා කන්න වගෙ නපුරු විදියට. හැරුන කොල්ල දිහාවට"

"ඔය ඉන්නෙ උඹගෙ කෝට්පති නාත්ත. ඉල්ල ගනින් වස්තුව. මම උඹ ලොකු මහත්කරල හදල මගේ නමත් දුන්න. එච්චරයි"

වීරසිංහ කරකියාගත හැකි කිසිවක් නැතිව තරුණයා සහ මව දෙස බැල්මක් හෙලීය. තරුණයා තම පියා මෙන් හඳුන්වා දුන් නැනැත්තා දෙස බැල්මක් හෙලීය.

එම අවස්ථාවේ වීරසිංහ හොඳටම බිමත්ව සිටියෙන් තරුණයාට පෙනුනේ තම පියා යයි හඳුන්වා දුන් පුද්ගලයා සුරා සොඳෙන් ලෙසිනි.

නව නාමිපුත්‍රා අධික ලෙස බිමත්ව සිටි බැවින් ජේම්ස්ට අවස්ථාවේ අවධානම තත්ත්වය තේරුම් ගියේය.

"මහත්තය අපි යනව" ජේම්ස්ගේ බිරිඳ උස් හඬින් වීරසිංහට ඇසෙන සේ කිවාය.

වීරසිංහ ඔවුන්ට පිටව යාමට අතින් සන්කරන විට ජේම්ස් ඔහු අසලට ලඟාවිය.

"පුතයි පරණ ගැනියි යනව. ඒත් මම ඉන්නව. මෙහෙ කොල්ල රට නොයැවිවොත් මම ජේම්ස් නෙවී. ටිකක් ඒකත් මනක තියාගන්නව."

වීරසිංහ අඩසිහියෙන් මෙන් නැගී සිටියේය. "මගේ ලඟ නැහැ උඹලට ඉල්ලන කොට දෙන්න පනස් දහවල්. මග වියදමට මේක තියාගනිල්ල."

ඔහු සාක්කුවට අත දමා මුදල් වගයක් ගෙන ඔවුන් වෙත වීසි කර දැම්මේය. ජේම්ස් මුදල් නෝට්ටු සියල්ල අහුලා ගෙන ගණන් කළේය.

"මෙහෙන තියෙනව භයදාහක් විතර. උඹල මේකත් අරන් පලයල්ල ගමට. මම කොහොම හරි සල්ලි හොයාගෙන එනව කොල්ල රට යවන්න. මුන් හිරිසන්තු. දැක්කද සලකපු නැටි. කිව්වද ගෙදරින් බත් වේලක් කන්න කියල. පුතා ගත්තද ලඟට. උට හැමතැනම ළමයි. උගේ ළමය උ‍ා අඳහන්නෙ නැහැ. ඒ වාගේ කාලකන්නියෙක්. හරි හිටපන් මහත්තයෝ මම උඹ දාල යන්නෙත් නැහැ. මීට පස්සෙ ඔය බොරු නෙයියාඩත් නරන්න ආවොත් මට කියන්න එපා ජේම්ස් කියල. හා දැන් වරෙල්ල යන්න."

"ඔන්න ඔකයි මහත්තයො කතාව. එදා ඉඳල ජේම්ස් පොළඟෙක්. මාපිලෙක් වගෙයි. පවුලවයි. ළමයයි ගෙදර යන්න බස් එකට නග්ගල ආව ගෙදර එනකොට මහත්තය නිදි කැටියෙ. මම බලාගෙන හිටියෙ."

"ජේම්ස් කෙළින්ම ගියෙ මහත්තයගෙ සල්ලි බෑග් එක ළඟට. ඇරිය බෑග් එක. ගත්ත සල්ලි මිටි තුන හතරක්. උගේ පාඩුවෙ යන්න ගියා.

වික්ටර් කල්පනාවෙන් හිඳී වේටර් කැඳවීය. වද වේලාවකින් දිවා ආහාරය සූදානම් විය. සුදත් සහ අනෝමා පමණක් තුන්හි විදින බව කියන, ඔවුන්ට නිකමට හෝ නොදෙන බියලුම් ඇල්වල් දැන් මේසය මතය. සොපිගේ දෙනෙත් සතුටෙන් ඉවිලී ගොස් ඇත.

"මමත් අවුරුවු කියක් බංගලාවෙ ඉවවද. ඉල්ලන ඕන දෙයක්, මෙහෙම සුවඳක් මුන් එක එකට අතවඳනි මොනව හරි. මම හදල නැද්ද නුඩල්ස්, ප්‍රයිඩ් රයිස්, බැදල නැද්ද මාළු මස්"

වික්ටර් යටැසින් ඇය දෙස බැල්මක් හෙලීය. "සොපි අම්මි දැන් වැඩ දෙන්න නියම විදියට. මේව ආපහු යැවිවත් සල්ලි ගන්නව"

සොපී ඇස් දෙක මනත්කර නැම සහ අනෙකුත් සියල්ල දෙස බලා මොහොතක් කල්පනාකාරිව සිට යෝජනාවක් ඉදිරිපත් කළාය.

"මහත්තය තරහ නැද්ද මන් වචනයක් කියන්න"

වික්ටර් කුකුස මුසු බැල්මක් ඇය දෙසට හෙලීය.

"කියන්න ඕන දෙයක්, කැම මදිද?"

සොපිගේ පරණ පුරුද්ද නවම ඇයට අමතකව ගොස් නැත.

ඇය නැඟිට පොඩි මෙන්නයට කෑම බෙදන්නට වූවාය. ඔහු සෑහීමෙට පත්වූ පසු ඔයාදු ලෙස අසුන්ගෙන නම පිහානට ආහාර ටික ටික බෙදාගන්නාය. වික්ටර් බීසිල්ලෙන් අසුනෙන් නැඟිට කොපීගේ පිහාන පිරෙන තෙක් තැම දෙයක්ම බෙදන්නට විය. ඉන් ඇගේ බඩ පිරෙනවාටත් වඩා සිත පිරෙන බවත්, ඉන් ඇගේ දෙකොපුල් ඔස් නැන්වෙන අන්දමත් ඔහුට පෙනින.

වික්ටර් බොරුවට තරහ වූ බවක් අඟවයි.

"අදත් ගෙදර වගේ. මට බෙදල ඉවර වෙලා බෙදා ගත්ත. ඒත් හැන්දයි"

සොපී නිහඬව කෑම කන්නට වූවාය. වික්ටර් ඇයට රිසි සේ කෑම සඳහා අවකාශය සියල්ල පිහානට බෙදන්නට විය. මද අවසරයකින් පසු සොපී සුප් බඳුනේ රස බලන්නට වූවාය්.

"අපි කළින් බිව්වෙ වෙන සුප්. මේක වෙනින් සුප් ජාතියක්"

විකටර් සිනාසෙමින් වට පිට බලයි.

"මහෙලාට නෝන්ඩි කරන්න එපා. හැමදාම හදනව නේද සුප්?"

සොපී නිහඬය

"ඇත්තයි! එළවළු, එග්ස්, වෙල් චිකන්, වටන් මික්ස්ඩ හැම සුප් එකක්ම හදනව දවස ගානෙම ඉල්ලන ඉල්ලන විදියට ඇයි මේ වෙනස. ඉන් මොනව හරි කලවන් කරන්න ඇති මේව රස වෙන්න.

සොපී දරුසෙනෙහසින් යුතුව ඔහු දෙස බැලුවාය.

"මම මහත්තය ලොකු මහත් කරන්න දුක් වින්ද සෑහෙන්න"

ඇගේ දෑස් කදුළු වලින් පිරී ඇත. මේ දුටු වික්ටර් හිටි අඩියේම කෑම ගැනීම නවතා දැමිය.

"මෙතෙන්ට එක්ක ආවෙ මගේ අම්ම වගෙ හිතාගෙන. දැන් කනවද? නැත්නන් අඩනවද?"

ඇය කදුළු පිසදා ගනිමින් නැවත ආහාර අනුභව කිරීමට පටන් ගත්තාය. කෑම කා අවසන් වීමට පෙර වික්ටර් බිල නොගෙවා තවත් වෙනම ඇනවුමක් කළේය.

"හැබැයි විනාඩි දහයකින් පාර්සල් රෙඩි කරල ඕන"

වේටර් හිස බිමට නැඹුරු කොට ඇනවුම් බාරගෙන කඩිනමින් ඉවත්ව ගියේය.

සොපී ඉතිරි කෑම දෙස බැල්මක් හෙළුවාය. මේ ටික ගෙදර

අරන් ගියොත් කෙල්ලො කොල්ලො හරි ආසාවෙන් කාවි යන හැඟීමක් ඇයට ඇති වූ සිතුවිල්ලකි.. මෙය තේරුම් ගත් වික්ටර්ගේ දෙනෙතට කැටිවුනේ සාතුකම්පිත, හෝඨනීය පසුතැවිල්ල කැටි බැල්මකි.

"මේව කුණු බාල්දියට, මේ සොපී අම්මට ගෙදර ගෙනියන්න කෑම ඕඩර් කෙරුව. විනාඩි පහයි යන්නෙ"

සොපී මේ ගැන පුදුම නොවීය. කෑමෙන් පසු අති මිහිරි සලාදයේ රස විඳිමින් ඇගේ මනැස එහා මෙහා සක්මන් කරන්නට විණ.

"මුන් මොනව කෙරුවත් සල්ලිකාර මෙන්තුරු. පේනවද වීසිකරන කෑම ගොඩ. ගමට ගෙනිව්වනන් අර දුප්පත් එවුන්ගෙ බඩ කට පිරෙනව වේලකටවත්. ඒත් බංගලාවෙ අර කුම්මැලි නෝනා, අනෝමා ආවට පස්සෙ මීට වැඩිය නොදට හදනව කෑම බීම. ඒ වුනාට අපට ඇතිලිත් නැහැ."

කවාපන්කොා ඔක්කොම ගිහින් එක්කෙනෙකුට. සුදන්ට මකාට කලිසන් ඇදගෙන බයිසිකල් පටුවේ ආ සුදත්. මම දවසක් සුදන්ට කෑම හැදුව කිව්ව. නැගල වරෙන්කොා නෝන්න

හැලෙනවද දන් සුදන්ට මහත්තය කිව්වම. දැන් එයා නමයි මැනේජර් මහත්තයා

අනේ කාලේ වගේ වාසේ අහපල්ල වේවා හදියට මැලිල ඉපදුන වගෙ

විරසිංහ මහත්තය තමන්ගෙ ස්වාමිපුරුෂයෙ දවසකට හරි. දෙනවද හදල බත් පැකට්. අහනවද කන්න ආස . කොටින්ම ගණන් බලන්නවද මිනිහෙක් කියල.

ඉතින් ඒකටත් එක්ක හරියන්න සුදන්ට නැමදුම් උදේට දන්නව එන වෙලාව. බාගෙට හෙල්ලුවැල්ලෙන් බැල්කනියට වෙලා බලා ඉන්නව. සුදත් ඇතුලට ආපු ගමන් මේ දැන් නැඟිවල එන විදියට අර හෙල්ලුවැලි නයිට්ය පිටින්ම සොල්දරේ පල්ලෙහාට බාගෙට බැහැල ඉන්නව සුදත් එනකල් පල්ලෙහාට එනකොට හලෝ ගුඩ් මෝනිං සුදත්, කියාගෙන පල්ලෙහාට බහින්නෙ. අනේ මගේ කට.

වික්ටර් ඇය දෙස බලාගෙන සිටි බව නොඇඟවීය.

"සොපී අම්ම ලොකු කල්පනාවකින් වගෙයි"

සොපී එක්වරම නිගැස්සී අන්ද, මන්ද බූමෑක් මෙන් වික්ටර්

දෙස බැලුවාය. "නැහැ මහත්තය මම මේ ප්‍රේමිසා ගැන කල්පනා කෙරුවේ"

"ප්‍රේමිස් නාමත් බංගලාවේ වැඩ. සොපි වෙනුවට කෝකියෙක් ගෙනාව"

සොපි අවතාරයක් දුටුවාක් මෙන් එක්වරම ගල්ගැසිනි. ඇගේ මුහුණේ බිය ජනක පෙනුමක් විය.

"මහත්තයල වැටෙන්නෙ ලොකු අමාරුවක. මට අනෝම නෝනට මොනව වුනත් කමක් නැහැ. පුංචි මහත්තය ගැන මට දුකයි."

මෙසේ කී ඇය නිගමනයකට මං සොයන බවක් පල කළාය. "මය ගෙදරින් මහත්තය යන්න. ආයෙ එන්නත් එපා." ඈ ආයාචනයක ස්වරූපයෙන් කීවාය.

වික්ටර් විශ්මයට පත්ව නළල රැළි නංවා ගත්තේය.

"මමයි, අක්කයි දෙන්නම අද හෙට රිමාන්ඩ්. කොහේ කියල යන්නද? ගියොත් හැංගුනා කියලයි කියන්නෙ"

සොපි යළින් කල්පනාවේය. "මගේම ළමයි වගේ, මගේ ළඟ මගේ අතින් කාල බිල අත පය දික් දඩු වුනෙ. බැහැ මේ ටිකක් නොකියම එලවල දාපු ගෑනි ගෙදරින්. කොස්සෙනුත් ගහනව කියල. ඇයි ආවෙ ආපහු හොයාගෙන. ඇයි සැලකුවෙ මෙහෙම කනාකරන්නෙ අම්මට වගේම. ඊක පුදුමයක් නොවෙයි.

කවිල පොවල නදාපු එකේ කෙලෙහි ගුණේ, බැහැ නිකම්ම මැරෙන්න දෙන්න. මට පලිගන්න ඕන අරකිගෙන්. අර කොස් පොලොස් නෝන පොඩිත්ත අනෝමගෙන්. අර අනාථ මඩමෙ හැදුන හිඟල දැන් සුදත් මහත්තය ඒක කරන්න ඉඩ දෙන්න බැහැ. එයා මේ වගේම පුතෙක් වගේ. පේන්නෙ නැද්ද සලකන හැටි. ගෙදර වැඩකාරි කියලද? තමන්ගෙ ළඟම ඥාතියෙකුට වගෙ බලෙන් කවනව. සුප් පොවනව. සැලඩ්. පුඩින් ඕනම දෙයක්ද ගෙදර ගෙනියන්න වෙනම ඔඩරයක් මේ දන්න දේවල් ඔක්කොම කියනව"

මෙසේ සිතූ සොපි වික්ටර් දෙස දරු සෙනෙහසින් යුතු බැල්මක් හෙළුවාය,

"බේබි මහත්තය මම හොඳටයි කියන්නෙ. ජේම්ස් දාන්න එලියට. එහාම, ඔතන යනව ලොකු කුමන්ත්‍රණයක්. උගේ අර යාලු කෝකියත් එක්ක එකතුවෙලා හැරම්ම නැති කරන්න."

වික්ටර් ඇය දෙස විනිවිද යන බැල්මක් හෙලීය.

"යන යකා කොරහ බිඳගෙන යන්න වගෙයි"

සොපීගේ නෙතට නපුරු පෙනුමක් එක්විණ. "ඕන විදියකට හිනා ගන්න. විරසිංහ මහත්තය මරන්න කළින් උගේ පුතා රට යවන්න සල්ලි නුදුන්නට පස්සෙ ජේම්ස් හිටියෙ රජවෙලා. අපේ මහත්තයව සතේකට මායිම් කෙරුවෙ නැහැ. දැක්කොත් කාරලම කෙල ගහනව"

"අයිය පාඩුවෙ හිටියද මේවා බලාගෙන?"

"දැන් ඒවා අහන්න විදියක් නැහැ. පුතා රට යවන්න සල්ලි නොදුන්නට හරිම හරි කේන්තියෙන් ජෙමා හිටියෙ නයා වගේ"

"අයිය මැරුන වැඩේ ඉවරයි. සුදත් ඇතුලෙ. අපි දෙන්නත් හෙට අනිද්ද එහෙ."

ඒ වචන කිහිපය සොපිගේ හදවතේ කුරිරු බව පළිගැනීමේ වේදනාව, නපුරු කම් වසා සිටි සිදුරු සියල්ල විවර කිරීමට සමත් විය. පිරිසිදු වාතය සහ පිරිසිදු ජලද එකතුව කාන්දු වී හදවත පාරිශුද්ධ කරමින් ඇයට ජීවිතයේ යථාර්ථය වටහා දෙමින් නැවත සිරුර පුරා දිවීමට පටන් ගැනිණ. එය ප්‍රාණවායුව බෑ දෙයකි.

ගල් බෝරකින් දමා කැඩිය නොහැකි කලු ගලක් යිසිල් පැන් පොදක් මෙලෙක් කිරීම වැනි විශ්මය ජනක සිදුවීමකි.

"ඔය ජේම්ස්ට ඉන්නව යාලු කෝකියෙක්. උෆ් බංගලාවල වැඩ කරන්නෙ ටැම්පරි. මූ ජෙමා මාට්ටු කෙරුවේ මේක අපේ විරසිංහ මහත්තයට."

වික්ටර් ඇය දෙස සැකයෙන් හා පුදුමයෙන් බලා සිටියේය.

"සොපි අම්මන් ඒ කාලෙ ගෙදර හිටියද?"

"මන් ගෙදර ඉන්නෙ නැතුව කොයි දිහන්කරේ යන්නද? මූ එනව ලොකු මහත්තයෙක් එක්ක කුටු කුටු ගානව. යනව යන්න. ඊට පස්සෙ ටැලිෆෝන් කතා ඉවරයක් නැහැ. උත්තර දෙන්නෙ ජේම්ස්. හරි, රෑ දහයට ඒවි. හොඳට ලැස්තිවෙලා එන්න. නේන ඔය වගේ කතා නමයි වැඩිපුර ඇහුනෙ"

"යාලුවෝ ඔක්කොම ගැහුද?" වික්ටර් විමැසීය.

"දෙතුන් පාරක්ම ජෙමා නැති වෙලාවල මේ ටෙලිෆෝන් කෝල් වලට උත්තර දෙන්න ගියා. මගේ කටහඬ ඇහුන ගමන් කතා නැහැ. මම ටෙලිෆෝන් එක බිම තියනව"

"කොහොමද ජේම්ස්ගෙ යාලු කෝකියගෙ හැටි. " මද වේලාවක් සොපී දෙස කල්පනාකාරීව බලා සිටි වික්ටර් ප්‍රශ්න කළේය.

"ඌ කොටයි. මහතයි. නටටෙ ටිකක් තියෙනව. අඳින්නෙ සුදු සරම. කමිසෙ. පෙනුමට ඉන්නව"

වික්ටර් යමක් තේරුම් ගත්නාක් මෙන් හිස සැලීය.

"දැන් බංගලාවෙ කෝකිය මිනිහ තමයි. සොපි අම්මට පස්සෙ. ජේම්ස් එක්කර ගෙන ආවෙ. නම වඩිවේල් දෙමළ මිනිහෙක්. හරිම නොදයි."

සොපී වික්ටර් දෙස අනුකම්පාවෙන් සහ ආදරය කැටි මාතෘ සෙනෙහස උතුරා යන බැල්මක් හෙලුවාය.

"මය දෙන්නම අස්කරල දාන්න. හිරේට යනකල් කන්න හෝටලෙන්. කිසිදේකට මුහු වෙන්න එපා. වීරසිංහ මහත්තය මැරුනට පස්සෙ දෙන්න හිනාවුන හැටි."

"ලොකු ගහ බිම. පොඩි අතු ටික පොරවකින් කපල දාමු. මැඩම්ගෙන් අහල. උඹේ අපේ වැඩේ මැඩම් හරියට කෙරුව ඒකයි බය නැත්තෙ කාටවත්"

"උන් දෙන්න ඔන්න ඔහොම කියල හිනාවුනා"යි සොපී කෝපයෙන් යුතුව සඳහන් කළාය.

වික්ටර් මේසයට දෙවැලමිට තබා ඇගේ කතාව දැඩි උනන්දුවකින් සවන්දී සිටී.

"ඒකාර කතා එපා. අපේ වැඩේ කෙරුන. මැඩම් හොඳයි. මොකක්ද කෙරුන වැඩේ? කවුද මැඩම්?

සොපි බොරුවට සිනාසීමට උත්සාහ දැරුවාය.

"ඒව දන්නෙ උඩ ඉන්න දෙවියො. කරන්න මම කියන දේ. ප්‍රවේශමෙන් ඉන්න. උන් දෙන්න දෙන කිසිම දෙයක් ඉඳුල් කරන්න එපා"

නිවෙසින් පිටමං කළ නිසා සොපිට මානසික ආබාධයක් වැලඳිගෙන එනවාද යන්න සැක හැර දැනගැනීමට වික්ටර් උත්සාහයක යෙදුනි. ඔහු වේටර් ඇමතීය.

වේටර් පාර්සල් කිහිපයක් ගෙන ආ විට වික්ටර් මුදල් ගෙවා දමා නැගී සිටියේය. "දැන් අපි යමු"

වේටර් පාර්සල් රැගෙන පසුපසින් පැමිණි අතර වික්ටර් මෝටර් රථයේ පිටුපස දොර විවෘත කළේය. වේටර් පාර්සල්

කිහිපය අසුතේ පසෙක තැබීය.

"සොපි අම්ම වාඩිවෙන්න." කී වික්ටර් රියැදුරු අසුනට බර විය.

"මම ගෙදරටම ගිහින් බස්සල එන්නම්. බස්වල යන්න ගියොත් මග මැරෙනව. මොකෝ මේ ගිහිල්ල නුවරුඳු නැනක්යැ?"

සොපී නැවතත් හුදුමයට පත්වූවාය.

"එපා බේබි මහත්තය. මාව බස් ස්ටෑන්ඩ් එකට දාන්න. ඒ ඇති"

වික්ටර් එය නැසුනාක් මෙන් රථය පෙරට ධාවනය කරන්නට විය.

සොපී නිවසින් පිටමන් කර ඇත. ඇය ඉන් සෙවීමට බැලීමට පමණක් නොව ඉදිරි ජීවිතය ගැන වගකීමට තාත් කවුරුත් නැත. මුළු ජීවිතයම මේ බංගලාවට කැප කල නැඟ වැඩූ ළමයි දැන් ලොක්කො. දෙමව්පියො දෙන්න රත්තරන්. ඒක් මට කරපු දෙයක් නැහැ.

ජේම්ස් මෙතෙන්ට වැඩට ආවෙ මට ගුහාක් පස්සෙ. ඒත් ජේම්ස් දිනුව. ඒත් මම හිතන්නෙ නැහැ ඒක දිනුමක් කියල. වික්ටර් මහත්තය මහනුවර ලොකු කොලීජියක මේස්ත්‍රිවරයි. මාසෙකට ගෙවනව ලොකු ගණනක්. ගෙදර එන්නෙ නිවාඩුවට විතරයි. ආවම නටනව. දගලනව. ආපහු යනව.

වීරසිංහ මහත්තය හැදුනෙ ගෙදර. සුමනත් ගෙදර. සුමනා ගෙදර වැඩපල කරපු කෙල්ල. ඒකිට වැඩිම වුනොත් අවුරුදු දහසයක්, දාහතක් විතර ඇති. ඉස්කෝලෙ නිවාඩු කාලෙ ආවම මේ දෙන්නම ගෙදර මාස හතරක් විතර යනකොට නිවාඩු කාලෙ ඉවරවෙලා. සුමන වම්මෙ කරනව. වලුව කැරකෙනව. ක්ලාන්තෙ ගතියෙන් වගෙ ඉන්නවා හරියට වැඩ කරන්නෙන් නැතුව.

ගියා මම ලොකු නෝන්න ලඟට. කිව්ව කතේදරේ මේක අහපු ලොකු නෝනට ගිනිපත්තු උනා. ආව පනළට. ගියා සුමනගෙ කාමරේට. සුමන දැන් ඇදේ හාන්සිවෙලා සෙදිරි ගානව බලා හිටිය. ටික වේලාවක් සුමන දිහා මටත් බලවගෙන උඩට නගින ගමන් "වරෙන් සොපි උඩට. වැවේ ගැස්සිල වගෙයි" නෝනා එහෙම කිව්වා.

"මටත් ඒ කාලෙ කිසිම දෙයක් ගැන තේරුමක් නැහැ. තේරුනත් මම බය නැතිව උඩට ගියා. ලොකු නෝන ඇඳේ හාන්සි වෙලා බර කල්පනාවක.

සොපී පැමිණි බව දුටු ඇය කෝපයට පත්වූ සේය.

"උඹේ ඇස් වහගෙනද හිටියෙ මෙච්චර දවස්?"

සොපීට එය පුදුමයකි. ඇය යාන්තමින් සිනාසුනාය.

" මෙහෙ ඇස් වහන්නෙ මූකලන් බස්සො. එළියට මහ රෑට පාලොස් පැමේ මට ඇස් වැහෙන්නෙ නිදාගන්න වෙලාවට විතරයි. ඒත් පාන්දර පහට ආපනු ඇස් අරිනව"

ලොකු නෝනට එයද ඇනුම් පදයක් වැන්න.

"උඹ කියන්නෙ මරව මරව වැඩ ගන්නව කියන එක"

සොපී නැවත සිනාසෙන්නට විණ. "මම කිව්වෙ මම නිදාගන්න වෙලාව නැඟිටින වෙලාව" සොපී ලොකු නෝනා දෙස නොබලා සිවිලිම දෙසම බලා සිටියාය.

"අරකි එමනෙ දාන්නෙ?"

"අජීර්ණයක් ඇති බඩේ. බෙහෙත් ටිකක් අරන් දෙමු"

සොපී අහිංසකව කිව්වාය.

ලොකු නෝනා නැඟිට සයනයේ වාඩි වූවාය. "එයා හොඳට කෑම කාල නියෙනව. දැන් බෙහෙත් වැඩක් නැහැ. වැඩියෙන් හාන්සි වෙන්න දෙන්න එපා. පාඩුවේ ඉන්න ඇරපන්. මම බලා ගන්නන් ඉතුරු හරිය. කෝ ජේම්ස් ඉන්නවද?"

"විත්තෙ වැඩ ඇති. කතා කරන්නද?"

එය එක්තරා ඡේදයක අවසානයයි. නිවාඩු කාලය තුළදී විරසිංහගෙ කෙලිබඩුවක් බවට පත් මෙනෙකාරිය දැන් ගැබ්ගෙන ඇත. කම සැමියාටද නොහඟවා මෙයට යෙදිය යුතු පිළියම් විරසිංහගේ මව සුහුසුලු වූවාය.

ගබ්සා කිරීමකට කල්ගතවූවා වැඩිය. කෙල්ල ගෙදරින් පන්නා දැමීමෙන් ලෝකාපවාදයට භාජනය වන බවත් ඇය හොඳින් මෙනෙහි කළාය. නිකම්ම අම්මට නුන්නට බාර දුන්නොත් උන් මෙහෙ ඇවිත් කෑ කෝ ගහල අහල පහල අය හිනස්සල පොලිසියෙනුත් ගිනි විජ්ජුම්බරයක් වෙන්නෙ?

ඇය අවසන් වශයෙන් ගත් තීරණය ක්‍රියාත්මක විය. කුරුණෑගලින් පොල් අක්කර පහක්, කුඹුරකුත් තියෙනව අක්කර කාලක් විතර. සල්ලි ටිකක් දෙමු. ජේම්ස් වැඩේට කැමතියි.

සුමනා ජේම්ස්ගේ බිරිඳ වූවාය. දරු ගැබකුත් සමඟ - දරු ගැබේ වගකිව යුත්තා කවුරුන්දැයි ගමේ අය දැන සිටියේ නැත.

ගමේ කඩ සිල් වල කතාවෙනව ජේම්ස් පදිංචියට ආවට පස්සෙ නොයෙකුත් කවි කතන්දර හරිබරියා හඟෙයි. එතෙනම් ඉන්නෙ බලව්වෙ නාමුදුරුවො වගෙ"

වයස්ගත කෙනෙක් සිනාසෙයි. "කොල්ලො උණුල තැලිල පොඩිවෙලා මදි. බලපල්ල තව ටික දවසක් ඉඳලා"

අනෝමා දිවා ආහාරය ගැනෙන රිමාන්ඩ් හාරයේ පසුවන සුදත් බැලීමට ගියාය.

මිරිහාන පොලිසියේ මූලස්ථාන කාර්යභාර නීලධාරියා පිටත ගොස්ය. සාජන් ආරියදාස සහ උප පොලිස් පරීක්ෂක වික්‍රම ජයවීර දුවුසැනින් ඇය හඳුනාගෙන මුව පුරා සිනා නගා ගත්හ.

"තුන්වේල වරද්දන්නෙ නැහැ. පොහොම් හරි මැනේජර්ගෙ" ඒ සාජන්ය.

උප පොලිස් පරීක්ෂක වික්‍රම මහු දෙස බලවා බැලීය. "හිමින් දෙන්න කෑම. දැන් ස්පෙෂල් සෙල් එකකුත් හම්බවෙලා යාලුවෙකුත් ඉන්නව"

අනෝමා සිනාසුනාය. "රිමෙ හිටියෙත් ඒකෙ"

සාජන් සේවයේ යෙදී සිටි පොලිස් කාන්තාවක් අමතා "යන්න මේ නෝන එක්ක. පැයෙන් ආපහු යවන්න ඕන" දැන්වීය.

පොලිස් නිලධාරිනිය සිනාසෙමින් අනෝමා සමඟ යාමට සැරසුනාය. "ඒක නමයි අම්මරු වැඩේ. මේ දෙන්න කතාවට වැටුනම"

උප පොලිස් පරීක්ෂකවරයා නරවටුවක ස්වරූපයෙන් "පැයයි කියන්න හරියටම. පැයයි, තේරුනාද?" නිලධාරිනියට මතක් කර දුන්නේය.

එයට සැවොම සිනානුහුන.

පොලිස් කාන්තාව සමඟ අනෝමා සුදත්ගේ සිරකුඩුව වෙත

ගමන් කළාය.

"අද ලොක්ක පිට. එස්. අයි. මහත්තයත් දැන් යනව ගෙදර කෑමට. සාජන් මහත්තය ගියාට පස්සෙ එන්නෙ හතරට. කාල බීල නිදාගෙන ඉඳල. හිතේ හැටියට කතාකරගෙන ඉන්න. මමත් නැහැ තාම බැඳල. ඉන්නව බෝයි ප්‍රෙන්ඩ් කෙනෙක්. ගෙදර ආවම යන්නෙත් නැහැ. ලේසියෙන් මම යවන්නෙත් නැහැ."

පොලිස් නිලධාරිනියගේ කතාවට අනෝමා සිනාසුනාය.

"තාත්ත පොල්ලක් ගත්තොත් ඇර"

ඇදදෙනාම සිනාසෙමින් සුදත් සිටි සිරකුඩුව වෙත ලඟාවූහ.

"මිස්ටර් සුදත්"

සුදත් ඉවත බලාගෙනම "ආපනු ගන්නද කට උත්තර? මේක හරිම කරදරයක්" පැමිණ සිටි අය කවුරුන්දැයි නොබලාම කීය.

පොලිස් නිලධාරිනිය සිනාසෙන්නට වූවාය. "දැන් කට උත්තර දෙන්න වෙන්නෙ ලොකුම තැනට. මේ පාර්සල් ගොඩක් උස්සගෙන ඇවිත් ඉන්නෙ"

සුදත් එක්වරම සිමෙන්ති බීම්මෙන් නැගිට ඉදිරියට එන්ම අනෝමා දකින්ම ඔහුගේ මුව ප්‍රීතිමත් සතුටකින් ඉපිලී යයි.

"ඊහිලුත් කරනව පොලිස් නෝනල ඉඳල හිටල"

පොලිස් නිලධාරිනිය අනෝමා දෙස බැල්මක් හෙලුවාය. "දැක්කද දැන් වුනෙ තියෙන සොඹය. ඉහේ මලක් පිපුන වගේ. මම යනව ගැබැයි පැයෙන් එනව ආපහු මෙයා එලියට. ලොක්කගෙ ඔඩර්ස් ඒව"පවසමින් නිලධාරිනිය ඉවත්ව ගියාය.

"මම පරක්කු උනාද සුදත්?"

ඔහු දෙස බලා සිටී මෙම රූමතිය, ඔහුට පෙනුනේ විවාහත් ගැහැනියක් ලෙස නොවේ. සුරූපී යෞවනියක් ලෙසය. වචනයේ පරිසමාප්තයෙන්ම ඇය සුරූපීය. අතිශයින් රූමත්ය.

රූ රැජිනක් වීමට සියලු සුදුසුකම් ඇත. විවාහපත් බවක් කිසිදු ඉරියව්වකින් හෝ අඟ පසඟින් හෝ පෙන්නුම් කළේ නැත. උස් ලෑම පෙදෙස, දිස්වන සිහින් ඉඟ, දත් දෙපල, පුළුල් උකුල දිගු වරලස යාත්තමට සිනාසෙන විට පවා කලාත්මක ස්වරූපයක් ගත් නිතඹ පෙදෙස - පා ගමනට අනුව සැලෙන අනෙක් ශරීරාංග ගැන කියනුම් කවරෙක්ද?

සඳෙසේ කිරියන් හට ස්ත්‍රිය වර්ණනාවන්හිදී මැය මූණගැසී ඇද්ද යන්න සැකයක් සුදත් තුළ සමහර අවස්ථාවලදී පහළවී

ඇත.

මෝඩයා ඒ තමන් මවා ගෙන ඉන්න දේවල්. හිත ගිය තැන නැහැ. ඇස් වලින් හරියට බලන්න දකින්න පුරුදු වෙන්න ඕන. ඇහැට පේන දේ හරියට අගයන එකයි මිනිස්කම.

සුදත්ට අනෝමාගේ පෙනුම පොත් පත්වලින් කියවල තිබුන ඇගේ රූපකාය ඒ තරමම මටටමකට ගෙනාවේ තමාගේ ඇස් වල කිසියම් මායාපටලයකින් වැසී තිබුන නිසාවත්ද?

නොඑසේනම් තමාගේ ඒක පාක්ෂික නිරීක්ෂණවල නිරණයක්ද? මහු දැන් ඇය ඉදිරිපිටය.

සිරකුඩුව වෙත ලංවෙමින් ඇය මහු සමඟ සිනාසුනාය.

මේක තේරුම් බේරුම් කරගන්න බැරි අමාරු වැඩක්. මෙච්චර ලස්සන කෙනෙක් දැන් මහත්තයත් මැරිලා. කෝටි ගණනක දේවල් ඉඩෙම අයිතිවෙලා. බැරියැ තව හොඳ කෝටිපතියෙක් එක්ක පැහෙන්න. මේතෙන්ට කැම උස්සගෙන උදේ නවස රෑ එන්නෙ මේතෙන පැය ගණන් ලැගල ඉන්නව. මට කොයි එකත් එකයි. අම්මෙක් අප්පෙක් නැහැ. හැදුනෙ අනාථ මඩමක. නැදැයෝ ඉන්නව නැමෙන්ටම මට නැතුවට. කවුද දන්නෙ නැහැ මේ ලෝකෙට මාව උත්පාද කරපු දෙන්න. දකින්න ඇත්නම් ඒ දෙන්න ගැන අනන්ත හරිම ආසයි.

හොස්ටල් එකෙන් පිටවෙන දවසෙ මැඩම් කිව්වේ "අවුරුදු දාසයෙන් පස්සෙ අපි මෙහෙ තියාගන්නෙ නෑ. ඔහින් හොඳට ඉන්න. හොඳ මිනිහෙක් වෙන්න. කවදාවත් කාටවත් වැරදි කරන්න එපා. මොනව නැතත් අන්තිම වචනෙ අකුරටම පිළිපැදල තියෙනව. මිනිහෙක් මරල හිරකුඩුවෙ. මඩමේ නෝන දැන ගත්තනන්, ඇහුවනන් කොහෙමට හිටීවිද?

කම්මුල් දෙක හොඳට රත්කරල යාවි. ජීවිතේ නැති ඔහොමයි. මඩමෙන් ගියා යකඩ කඩේට. රහිම් නානා ස්ටෝර්ස් කිපර්ට පිං සිද්ධ වෙන්න. ඒත් අහම්බෙන් යකඩ උස්සන්න, ඊට පස්සෙ සේල්ස්මන්, අවුරුදු දෙක තුනකට පස්සෙ, ඒ කාලෙ ලොක්ක වීරසිංහ මුදලාලි. ඊට පස්සෙ මැනේජර්, ඌන් හිරකුඩුවෙ.

මනැස පුරා දිවූ සේයා පටය තත්පර කිපයකින් ඇති මැකී ගියේය.

"මැඩමිටන් හරි කරදරේ මං හින්ද"

දෙදෙනාම සිනාසුනාහ.

අනෝමා ඔහුට ලංව ගෙනැවිත් තිබූ සියලුම පාර්සල් ඔහු අත තැබුවාය.

"කෝ වික්ටර් මහත්තය?"

අනෝමා මල් මල් සිනාවක් පෑවාය.

"ගියා එයාගෙ ආදරවන්තිය බලන්න"

සුදත්ගේ සින කැළඹුනේ එවිටය. වික්ටර් මහත්මයා ඔහුගේ ප්‍රේමවන්තිය හමුවීමට ගොස් ඇත. ඇත්තෙන්ම එය කොතරම් සුන්දර ප්‍රියජනක හමුවීමක් විය හැකිද? එතකොට අනෝමා නෝනා මෙහාට ආවේ? සමහර වෙලාවට?

සමහර වෙලාවට නෙවි ඇත්තටම, ඊයේ අත්දෙක අල්ලගෙන අඩපු ඇඩිල්ල. මේ ඇවිල්ල ඉන්නෙ හිරකාරයෝ බලන්න නෙවී. තමන්ගෙම ප්‍රේමවන්තය බලන්න.

කුඩු මනය නිසා පසෙකට වී නිදන සෝමේ අයියා දෙස බැල්මක් හෙලූ සුදත් කුඩුව ඉදිරියට පැමිණ ඇගේ දෑත් තරයේ අල්ලා ගත්තේය.

අවුරුදු ගාණක් එකට හිටිය ඵළියෙ බැරිවුනා මගේ අතක් අල්ල ගන්න මම මොන තරන් වලිකැවත් දැන් තමයි හිරකුඩුව ඇතුළට ආවව පස්සෙ ඔනැවුනේ.

සුදත් සුරත ඇගේ ගෙලවටා යැවීය. ඇය යකඩ දොරට තව තවත් සමීප වූවාය.

මොන පොලිසියක්ද?

මොන මිනීමැරුමක්ද?

මොන සිර කුඩුවක්ද?

දෙනෑගේ දොතොල් විනාඩි කිහිපයකට යකඩ සීමාව අතරින් හෑවෙයි. එය ආදරයෙන් පිරි ඉතිරිගිය රස මදිරා උතුරායන මොහොතක් විණ. ඔවුන් පියවි ලොවට පිවිසීමට විනාඩි ගණනාවක් ගතවින.

අනෝමාගේ දෙනෙත්වල කඳුළය, සතුට හෝ දොම්නස පසුතැවිලි ආදරය එසේත් නැතිනම් ආත්මීය ජයග්‍රහණයක හෝ පරාජයක යයි නිවැරදි විග්‍රහයක් කළ හැක්කේ කාටද?

ඇය තොඳොල් බසින් යමක් මුමුණන්නට වූවාය. "අපි දෙන්න එලියට ආපු ගමන් කසාද බඳිමු."

සුදත් ඇය දෙස විස්මයෙන් බලා සිටියේය.

"ඇයි සුදත් කතා නැත්තෙ, එපාද මාව" අනෝමා කඩිනමින් ඇසුවාය.

සුදත් නවමත් නිහඬය.

"කියන්න හරි වගෙනෙ. මම දන්නව ඔයාට මම ගැලපෙන්නෙ නැති එක. යෝජනාවම ඔයාට නොකිය මම ම කෙරුව ඒ නිසයි"

සුදත් ඇගේ සුරත තදින් අල්ලා ගත්තේය. "බඳිමු. අදම මේ දැන්ම"

එයට දෙදෙනාම සිනාසෙන්නට වූහ. ඔවුන් මෙසේ සිනාසෙන අතර මෙපමණ වේලා කුඩු මතින් නිදාසිටි සෝමේ නැගිට සිනාසෙමින් පෙරට එනු පෙනිනි.

"මම අහගෙන හිටියෙ ඔක්කොම. මන් ඉන්නව එක සාක්කියකට. වැඩේව තව එක සාක්කියක් ඕනේ"

එයට තිදෙනම සිනාසෙන්නට වූහ.

"සෝමේ අයිය නිදාගෙන හිටියෙ බොරුවට." සුදත් කී විට සෝමේ දුම්වැටියක් දල්වා ගත්තේය.

"මටත් තිබුන මහත්තයෝ ඔය වගෙ කාලයක්. අපිවව දෙන්න ඔන ඒවට. මම නැගිටල ආවෙ වැඩේ තින්දු වුනාව පස්සෙ"

අනෝමා සෝමේ කෙරෙහි තිබූ ගිනමානය ආකල්පය, අවතක්සේරුව වෙනුවට කෘතඥාපූර්වක බැල්මක් ඔහු වෙත හෙලුවාය.

"සෝමේ අයිය කැමතිද වැඩෙට?"

"එක පාරක් නෙවි සිය දහස් වාරයක්. මෙයා නෝනා ගැන හිතින් දුක් විඳින හැටි මන් දැකගත්තෙ මේ දවස් දෙක තුනේ, මඟ බලාගෙන ඉන්නෙ එනකල්, කෑම ගන්න නෙවී. නෝන දැකගන්න, කතා කරන්න, හිනාවෙන්න.

ඇය අකමැත්තෙන් මෙන් සුදන්ගෙන් සමුගෙන නිවස බලා පිටත්ව ගියාය. පසුගිය පැය එකහමාර ඇගේ ජීවිතයේ සුන්දරම කාලය බව ඇයට නැඟින.

දෙවියන්ගෙ හෝ දෙවඟේ වරදකින් නම අපේක්ෂවන් මුදුන්පත්වන පෙර නිමිති පළමුවරට සුදත් ඇය සිප ගැනීම, එය අනෝමාගේ ජීවිතයේ ඇති ස්වර්ණමය මොහොතකි.

අවුරුදු විසිහතරක් පමණ වයස, කිසිවෙකුගේ ආදරය නිරීමට අවස්ථාවක්ද නැත. ආදරය කිරීමට අවස්ථාවක්ද ලැබී නැත. ආදරය කල පෙම්වතාගේ සෙනෙහස ප්‍රකාශිත වූයේ ද සිර කුඩුවේ යකඩ කම්බිවලින් දෙදෙන වෙන්කර තිබියදීය.

කමක් නැහැ. ඒත් නිකන් ඉන්න මට අහල ගියත් ඇති. කසාද බඳින්න යෝජනා කෙරුවෙ මම ඇත්ත දශයෙන්ම ඒ යෝජනාව කරන්න ඔන සුදන්. නැහැ ලැජ්ජාවක් මට සුදත් එකපාරටම යෝජනාව අනුමන කෙරුව. දැන් සුදත් මගේ මම සුදන්ගෙ. ඵල්ලුම් ගහට ගියත් යන්නෙ ආදරේ හිතේ තියාගෙන. එහෙම වුනොත් අපි එක්වෙමු ලබන ආත්මෙ මිනිස් බව ලැබුනොත්."

"ගමන නැහැ- අවසන් පටන් ගැත්ත නෙවි. පියවර දෙක තුනක් තිබ්බ විතරයි. නැහැ- අපි දෙන්නම කාටවත් හීනෙන් හරි වරදක් කරල. ලෝක පාලක දෙවිවරු ඉන්නව. පේන්න ඔන අපි දෙන්නගෙ දුක. මේ ගෙවන්නෙ වෙන කෙනෙකුගෙ පවක්."

"දෙවිවරුන්ගෙන් වැඩක්ම නැහැ. පොලිසියට තියෙනව සාක්කි. ඒව බැහැ බොරු කරන්න. දැනුයි තේරෙන්නෙ අපි දෙන්න ගැන තුන් ලෝකෙම වපර ඇහින් බලල තියෙන්නෙ"

ඒම සල්ලි තියෙන බැඳපු ගැනියෙක් සුදත් මගේ මැනේජර්. එයා මැනේජර් කෙරුවෙ මම. මම සුදත් අල්ල ගන්න හැදුවද? නැත්නම් සුදත් මාව අල්ලගන්න හැදුවද? මේ දෙකම බොරු කතා. අපි හිතින් එකිනෙකාට ආදරේ කලා. එච්චරයි. ඒකෙ ඇති වරදක් නැහැ. දෙන්නම ජීවිතේටම ආදරේ නොලබපු අය. මට ආදරේ ගැන මීට කලින් අත්දැකීම් තිබුනෙ නැහැ.

කෙස්පැහුන පියාගේ වයසෙ එකෙකුට බලහත්කාරයෙන් කසාද බන්දල දුන්න. ඒ කසාදෙ සති දෙකයි. දෙන්න දෙපැත්තෙ. නාත්තගෙ දිවිනසාගැනීමෙන් පස්සෙ මට මිනිහව වහකඳුරු වගේ වුනා. දැනැට පේන්න බැරුව ගියා. හොඳ වෙලාවට නාත්ත එකම එක දෙයක් කරල තිබුන. කසාදබඳින වෙලාවෙදිම යකඩ කඩෙත් මගේ නමට සින්නක්කර විකුණුමකරේකට විරසිංහගෙ අත්සන ගත්ත. එහෙම නැත්නම් මමත් අද්ද ගමේම, මල්ලිල දෙන්න මේවිවර කාලෙකට මේ පැත්තෙ පලාතෙ ආවෙත් නැහැ. ලියුමක් හරි එවුවෙත් නැහැ.

ආරංචිවුනා ඇබ්ලිපිටියෙ, ඇළෙරෙ පැත්තෙ ගිහින් ගරනව

කියල. මේ කලබල ඉවර වුනොත්, සුදත් කස්බාද බැන්දොත්, මේක දිනිරී කාපු කතාව වගෙයි. නාම නඩුව දැම්මෙත් නැහැ. උසාවි ගියෙත් නැහැ. අහසෙ මාලිගා සැනෙන්න හදල සමහරක් පොළවට සමතලා වෙලා.

ජීවිතේ කියන්නෙ සුදුම දෙයක්. ඔතන්නෙ එකක්, කෙරෙන්නෙ වෙනම දෙයක්. කරන්න බලාපොරොත්තු වෙන්නෙ මොකක්ද? ජීවිතයේ විවිධ අපේක්ෂාවන්, ආශාවන්, දහසක් බැඳ අතරමංවූ අනෝමා මනසකින් යුතුවය.

වික්ටර් ඇය එනතුරු නෙත් නොයිවසිල්ලෙන් බලා සිටියේය.

"කොහොමද සුදත්ට?"

අනෝමා මොටර් රිය ගරාජයේ දමා නිවසට ඇතුළු වෙද්දී වික්ටර් ඇසීය.

"අනේ පව්, ඉන්නව කුඩුවට වෙල ගිරව වගේ. රෑට යමු දෙන්නම. දැක්ක ගමන් ඇතුව ලේලි ගෙන"

වික්ටර් කල්පනාකාරීව වටපිට බැලීය. 'අපි උණු උණු පොඩි කතාවක් තියෙනව කියන්න"

"කෝ ජේම්ස්?"

වික්ටර් සරදම් සිනාරැල්ලකින් මුව සරසා ගන්නවා පෙනිණ.

"දෙන්න බරට වැඩ. කුස්සියෙ නැම නදනව"

දෙදෙන දෙවන මහලට ගොස් බැල්කනියේ අසුන් ගත්හ. වික්ටර් අමුතු ආකාරයට අනෝමා දෙස බැලීය.

"නැද්ද බොන්න මොකුත්"

අනෝමා නැගිට ගොස් වීරසිංහගේ හීම රාක්කයෙන් විස්කි බොතලයක් හා අවශ්‍ය දේ රැගෙන වඩු ඉදිරිපිට ටීපොව මත තැබුවාය. මද වේලාවක් ගතවූ පසු වික්ටර් කතා කරන්නට විය.

"මට ජේම්ස්ගෙ හිතවත්කම වැටිය අල්ලන්නෙ නැහැ. අත්ත මොනව වුනත් සොයී යනකොට මට කියල ඕයෙ මේ පේරේ ජේම්ස් දන්නව කියල. මහත්තයල. නෝනල මිනිහගෙන් බේරිල ඉන්න කියලත් සොයී කිව්ව"

"මම හිතන්නෙ ජේම්ස් අහිංසකයෙක් කියල"

වික්ටර් විස්කි උගුරක් සී දුම්වැටියක් දල්වා ගත්තේය.

"ජේම්ස් කෑන් කවුරුවත් නැහැ කියන්නෙ පට්ට පල් බොරු. ඔය එක්ක ඇවිත් ඉන්නෙත් මිනිහගෙ ලඟම ඥාතියෙක්. හෙට දෙන්නම එලවල දාමු. නඳන කෑම බීම මොකුත් කන්නත් එපා." සුදන්ට හෙනියන්නත් එපා. ඔහු අනතුරු අඟවා සිටියේය.

අනෝමා පුදුමයට පත්ව මහු දෙස බලා සිටියේය. "ලේලිමයි කිව්වෙ ජේම්ස් කියාගන්න. කෝකියෙක් ගේන්න. දැන් තනාව වෙනස් කරල."

"මේ නුගේගොඩ හොටෙල් එකට ගිහින් වෙක් කෙරුව. එහෙ කිසිම දවසක මේ නම් කියෙන කෝකියෙක් ඉඳල නැහැ. පස්සෙ මන් පෙන්නුව අයිඩෙන්ටි කාඩ් එක. එකකොටයි අඳනගත්තෙ. හැබැයි වෙන නමකින්."

අනෝමා තවත් පුදුමයට පත්වූවාය. වික්ටර් නැවතත් තහාකරන්නට විය. "මේ ජේම්ස්ව හොඳටම විශ්වාස කෙරුව. ඒත් මිනිහට කියෙන්නෙ දෙබිඩි ජීවිතයක්. මේ ගෙදරම හිටිය වැඩකාර ගෑනු ළමයෙක්, ඔයා මෙහාට එන්නත් කලින් කල්‍යාණි අත්ත දන්නව කතාව. අයිය ගාමන ළමයෙක් ඇතිවෙලා. පස්සෙ ඒ කෙල්ල ජේම්ස්ට බන්දල දිල."

මෙම ප්‍රකාශය ඇසෙත්ම අනෝමාගේ මුහුණ එක්වරම අඳුරු විණ.

"ඉන්නෙ එකට ගණිත්ත බැරුව වගේ"

"ඇන් ඒ ගැනි ගමේ ගෙදර ඉන්නව. ලැබිච්ච ළමය ඇන් ඉලන්දරියෙක්. නැහැ කිසිම රස්සාවක්. රට යන්න පණස්දාහක් පල්ලි ඉල්ලල තියෙනව ගැනි කල්‍යාණි අක්කගෙන්. එයාලගම කිබිච්ච සල්ලි දිල නැහැ. ජේම්ස් හොයාගෙන ඇවිත් තියෙන්නෙ ඊට පස්සෙ."

ලෝකය පුදුමාකාර තැනක් ලෙස අනෝමාට කල්පනා වෙයි. "තොයි මිනිහත් විශ්වාස කරන්න බැහැ. තමන්ට තමන්වත් විශ්වාස කල නොහැකි - කරන්න බැරි කාලයක් මේක"යි අනෝමා සිතන්නට පුරුදුය.

"ජේම්ස් කිව්වෙ කාත් කවුරුත්වත් නැහැ කියල. දිව හැරෙන පැත්තට වචන පිටකරන එක හැමෝම කරන දෙයක්."

මේ අතර ජේම්ස් සහ අලුත් කෝකියා වික්ටර් ලඟට පැමිණ පසෙකට වී බියාදු බැල්මකින් මහුට සංඥා කලහ.

"මොකද මේ ජෝඩුවල?"

"අපි නඳන්නෙ ටිකක් එලියට. පහළියට ගිහින් එන්න. පර් සල්ලි කියක් හරි දුන්නොත් ....." ජේම්ස් යටත් පහත් තාවයෙන් කියා සිටියේය.

වික්ටර් සාක්කුවට දමා තෝරපු කිපයක මිදල් දෙන්වට ජේම්ස් කෝකියාද සමඟ නිවෙසින් පිටව යනු පෙනිණ.

මවුන් දෙදෙනා යනු බලා සිටි අනෝමා "අර කොහේද යන්නෙ?" වික්ටර්ගෙන් ප්‍රශ්න කළාය.

"ඒක උන්ගෙ ප්‍රශ්නයක්. ඒත් අපේ ප්‍රශ්නෙට විසඳුම් ඉන් මේ හොයල තියෙන්නෙ. කැවිවෙලාවත් අපි තුන්දෙනා මේ අක්ක සුදත් හිටියමන් මැරිල ගියොත්, නෝ චේන්ස්. මේ මක්කොම වස්තුව දෙපොල වෙවුනාට"

එම ප්‍රකාශයෙන් අනෝමා කල්පනාවට වැටුණාය. "ඒත් අපි තුන්දෙනාම නාම ඉන්නෙ ගෙදර, පැහැපිටින්. කාටද අවිව මරන්න ඔන කරල තියෙන්නෙ?"

7

නුවරගොඩ පොලිස් මූලස්ථානයේ පැවැති විශේෂ සාකච්ඡාවට සහභාගි වූ සුවිශේෂ පුද්ගලයන් අතර ප්‍රධානියාවූයේ දකුණු කොළඹ නියෝජ්‍ය පොලිස් අධිකාරි ට්‍රැසි අබේසුන්දරය. අනෙක් දෙදෙනා මිරිහාන පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශයේ ඉන්ස්පෙක්ටර් ඩෙරික් තේනබදු සහ උප පොලිස් පරීක්ෂක වික්‍රම ජයවීරය.

නියෝජ්‍ය පොලිස් අධිකාරිවරයා අනෙක් නිලධාරීන් දෙදෙනා දෙස නිරීක්ෂනොත්මක බැල්මක් හෙලීය.

"දැන් කොහොමද මේ විරසිංහ මර්ඩර් කේස් එකේ ප්‍රෝග්‍රස් එක? යි අසමින් ඔහු මිරිහාන පොලිසියේ අපරාධ අංශය භාර ඩෙරික් තේනබදු දෙසට සිය අවධානය යොමු කළේය.

"දැනට එක්කෙනෙක් ඇරෙස්ට් කරලයි තියෙත්තෙ සර්"

නියෝජ්‍ය පොලිස්පති තැන නළල් තලය රැළි නංවා ගෙන හිස සැලීය. "ඔයාලට මේ කේස් එකේ බරපතලකම තාම හරියට තේරිල නැහැ. හැම පැත්තෙන්ම කරදරේ මට. මේ වෙඩි වැදිල

මැරිල තියෙන්නෙ නිකමෙක් කියල හිතනවනේ. විරසිංහ එක පැත්තකින් කෝටපතියෙක්. බලපුළුවන් කාරයෙක්. මැති ඇමතිවරු කීප දෙනෙකුටම ළඟින් ගණුන් වියදුන් කරල තියෙනව. ඒ ගොල්ල හැමදාම අයි. ජී. පී. ට තෝල් දීල කේස් එක ගැන අහනව. අනෙක් පැත්තෙන් පත්තරකාරයෝ අහන ප්‍රශ්ණවලට උත්තරදීල ඉවරයක්ම නැහැ. උත්තර කියල මොනව දෙන්නද? ලංකාවේ අපේ පොලිසියට කේස් එක හරියට හැන්ඩ්ල් කරන්න බැරි විදිහටලු පත්තර වාර්තාකාරයන්ට පේන්නෙ. ඉන්දියාවේ ආර්. ඒ. ඩබ්ලිව් එකට හරි කේස් බාරදෙන්නලු. ඔය වාගෙ අපහාස කතා හැමදාම වගේ කණට ඇහෙනව."

R.A.W. ස්කොට්ලන්ඩ්යාඩ්F.B.I. වගේ අවිට මොනවටද? සුදත් දැනට හිරබාරෙ. "මිරිහාන පොලිසියේ ඕ. අයි. සී.කියන්නත් විය" "ඩෙරික් දිගටම පරීක්ෂණ කරගෙන යනව. එයා දැනව කරන්නෙත් ඒ කේස් එක විතරයි."

නියෝජ්‍ය පොලිස් අධිකාරිවරයා සිනාසෙන්නට විය. එයද සරදමට මෙනි. "මට කවුරු පරීක්ෂණ කෙරුවත් එකයි. නාම කී ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. විරසිංහගෙ නැනිටි, වල්ලිටි දෙන්න තුන්වේලටම ඔය මහලොකුවට හිරබාරෙට අරන් ඉන්නවයි කියන හාඩවෙයාර් එකේ මේජර් කොල්ලට කැම බීම අරගෙන යනව. ඒක ඇත්තක්ද?"

පොලිස් ස්නාධිපතිවරයා හනු දෙස අමුතු ආකාරයේ බැල්මක් හෙලීය.

"පොලිස් කුඩුවෙ ඉන්න කෙනෙකුට කැම බීම දෙන්න පුළුවන් ඔන කෙනෙකුට"

"ඇයි මිනිහ උසාවිදාල රිමාන්ඩ කෙරුවෙ නැත්තෙ"

"නාම පරීක්ෂණ කරගෙන යන්නෙ තව කීප දෙනෙක්ම හිරබාරෙට ගන්න තියෙනව. නැමෝම එකට රිමාන්ඩ කරන්න වෙන්නෙ"

"පත්තරකාරයොයි. දේශපාලනකාරයොයි. විරසිංහගෙ ඥාති මිත්‍රයොයි නැමෝම කියන්නෙ විරසිංහ මැරුවෙ දැනට හිරබාරෙ ඉන්න සුදත්. අනේම කියන විරසිංහගෙ තරුණ ගැනි නිතරම දේපලවලට සංඛු සරුවල් ඇතිකර ගන්න විරසිංහගෙ මල්ලි පික්ටර් කියන තුන්දෙනා එකතුවෙලා තියල"

ඩෙරික් සමච්චලයට මෙන් කියාසුනි. "පොලිසිය නැතුව ඔය කියන හිතිස්සුන්වම පරීක්ෂණේ බාරදුන්නාම ඉවරයිනේ. සැකකාරයෝ තේරා අත් අඩංගුවට දාම උසාවිය-"

නියෝජ්‍ය පොලිස්පති තනුමේ කතාවට බාස් කැපිය. ඩෙරික් ගේ කියන දේ නරියට"

"මට තේරෙනවා සර්. ඔයා බැල්මට නැති මෝඩයෙ තේන්නෙ ඔය විදියට. ඒත් පරීක්ෂණ කරගෙන යන මට තේන්නෙ වෙන විදියකට"

නියෝජ්‍ය පොලිස්පති තුමාගේ පෙනුම වෙනස් විණ. දෙනෙත් මහත්වී නළල රැළි නැංවිණ.

"මේ තුන්දෙනා ඇරෙන්න වෙන මොකාටද විරසිංහ මරන්න තියෙන උවමනාව"

"ඒ වැන තමයි නොයාගෙන යන්නෙ?"

"ඔබ කියන්නද එතන?"

"ඊට කලින් සර් අහන්න මේ කියන කතාව. ඔය අනෝම විරසිංහගෙ අන්තිම කිව්ද. දන්නවද වයස කීයද කියල?"

තේරුම් පොලිස් අධිකාරී ධ්‍රැසී අබේසුන්දර කෝපයට පත් බැල්මක් හෙලීය.

"ඒ නැතිගේ වයස මේතෙන්ට මොනවටද?" ඔහු තරමක් තේන්තියෙන් ප්‍රශ්න කළේය.

"මේ අහන්න සර්. අනෝමගෙ වයස තාම අවුරුදු විසිදෙකයි. විරසිංහගෙ වයස හැට පහයි. කොහොමද ගැනිගෙයි මිනිහයෙයි වයසෙ තියෙන පොඩි පරතරේ"

"ඔයස පරතරේ කේස එකට අදාල වෙන්නෙ කොහොමද?" ඩෙරික් තේනබද තම පොලිස් ස්ථානයේ ඕ. අයි. සී. මහතා වෙත හැරුණි. "සර්ම කියන්නකෝ ලොකු හෙන්තයට ඔය දිග විස්තරේ කේරුම් බෙරුම් කරල"

මිරිහාන මූලස්ථාන පොලිස් ස්ථානාධිපතිවරයා නියෝජ්‍ය පොලිස්පති තැන දෙස විනාඩි කිහිපයක් වමසිලිමත්ව බලා සිටියේය. ඉන්පසු කතා කරන්නට විය.

"මය මැරිච්ච විරසිංහ ඇවිල්ල නොමේරෙ රහේ ඩේඩද්දෙක්. ඒ වගේම සල්ලාලයෙක්"

"සමාජේ ඩිළි අරගෙන තියෙන්නෙ වෙන විදියකට. නියම දානපතියෙක්. සමාජ සේවකයෙක් නැවියට" නියෝජ්‍ය

පොලිස්පති කතාවට හරස් කටඉල්ලා සිටියි.

මිරිහාන පොලිස් ස්ථානාධිපතිවරයාගේ මුහුණ පැහැදී කැටි සිනාවක් නැඟිණ.

"අපිත් ඉතිදී යිවවුනා ඔය හරි කියන වැරදි හමුව.ඇතුල්වෙන්න හරියට නෙවී, ටිකක් හාය අවුස්සලා බලන කොට තමයි ඇත්ත මොකක්ද කියල වැටහෙන්නෙ"

"බොරු අපහුංගෙ කැතුව කියන්න හරි විස්තරයක්"

පොලිස් ස්ථානාධිපතිතුමා දිගු විග්‍රහයකට පූර්ව සිහිවෙන් මෙසය මත තිබුන වතා ජෝක්කුවෙන් පිටුපැවිත් හොඳ අවසන් කොට කතාව ඇරඹුවේය.

"සර්, අනෝම කියන්නෙ විරසිංහ කියන මිනිහගෙ දුවකගෙ වයසෙ කෙල්ලෙක් කසාද බැඳල තියෙන්නෙ මහ උප්පරවැට්ටියක් දාල. ඩෙරික් කියන්න ඉතුරු හරියට රහසෙන්ම සර්ට තේරෙයි අපි කරගෙන යන්නෙ මොනවද කියල"

පොලිස් ස්ථානාධිපතිතුමා අවසන් කළ කෑන්ට් විදි අපරාධ පරීක්ෂණ අංශයේ ප්‍රධානියා වන ඩෙරික් තේනබදු දිගා කතාවකට මුල පුරන්නට විය.

"විරසිංහයි, අනෝමගෙ තාත්ත ගත්තායකයි දෙන්න අඳුරුදු දනයක් පහලොවක් විතර එකට බිස්නස් කරපු හොඳ, කාළෙක මදන්නෙක්"

"කියද අනෝමාගෙ තාත්තගෙ වයස?"

"එයාටත් හැට ගණන්"

"එතකොට මොන කෙන්ගෙඩියටද තමන්ගෙ ලාබාල දුව තමන්ගෙම වයසෙ නාකියෙකුට බන්දල දුන්නෙ?"

ඩෙරික් සිනාසෙන්නට විය. "කැමැත්තෙන් බන්දල දුන්න නෙවී. දුව බන්දල දෙන තැනට නැත්නම් දුව බන්දල නොදී ඉන්න බැරි තත්වෙට විරසිංහ නියම ගෙඩියක් කෙරුව"

"බිස්නස්කාරයෝ කියන්නෙ නොමේරට රහේ මහවී කාරයින්ට. සර්සාධාරණ එක්කෙනෙක් ගැන නිකරුවෙන් හෙව තියෙනවද? ඒව පැත්තක දාමු. මොනවටද ඔය කලපෙණිය තමන්ගෙ පොඩි කෙල්ල මේ හද්ද හම්පව නාකියට බන්දල දුන්නෙ?"

"මෙන්න මේකයි සර් සම්පූර්ණ කතාව"

විරසිංහගේ වාග්සමීකරණය කළ කාර්යාලය තුළ මහ

ඉදිරිපස සැපපහසු පුටුවේ වාඩිගෙන සිටියේ ජජනායකය.

ජජනායකගේ මුහුණ අඳුරු පෙනුමකින් යුක්තය.

"එතකොට මුදලාලි මය අරාබිකාරය කියන්නෙ මම ගෙනත් දුන්නෙ මැණික් නෙවි වීදුරු ගල් කියලද?"

විරසිංහ තෝපයට පත්වූවාක් මෙනි.

"ගෙනත් දුන්න කියනව නෙවි. ගෙනත් දීල තියෙන්නෙ. තමන්ගෙ හින දැනුවත්වම පාට කරපු පලිඟු ගල් ජජනායක. නමුත්ගෙ මය කපටි ජරාවැඩෙන් ඒ කෝටිපති අරාබිකාරයගෙයි මගෙයි අවුරුදු ගාණක ඉඳල තිබුන විශ්වාසෙත් නැතුව ගියා. ගනිවිද මිනිහ මගෙන් මැණික් ගල් මිට පස්සෙ. මිනිස්සු රැවටෙන්නෙ එක පාරයි. හැදෙම නෙවි. අනික මේව රුපියල් දහ දෙදහෙයි. ලක්ෂ ගණන්වල බිස්නස්....."

ජජනායක දැන් බියපත්වය. ඔහුගේ දෙනෙත් කඳුලින් බරවී ඇත.

"මොහ කාලකන්නි අරාබිය, කොයි දේ කිව්වත් මට විශ්වාසයි. මම හෙනත් දුන්න ගල් නෙත. මේවිටර කාලෙකට මම කරල තියෙනවද මය වගෙ පාහර වැඩ?"

විරසිංහ දත් විලිස්සන්නාට විය.

"හැමදා නියං එකදා වැහි වලාවෙ. කිව්වලු කෙරුවේ එක පාරයි. තමුසෙට මොකද මන් නැතිවුනාව, වෙන එකෙකුට ගල් විකුණාවි. මගේ හොඳ හනුදෙනුකාර අරාබිය මට නැතුව ගියා. ඒකයි මට හිතට අමාරු."

"මුදලාලිට අරාබිය නැතුව ගිය. මට සමරට පැත්ත පලාතට යන්න සැරුව ගියා. මම හොනාවේ මගේ පතල්වල ගල් නෙවි. පතල්කාරයින්ගෙන් ගත්ත ගල්. ලක්ෂ පහලොවක් කිව්වම මුදලාලිට ආසයක් නැතුව ඇති. ඒත් අපිට අපේ ගම්පළාත්වල මිනිස්සුන්ට ලක්ෂයක්, දෙකක් කිව්වම ඉවරත් උඩින් යන ලොකු ගානක්"

විරසිංහ ඔහු දෙස ටික වෙලාවක් කල්පනාකාරීව බලා සිටියේය. "මම නොදන්නවයි ඒ වග. තමාගෙ දෛවට මම කී දවසක් ගිහින් නැවතිල ඉඳල කාල බීල මය කියන පතල්කාරයො හම්බවෙලා ඇඩ්වාන්ස් එහෙමත් දීල තියෙන්නෙ"

පාසැල් වියේ සිටි සුරුපි නරුණ අනෝමාට "විරසිංහ අන්කල්" මුණ ගැසී ඇත. ඇඳින ගැනීමට ඉඩකඩ කැලඹිනේද

මෙම ගමන් බිමන්වලදීය. සල්ලාල විරසිංහගේ උකුසු නෙත් ඇය වෙත යොමුවූයේද මේම ඩකවාතුවේදීය.

ගිල්ලිහිණියා මස් කෑමෙන් ඒවත්වන රෑදුරු පක්ෂියෙකි. නමුත් ඉතාමත්ම ඉවසිලිවන්තය. ගොදුරක් දුටු පමණින්ම එය ගිල දැමීමට හෝ ගිලගැනීමට නැත්තිරීම උගේ සුරුදු නොවිය. සල්යල්බලා නියම අවස්ථාව නා වාතාවරණය සැකසුණ පසු තම අභිලාෂය ඉටුකර ගැනීම ගිල්ලිහිණියාගේ ජාන්ම සුරුදුයි.

එනකොට මුදලාලි දන්නවනේ මේ පතල්කාරයින්ව පලිලි නොගෙවිවොත් වෙන්නෙ මොනවද කියල. උන් මාව මරල දාවි. හෙවල් දොරවල් ගිහිං තියාවි. ඒ විතරක් නෙවි අපේ දරුමල්ලොත් නැතිකරල දාවි. අම්මත් නැති අඹිංසක කොල්ලො දෙන්නයි, කෙල්ලයි මේවට පලි නෑ."

"ජජනායක, තමුසෙගෙ පවී මට හෙවෙන්නද කියන්නෙ" විරසිංහ තරමක උස් ස්වරයෙන් විමැසිය.

ජජනායක අනුකම්පාව අයදින ආකාරයේ බැල්මක් විරසිංහ දෙස හෙලුවේය.

"මම මොකොහොමද පතල් කාරයන්ට මුහුණ දෙන්නේ. මොනවද ඒ මිනිස්සුන්ට කියන්නෙ. මේ කියන බේනල් උන් නිකමට හරි විශ්වාස කරාවි කියල හිතනවද?"

"ඒකට මම මොනව කරන්නද? තමාගේත්ගත් කරදර කරන්න එනව එහෙම නෙවි. හොඳ වෙලාවට මේ අරාබිකාරයා ගෙන් සල්ලි අරගෙන නොහිටුන එක" යි පවසමින් විරසිංහ මේස ලාච්චුව විවෘතකර කුඩා ප්ලාස්ටික් බෙදුසාවක් අතට ගත්තේය.

"මේ තියෙන්නෙ තමුසෙගෙ හිරුවාන ගල්මිත. ඔහිල්ල දෙනව විකුණන්න දුන්න පතල්කාරයින්වම ආපහු. හොර හැත්ත අපින් උගස් කියන්නයි හැදුවෙ එහෙනන්"

විරසිංහ විසින් මේසය හරහා තල්ලු කරන ලද බෙදුසාව දෙස ජජනායක විමතියෙන් හා කුතුහලයෙන් යුතුව මද වේලාවක් බලා සිටියේය.

"අරාබිකාරය මම දුන්නෙ පාට කරපු හිරුවානා ගල් කියල කොහොමද කියන්නෙ? මට ඉන්නව ගල් දුන්න පතල් කාරයො සාක්ෂියට. ඒ මිනිස්සු පොලීසියම්"

වීරසිංහ සමච්චලයට මෙන් සිනාසෙන්නට විය.

"පොලිසිය බැරිනන් යන්න කියනව උසාවි හරි. අරාබිකාරය ගල් ගන්නෙ. මේචර කල් ගත්තෙත් කොමිප්‍රුවරේට ගල් ඩැක්කරල තමුසෙල අපි වගේ නොවෙයි"

ගජනායක ඔහු දෙස සැකමුසු බැල්මක් හෙලීය. "නොදයි මය අරාබිය අපේ නොද ගල් ටික මේවට මාරුකරල තිබුනොත්?"

වීරසිංහ මෙයට තදින්ම කෝපයට පත් බවක් හැඟවීය. "මේ ගජනායක! තමුසෙ මගේ යකා අවුස්සන්න එපා. තමුසෙගෙ මුය ලක්ෂ දහය පහළොව උන්ට කප්පු ඇට කොස්ඇට වගෙයි. සවුදිඅරාබියෙ කෝටියක්. ප්‍රංශෙ, ඊංගලන්තෙ, ඇමරිකාව වගෙ රටවල් වල කෝටි ගණන් වටින රේස් අශ්වයො හිට ඉන්න ලොකු බිස්නස්කාරයෙක්. ඒක නේ මම මිනිහ අල්ලගෙන ඉන්නෙ"

"මම මොන යකා කෝටිපතිය වුනත් එකයි. දිවියලෝකෙ නැතිනන් අපායෙ හරි රේස් අස්සයො හිටියත් උඹ කරල තියෙන්නෙ අන්තිම පාහර, බලු වැඩක්. ඔය දෙන්නටම ගානක් නැහැ. මමයි මේකෙන් අමාරුවෙ වැටුනෙ"

"අමාරුවෙ නොවැටි බිස්නස් කරන එක තමන්ගෙ වැඩක්"

මේ අවස්ථාවේදී මෙපය මත රැඳි දුරකථනය නාද වුයෙන් වීරසිංහ එයට පිළිතුරු දෙද්දි ගජනායක අන්දමන්දව බලා සිටියේය.

විනාඩි කිපයකින් දුරකථන සාකච්ඡාවේ නියැලි සිටි වීරසිංහ මිඩිවරය තැන්පත් කර යළි ගජනායක දෙස බැලීය.

"දැන් මට තියෙනව ලොකු බිස්නස් වැඩකට යන්න. ඔය ගල් ටික අරගෙන ගිහින් දෙනව දුන්න එවුන්ටම. වියදමට එරින් නෝනගෙන් රුපියල් පන්දාහක් ඉල්ලගෙන යනව"

දැන් වීරසිංහ යාමට යාමට සූදානම් වී හිටගෙනය. ගජනායක අප්‍රාණිකව තවමත් පුටුවේ හිඳගෙනය.

"එහෙකොට මුදලාලි?"

වීරසිංහ අඩි කිහිපයක් ඉදිරියට තබා දොරටුව අසලට ගොස් අවසන්ය.

"එහෙකොට නෙවි. ගැම දේටම මට කරන්න සිදුවුන් දේ එවිවරයි. රුපියල් පන් දාහක් අරගෙන යනව. ඒකත් කරන්නෙ අඩුරාදු ගානක් ආස්සරේ පාරද මනුස්ස ගමට"

කාර්යාලයේ විවෘත ද්වාරයෙන් පිටව යන වීරසිංහ දෙස අසුනේ සිටි ගජනායක තෙත් අයාගෙන සිටියේය. ඔහුත් මැණික් ගල් සහිත මංජුසාව අතැ'තිව ඔහු ස්වල්ප වේලාවකින් මේපය මත හිස නඹා ගත්තේ ය.

ඔහු කොතෙක් වේලා ඒ ඉරියව්වෙන් සිටියාද යන්න ඔහුට මතක නැත. ගැහැණු කටහඬක් සවන් වැකෙන්ම ඔහු හිස ඔසවා බැලීය.

"ආ..... මිස්ටර් ගජනායක, මේ වෙලාවෙ නිදි. මෙන්න බොස් රුපියල් පන්දාහක් දෙන්න කිවුව"

ඒ වීරසිංහ සමූහ ව්‍යාපාරයේ කලමනාකාර අධ්‍යක්ෂිකා එරින් දල්පනාදුගේ කටහඬය.

ගජනායක ඇය දෙස දුක්මුසු බැල්මක් හෙලා අතැඳි රුපියල් පන්දහස සහිත ලිපිකවරය දෙස බැලුවේය.

එරින් දල්පනාදු දැන් පනස් දෙවැනිවියේ පසුවන ගැහැණියකි. වීරසිංහ සමාගමේ සේවයට පැමිණ දැනට අවුරුදු විසිපහකටත් වැඩිය. සමාගමේ සේවයට බැඳෙන විටත් ඇය අවිවාහකය. දැනුදු එසේමය. එහෙත් ඊට එකම වෙහෙසත් නිදුකි.

වසර විස්සක් පමණ ඇය වීරසිංහගේ එක් අනියම් බිරිඳකි. නාමත් එලෙසමය. නුගේගොඩ නිස්කලංක පෙදෙසක නවීන පන්නයේ නිවසක්. මෙහෙකාර මෙනෙකාරියන්, සුපිරි මෝටර්රියක්, ස්ථිර මාසික ආදායමක් සමඟ ලක්ෂ කිපයක ස්ථිර ගිණුමක හිමිකාරියක් ද වූවාය. ඒ සියල්ල මේනෙස් කල් වීරසිංහගේ අනියම් බිරියක් ලෙස ජීවත්වීමේ ප්‍රතිඵලයන්ය.

"මොකද ඔලුවෙ කැක්කුමද? යි විසෙමින් ඇය වීරසිංහයේ අසුනට යාබද අසුනේ වාඩිවුවාය. "ඉන්න මම මොනව හරි බොන්න ගේන්න කියන්න"

ඇය මෙසය රැඳි මෙවලමක බොන්නමක් නඳකර ගජනායක දෙස බැලුවාය.

"මේ රුපියල් පන්දාහ බොස් දෙන්න කියල ගියෙ?" ඇය මුදල් සහිත ලිපි කවරය ඔහු දෙසට දිගු කළාය.

ගජනායක එදෙස පිළිකුල කැවී බැල්මක් හෙලීය.

"ලක්ෂ පහළොවක් ඕන තැනට රුපියල් පන්දහසකින් මොනව කරන්නද?"

එවිට සිසිල් බීම බෝතල් දෙකක් රැගත් කාර්යාලයේ

සේවකයෙකු පැමිණ එය මෙසයේ තැන්පත්කර ඉවත්ව යාමට සූදානම් විය. එහේත් ඊට පෙර එරින් දල්පනාදු සේවකයා අමතා "දොර හොඳට වහගෙන එළියට ගිහින් ඉන්නව කාටවත් ඔෆිස් එක ඇතුළට එන්න දෙන්න එපා." නියෝග කළාය.

අනගුරුව ඈ ගජනායකට සිසිල් බීම වීදුරුවක් පිළිගැන්වුවාය.

"හරිම කපටි මිනිස්සු ටිකක් නේ මිස්ටර් ගජනායක මෙදාපාර මාව්ට වෙලා තියෙන්නෙ..... කවදාවත්ම නැතුව, අද ඊයේ බිස්නස් කෙරුව කෙනෙක්යැ?"

ගජනායක සිසිල් පැන් වීදුරුව පානය කරන අතර එරින් දල්පනාදු දෙස බැලුවේය.

"මම කාටවත් රැවටුනෙත් නැහැ. අහුවුනෙත් නැහැ. මම මැණික් ගල් බිස්නස් කරන්නෙ අවුරුදු විස්සෙ ඉඳලයි. මට හිතෙන විදියට ඕය අරාබිය..... මුදලාලියි මාවයි දෙන්නම නියමෙට රැවැට්ටුව"

එරින්ගේ මුහුණ යාන්තමට අඳුරු වූවාක් මෙනි.

"එහෙම කියන්නෙ කොහොමද? මිනිහ බොස් එක්ක ගනුදෙනු කරන්නෙ කෝච්චර කාලෙක ඉඳලද?"

"ඒක වෙනම කතාවක්. මෙතන මොකක් හරි මගඩියක් සිද්ධවෙලා තියෙන්නම ඕන"

දුරකථනය නාදවූයෙන් එයට පිළිතුරු දීමෙන් පසු එරින් නැවත ඇගේ අවධානය ගජනායක වෙත යොමු කළාය.

"දැන් අරාබිය නෙවි ප්‍රංශකාරය ගැන කල්පනාකලත් මොනවටද? මට වැඩ තියෙනව. මේ පත්ඉහ අරගෙන ගමට යනවද?"

ගජනායක අසරණ, අනිංසක බැල්මක් එරින් වෙත හෙළීය.

"මේ අහන්න නෝන. මම පතල්කාරයින්ට දෙන්නම තියෙනව ලක්ෂ පහලොවක්. ඒ සල්ලි නැතුව මට ගමට පය ගහන්න බැහැ කොහොමත්ම. උන් මාව මරාගෙන කාවි. ඒ විතරක් නෙවි. මගේ ළමයි ලපටි, ගේ දොර ඉතුරු කරයිද?"

එරින් ඔහු දෙස අමුතු ආකාරයේ බැල්මක් හෙලුවාය.

"ඔය ලක්ෂ පහලොව පතල් කාරයින්ට ගෙවන්නම ඕනද? බැරිද කල් ගන්න. පහුවෙලා බිස්නස් කරන ගමන් ටික ටික ගෙවන්න"

ගජනායක උපහාසයෙන් යාන්තමට දත් විලිස්සීය.

"විකාර කතා, උන් දෙයිද මට ගල් මින් මත්තෙ කරල තියෙන වංචාවෙ හැටියට"

"මොනවද එතකොට කරන්නෙ?

ගජනායක මඳ වේලාවක් එරින් දෙස එක එල්ලේ බලා සිටියේය.

"බැරිද මුදලාලිගෙන් අතමාරුවක් කරල දෙන්න. මම ටික ටික ගෙවනව පොළියත් එක්ක"

එරින් උස්හඬින් සිනාසෙන්නට වූවාය.

"අවුරුදු විසිපහකටත් වැඩිය එයාගෙම කොම්පැනියෙ වැඩකරන මටවත් බැහැ එක ලක්ෂයක නමාරක ණයක් ගන්න"

"මම ගන්න සල්ලි සතේට ආපනු ගෙවන්න පොරොන්දු වෙනව"

"ඒක වෙනම කතාවක්. මම කියන්නෙ ණය ගනුදෙනුව නොකෙරෙන වැඩක්. හැබැයි ලක්ෂ පහළොවක් නෙවි ඊටත් වැඩි ගාණක් මිනිහගෙන් ගන්න පුලුවන් එක දෙයක් තියෙනව කරන්න"

ගජනායකගේ මුහුණ තරමක් පැහැපත් විය. දෙදෙනම බලාපොරොත්තුවේ අමුතු දීප්තියක් එක්වී ඇත.

"මම ඔනම දෙයක් කරනව මේ ණය ටික ගෙවල දාන්න පුලුවන් විදියට වැඩ කෙරෙනවනන්"

එරින් සිසිල් පැන් වීදුරුව නොලගාන අතරම, ගජනායක දෙස ගැඹුරු බැල්මක් හෙලුවාය.

"මම කියන්නද කරන්න තියෙන එකම එක වැඩේ?"

ගජනායක දැන් කුතුහලයෙන්ය. "කේවල් නොකර නෝන කියන්කො බලන්න"

"ගජනායකගෙ දුවක් ඉන්නව නේද?"

"ඔව්, ඉන්නව, ඉස්කෝලෙ යනව"

එරින් නැවතත් නිහඬව මඳ කල්පනාවේ ගිලී සිටියාය. ගජනායක දැඩි නොසන්සුන්තාවයෙනි.

"සල්ලි ගන්නම ඕනනන් දුව අපේ බොස්ට කසාද බන්දල දෙන්න වෙනව"

මේ වචන කිහිපය ගජනායකට දැනුනේ වැහි නැති අකුණු සැරයක් හිස මත පතිත වූවාක් මෙනි. සෙල් මුවා පිළිරුවක්

මෙන් ඔහු දෙනෙත් අයාගෙනම ඇය දෙස බලා සිටිත්ය.

"නෝහට පිස්සු හැදිගෙන එනවද මන්ද? මගේ කෙල්ල තාම ඉස්කෝලෙ යන පොඩි එකී. මේ හැට පැනපු නාකියෙකුට දීග දෙන්නද කියන්නෙ?"ඔහු තරමක උද්වේගීව ඇසුවේය.

දැන් එරින් ගේ දෙතොලේ සරදම සිනාවකි. "මට ඒක ප්‍රශ්නයක් කොහෙත්ම නැහැ. මම කිව්වෙ සල්ලි සොයාගන්න පුලුවන් එකම විදිය ගැන විතරයි. "

ඉජනායක නිහඬව, නිසලව, එරින් දෙස බලා සිටිත්ය.

"නමන්ගෙ වැඩෙත් කෙරෙනව. මනමාලිගෙ පැත්තෙන් කියල එක තඹ සතේක වියදමක් නැහැ. රත්තරන් බඩු, ඇඳුම්, පැළඳුම් , ජීවත්වෙන්න තට්ටු දෙකේ බංගලාවක්, අතට පයට වැඩකාරයො, යාන වාහන ඒ විතරක් නෙවි ලොකු හාඩ්වෙයාර් එකත් තනි අයිතියට එයාගෙම නමට"

"ඇතෙක් බරට වස්තුව හම්බවෙන එක නෙවි, විරසිංහ මගේ වයසෙ"

එරින් නොමනාපයෙන් ඔහු දෙස බැලුවාය.. "මිස්ටර් ඉජනායකට නොතේරෙන තව දෙයක් තියෙනව. ඔය සිදියට කෝටි ගණන් දේපොල සල්ලි වියහියදන් බලන කොට බොස්ට පුලුවන් ඉජනායකගෙ දුලවගෙ දුසිමක් හොයාගන්න"

ඉජනායක කිසිත් නොකියා තුමූනිමුහුනව වූ ස්වභාවයෙන් ඇය දෙසම නෙත් රැඳවාගෙන සිටියේය.

ඩෙරික් තේනබදු තම විස්තර කථනය හමාර කොට නියෝජ්‍ය පොලිස්පති ට්‍රැයි අබේසුන්දර දෙස බැල්මක් හෙලීය.

"මන්න ඔය විදියට තමයි සර්, විරසිංහ, අනෝමා කසාදෙ කෙරුනෙ. දුව නාකි මනමාලයට බන්දල දුන්න. ලක්ෂ පහලොව අරගෙනපනල් කාරයන්ගෙ ගනුදෙනු බෙරුව. ඉජනායක ඊට පස්සෙ ආගිය අතක් නැතුව ගියා. කසාදෙට හරියටම සුමාන දෙකකට පස්සෙ ගල්ඔය පැත්තෙ යාළුවෙකුගෙ ගෙදර ගිහින් මැහිතෙල් බීල මිනිහ ජීවිතේ නැතිකරගත්ත"

"කොහොමද දන්නෙ?"

"දුවට ලියුමක් එවල නිබුන වහ බොන්න කලින්. ලියුම හම්බවෙන කොට මිනිහ මැරිල ඉවරවුලි"

"තාත්තගෙ මරණෙට මොකෝ උනේ?"

"මොනව වෙන්නද? අනෝම කසාදෙන් පස්සෙ තාත්තගෙ

වුණවත් බැලුවෙ නැහැ. මළගමට ගියෙත් නැහැ. කසාදෙත් එතනින්ම ඉවරයි"

"තාත්ත වහබීල මැරුනට පස්සෙ අනෝම විරසිංහගෙන් වෙන්වෙල වෙනම, ඒත් එක ගෙදර ජීවත්වුණා"

"වෙඩි තියන කොටත් දෙන්න වෙන්වෙලාද හිටියෙ?"

"ඔව්"

"අනෝමට තිබුන කසාදෙට අකමැති වෙන්න"

තේනබදු තම ජේෂ්ඨ නිලධාරියා දෙස නොරිස්සුම් සහගත බැල්මක් හෙලීය. "තාත්ත, අයියල මල්ලිල දෙන්නටත් කොරු කියල අනෝම කොළඹ විරසිංහගෙ පිටකෝටියෙ බංගලාවට එක්ක ඇවිත් එතනදි බලහත්කාරයෙන් කසාද බැන්දුව"

ට්‍රැයි අබේසුන්දර මිරිහාන පොලිසියේ පොලිස් නිලධාරීන් දෙදෙනා දෙස නිරීක්ෂනාත්මක බැල්මක් හෙලීය.

"එතකොට මේ කසාදෙ ගැන විරසිංහගෙ මල්ලි වික්ටර් දැනගෙන හිටියෙ නැද්ද?"

"එයා ගෙදර එන්නෙ කලාතුරකින්"

"අයිය එක්ක නිතරම සන්ඩු කරගත්ත නේද දෙතොලවලව"

"එහෙම වෙලා තියෙනව"

"අනෝමයි වික්ටරුයි දෙන්නත් හොඳට හිතවත් කමෙන් නේද ඉඳල ත්යෙන්නෙ?"

ඩෙරික් හිස සලා අනුමත කළේය.

අනෝම, විරසිංහත් එක්ක තරහවෙලා එයාට ලියල දුන්න යකඩ කඩේ මැනේජර් සුදත් එක්ක යාලුවුන එකත් ඇත්ත?"

"ඒකත් සම්පූර්ණ ඇත්ත"

"විරසිංහගෙ මරනෙන් මිනිහට අයිති හැම දේපොලක්ම අනෝමට අයිතිවෙනව. සුදත් කසාද බැන්දම අනිවාර්යයෙන්ම දේපොල මිනිහටත් අයිතිවෙනව. දෙන්නගෙ කසාදෙට සපෝට් එක දුන්න විරසිංහාගෙ මල්ලි වික්ටර්ටත් අය්යගෙන් නොලැබිච්ච අයිතිවාසිකම් හම්බවෙනව"

පොලිස් ස්ථානාධිපති සහ ඩෙරික් තේනබදු නියෝජ්‍ය පොලිස්පතිවරයා දෙස බලාගෙන සිටියේය.

"එහෙම වෙන්න ඉඩ තියෙනව. වික්ටර් අනෝමා දෙන්න විහාම හිරබාරයට අරගෙන සුදත් කියන හාඩ්වෙයාර් මැනේජරුත් එක්ක උසාවියට ඉදිරිපත් කරන්න.

ඩෙරික් තේනබදු අවිනිශ්චිත ස්වභාවයකට පත්විය.

"වීරසිංහට වෙඩි තියන වෙලාවෙ අනෝම ගෙදර ඉඳලවත්, වික්ටර් කොළඹ ඉඳලවත් නැහැ. ගෙදර කුස්සි අම්මට කළින් දවසෙ ටෙලිග්‍රෑම් එකක් ඇවිත් ගමට ගිහින්, ජේම්ස් කියන ගෙදර වැඩකාරයට ටෙලිෆෝන් කෝල් එකක් ඇවිත් මරදානේ ස්ටේෂන් එකට ගිහින්, අනෝම ගිහින් තියෙන්නෙ නානුඔයද බදුල්ලෙද ඉන්න එයාගෙ යාලුවෙක් හම්බවෙන්න කොටුවෙ ස්ටේෂන් එකට. යාළුව එව්ව ලියුමත් අපි ලඟ තියෙනව."

"ලියුමෙ කතාවෙන් වැඩක් නැහැ. වෙක් කෙරුවද අනෝම එදා ස්ටේෂන් එකේ හිටියද කියල?"

"ස්ටේෂන් මාස්ටර්ට හොඳට මතකයි අනෝම ගැන. යාලුව බදුල්ල කෝච්චියෙන් නාව හින්ද ඊලඟට තියෙන්නෙ බදුලු කෝච්චිය ගැන අහල තියෙනව එස්. එම්. ගෙන් දෙතුන් පාරක්ම"

"ජේම්ස් කියන මිනිහට කවුද ටෙලිෆෝන් කෝල් එක දුන්න මරදානෙ ස්ටේෂන් එකට එන්න කියල?"

තේනබදු තම උසස් නිලධාරියා දෙස එක එල්ලේ බලා සිටියේය.

"එතන තියෙනව බරපතල ප්‍රශ්නයක්, ඒ වගේම ගැටළුවක්, ජේම්ස් දිවරල කියනව එයාට ගෙදරට කෝල් එක දුන්නෙ නෝන, අනෝම නෝනමයි කියල. කටහඬ අනෝමගෙම විත්තිය එයාට හොඳටම විශ්වාසලු."

නියෝජ්‍ය පොලිස්පති තැන නළල රැලි නංවා ගත්තේය.

"අනෝමද කෝල් එක දිල තියෙන්නෙ?"

"නැහැ, එයා ප්ලැට්ෆෝම් ටිකට් එකක් අරගෙන ස්ටේෂන් එක ඇතුලට ගිහින් කෝච්චිය එනකල් බංකුවක වාඩි වෙලා ඉඳල තියෙන්නෙ. ටෙලිෆෝන් එකක් අහලකට ගියෙවත්, ජේම්ස්ට තියා වෙන කාටවත් කෝල් එකක් දිලත් නැතිය කියනව"

"එතකොට සොපී"

"සොපීට ගෙදරින් ටෙලිග්‍රෑම් එවලත් නැහැ. ගෙදර කරදරයක් තිබිලත් නැහැ."

"කවුද එතකොට ටෙලිග්‍රෑම් එක ගහල තියෙන්නෙ?"

"ඒකත් විසඳන්න බැරිවෙච්ච ගැටළුවක්. හැබැයි ටෙලිග්‍රෑම් එක ගහල තියෙන්නෙ පොල්ගහවෙල පැත්තෙ පොඩි කැපැල්කන්තෝරුවකින්. සොපීගෙ ගෙදර ඉන්න

සහෝදරයෙකුගෙ නමින්" 125

"ඒ සහෝදරයගෙ කට උත්තර ගත්තද?"

"ඔව්, ඒ මිනිහ නැපැල් කන්තෝරුවෙ පැත්තෙ නිකමටවත් ගියෙවත්, ටෙලිග්‍රෑම් එක ගැහුවෙත් නැතැයි කියනව"

නියෝජ්‍ය පොලිස් අධිකාරිවරයා බිමට දෙතෙත් නැහුරු කොටගෙන පැනෙන් මෙසයට තට්ටු කරන්නට විය.

"මේ ඉන්වෙස්ටිගේෂන් එක ඩෙරික්ම කරගෙන යන්න. ඒ. අයි. සී. ඕන කරන හැම දේම කරල දේවී. මේ දැන් පත්තරවලටත් දැනුම් දෙනව. එහෙම අනෝම, වික්ටර් දෙන්න ඇරෙස්ට් කරල රිමාන්ඩ් කරන්න.

"මම හිතන්නෙ ඒක ඩොරු වැඩක් නැටියට"

නියෝජ්‍ය පොලිස් අධිකාරි ලැයි අබේසුන්දර අසුනෙන් නැගී සිට සාකච්ඡාව අවසන් බව ඇඟවීය. පොලිස් ස්ථානාධිපති සහ ඩෙරික් තේනබදු දැන් අසුන්වලින් නැගිට ගත්හ.

"ඇත්ත, ඩොරු දාන්න පැත්තකට. මම දුන්නෙ ඔර්ඩර් එකක්. අද අකුරටම ක්‍රියාත්මක කරන්න ඕන" ලැයි අබේසුන්දර ගොරෝසු මහත්තන්ව හඬකින් පැවසීය.

www.sudasyalbums.lk

8

මිරිහාන පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශය භාර ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩෙරික් තේනබදු තම අසුනේ වාඩිගෙන බැරෑරුම් කල්පනාවලියක නියැලී සිටිනු පෙනිනි. එය කුමක් සඳහාද යන්න දැන සිටියේ ඔහු පමණි.

දුම්වැටිය අඩක් පමණ දැල්වෙමින් තිබියදී ඔහු සහායක පොලිස් නිලධාරියෙක් කැඳවිය.

"එක්ක එනව අර විරසිංහ මර්ඩර් කේස් එකට රිමාන්ඩ් කරල ඉන්න සුදත් මෙහාට"

පොලිස් නිලධාරියා මොහොතක් හෝ පමා නොවී විශේෂ සිර මැදිරිය කරා ලඟාවූයේ තම ස්වාමියාගේ නියෝගය පමානොවී ඉටුකිරීමේ පිලිවෙත හොඳකාරවම දැන සිටි නිසාවෙනි.

"කවුද සුදත් කියන්නේ?"

සිමෙන්ති බැමමේ, දිගු කල්පනාවක වෙලී සිටි සුදත් මේ ඇමතුම ලැබෙන විට දවසේ සිදුවීම් ආවර්ජනය කරමින්

සිටියේය.

පොලිස් නිලධාරියා කල්පනාවේ යෙදී සිටි සුදත්ට නැවතත් උස් හිත් ආමන්ත්‍රණය කළේය.

"සුදත්, බර කල්පනාවක වගෙයි. එනවද මාත් එක්ක ලොකු මහත්තය බලාගෙන ඉන්නව"

සුදත් තිගැස්සී නැගිට විවෘත කල දොරින් පැමිණ මඳක් වටපිට බලා පොලිස් නිලධාරියා අනුගමනය කිරීමට සැරසුනේය. එනෙත් ඊට පෙර "සෝමේ අයිය කාල නිදාගත්ත මම ආපහු එව්වොත් මෙතෙන්ටම එනව. නාමොන් අක්කට කියන්න ටිකක් සොයල බලන්න"යයි පවසමින් සිරමැදිරියෙන් පිටවිය.

සිරමැදිරියෙන් පිටව යන සුදත්ගේ දැත්. දැන් සෝමේ බදාගෙනය.

"අපි කාපු බතේ පහරත පාහරයො නෙවි මහත්තය. මට ඵලියට යන්න හැටියක් නැහැ. ඒත් පවුල ආපු හැටියෙ මම එවනව. ඒකිට මය කොයි ලොක්කත් එකයි"

සුදත් මොහොතක් මහු දෙස බලා සිටියේය. හොඳ කෙලෙහිගුණ නියෙන මිනිහෙක්. ඒ මතස හරහා දිවගිය ක්ෂණික සිතුවිලි දාමයකි.

ඩෙරික් තේනබදු නමා ඉදිරියට පැමිණි සුදත් දෙස සුපරීක්ෂාකාරී බැල්මක් හෙලීය.

"වාඩිවෙන්න ඔහොම"

සුදත් බයාදු අයුරින් අසුන් ගත්තේය.

"නම?"

"සුදත්"

"කියනව සම්පූර්ණ නම හරියට"

"පේදුරු අප්පුහාමිලාගේ සුදත් වීරසේකර"

"ගම, රට?"

"කැගල්ල"

"කැගල්ල කියන්නෙ ලොකු පලාතක්. මම අහන්නෙ තමාගෙ ගම ගැන"

බියපත්ව සිටි සුදත් "අපේ ගම කැගල්ලෙ ඉඳන් හැන්දෑම දහයක් විතර යන්න ඔන, කොටදෙනියාව"

"ඉන්නවද අම්ම තාත්ත"

"දෙන්නම මැරිල. එවුලෙ වෙන කට්ටරුවන්ම නැහැ"

"දේපොල එහෙම"

"මොන දේපොලක්ද සර්. ඔය පොඩි කට්ට මැටි ගේක ඒවත්ද්‍රනා. මේ ඉස්කෝලෙ ගියෙන් හරි අමාරුවෙන්, නාත්තට හරි නමේ රස්සාවක් තිබුනෙ නැහැ."

"කොච්චර දුරට ඉගෙන ගත්තද?"

"ඕ ලෙවල් පාස්වුනා. ඒකත් නොවිදිනා දුක් විඳලා"

ඉන්ස්පෙක්ටර් තේනබදු නවත් දුම්වැටියක් දල්වා ගත්තේය. ඉන්පසු නැවතත් තරුණයා නිරීක්ෂණය කරන්නට විය.

"හොඳයි, ඉතින් ඊට පස්සෙ?"

"අම්මයි නාත්තයි දෙන්නම අවුරුදු දෙක තුනකදි මියැදුන"

"එතකොට නමා?"

"ගමේ හැමතැනම තියෙන තැනක කුලීවැඩ කෙරුව"

දැන් ඉන්ස්පෙක්ටර්ගේ පෙනුම වෙනස් විය. "කොළඹ ආවේ?"

සුදත් ඉන්ස්පෙක්ටර් දෙස හෙලූ බැල්ම ඔහුටම වටහා ගත නොහැකිවාක් මෙනි. "ගමේ වැව් ඉස්මත්තෙ තියෙනව පොඩි කඩයක්. ඒකට ඉරිදා පත්තර ගේනව. මමත් ඒව බලන්න යනව. ඒකට ඉරිදා දවසක යකඩ කඩේකට කම්කරුවොා ගත්නව කියල දැන්වීම් දැක්කම් මෙ අහමාරුවක් කර කොළඹ ආව. මට එතන රස්සාව හම්බවුනා"

මෙය අනවශ්‍ය ප්‍රශ්න ඇසීමක් බැව් තේනබදුට හොඳටම විශ්වාසය. ඔහු සුදත්ගේ වත ගොන ගැන සියලු විස්තර සවිස්තරව විස්තර කරගෙන හමාරය.

"කියාගෙන යන්න මම අහගෙන ඉන්නෙ. අනික ඔය කියන හැම දේම ඇත්ත වෙන්නත් ඕන. උසාවි සාක්කි හැටියට ඉදිරිපත් වෙනව"

උසාවිය ගැන සඳහන් කිරීමෙන් පසු සුදත්ගේ පෙනුම පුදුමාකාර අයුරින් වෙනස්වන ආකාරය තේනබදු ඒහැදිලිවම දුටුවේය. මොනුගෙන් තවත් ඉදිරියට ප්‍රශ්න කරගෙන යාම ගැන ඔහු තුළ හටගත් පිළිකුල ආයාසයෙන් යටපත් කර ගත්තේය. ඒ අවස්ථාවේ සුදත් ඔහු දෙස හෙලූ බැල්ම එතරම්ම ව්‍යාකූල සහගතය.

"යකඩ කඩේ රස්සාව නම්බවුනාද?"

"ඔව්, ලේබර් හැටියට. මම වැව බාර අරගෙන පොඩි මුඩුක්කුවක නැවතුනා, ගානක් ගෙවල. එතන ඉඳල වැඩට ගියා. මාස හය හතක් යනකොට මුදලාලි මට කතාකරල බයිසිකලයක ගන්න සල්ලි දුන්න. මාව සේල්ස්මන් කෙනෙක් නැටියට උපස් කෙරුව. පඩිත් වැඩිකරල."

ඉන්ස්පෙක්ටර් ඔහු දෙස තියුනු බැල්මක් හෙලීය.

"එහෙම කරපු බොස්ද වෙඩි කියල මරල දැම්මෙ?"

එම ප්‍රශ්නය සුදත්ගේ හිසට කෙලින්ම එල්ල කරන ලද යකඩ පොලු පහරක් බඳු විය.

"නමත් දැන් ඉන්නෙ පොලිසියෙ, සැක තරල තියෙන්නෙත් නමත් බොස්ගෙ මරණෙට. උඩ ඉන්න දෙවියො විතරයි දන්නෙ වෙච්ච දේවල්"

"සර් විතරක් නෙවි, හැමෝම ගිහාගෙනා ඉන්නෙ එහෙම. මේ මුළු ජීවිතේටම ට්‍රිස්තෝලයක් කියන දෙයක් ඇගින් දැකලවත් . අල්ලල වත් නැහැ"

"හා! ඉතුරු හරිය කියාගෙන යනවකො බලන්න"

"බයිසිකලේ ගත්තම පස්සෙ මුදලාලි නව වැඩක් බාරදුන්න. හාඩ්වෙයාර් එකේ වැඩ ඉවරවුනාට පස්සෙ එදා එදාට එකතුවෙන සල්ලි ගෙදරට ගිහින් බාරදෙන්න ඔන මුදලාලිට යතුරුත් දුන්න. පනුවදා උදේට මම ඇවිත් යතුරු ගෙනියන්නත් ඕන"

ඉන්ස්පෙක්ටර් මඳක් ඉවත බලා ගත්තේය.

"ඒකට වෙනම ගෙව්වද?"

"ඔව් සර්, දවසට ද.ට්‍රියල් පනහක් වැඩිදුර. නිධානයත් පහලවුනා වගෙ වැඩක්"

"කොච්චර විතර සල්ලි ගේනවද හැමදාම ගැන්නුවට?"

සුදත් අවිනිශ්චිතව මොහොතක් කල්පනාවක වැටුනි.

"එකම ගානක් නෙවි. බිස්නස් වෙන හැටියට. සමහර දවස්වල ලක්ෂ තුන හතරෙ වගේ"

ඉන්ස්පෙක්ටර් නැවත උනන්දුවෙන් සුදත් දෙස බලා සිටිනු පෙනින.

"ලක්ෂ තුන හතරක බිස්නස් කෙරෙනව. කවුද තමාට සල්ලි බාරදෙන්නෙ, කැමියර්ද?"

"අපේ කඩේ කැමියර්ල නැහැ. මැනේජර් මහත්තය තමයි සේරම කරල. වැඩ ඉවර වෙලා මට සල්ලි බාර දෙන්නෙ. මෙන්

ඉස්සරහ පිට ගැනල බැග් එකට දාල"

ඉන්ස්පෙක්ටර් නළල පිරිමදිමින් මඳ වෙලාවක් සුදත් දෙස බලා හිඳ "ඔය වැඩේ හුඟාක් කල් කෙරුනද"යි ප්‍රශ්නයක් නැඟීය.

සුදන් මදක් පසුබා නිරුත්තරව මහු දෙස බලා සිටිත්ය.

"මොකද කතා නැත්තෙ, මම ඇහුවෙ ප්‍රශ්නයක්?"

සුදත් ගෝකී හඬකින් කතා කරන්නට විය.

"මම බොස් කිව්ව විදියට මගේ රස්සාව හුඟාක් කාලයක්ම කෙරුව. මට පුම් බයික් එක ගන්න දුන්න සල්ලි එක ශතයක්වත් උඩියෙන් කැපුවෙත් නැහැ. 'මට දවසක් කතා කරල කිව්ව, උඹ කන්න එපා කඩෙෝරු. කාපන් මගේ බත් එකේ ඉතුරු නරිය, සොපී දෙතුන් දෙනෙකුට සෑහෙන්න උයල එවනව මට"

"කැවද ඉතුරු බත්?"

"මොකද නත්තෙ, මමත් කාල, පීටර්ටත් දෙනව ඉතුරු ඔක්කොම"

"කවුද පීටර්?"

"කන්තෝරුවෙ පියුන්"

"නමා කියනව දවසට දෙපාරක් ඔය බංගලාවට යනව කියල. උදේට, හවසට, හිටියෙ නැද්ද ඔය මුදලාලිට නෝන කෙනෙක් එහෙම"

ප්‍රහාරයක් එල්ල වීමට ආසන්න බවක් ඉවෙන් මෙන් සුදත්ට දැනිණ.

"නැහැ, සෑහෙන කාලයක් යනකල්"

ඉන්ස්පෙක්ටර් ගේ සුහදශීලී බව කෙමෙන් ඉවත්ව යන බව සුදත්ට තේරුම් ගියේය.

"නමා නිතරම ගෙදරට ආව ගියා කියනව. දැකල නැද්ද මිසිස් වීරසිංහට කෙනෙක් එහෙම ඉන්නව?"

සුදත් නැවතත් මද විරාමයකය.

"ටික කාලෙකට පස්සෙ හිටිය නෝන කෙනෙක්"

තේනබදුගේ දෙතොලට සිනාවක් නැඟින.

"දැක්කද එයා?"

දැන් සුදත්ගේ දෙනෙත් බිමට යොමුවී ඇත. ඔහු හිස එසවූයේ මඳ සිනාවක් දෙතොල් අතර රඳවාගෙනය.

"දැක්ක සර්. ඒ අනෝම නෝන"

"ගෙදරට අමුත්තෙක්, අනල බැලුවෙ නැද්ද කවුද මේ ඇවිත්

ඉන්න නෝන මනත්තය ගැන?"

සුදත්ගේ කෘතිම වෙහෙස ඉන්ස්පෙක්ටර් නොදුටුවා නොවේ. නමුත් කිසිත් නොදත් නොහැඟුන බැව් ඇඟවීමට මහු වගබලා ගන්නා ආකාරය සුදත් ද හොඳින් තේරුම් ගත්තේය.

"වැඩි දවසක් නොගිහින් මට දැනගන්න ලැබුන ඒ බොස්ගෙ නෝන විත්තිය. බොහොම ලස්සන තරුණ කෙනෙක්. ඒ වගේම කාටත් කරුණාවන්තයි" යි සුදත් එක එල්ලේව කියාගෙන ගියේය.

පොලිස් පරීක්ෂකවරයාගේ මුව'ඟට උපහාසාත්මක සිනා රැල්ලක් නැඟිනි.

"තමන්ට ඒ තරුණ නෝන මොන ආකාරයටද කරුණාව දැක්වුයේ?"

සුදත් කල්පනාකාරීව පිළිතුරු දුන්නේය. "මම ටික කලක් යන කොට මම මේ යකඩ කඩේ අවංක සේවකයෙක් බව නෝන තේරුම් ගත්ත. ඒක පාලනය කලේ නෝනා. ඒ නිසා මම සේවයෙන් උසස් කලා. පඩි නඩි වැඩි කෙරුව. කොච්චර කිව්වොත් මාව මනුස්සයෙක් කලේ ඒ නෝන මහත්තය"

"හොඳයි මම මෙහෙම කිව්වොත්, නමා ඒ තරුණ නෝනට ආදරේ කලේ තමන්ට පණකෙන්ද ගැටගහගත්ත අත දීපු වීරසිංහ මුදලාලිට ද්‍රෝහිවෙලා, අන්තිමේදි දෙන්න හේතුල්වෙලා ඒ මනුස්සයව මරල දැම්ම"

සුදත්ගේ මුව'ඟට කෙටි සිනාවක් නැඟින.

"මම දන්නව සර් අන්තිමට මගෙන් අහන්නෙත් මය ප්‍රශ්නෙ බව. ඒක ඕනෑම සාමාන්‍ය කෙනෙක් හිතන විදිය. ඒකට මම කාටවත් දොස් කියන්නෙ නැහැ. මගේ නිර්දෝෂිභාවය දන්නෙ උඩ ඉන්න දෙවියො විතරයි. තව එකක් ඒ අහිංසක නෝන මේ කිසිම දේකට ගාවන්න එපා. මට කරපු උදව් උපකාරවලට එයා වන්දි ගෙවන්න අවශ්‍ය නෑ"

ඩෙරික් නිහඬව භූදිතයා දෙස මොහොතක් බලා සිටියේය.

* * * *

9

මිරිහාන පොලිසිය

හෝටලුව අසලට පැමිණි අනෝමා සහ වික්ටර් බඩු බාහිර රැසක් සමඟ වාහනයෙන් බිමට බසිද්දී රාජකාරියේ නියැලී සිටි, ඇනට ඔවුන් දෙදෙනා හඳුනන පොලිස් නිලධාරියෙකු ඔවුන් වෙත පැමිණියේය.

"මොකෝ මේ නෝන මහත්තයල නවලමකට බඩු මුට්ටු කරගහගෙන. මෙහෙ බෝඩිං වෙන්නද හදන්නෙ?"

වික්ටර් ඔහු දෙස බැලීය. "මේ බඩු ටික, ටික වෙලාවක් බලාගන්නවද, අපි ඇතුලට ගිහින් තේනබදු මහත්තය හම්බවෙලා එනකල්?"

ඒ වචන සමඟ වටපිට නොදින් බලා වික්ටර් ඔහු අත තැබූ මුදල් නෝට්ටුව ගොදුරක් අපේක්ෂාවෙන් දිගු වේලාවක් බලා සිටි සර්පයෙකු මෙන් විලාසයෙන් සාක්කුවට දමා ගත්තේය.

"නියෙන්න අරින්න සර්, ඔන වෙලාවක්, මම ඩියුටි එළිවෙනකල්ම"

"කැන්කි සූ, අපි යනව ඇතුළට"

සුදත් සහ වික්ටර් සදනා අනෝමා විසින් ගෙනෙන ලද කෑම පාර්සල් සහ ඇයගේ කෑම පාර්සලයද රැගෙන දෙදෙන අපරාධ අංශය වෙත ගමන් කළහ. එතැන දී රැකවලේ සෙදී සිටි පොලිස් පොලිස් නිලධාරියෙකි.

"තේනබදු මහත්තය ඉන්නවද?"

පොලිස් නිලධාරියා වඩුන් දෙදෙනා දෙස බැලූ නිරීක්ෂණයක යෙදිණ.

"ලොකු සර් ඉන්නව ඇතුලෙ. ඇයි නම්බවෙන්න ඕනද?"

වික්ටර් සිටියේ තරමක් බිමත්වය.

"නැතුව නිකමට එනවද මෙතෙන්ට"

පොලිස් නිලධාරියාගේ මුහුණ ඇඹුල් විය.

"මේ මම ඇතුවෙ....."

"මේ මම කියන්නෙ....."

එවිටම කලින් දින සුදත් බැලීමට පැමිණි වෙස්ටාවේ හඳුනූ පොලිස් නිලධාරියෙක් එතැනට පැමිණියේය.

"ආ... සර්ල, ඇවිත් වෙලාවටත් කලින්. යන්න ඇතුළට..."

අනෙකා තුන්නිමිහුතුව බලා සිටියදී අනෝමා වික්ටර් ඩෙරික් තේනබදු ගේ කාර්යාලයට ඇතුළුවූහ.

ඔවුන් දෙදෙන කාමරයට ඇතුළුවනු දුටු තේනබදු අඩ සිනාවකින් යුතුව අත් වරලෝසුව දෙස බැලීය.

මම කිව්ව වෙලාවට තව විනාඩි විස්සක් තියෙනව. වාඩිවෙන්න දෙන්නම්. දැන් මගෙල්ලොන්ගෙ බිස්නස් වැඩ ටික ඔක්කොම පිළිවෙලක් කරගත්නද?"

ඔවුන් දෙදෙන හිස සලා අනුමත කළහ.

වික්ටර් අසුන් ගන් අතර අනෝමා හිටගෙනෙය.

"සර් මම එන්නද ගිහින් මේ කෑම ටික සුදත්ට දීල. වචන දෙක කුනකුත් එයත් එක්ක කතා බහ කරල. අද අන්තිම දවසනේ. අපි දෙන්නම දෙපොලක කොටු වෙනව"

තේනබදුගේ සිනට සියුම් වේදනාවක් ඇතුනි. ඇගේ බැගෑපත් හා ආයාචනාත්මක වචන ක්ෂණයෙන් ඔහුගේ ලේ ගිත පවා සසල විය.

ඔහු හිස ඔසවා ඇය දෙස බැලීය.

"මට පැවරුණ රාජකාරියක් විනරයි මම කරන්නෙ. අද ඉඳල ඔය දෙන්නත් ලොකප්. මම මේ මර්ඩර් එක කොහොම හරි

විසඳනව. මම ඒ නීරණේ අරගෙන ඉවරයි."ය ශෝකයෙන් මුසපන්ව පාර්සල් කිපයක් අතැතිව තමා දෙස ආයාසයෙන් බලා සිටින අනෝමාට තේනබදු පැවසීය. "යන්න, ගිහින් කෑම බීම දිල ඕන විදියට කතා කරගෙන ඉන්න. ඒක වැදගත්කමට. නියම වෙලාවට මෙතෙන්ට ඇවිත් බාරවුන එකට කරන සැලකිල්ලක්"

අනෝමා මහු දෙස කානඥපූර්වක බැල්මක් හෙලුවාය.

"මේ යන්නද සර්"

"වහාම යන්න කිව්වෙ. මම එවනව නියම වෙලාවට පොලිස් කාන්තාවක්. එතකොට තමන්ගෙ අලුත්ම කාමරේට යන්න පුලුවනි. මෙයත් මම යවනව වෙලාවට සුදත් ඉන්න තැනටම"

අනෝමා ස්තුති පූර්ක බැල්මක් හෙලමින් එතැනින් ඉවත්ව ගියාය. පාර්සල් කිපයක් අතැතිව සිරමැදිරිය අබියසට පැමිණ සිටි අනෝමා දුටු සුදත් සියලු දුක්කම්කටොලු අමතක කර දමා වහා ඇය කරා ලඟාවිය. සෝමේ බිම නිදාගෙනය.

දෙදෙනා එකිනෙකා දෙස මොහොතක් බලා සිටියහ. නිහඬව. නිසලව.

සුදත්, ඇය වෙත ලංව ඇගේ හිස පිරිමදින්නට විය. හිස පිරිමැද අත ඇගේ දෙනෙත් රැදි කඳුළු පිසිමින් මුහුණ තෙහන්නට විය.

"ඔට ආරංචි වුනා අද ඔය දෙන්නත් රිමාන්ඩ් කරනව කියල. මේ වගේ අවාසනාවන්තයෙක් නිසා ඔයාලටත් මේ වගෙ බලු කුට්ටිවල ලඟින්නත් සිද්ධවුනාට මට හරි හිතට දුකයි."

"එහෙම කියන්න එපා සුදත්. මම හොඳාකාරවම දන්නව, ඔයා මේ ගෙවන්නෙ අනුන්ගෙ පව්. තමන් නොකරපු වරදකට

සෝමේ තද නින්දේය.

"අද මට ඔයා හම්බවෙන අන්තිම දවස. හයේ ඉඳල අපි දෙන්නත් හිරබාරෙට ගත්ත. වික්ටර් ඒවි මෙතෙන්ට"

"එතකොට නෝන?.."

"මට වෙන සෙල් එකක් තියෙනව"

දැන් සුදත් තරමක කෝපයක පත්වූ බවක් පෙනෙන්ට ඇත.

"ගියා වැඩි පැහිච්ච කමට. මම කරන්න හැදුව දේ"

"එහෙම හිතට විරුද්ධව වැඩ කරන්නෙ කවුද? වෙන

දෙයක් කුන්දෙනාටම. අනුන්ගෙ පව් ඇයි තමන් ගෙවන්න හදන්නෙ? එක්කෙනෙක්"

"කුන්දෙනාම පව් බෙදා ගත්තමද හරියන්නෙ?"

"ඔය බිම තියෙන පාර්සල් ටික ගන්න ඇතුලට. දවල්ට කෑම ආවද?"

"කෑම ගෙනාව වෙලාවට, නියමෙට. ඔය සෝමෙ අයිය තාම නිදි සැපට අඹරල. ඒක නෙව්, කඩේ, බංගලාව, බිස්නස්වලට මොකද වෙන්නෙ?"

අනෝමා සියල්ල සැකවින් පැහැදිලි කර දුන්නාය. මේ අතර චාරයේ පොලිස් නිලධාරිනිය එතැනට පැමිණියාය.

"බොස් දිපු ටයිම් එක පැය භාගයක් පැනල. නැද්ද තාම කතාබහේ ඉවරයක්"

අනෝමා ඇය දෙසට හැරුනාය. "අන්තිම දවසනේ නව එකම එක විනාඩි පහක් දෙන්න"

නිලධාරිනිය සිනා සෙමින් ආපසු හැරුනාය. "බොස් මට බැන්නොත් ඒකත් දෙන්නම බලාගන්න ඕන. අනික මම නෙයි අද නයිට් ඩියුටි, ඔයාගෙ ලෙසල් එක ලඟ"

ඇය ඉවත්ව ගියාය.

අනෝමා පොලිස් පරිශ්‍රයෙන් නැන ගේ කාර්යාලයෙන් ඉවත්ව සුදත් වෙත ගිය පසු වික්ටර් මහු අතර පැවතුනේ දිගු කතා බහකි. එම කතාබහ අවසන්වීමටත්, අනෝමා සුදත් අතර කතාබහ කෙලවර වීමටත් පැයකටත් වඩා කාලයක් ගිවිණු වී තිබිණ. අවසන වික්ටර් සුදත් සිටි සිර මැදිරියටත්, රාත්‍රියහ සුවසේ ගත කිරීමට කටයුතු සලස්වන ලදි.

• • • •

පොලිස් නිලධාරියෙකු පැමිණ වික්ටර් වීරසිංහ, සුදත් රඳවා සිටි විශේෂ සිරමැදිරියට ඇතුළු කිරීමට පැමිණෙද්දී සුදත් සහ සෝමේ අයියා කිසියම් කතා බහක නිරතව සිටියහ. වික්ටර් සිරමැදිරියට ඇතුළු කර පොලිස් නිලධාරියා ඉවත්ව ගියේය.

"ඔන් මාත් ආව, පාලු මකන්නත් එක්ක ඔයාගෙ, කෝ ඇඳ එහෙම?"

සුදත් සිනාසෙමින් දිගු සිමෙන්ති බැම්ම දෙසට අත දිගුකර

පෙනිය.

"මූය කියෙන්නෙ නොවිට, මෙවට. ඇඳ ඇතිලිලින් එක්ක සෝමේ අයියට හොඳයිලු හෙදර විදියට පුරුදු සිමෙන්ති පොළොව"

වික්ටර් අත රැඳි පාර්සලය සුදත්ට දෙමින් සිමෙන්ති බැම්ම මත වාඩිවිය. ඔවුන් හිඳෙන දිගු වේලාවක් කතාබහේ යෙදී සිට රාත්‍රී ආහාරයද ගෙන නිදාගැනීමට සැරසුනහ.

"දැන් සර් නවුවෙ සැකකාරයො තුන්දෙනාම අල්ලල ලොක්අප් කරල ඉවරයි. ඊලඟට උසාවි දාල එක්කොම රිමාන්ඩ් කරන්න ඕන. නැත්නම් ඇප දෙන්න ඕන. ඒකයි නීතිය"

ඒ සෝමේ දුම් වැටියක් දල්වාගෙන බිත්තියට හේත්තුවී සුදත් සහ වික්ටර් දෙස නෙත් යොමු කරමින් පැවසූ අන්දමය.

"අපි ඇල්ලුව හොඳ ඇඩ්වකේට් මහත්තයෙක්. එයා හෙට නේව ක්‍රයිම් ඕ. අයි. සී. හම්බවෙන්න. බලමු වෙන්නෙ මොනවද කියල"

"මොනවද සර් බලන්නෙ? මිනීමැරුම් නඩු ගැන මට ද කියන්නෙ? "

"එතකොට සෝමේ අයිය?"

"මගේ කතාව වෙන එකක්. මම ඉන්නෙ ගංජ ගහල. ගංජ විකුණල අහුවෙල. ඒත් නැහැ ප්‍රොඩක්ෂන්, ඒ කියන්නෙ මම විකුණපු ගංජා, හෙට දානව මාව උසාවි, වෙන ගංජා පැකට් ටිකක් මෙහෙන් දාල අව්වුවක් අදින්න වෙනව. අඩුම ගානෙ මාස තුනක් විතර....."

වික්ටර් සහ සුදත් ඔහු දෙස සවන් යොමාගෙනය.

"දඩයක් ගහල වෙරෙන්න බැරිද? කියක් වුනත් අපි ගෙවනව"

සෝමේ සිනාසුනේය.

"පිස්සුද සර්ලට, මම මේවට හොඳට තැම්බිල ඉන්නෙ"

"අල්ලමු හොඳ මහත්තයෙක්?"

"ඒ සල්ලි තියාගෙන කාක්කන්ට ආජ්ප අරන් දුන්නම ඉවරයි. සක්කරයටවත් බැහැ මොකුත්ම කරන්න. පනිෂ්මන්ට් එක කන්නම වෙනව. අනික සර් ගංජා විකිණිල්ලටම කලින් වැඩි තියෙනව නැවකට"

"එතකොට අපෙන් කෙරෙන්න කිසිම දෙයක් නැද්ද?"

ඩනේ ආනන්ද

ඔහු අහිංසක ලෙස සිනාසුනේය.

"මේ කරපු හරිය මදැයි ජීවිතේටම මහන්සයල නෝනල මනක් වෙන්න. හැබැයි එකක්. සර්ගෙ කේස් එක ටිකක් කරපතලයි."

"ඒ කියන්නෙ?" වික්ටර් දුම් වැටියක් දල්වමින් ඇසීය.

"සර්ල මිනීමැරුව කියනව නෙවි. දන්නෙ නැද්ද උසාවි දානකොට ඉදිරි පත්තරකාරයො පිරිල ෆොටෝ ගන්න. වක්තුව අයිනි කරගන්න මැනේජර් කොල්ල එක්ක යාලුවෙලා වීතිහ මැරූ ගෑනි. ඒකට සපෝට් එක දීල රංඩු ගන්න යන වල්ලි ගැන පත්තරවලට ලියන්න. බැරිවෙලාවත් ඇප දුන්නොත් උසාවියෙ ඉඳල එළියට එනකොට නෝන්ඩියට වෙන කියන දන්න නාල්පාරුවොත් උසාවියෙ පිරිල ඉඳීවි, තප්පලේට"

වික්ටර් ඔහු දෙස බැලීය. " ඇයි එහෙම කරන්නෙ? අපි කාටවත් වැරදි කරල නියෙනවද?"

සෝමේ ඔහු දෙස රවා බැලුවේය.

"මහත්තෙයල් නාම පොලිසි. හිරකුඩු, උසාවි, හිරගෙවල් වලට කිරිකෝඩු. අපි හොඳට බැට කාල , නැලිල පොඩෙවිල හෙමබත්වෙලා ඉන්නෙ. මගේ ගැනිත් එහෙමයි. නෝනයි හෙන්තයල දෙන්නයි උසාවිදාන දවසට මම එන්න කියනව අපේ පවුලට උසාවියට. කයිවාරු ගහනව නෙවි සර්, මරිය කවේ පෙමම කිව්වොත් බජාර් එකම නෝ ෆෝක්, නියමෙට ලෙවල් එක තියාගෙන ඉන්නෙ එදා ඉඳලම"

වික්ටර් ගේ කුතුහලය ඉහ වහා යන්නට විය.

"එයා ඇවින් මොනව කරන්නද?"

"කරන දේ ඒ වෙලාවට බලාගන්න පුලුවනි. ඔය තුන් දෙනාට ඇප දුන්නට පස්සෙ එළියට ගෙනේවි බබාල එහෙ ආයි. එකෙකුටවත් හූ-මී කියන්න ඉඩ නොනියන්න"

සුදත්, අනෝමා සහ වික්ටර් හිඳෙන අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ජන මාධ්‍ය තුළින් ප්‍රචාරයක් දෙනු ලැබිය. සවිතර පුවත්පත්වල ශීර්ෂ පාඨ ලෙසද පලකර තිබිණ.

වීරසිංහ වැනි ධනපතියෙකු සමාජ සේවකයෙකු කෝටිපතියෙකු, මානව දයාවෙන් පිරිපුන් උතුමෙකු වශ්‍ය නණ්ඩාවෙන් ඝාතනය කිරීම කදිමට හුවා දක්වන ලද පුවත් එමට ගනණ විය.

මිණිමරුවන් නිතිසේ රැහැනට කොටුකර ගැනීමට සමත්වූ ගැන පොලිසියටද මල් පොකුරු ප්‍රිරිනමා තිබීම දැකපු කොළඹ දිස්ත්‍රික්කය භාර උප නියෝජ්‍යපොලිස් අධිකාරී ට්‍රැසී අබේසුන්දර මහතාගේ ද අමන්දානන්දයට හේතුවිය.

එම සිද්ධිය නියාම මෙම සැකකරුවන් තිදෙන අලුත්කඩේ උසාවියට ඉදිරිපත් කල දිනයේ මුලු උසාවියම අතුරු සිදුරු නැතිව මිනිසුන්ගෙන් පිරී පැවතින. උසාවියෙන් පිටත ද සෙනඟ රැස් කමින් බලා සිටියේ මෙම කෲර මිනිස් ඝාතනය කිරීමට එක්ව සිටි රුමේ තරුණ බිරිඳ. ඇගේ පෙම්වතා සහ මස්සිනා යාන්තමට නෝ දැක බලා ගැනීමේ අටියෙනි.

විත්තිකුඩුවේ සිටි සැකකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ පැත්තට මුලු මහත් ජනකාය අතරින්ම සිටියේ තිදෙනෙක් පමනි. ඒ නිමේ ඇගේ නැන්දනිය හා සෝමේගේ බිරිඳ වන ප්‍රේමා නොහොත් පෙම්මාය.

නඩුව විභාගයට ගැනීමෙන් පසු තිදෙන වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥ මහතා සැකකරුවන්ට ඇප ලබාදීමට කල් ඉල්ලීම පැමිණිල්ල මෙනෙයවන ලද මිරිහාන පොලිසියේ අපරාධ අංශය භාර ප්‍රධාන පරීක්ෂක මහතා විසින් විරුද්ධත්වය පළ නොකල හෙයින් තිදෙනාට එක් සැක කරුවෙකුට රුපියල් පහලොස් දහසක මුදල් ඇප මත මුදාහැරීමට මහේන්ද්‍රාත්තුමා නියෝග කරන ලදී.

නිමේ සහ ප්‍රේමා එය නීතිඥ මහතාගේ ද සහාය ඇතුව ඇප මුදල් තැන්පත් කර අවශ්‍ය ලියකියවිලි උසාවියට ඉදිරිපත් කිරීමෙන් පසු තිදෙනම ඇප මත මුදා හරිනු ලැබුහ.

මහේන්ද්‍රාත් තුමාගේ ඇප නියම කිරීමේ තීරණයට හා එයට ඉඩ සැලසූ පොලිස් පරීක්ෂක ඩෙරික් තේනබදු කෙරෙහිද උසාවිය තුළ විවිධ මැදිලියේ අපහාස හා උපහාසාත්මක කසු කුසු පැතිර යාමට විය.

ඇප ලබා ගැනීමෙන් පසු සැකකරුවන් තිදෙන නිමේ සහ නැන්දනිය නීතිඥ මහතා උසාවියෙන් එළියට පැමිණියේ මරිය කඩේ පෙම්මා නොහොත් ප්‍රේමා පෙරටුකරගෙනය. අනෝමා ඇය අසලින්ම විය.

"බය වෙන්න එපා නෝන. එකෙකුටවත්, කට හෙල්ලුවොත් මම බලාගන්නව. පිහිය තියෙනව මගේ හැට්ටේ අස්සෙ, කපනව

කටවල් ඔන පාහරයෙකුගෙ"

"බලන්නකෝ සෙනඟ හරියට....."

"හිටපුදෙන් ඔන තරන්. අපි යමු වාහනේ ලඟට. මෙ ඉන්නව ඔන දේකට, මේකෙ අපි නොදන්න කරෙක් නරි නැහැ. අපිත් මේ බජාර් කාල තියෙන්නෙ අවුරුදු ගානක්"

මවුන් සත් දෙන උසාවි බිමෙන් පිටව වාහනය නවතා තිබුන තැනට පැමිණෙන තෙක් කිසිම හා- හුවක් - නිකමට කණ උරුහන්බෑම් හා උසුලු විසුලු කිපයක් යාන්තමට කණ වැකුණ මුත් ප්‍රේමාගේ පක බැල්මෙන් ඒ සියල්ල ඇකි මැකි ගියේ අන් සියලු දෙනාම මවිත කරවමිනි.

"නගින්න වාහනේට, මම කිව්ව නරිද? කෝ එක නරියෙක් කට හෙල්ලුවද? මුන් පුදුම ජාතියෙ හැත්ත. වැරදි නරි නැතුව නරි මුන්ට ඔන නක්කලේදාල අපහාස කරන්න. බොරුවට බනින්න. කෝ පත්තරකාරයො ආවද ෆොටෝ ගන්න. එකෙක් නරි ආවනත් පෙන්නනව ෆොටෝ ගන්න ඔන මොනවද කියල"

එයට සිනාසෙමින් සැමොම පැපරෝ රියට නගින ආකාරය රැස්ව සිටි පිරිස පිළිකුල අවඥාව හා කලකිරීමෙන් යුතුව බලා සිටීමද මවුන්ගේ පැත්තෙන් අසාධාරණයක් නොවන බව සැමොම අවබෝධකරගෙන හමාරය.

දැන් සැමොම පිටකෝට්ටේ රජමහා විහාර මාවතේ පිහිටි නිවසේ විසින්න කාමරයේ අසුන්ගෙනය.

වෙලාව 17. 00 පැයට ආසන්න වෙමින් තිබිණ.

"මගෙන් කෙරෙන්න ඔන මුල් දවසෙ රාජකාරිය අකුරටම මම පොරොන්දු හැට්ටට කරල දුන්න. මතකතේ ඊළඟ නඩු දිනේ මාර්තු 15. නරකම දවසක්. ඉතිහාසෙ දිහා බලනකොට"

අනෙක් සැමොම නිහඬය; නිමේ සිනාසෙමින් නීතිඥයා දෙස බැලුවාය.

අවුරුදු දහස් ගණනකට කළින් රෝමේ වෙච්ච දේවල් මෙහෙත් කෙරෙයි කියලද සර් කියන්නෙ?"

නීතිවේදියා ද සිනාසුනි.

මම කිව්වෙ මාර්තු 15 නරක දවසක් කියල. ජූලියස් සීසර්ට එදා නරක දවසක් වුනා. කල්තියල දැනුම් දීල තියෙද්දි දින ගණන් නොගත්ත එකයි වරද"

නිහිඳයා ඇය දෙස බැරෑරුම් බැල්මක් හෙලීය. "හරියට හරි. පිට හොර හතුරන් වැඩියි.තමන්ට වැඩි සෙනෙහෙ දක්වන, ළඟ හින මිතුරන්ගෙන් අපි කවුරුත් ප්‍රවේශම් වෙන්නම ඕන. ඔය දෙන්න පිටිපස්සෙ බෲටස්ල කී දෙනෙක් ඇත්ද?"

නිමේ නිහඬව යහුගේ තර්කානුකූල නිගමනය කෙරෙහි මණෑස යොමු කළාය.

"ඒකත් ඇත්ත සර්. මිනීමැරුමට මේ සැකකරුල ඉන්න තුන්දෙනාම නිර්දේෂයි. ඒක මට ඉර හඳ වගෙ විශ්වාසයි. එතකොට කවුද මිනීමරුවා?"

"ඒක සොයාගන්න සී. අයි. ඩී. එක, පොලිසිය ඉන්නව. ඔයාලට තියෙන්නෙ ප්‍රවේශමෙන් රාජකාරිය කරන එක විතරයි. ළඟින්, ඇතින් ඇසුරු කරන හිතවත්කම් පෙන්වන කිසිම කෙනෙක් මොනම හේතුවක් නිසා හරි විශ්වාසෙට අරගෙන තුරුලුකරගෙන නිරපරාදේ තවත් අමාරුවේ, දුක් කරදර වලා වැටෙන්න එපා. මට කියන්න තියෙන්නෙ එච්චරයි. කවුරුහරි මිස්ටර් විරසිංහට වෙඩි තියල මරල ලක්ෂ දහයක් අරගෙන පැනල. කවුද? හොඳට අභ්‍යන්තරේ දන්න කියන කෙනෙක්, නැත්නම් පිරිසක්, පොලිස් පරීක්ෂණවලට හැම සහයෝගයක්ම දෙන්න. මම යන්න ඕන කේස් එක මොන විදියට ඉදිරිපත් කෙරුවත් නවුවට පෙනී ඉන්නෙ මම. ඒක මම බලා ගන්නව උසාවියෙදි."

නිහිවෙදි තැන ඒ අවසන් අවවාදයත් සමඟ නිවසින් පිටව ගියේය.

රෝමේ සීසර්, බෲටස්, ඇන් මැරිල පස්යට ප්‍රේම අක්කට අපි සලකන්න ඕන සහෝදරියකට වගේ හැමදාම. අද උසාවියෙදි දුන්න බක්අප් එකට දාස් ගණනක් හිටිය. එකෙක් කට හෙල්ලුවෙ නැත්තෙ මෙයාගෙ නොම්මරේ බජාර් එකම හොඳට දන්න හින්ද" වික්ටර් එසේ පැවසුවේ ප්‍රේමා දෙස කාතඥපූර්වක බැල්මක් හෙලන අතරය.

"මගේ ඇගේ ලේ නැතුව හිටියෙ. කකුල් දෙකත් එක්ක වෙව්ලනව. අර අපි දිනා ඇහිපිය ගහන්නෙ නැතුව බලා හිටිය සෙනග ගොඩ දැකල. මම උසාවියෙ ඉඳල වාහනේ ලඟට කොහොම ආවද කියන එක දන්නෙ දෙයියො විතරයි" ඒ අනෝමාය.

"ඔයා අවේ ප්‍රේම අක්කගෙ අතේ එල්ලිල. ඕරාන්ත වෙලා. හරියට වෙන ලෝකෙක ඉඳල එනව වගේ"

ඒ සුදත්ය. සැවොම සිනාසුනහ.

"දැන් ගිය දේවල් ගියා. මම යන්න ඕන බෝඩිවට. ඒක නියෙනවද කියන්නත් අමාරුයි. මිනීමරුවෙක් ඇප මිට නිදහස් වෙලා ආවම කියාගන්න කැමති වෙවිද මන්ද?"

වික්ටර් නැගිට ගොස් හිස් විස්කි බෝතලය පසෙක තබා නවත් බෝතලයක් රැගෙන විත් අනෝමා දෙස බැලුවේය.

"ප්‍රේම අක්ක හිටපුදෙන් අපිත් එක්ක. ඔය නෝනල තුන්දෙනා මෙතනින් නට්ටුවෙලා ටවනට්ල ඉක්මනට ඔයිට මොනව හරි. ස්පෙශල් එකෙන් මේක සැනෙන්න බොන්න ඕන වැඩක්, දවසක්"

නැන්දනිය අසුනෙන් නැගී සිටියාය.

"අපි දෙන්නත් ඉන්නව මෙතනම. හිතේ ගතේ හිබුන ඔය, අමාරු අමතක වෙන්න ගෙදර තියෙන වක්කොම බියර් ටික ඉවර කරනව. රෑ වෙනා කොට ඇන්ටි ජේමිස්ගෙ කෝකියට කියල බයිට් ටිකක් හදල එවන්න ඉක්මනට"යි නැන්දනිය ඉක්මනට එනැතින් ඉවත්ව ගියාය.

සුදත්, වික්ටර් සහ ප්‍රේමා තිදෙනා අත විස්කි විදුරුය. අනෝමා සහ නිමේ ඉදිරිපිට බියර් විදුරුය. වික්ටර් දුම්වැටියක් දල්වාගෙන පැකට්ටුව සුදත්ට දිගුකළේය.

"සුදත් කොහේවත් බෝඩින් ගානෙ යන්න එපා. ඒකත් නව ප්‍රශ්නයක් වෙනව. යන්න හේතුවකුත් නැහැ. අද හෙටම වැඩ් සද්ද බද්ද නැතුව දෙන්න කසාද බඳින එකයි ඇත්තෙ. ඒකෙන් වක්කොම කටවල් වැහෙනව. ප්‍රශ්නෙත් ඉවරයි. නවුවෙන් වෙන දෙයක් බලාගමු පස්සෙ"

ප්‍රේමා හා නිමේ එම තීරණය එක හෙලාම අනුමත කළහ.

"මුලු ලංකාවම මේ දෙන්නගෙ විතරක් නෙවී අපි දෙන්නගෙ සම්බන්දෙත් දන්නව. පත්තරකාරයින්ට පිං සිද්ධ වෙන්න. ගහල බැන්ද, බැඳල ගැහුව දෙකම එකයි." ඒ නිමේ බියර් විදුරුව තොලගාන අතර පැවසූ ආකාරයයි.

"බෝඩිමේ තියෙන මගේ බඩු මුට්ටු"යි සුදත් දුම්වැටිය උරමින් විමසන්නට විය.

ප්‍රේමා දැන් විස්කි මතින් පදම් වගෙන එන සේය.

"කොහෙද කියෙන්නෙ කෝඩිම?"

"කිරුළපනේ, සිමල් ඇවනිව් එකේ"

"හෙට හිතින් හේතු බඩු, වාහනේ තියෙනව නේ. මම එනව අපේ මරිය තවේ නියම බජාර් පොරක් එක්ක. බෝට්ම යකාගෙ ට්‍රිනක් අපි සර්ගෙ බඩු හේනව"

වික්ටර්, ප්‍රේමා, සුදත්, සහ අවසාන වශයෙන් අනෝමා දෙස බැලුවේය.

"නියම වැඩ පාර. එතෙන්ට මෙයා තනියම යන එක ඇහට දුණ හදි. එක එක ජාතියෙ පරාල ඒ වැයිස්කියෙ ඇතිනෙ. එහෙන් මෙහෙන් වචන දාල ගාන කපන්න බලාගෙන. අපේ අයියලාගෙ හැටි දන්නවනේ, වෙලාවට සම්පින් එක හොයන හාදයො"

"එක හොඳ අදහස. සුදත් කවුළුන්න. අද ඉඳල මෙහෙ ලොක්අප් එකේ සිමෙන්ති බැම්ම උඩ තනියම නිදාගන්න කැත්තියයි මාත්තියයි, පාළුවයි මැකෙන්න අද ඉඳල මෙවට කොටිට ඇද ඇනිවිලි. අනිත මේ නත්තල් මාමෙ සිනල මැකෙන්න සුපර් හීවර් එකකුත් අතලගෙ ඇතුල්"

එයට අනෝමා සහ සුදත් හැර අනෙක් සැමොම හඬා හසා සිනාසෙන්නට පුළුවන.

"මේයා ඒ මොකුත් නැතුව වෙන්න ඇති නිදාගන්න යන්නෙ අද ඉඳල"

"ඇත්ත, කිව්ව හරියටම නරී. අනිත් ඔහිස්සු ගැන විතරයි නැම සිස්සොම වගෙල කියවන්නෙ. එයා පුදන"

"අද සීනර් එක පෙම්නාගෙයි එකෙ පෝලියෙයි නෙවී. කරුපනේ හෝටලේක. ඉගලම විදියට. ඊල්ම අක්කයි එන්නම ඕන. පව් සෝමේ අයිය තැති එක. අපිට හොඳට සලෝව්ව කරල කය සැක ඇරිය ඕනෑ. කොවින්ම බජාර් ඒකිගේ අපිට නියමෙට කියල දුන්නෙ එයා හිර කුඩුව ඇතුලෙ ඉඳගෙන. මහරගේ ඉන්නෙ. මාස තුනේම විසිව දවසක අපි යමු එක්කොම. මිනිහගෙ ඔතටත් පොලියක් වෙන්න"

10

පොලිස් පරීක්ෂක වෙරිත් තේනබදු අලුත්කඩේ උසාවියේ ඔබ ආමඩු පැමිණ තම කාර්යාලයේ රාජකාරී කටයුතුවල නියැලී සිටියේ මනුගේ සහායක උප පොලිස් පරීක්ෂක විකුම් ජයවීර සමඟය.

"අද නියෙනවද මොකුත් විශේෂ වැඩක්?"

"නෑ සර්. පොඩි පොඩි කේස් දෙක තුනක්. අපි ඒව සෙට්ල් කෙරුවා. නුගේගොඩ පාගොඩ පාරේ ගේකට හොරු පැනල බඩු වගයක් අරගෙන කුඩුකාරයො තුන් දෙනෙක්. බඩු විකුණන්න ගිහින් මාට්ටුවෙලා කුඩිඩො ඉන්නව"

"මොනවද බඩු?"

"ටී. වී. එකයි, ප්‍රෙෂර් කුකුකර් සෙට් එකයි"

"බඩු අනුවුනාද?"

"පොලිසියට ගෙනාව"

"කුඩිවන්ට ගහල බැනල මොනවටද? පාර දෙන්න ඕන කුඩු විකුණෙ නැතිකරේට. ළුන් කාගෙන් හරී හොරකන් කරල කුරිටු දෙකට වීකුණල කුඩු විකුණෙ එවුන් පෝසත් කරනව"

"ඒ සමඟම ටෙලිෆෝනය නාදවෙද්දී තේනබදු රිසීවරය

කණ තමා හේතේය.

දුරකථන සාකච්ඡාව පැවති විනාඩි පහක පමණ කාලය තුළ තේනබදු පිළිවදන් වූයේ "ආ.....එහෙමද? මම නමුත් අවසන් වශයෙන් "කරල බලමුකෝ" පමණි. සහ ඉදිරිපස අසුනේ ගෙන සිටි වික්‍රම ජයවීරට ඇසුන් වසින් වර ඩෙරික් ගේ මුහුනේ පෙනුම තනා විලාසය හා ඉරියව් වෙනස් වන ආකාරය හා දෙතුන් වරක් වැරෙන් මෙසයට අත ගිට හොලවා පහර දුන් ආකාරය ද, පිසුවරය වේගයෙන් තැන්පත් කිරීමද පමණි.

"මොකෝ සර් හිටිගමන්ම නරක ගියා වාගෙ. කවුද කතා කෙරුවෙ, බොස්ද?"

තේනබදු සහ දෙස නිහඬව බලා සිටියේය.

ගන්නව එක්ස්චේන්ජ් එකට කෝල් එකක්"යයි වේගයෙන් පවසමින් සහ දුරකථනය වික්‍රම වෙත තල්ලු කළේය.

"අහන්න මෙහෙ ස්ටේසන් නම්බර් එකට කොහෙන්ද අර කෝල් එක දීල තියෙන්නෙ කියල ඉන්නෙව"

උප පොලිස් පරීක්ෂක වික්‍රම ජයවීර තම ස්වාමියාගේ වෙනස වටහාගෙන අණ සැනෙකින් පිළිපැදිදේය. තේනබදු දන්මිටි සමින් දැඩි උනන්දුවකින් පිළිතුරක් ලැබෙන තුරු නොඉසිලිමනේ පසුවිය.

"කෝල් එක දීල තියෙන්නෙ එක්තල පැත්තෙ හෝටලයක්. ළඟ තියෙන කෝල් බොක්ස් එකකින්"

"නැත?"

"එක්තල පල්ලිය පාරේ වර්ඩ විව් හෝටලය ලඟින්"

තේනබදු වහා අසුනෙන් නැඟී සිටියේය.

වික්‍රම ජීප් එකක් අරගෙන ඉන්නවා ඉස්සරහට එන්න, මම ඉන්නව එහන" තේනබදු කලබලයෙන් පැවසීය.

වික්‍රම වහා නැඟිට ජීප් රියැදුරු ජයන්ත සොයාගෙන විනාඩි කිපයක් ඇතුළත තරහෙන් පුපුරමින් සිටි තේනබදු ඉදිරියට පැමිණියේය.

පැය භාගයකින් පමණ පොලිස් ජීප් රථය එක්තල පල්ලිය පාරේ "වර්ඩ විව්" හෝටලය ඉදිරිපිට නැවතිණ. ඩෙරික් තේනබදු රියෙන් බිමට බැස ගත්තේය. සහ එතැන සිටගෙන පසෙක සවිකර තිබුන දුරකථන ඇණවුම් කුටිය දෙස බලා සිට හෙමින් සිරුවේ එයට ලංවිය. එය සවිකර තිබුනේ පිහිනුන හෝටලය

දෙසට යොමුවන ලෙසටය. ඇමතුමක් ලබාගන්නා අය හෝටලයේ අයකැමිට ඇස ගැසෙන ආකාරයට කුවිය තබන්න තිබීම මෙහි විශේෂත්වයයි.

තේනබදු හෝටලයට ඇතුලුවී එහි අයකැමි වශයෙන් සේවය කළ කාන්තාව වෙත ගමන් කළේය. තේ පානය කරමින් සිටි කිහිපදෙනෙකුගේ අවධානයද දැන් පොලිස් නිලධාරියා වෙත යොමුවී ඇත.

තේනබදු තම අත්මරලෝසුව දෙස බැලීය.

"තමාද කැමියර්?"

කාන්තාව කියපත් බවක් පලකරමින් අසුනෙන් නැඟී සිටියාය.

"ඔව් සර්!"

"කොයි වෙලාවේ ඉඳලද ඉන්නෙ කැමියර් එතෙක්?"

ඇය දැන් නවත් බියපත් වූ බවක් පෙනින.

"දවල් ඉඳල" ඇගේ කටහඬ යාන්තමට වෙව්ලන සුලුය.

"ඒ වෙලාවේ ඉඳල කොහේවත් ගියේම නැද්ද?"

"නැහැ සර්. මම මෙහ වෙන්නෙ හයට. එතකල් වෑඩ්"

ඉන් උප පොලිස් පරීක්ෂකද වාහනයෙන් බිමට බැස අවුල්ගෙයකින් නොරව වටපිට බලන්නට විය. මෙම හදිසි අමුත්තා ගැන ක්‍රමයෙන් වට පිට අයගේ නෙක් සින් යොමුවෙමින් පැවතිණි.

"ඉතින ඉදගෙන ඉන්න කොට අර ටෙලිෆෝන් එකේ ගොදට ජේනව නේද?"

"ඔව් සර්"

"කවුරු හරි කෝල් එකක් දුන්නොත් තමාට ගොදට ජේනව. නරිද?"

ඇය චකිතයෙන්ය. "මේ මොන ගින්නකද? ඔළුවට කවා වැටෙන්න යන්නෙ හිටි ගමන්," ඒ ඇගේ කැලඹීමට පත් යටි සිතය.

"ජේනව සර්! බිසී වෙලාවල් වලට වැඩිය ගානක් නැහැ."

"දැනට හරියටම විනාඩි හතලිහකට කලින් කවුරුහරි හෑකි කෙනෙක් කෝල් එකක් ගත්ත මතකද?"

ඇය මද වේලාවක් කල්පනාවේ යෙදී සිටියාය.

"මෙතනින් අපි දන්න නොදන්න හැමෝම කෝල් ගත්තව

දවස නිස්සෙම"

"මම ඇහුවෙ දවස පුරාම කෝල් ගන්න එක ගැන නොවෙය මේක මෙතන හයිකරල තියෙන්නෙත් ඕන කෙනෙකුට සල්ලි යල කෝල් ගන්න"

"මට දැනගන්න ඕන මගේ ප්‍රශ්නෙට උත්තරේ?"

එතැන ත්‍රී රෝද ගාලේ සිටි රියදුරන් කිප දෙනෙක් ද මේ දෙදෙනාගේ සංවාදයට සවන් දීගෙන දුරින් සිටියහ. අයකැම් කාන්තාව යමක් මතකයට නගන්නාක් මෙන් එක්වරම පිළිතුරු දෙන්නට ටුවාය.

"ටික වේලාවකට ඉස්සරවෙලා අන්තිම කෝල් එක ගත්තෙ ගැහැණු කෙනෙක්. කොට ගවුමක් ඇඳල හිටියෙ. එයා ගාව මාරු කාසි නැතුව මගෙන් රුපියල් දහයක දෙකේ කාසි ඉල්ලගත්ත. කාසි තුනක් අරගෙන දෙකක් මට දිල තමයි කෝල් එක ගත්තෙ"

"ඊට පස්සෙ?"

"මට මතකත් නැහැ. මම හෙව්වෙත් නැහැ"

"හැඩහුරුකම් මතකද?"

"පලවෙනි වතාවට දැක්කෙ කොන්ඩෙ කොටට කපල ලිප්ස්ටික් එහෙම ගාල, ටිකක් සුදුයි. මගේ උස මහත ඇති."

"වයස එහෙම?"

අයකැම් කාන්තාව යාන්තමට සිනා සුනාය. "ගැහුන්ගෙ මේකප් හින්ද ඒක ගැන කියන්න අමාරුයි. හැබැයි හොඳට ඉංග්‍රීෂ් දන්නව. මගෙන් මාරුකාසි ඉල්ලුවෙ ඉන්ග්‍රීෂ්වලින්"

"තැන්ක් යූ. මම ඔන වුනොත් එනව හම්බ වෙන්න" තේනබදු හෝටලයේ ඉදිරිපස හිටගෙන වටපිටාව පිරික්සමින් වික්‍රම අර කැමියර්ගෙ යෙදර ඇඩරස් එක ගන්න"ය දැන්වීය.

උප පොලිස් පරීක්ෂක වික්‍රම ජයවීර හෝටලය තුළට පිවිසෙද්දී අවුරුදු විසිපහක පමණ තරුණයෙක් තේනබදු වෙත සමීප විය.

"අර තර්මදා අක්ක කිව්ව ගැනි මගේ ත්‍රී වීලර් එකෙන් යන්න ගනන් ඇහුව"

ඩෙරික් තේනබදු උඩගොස් බිම වැටුනාක් මෙන් තරුණයා දෙස එක්වරම පුදුමයෙන් මෙන් බැලුවේය.

"කොයි වෙලාවෙද?"

"පැය භාගයකට විතර කලින්"

"කොහාටද යන්න ඇහුවෙ?"

"සීදුව නන්දියට ගණන් අහල - වැඩිසි කියල බයි ස්ටෑන්ඩ එක පැත්තට ගියා"

"අර කැමියර් කිව්ව ගැනිමද?"

"වෙන්න ඕන සර්, පිට පැත්තකින් හවස ආවෙ එයා විතරයි මේ පලාතෙ හැමෝම අපි හොඳට අඳුරනව"

"වයස කොහොමද?"

ත්‍රී රෝද රියදුරා උපහාසයෙන් මුසුව සිනාසුනේය.

"ටිකක් වයස පාටයි. ඒ වුනාට මාර ඉස්කුරුප්පු භාණ්ඩයක් වගෙ ඇක්ෂන්, කතාබහ එහෙම ඉංග්‍රීසි කැලින් එක්ක"

"ඒ කිව්වෙ?"

"මම ගාන කිව්වම "මයි ගෝඩ්, වූ මච්, හුගාක් වැඩියි නේද?" ඔන්න මය වාගෙ. හැබැයි කට හඬ තරුණ පාටයි, ඇඟ පත කොහොම වුනත්"

"අදුන ගන්න පුලුවන්ද ආපහු දැක්කොත්?"

"මම හිතන්නෙ පුලුවන් වෙයි"

දැන් වික්‍රම මවුන් අසලය. "මේ ළමයගෙ නම, ඇඩ්‍රස් එකත් අරගන්න. මිරිහාන පොලිසියෙ නම්බර් එකත් දෙන්න. බැරිවෙලා ඔය ගැනි ආපහු දැක්කොත් වහාම දෙන්න කෝල් එකක් හරි ඔය නම්බර් එකට. විනාඩි ගානෙන් කවුරු හරි මෙහෙ ඇති. නන්දියෙ ඩියුටි කරන රාලහාමිල හිටියොත් ඒයාලට කියන්න මිරිහාන පොලිසියෙ ඕ. අයි. සී. ගෙ පණිවිඩයක් විත්තිය. එයාල ගැනි නවත්තගෙන මට කෝල් කරාවි"

* * *

ජේරීගේ ඉදිරිපස අසුනට බරවී කල්පනාවේ යෙදී නිහඬව සිටි තම ලොක්කා දෙස උප පොලිස් පරීක්ෂක වික්‍රම වරින් වර නෙත් යොමු කළ නමුදු ඔහුට ලැබුන දුරකථන ඇමතුම, එය ආරම්භක ස්ථානය ගැන සොයා බැලීම, වත්තල ගමන, හෝටලයේ අයකැමි තරුණිය හා ත්‍රී රෝද රියදුරු නැතගෙන් ප්‍රශ්න ඇසීම සහ මවුන්ගේ නම ගම් ලිපිනයන් සටහන් කර ගැනීම පිළිබඳව ඔහු අගක් මුලක් දැන නොසිටියේද? තම

ලොක්කා ගෙන් ඒ ගැන විමසීම ඔහුට අයත් රාජකාරියක් නොවන බැව් ලොක්කා ඇසුරේ සිටි වසර කිපය තුළ උගත් පාඩමකි.

දෙනු ලබන නියෝගයන් අකුරට පිළිපැදීම විනා අතුරු ප්‍රශ්න හා විමසීම් ඔහු නොරිස්සුවේය. එලෙසම ඔහු යමක් හැමවිටම කළේ හේතු සාධකයන් අරමුණු ඉටුකර ගැනීමට මිස නිකරුනේ නොවන බැව් ද හොඳින් දැන සිටියේය.

ඉදිරිපස වාඩිගෙන සිටි තේනබදු කල්පනාවේ යෙදී දැනුවත්ව හෝ නිරායාසයෙන් අත් මිට මොලවන ආකාරයද වික්‍රම හොඳින් බලාගෙනය.

පොලිස් ජීප් රිය නොපෙනී යන තෙක් බලා සිටි වත්තල "වර්ච් ටිච්" හෝටලය අසල රැස්ව සිටි අය සැවොම දැන් අයකැමි තරුණිය සහ ත්‍රී රෝද රියදුරා වටකරගෙනය.

"ආවෙ මිරිහාන පොලිසියෙ ක්‍රයිම ඕ. අයි. සී. යි, එස් . අයි මහත්තයයි. මොකක් හරි ලොකු කේස් එකක්"යි ත්‍රී රෝද රියදුරා කිවේය.

"අපරාදෙ මට අඩුගානට නයර් එක ගියාද, ගැනි ඉන්න තැන හිකමිම් දැනගන්න තිබුනා"

හෝටලයේ අයිතිකරුද එතැනට පැමිණියේය.

"හෝඩයා, පොලිසියේ මය වාගෙ තදයෙක් එක්ක ගේමට යන්නෙ එසේ මෙසේ කරා ගැනියෙක් වෙන්න බැහැ. රජ බඩුවක් වෙන්නම ඕන. සීදුව කිව්වම මොත දිපන්කරේද කවුද දන්නෙ?"

"ජකත් ඇත්ත. කාවද කෝල් එක දුන්නෙ? මොනවටද? ඇයි මෙතෙන්ට ආවෙ? කොහේද නැති තර්මදා අක්කයි, මායි කොයි වෙලාවක හරි ගෙනියාවිද හතරවෙනි තට්ටුවට?"

එයට සැවොම සිනාසෙනු පෙනින.

"අපි දෙන්නම කිව්වෙ බොරුද? වෙච්ච දේවල් "

"බලමු ! බලමු !! වෙන දෙයක් වෙයි. අපි මොනවටද බය වෙන්නෙ?" ඒ අයකැමි තරුණිය තර්මදාය.

"තැගි බෝග එහෙමත් ලැබෙන්න ඉඩ තියෙනව"යි පිරිස අතරින් කෙනෙක් උපහාසාත්මකව කිය. "මොකුත් දන්නෙ නැති විදියට කටවල් වහගෙන හිටියොත්"

"තැගි නැතුවට කමක් නැහැ. අපි දෙන්නතෙ අතක් පයක්

නොකැඩී බේරුනොත් ලොකු උදව්වක්" ත්‍රී රෝද රියදුරාගේ පිළිතුරෙන් සැවොම සිනාසෙන්නට වූහ.

* * * *

සුදත්, වික්ටර්, අනෝමා, නිමේ, නැන්දනිය සහ ප්‍රේමා කොළඹ කොටුව වෙරළ ආශ්‍රිත තරුපහේ හෝටලයක එළිමහනේ සුවපහසු ලෙස අසුන්ගෙනය. සුපිරි පිටරට මත්පැන් හා බියර්වලින් සහ විවිධ අතුරු පසින් මෙස පිරී ගොස්ය.

"අද ඇවිල්ල මගේ නැනගෙයි, සුදත් මල්ලිගෙයි ජීවිතේ අමරණිය දවස. ඒ ප්‍රීතියට තමයි මේ පාටිය" ඒ තරමකටු පදම් වී සිටි වික්ටර්ය.

"ඇයි ඔය දෙන්න නොකර සද්ද. නොකර කන්න. අපි හතර දෙනාගෙ ජීවිතවල අලුත් පිටුවකට මුල පුරන දවසක් කිව්වොත් මොකද වෙන්නෙ"

ඒ පොකිරිස්සෙකු කැබලි කිරීමට පිහියකි අනැභිව සිටි අනෝමාය.

"නෝනගෙ කතාව සහතික ඇත්ත"යි ඒ නිමේගේ වචිතා සාරියකින් හා අනෝමාගේ කණ කර අහරණින් සැරසී ඉන්ද පෙලේ කාන්තාවක් ලෙස හැඳ පැළඳ වැඩි කතා බහකින් තොරව සිටි ප්‍රේමාය.

හෝටලයේ කෑම බීම සැපයුම් කළමනාකරු ඔවුන්ගේ මේසය වෙත පැමිණ සිනා මුසු මුහුණින් යුතුව අමුත්තන්ට ආචාර කළේය. ඔහු එරික් බර්තොලමියුස් නමැති බර්ගර් ජාතියෙකි.

"මට හරි සන්තෝසයි උසාවියෙන් ඇප දුන්න එක ගැන. ඔන්න මම රිමාන්ඩ එකට ඔරිජිනල් එකට කෑම යැව්ව"

"නැත්ත් යූ වෙරි මච් එරික් මට බිල දෙන්න"

"නෝ නැන්ක්ස්, හිරගෙවල් වල ඉන්න අපේ නෝමල් කස්ටමර්ස්ලට කෑම යවල අපි සල්ලි ගන්නවද? ඒව මගේ ගණනෙ"

"ඒක කරන්න බැරි වැඩක්. ඕඩර් එක දුන්නෙ මම" අනෝමා තරමක් බියර් මතින්ය.

"සල්ලයි කෙරුවෙ මම. මගේ ගණනේ. මාසයක් හිටියත්

මම ඒවා බලාගන්නවා. අපේ රියල් කස්ටමර් කෙනෙක්නේ මැඩම්. සැහෙන කාලෙක ඉඳල මම බීසී, ගුඩ් නයිට් ඇන්ඩ් තැන්ක්ස් ෆෝර් පැට්‍රොනයිසං.

අනෝමා සිනාසුනාය. "දිස් ඊස් මයි පේවරිට් ජොයින්ට්"

"තැන්ක්ස් ෆෝර් පැට්‍රොනයිසිං අවර් හොටෙල් ප්ලීස් කම් එගේන්" කියමින් මහු සමුගෙන ඉවත්ව ගියේය.

රාත්‍රියේ අනෝමා ඇතුලු කණ්ඩායම නිවස අසලට සේන්ද්‍ර වෙද්දී පන්සල පට්ටමගට යාර කිහිපයක් ඔබ්බෙන් පොලිස් භටයෙකු විසින් රථය නවතනු ලැබීය.

අණ පිළිපදිමින් ධීමන්ත වික්ටර් වාහනය පාර අයිනට ගෙන නවතා අපහසුවෙන් මෙන් බිමට බැස ගත්තේය. පොලිස් භටයා මහු අසලට පැමිණියේය.

"කොහේද ඉන්නෙ? මේ මහ රෑ බීගෙන, කෝ ලයිසන්?"

කතාව එතැනින් නැවතිණ. "මගෙ අම්මේ මේ අපි ගාඩ් කෙරුව බංගලාවෙ මහත්තෙයලනේ. එතැනට පැමිණි කණ්ඩායමේ නායක පොලිස් සාජන්ට් තැනය. ඔහු සියල්ලන් දෙස උනන්දුවෙන් බැලීය.

"දන්න අදනන කට්ටියක්ද?"

"මොනවද සර් අහන්නෙ? මේ අපි ගාඩ් කෙරුව ගෙදර කට්ටිය. අද නමයි උසාවියෙන් ඇප දුන්නෙ"

සාජන්ට් ද මඳක් පසුබස බවක් පලවීය.

"ඩෙක් කරනවද වාහනේ?"

කොස්තාපල් සිනාසෙන්නට විය. "සර්ට ඕකත් වැඩියි වගෙයි. ඇප දුන්න ජොලියට ගහල. අපිට ඉඩිය කාලෙ හොඳට සැලකුව. සර්ල යන්න"

වික්ටර් විවෘත වාහන දොර මෑත්කර ටිකක් බරකි තරුපහේ හෝටලයේ නම රෑදි බැනයක් අතට ගත්තේය.

"ටිකක් එනවද මෙහාට?" ඒ ඇමතුම ගෙදර ආරක්ෂාවට සිටි මහු නැඳින ගත් පොලිස් නිලධාරියාටය. මහු අත රෑදි පාර්සලය මහුට බාර දෙමින් කණට ලංකර යමක් පැවසුවේය. කොස්තාපල් කැන සිනාසෙමින් බැගය අතට ගත්තේය.

වික්ටර් සාක්කුවට අත දමා සිගරට් විස්තක් සහිත පැකට්ටුවක් ද මහුට දුන්නේය. ඉන්පසු වාහනයට නැග රියදුරු අසුනේ හැන්පත්ව "රෑ වුනා වැඩියි. අපි යනව ගෙදර. අඩුපාඩු

නිදුනට දැන් කරන්න දෙයක් නැහැ.නිදි මරණ එකේ විකත් නව් හොමියෙ ඉන්න. අපි ගියා. පස්සෙ හම්බ වෙමු"

සිදුවන දෙය අනෙක් තිදෙන නිහඬව බලා සිටියහ.

වාහනය පන්සල පට්ටමගට හරවා ගෙන මඳ දුරක් යන තෙක් අත රෑදි බැගය සමඟ එදෙස බලා සිටි කොස්තාපල් තැන සගයන් තිදෙනා වෙත ලංවිය.

"විස්කි බෝතලයක් - තරු පහේ හෝටලේක බයිට්. සියලුව ඔක්කොම දිල ගියෙ. මසුරන් නෝනල මහත්තුරු. අපිට හැඩි දෙන දවස් වලත් සැලකුව සුපර් විදියට. දැන් ඉහින් අපේ වැඩේ පටන් ගමු."

"නමාලට හරි සපෝර්ට් වගෙයි මහත්තය" ඒ සාජන්ට් තැනය. විස්කි බෝතලය අතට ගනිමින් "මේක රුපියල් අත් අට සියක් වෙනව ඇති. බයිට්වල සුට්ටේ බැහැ."යි වැඩි දුරටත් පීය.

එය කී ආකාරයට කාටත් සිනහ නොවී සිටිය නොහැකි විණ. "අහම්බෙන් කඩා වැටිච්ච පරණ පිනක්. ඉස්සරවෙල පත්තු කරමුකෝ සිගරට් එකක්"

"සාජන් මහත්තය බොන්නෙ පෙට්ටි සුරුට්ටු නේද?"

මහු හඬ නඟා සිනාසුනේය.

"නිකන් හම්බවෙනකොට නොදන්න ඉංගිරිසි දෙමළ පත්තරේ හරි කියවන්නෙ නැතුව ඉන්නෙ කවුද? ගන්නව මෙහාට සිගරට් එකක්"

• • • •

නීතියෙන් වරම් නොලැබුනද එකිනෙකාට ඉහ සිහින් පෙමකල මෙම ව්‍යසනයට මැදිව පෝරකයට නැඟීමට වරම් ලැබීමෙන් ගැලවීමට තැත් කරන අනෝමා, සුදත් යුවලගේ ප්‍රථම මංගල රැය නොහොත් හනිමුන් දින එයයි.

වික්ටර්, නිමිති යුවල කලින් එක්ම සිටිය ද සිත් සැනසීමෙන් යුතුව එක්වන ප්‍රථම රැයත් එයයි.

වේලාව පාන්දර 03. 30 පමණ ඇත. නිසල පරිසරය භේදකාර නංවමින් නිකුත් මහා භයන්කර පිපිරීම් හඬක් ඇසිණි. කියෙන් ඇලලී ගිය සාමකාමී හා නිශ්චල පෙදෙසේ නිවෙස්වල වැදුලි බිබුලු එකිනෙක දැල්වීමට පටන් ගැනිණ. මෙවැනි

වේලාවක මහ මඟ නොසිටින සැවොම බියෙන් ඉස්තව පන්සල පාරේ තම තමන්ගේ නිවෙස් ලඟ විවාහ ගේට්ටු අසලට වී නිදිගැට කඩමින් හා කුතුහලයෙන් යුතුව සිටියහ. කුමකින් කුමක් සිදුවී ඇද්ද යන්න සෑම දෙනාගේම කුතුහලයයි.

අනපේක්ෂිත පිපිරීම් හඬත්, සමහර විට කොටි ත්‍රස්ත ප්‍රහාරයක්ද, පානාල කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලයක්ද? නොඑසේනම් හමුදා, පොලිස් ප්‍රහාරයක්ද සතුරන්ට එල්ල කරන ලද? මේ කිසිවක් හරිහැටි නිශ්චය කර ගැනීමට කිසිවෙකු මේ අවස්ථාවේ සමත්වූයේ නැත.

එහෙත් ඒ සියල්ලටම පිළිතුර ක්ෂණික විය.

වීරසිංහ නිවසේ ප්‍රධාන දොරවෙත එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරයක් බැව් එදෙසින් ඇසෙන කෑ කෝ ගැසීම්වලින් වැටහිණ.

මාර්ග බාධකයේ සේවයේ නියැලී සිටි පොලිස් නිලධාරීන් සැවොම ආයුධ සන්නද්ධව නිවසේ වසා තිබුන උස් යකඩ දොර වෙත ලඟාවූහ.

රාත්‍රී ඇඳුම් පිටින් සිටි නිවැසියන් උඩුමහලින් පහතට බැසීමට පටන් බියෙන් ඒ මේ අත දුවමින් කෑ කෝ ගසමින් පසුවූහ. මුර කපොල්ලේ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන් ඉදිරිපස දොරට තට්ටු කළද ප්‍රතිචාරයක් නොමැති බැවින් පොලිස් භටයන් දෙදෙනෙකු අනෙක් දෙදෙනාගේ ආධාරයෙන් උස් තාප්පයෙන් ඇතුලට පැන ගත්හ. මුලු පෙදෙසම තවමත් කලු දුමෙන් වැසී ගොස්ය. වෙඩි බෙහෙත් ගඳ තවමත් වහනය වෙමින් නිබිණ.

ගෙවත්තට පැනගත් පොලිස් භටයින් දෙදෙනා උඩු මහලේ සිට වැලපෙමින් හා මරහඬ නගමින් සිටි නිවැසියන් අමතන්නට විය.

"ටෙලිෆෝන් කරන්න පොලිසියට. අපි සද්දෙ ඇහිල ආවෙ. ගාඩ් එකේ ඉඳල. ඉක්මනට"

සුදත් උඩු මහලේ සිට මවුන් දෙස බැලීය.

"කෝල් එකක් දුන්න. දැන් එයි පොලිසියෙන්. පහල ඇති දෙන්නෙක් කත්තාකරල බලන්න"

"මොන මලයකා හිටියත් නැඟිටල එන්න දිහාය මේ සද්දෙට. උඩට වෙලා ඉන්න පොලිසියෙන් එහකල් කවුද ඉන්නෙ පහල?"

"ජේම්ස්, වඩිවේල් කෝකියයි, අපේ ගෙදර වැඩකාරයයි. ටිකක් බලන්න රාළහාමි" බීමතින් නිදිමතින් සිටි වික්ටර් කීය.

"මම ඉන්නව මෙතන - ගිහින් රවුමක් දාල එන්න. කෝ ෂුන් දෙන්න"

එවිට අදුර තුළින් නැඟුන කටහඬකි. "සර්! අපි මෙනෙ හැංගිල, මොකෝ වුනේ?"

"වරෙල්ල යකෝ එළියට. ඔතන හැංගිල කොහේද නොපි දෙන්න හිටියෙ?"

ජේම්ස් සහ වඩිවේල් බියෙන් වෙව්ලමින් පොලිස් නිලධාරීන් ඉදිරියට පැමිණියහ.

"අපි කුස්සියෙ නිදාගෙන හිටියෙ. මේ හෙන යහන වගෙ සද්දෙට එලියට පැන ගත්ත හිනෙන් වගේ. මගෙ සන්තෝ මොකද වෙලා තියෙන්නෙ?" ඒ ජේම්ස්ය.

මේ අතර වේගයෙන් පැමිණි වාහනයක් ගේට්ටුව අසල නැවතිණ. එය පැමිණියේ අනතුරු ඇඟවීමේ නලාවක්ද ගබඳ නගමිනි.

"ඔය ආවෙ පොලිසියෙන්, ඇරපන් බූරුවො ගිහින් ගේට්ටුව ඉක්මනට"

ජේම්ස් නැතිගෙන ගේට්ටුව දෙසට දිව ගියේය.

ඩෙරික් තේනබදු, වික්‍රම ජයවීර මිරිහාන පොලිසියේ අපරාධ විමර්ෂන අංශයේ පොලිස් නිලධාරීන් රැසක් වාහනයෙන් බැස වට පිටව පිරික්සූහ.

මුර සේවයේ යෙදී සිටියදී හඬ ඇසී තාප්පයෙන් පැන ගෙවත්තට ඇතුලුව සිටි දෙදෙනා හා අනෙක් පොලිස් නිලධාරීන් දෙදෙනා දැන් මොවුන් සමඟය.

"වාහනය නරවල හෙඩ්ලයිට් ගේ ඉස්සරහ දොර පැත්තට එලිය වැටෙන විදියට තියන්න ලයිට් ඕන් නොකර"

"සර් අපිත් බහින්නද පහලට?"යි වික්ටර් උඩු මහලේ සඳලුතලයේ සිට ඇසීය.

"එපා දැන්ම, බලමු ඩැමේජ් එක. තේනබදු හා වික්‍රම පොලිස් වාහනයේ විදුලි එළිය ආධාරයෙන් පිරික්සන්නට වූහ.

නිවසේ මුලු ඉදිරිපසම, ආලින්දය සහිතව කැඩී බිඳී ගොස්ය. විදුලි රැහැන් සෑම තැනම විසිරී ගොස්ය. කැඩී බිඳී ගිය කොන්ක්‍රීට් කැබැලි සෑම තැනමය.

තේනබදු හිස කසමින් දිගු වේලාවක් සිදුව ඇති හානිය සිට විකුම දෙසට හැරුනේය.

"මේ උඩ ඉන්න මිනිස්සුන්ට පහලට බහින්න වෙන්නෙ ලයිට් ඕෆ් කරල. අනික මහ රෑ, දෙන්න කෝල් එකක් ඉලෙක්ට්‍රිසිටි බෝඩ් එකේ නාවල බ්‍රාන්ච් එකට විස්තරේ කියල ස්පොට් ලයිට් හතර පහකුත් එක්ක වහාම එන්න කියල"

උඩු මහලේ කොට්ටුවී සිටි සැවොම පහලට බැස පොලිස් නිලධාරීන් සිටි තැනට පැමිණියහ. මේ අතර පිපිරීම ගැන දැනගත් ප්‍රදේශයේ රාත්‍රියේ මුර සංචාරයේ යෙදුන හමුදා නිලධාරියෙක් ද එතැනය ලඟාවිය.

තේනබදු හමුදා නිලධාරියා සමඟ කතාවට වැටුනේය.

"සෑහෙන පවර්ෆුල් බෝම්බයක් ගහල තියෙන්නෙ"

හමුදා නිලධාරියා මඳ නිහැඬියාවකය.

"වෙන්න බැහැ. ලඟම. කියන්නෙ ඉස්සරහ දොර කිට්ටුව ඉඳල හරියටම ඉලක්ක කරල ගහල තියෙන්නෙ"

"මට හරියට තේරුම් ඇතුව කියන්න. බෝම්බ ගැන මම දන්නෙ බොහොම ටිකයි.

"කෝ මෙන් ගේට් එක?"

"අර තියෙන්නෙ" තේනබදු ඇඟිල්ල දිගු කරමින් පෙන්වීය.

හමුදා නිලධාරියා දුර ප්‍රමාණය ගණනය කරමින් සිට "යාර දෙසීයක් විතර තියෙනව එතන ඉඳල ඉස්සරහ දොර ලඟට"

තේනබදු හිස සැලීය.

"ගේට් එක වහල ලොක් කරලද තිබුනෙ?"

තේනබදු එකට ගුලිව සිටි නිවැසියන් දෙස බැල්මක් හෙලීය. ඔහුගේ බැල්ම වික්ටර් වෙත යොමුවිය.

"ඉස්සරහ ගේට්ටුව රෑට ඇරලද තියෙන්නෙ?"

"මොන පිස්සුද. ජේම්ස් හැමදාම ගේට් එක ඇතුලෙන් වහල ලොක් කරල නිදාගන්නෙ"

"කෝ ජේම්ස්?" තේනබදු ගේ උස් හඬින් බියපත් ජේම්ස් පෙරට පැමිණියේය.

"කවුද ඊයේ රෑ ගේට්ටුව වැහුවෙ?"

ඔහු මඳක් පැකිලෙමින් පිළිතුරු දෙන්නට විය. "ගෙදර නෝනල මහත්තයල ආවෙ ටිකක්"

තේනබදු වියරුවෙන් මෙන් ජේම්ස්ගේ කමිස කොලරයෙන්

පෙරට ඇද එහා මෙහා සෙලවීය.

"උත්තර දීපන් යකෝ! අහන දේට. කවුද රෑ ගේට්ටුව වැහුවේ?"

"මම"

"කියට විතරද?"

"රෑ එකට විතර"

"ඊට කලින්?"

"දවසෙම වහල තිබුනෙ. නෝනල. මහත්තයල ආවට පස්සෙ ගේට්ටුව ඇරල වැහුව. මේ ටිකකට කලින් ඇරියෙ. සර්ල ආවට පස්සෙ. මේ තියෙන්නෙ ඉබ්බයි යකුරයි"

"මේකා වැහුව කියන්නෙ ගේට්ටුව?"

පිපිරීම හඬින් එතැනට පැමිණි මුර කපොල්ලේ සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරීන් ගෙන් කෙනෙකු "ඒක ඇත්ත සර් අපි එනකොටත් ගේට්ටුව ලොක් කරල. දෙන්නෙක් ඇතුලට පැන්නෙ නාප්පෙන් එක්කෙනෙකුගෙ කරට නැගල"

හමුදා නිලධාරියා වික්ෂිප්තවය.

"බෝම්බෙ ගහල තියෙන්නෙ දොරට අඩි දහයක් විස්සක් විතර ඇතින් ඉඳල. ඒක මට ඉර, හඳ වගෙ විශ්වාසයි.

තේනබදු සෑහෙන වේලාවක් කල්පනාවේ යෙදී වික්ටර් දෙසට හැරුනි.

"දැන් වෙච්ච දේට මොනව කරන්නද? හෙට බලමු කරන්න ඕන දේවල් ගැන. මම පොලිස් ගාඩ් එකක් දාල යන්නෙ. ස්පෝට් ලයිට් හතරක් දාල තියෙන්නෙ. මෙන් ස්විච් ඕෆ් කරල. දැන් උඩට ගිහින් නිදාගන්න."

"සර් අපි දෙන්න?" ඒ ජේම්ස් සහ කෝකි වඩිවේල්ය.

"උඹල දෙන්නද? මැරියව් වහ ටිකක් කාල- මෙච්චර දෙයක් වෙලත් ගාඩ් එකේ රාළහාමිල නාප්පෙන් පැනල එනකල් බයේ හැංගිලා හිටිය කාලකන්නි. මම ආපහු එනකල් අර ගේට්ටුව ලඟ ඉන්න රාළහාමිල ලඟ හිටපියව්, පට්ට ගහනව ඇනේ ඉඳලම නෙව"

අනතුරුව තේනබදු රැකවලට නැඹු පොලිස් භටයින් කැඳවීය. "මුන් දෙන්නට එළියට යන්න දෙන්න එපා. නිදාගන්න දෙන්නත් එපා. මම ආපහු එනකල්. ඇහැට පේන හරියෙ වාඩි කරල තියන්න"

තේනබදු පොලිස් වාහනයට නැඟී පිටව යද්දී බියෙන් හුස්නට කනා බහෙන් තොරව සිටි නිවැසියන් ආලින්දයේ සුන්බුන් මැදින් අවිනිශ්චිතව බියෙන් හා සැකයෙන් යුතුව උඩුමෙලට පිය නැඟුහ.

* * * *

වේලාව උදැසන 09. 10 ට පමණය. පිටකෝට්ටේ වීරසිංහ බංගලාවේ ගෙවත්තේ සෙවනැති නැනක නබන ලද මේසයක් හා පුටු කිපයකි.

එක් පුටුවක වාඩිවී සිටියේ දකුණු කොළඹ නියෝජ්‍ය පොලිස් අධිකාරී ට්‍රැසී අබේසුන්දරය. යාබදව මිරිහාන පොලිස් ස්ථානාධිපතිය. මවුන් ඉදිරිපිට ඩෙරික් තේනබදු සහ වික්‍රම ජයවීර ය.

පසෙක තිබූ අසුන්වල සිටියේ අනෝමා, සුදත්, වික්ටර් සහ නිමේෂ්‍ය.

ප්‍රේමා ,නැන්දා සහ ගින් මැණිකා කුස්සියේය. ජේම්ස් සහ එඩිවේල් නවමත් මුර සේවයේ යොදවන ලද පොලිස් නිලධාරීන් පසෙකය.

කල්පනාවේ යෙදී සිටි පොලිස් අධිකාරී ට්‍රැසී අබේසුන්දර "ඩෙරික් මොකද කියන්නෙ මේ වැඩේ ගැන" ඇසීය.

ඔහු එම පැනය ගැන අඛණ්ඩ රේණුවක තරමට හෝ නැකීමක් නොකළේය.

"උත්තර දෙන්න බැරි ප්‍රශ්නයක්, එච්චරයි"

ඊලඟ ඔහු බැල්ම යොමුකළේ පොලිස් ස්ථානිධිපති තැන වෙතය.

"නැද්ද කියන්නෙ තමාවත් මොකුක්ම?"

"ඉන්ක්වරිය එක හැන්ඩල් කරන්නෙ ඩෙරික්, විස්තර දන්නෙ එයා"

ට්‍රැසී අබේසුන්දර තේනබදු දෙස තද බැල්මක් හෙලීය.

"මේ තුන්දෙනාට අද උසාවියේදී ඇප දුන්න. තමන් විරුද්ධ නොවෙච්ච නිසා"

"මම කොහොමද ඇප දෙනවට විරුද්ධ වෙන්නෙ. මේ තුන්දෙනා ගැන පරීක්ෂණ පවත්වල ඉවරයි. ලඟම තියෙනව

ඉන්වෙස්ටිගේෂන්ස් රිපෝට්ස්. ප්‍රශ්නෙ ඇප දුන්න එක නෙවේ. බෝම්බ ගැහිල්ලයි. මට උසාවියෙ ඉඳල ආව ගමන් ලැබුන කෝල් එකයි. දෙක මේ කේස් එකට සම්බන්ධ අපිට මෙතෙක් සොයාගන්න බැරිවුන බලවේගයක් තියෙනව"

"කෝල් එක දුන්නෙ ගැනියෙක් නේද?"

ඔහු හිස සැලීය.

"අහුවෙලා ඉන්න මිනිමරුවන්ට උසාවියෙදි දඬුවම් නොකෙරුවොත්, ඒ තුන් දෙනත් මරනව කිව්ට මොන් ඵක්කම උසාවියෙ ඇතුලෙදීම"

"මැරිච්ච වීරසිංහගේ ශ්‍රාතියෙක් , යාලුවෙක් නිතාවතෙක් ඉන්නව. මේ තුන්දෙනා එකතුවෙලා මිනිමැරුම කෙරුව එක සහතික වශයෙන්ම දන්න. ඇප දෙන්න විරුද්ධ නුතෙ පොලිසිය මිනීමරුවන්ට සපෝර්ට් නිසා. තමාට තර්ජනය කරල ගෙදරට බෝම්බ ගැහුවෙ වෙලා තියෙන අසාධාරනේට විරෝධය පලකිරීම පෙන්නල දෙන්න"

අබේසුන්දර නිගමනය කෙලවර සැලෙමි දෙන සිය දෙනෙත් පිලිවෙලින් සොමු කරන්නට විය.

"ඒ සර් හිතන විදිය. මම ඒක නිකමට හරි අනුමන නොකරන්නෙ පරීක්ෂණ කෙරුවෙත්, කරගෙන යන්නෙත් මම නිසා"

ඉන් අබේසුන්දර මඳක් මෙල්ල වූ බවක් පෙනින. "මොකක්ද තමාගේ තීරණේ?"

තේනබදු නොරිස්සුම් බැල්මක් හෙලීය. "ඒක මගේ ෆයිනල් රිපෝට් එකෙන් සර්ට දැනගන්න පුලුවන් වේවි"

දැන් අබේසුන්දර කෝපයට පත්වී ඇත. "ඔය රිපෝට් එක මට හම්බ වෙන්න ගනවෙන කාල සීමාව?"

"මම නාම පරීක්ෂණ පටන් ගත්ත විතරයි. කාල සීමාවක් හරියටම කොහොමද කියන්නෙ? මම සැහීමකට පත්වෙල. පරීක්ෂණය ඉවරවුන දාට සර්ගෙ මේසෙ උඩ ඇති වාර්තාව"

අබේසුන්දර තේනබදු මෙල්ල කිරීමට මඟක් සොයන්නට උත්සාහ දැරිය.

"අතුරු සිදුවීම්, කොටින්ම තමන්ට ලැබුණු කෝල්, එක මේ ගෙදර බෝම්බ ගැහිල්ල ඒ ගැන අදහස?"

තේනබදු සිනාසෙන්නට විය.

"ඒ දෙකම මේ මිනීමැරුමට සම්බන්ධයි. බෝම්බ ගහන වෙලාවෙ සැකකාරයො තුන්දෙනාම නිදාගෙන හිටියෙ. මට කෝල් එක දිල නියෙන්නෙ චන්තල කෝල් බොක්ස් එකකින්"

අබේසුන්දර ලෙහෙසියෙන් මේල්ල කළ හැකි පුද්ගලයෙක් නොවිය.

"මුව සිම්පල් වැඩ. සල්ලි ටිකක් නියම තැන්වලට විසිකෙරුවම කුලියට ඔයිට වැඩිය දේවල් කරන අපරාධකාරයො පාහාලෙ ඉන්නව එමට"

තේනබදු ද ලෙහෙසියෙන් මේල්ල කල හැකි පුද්ගලයෙකු නොවිය.

"එකු තමයි පරීක්ෂනෙ පවත්වාගෙන යන්නෙ. සර්ට කැමති කෙනෙක් දාන්න මන් වෙනුවට. එතකොට පුලුවන් වෙන දේ බලාගන්න"

ඒ හරියටම ඉලක්කයටම වෙඩි උණ්ඩය ලැබුණු අවස්ථාවයි.

අබේසුන්දර මුවින් නොබැන මඳ වේලාවක් මේසය දෙස යොමු කරගෙන සිටි තම දෙනෙත් තේනබදු දෙසට යොමු කළේය.

"අයි ඇම සොරි, ඩෙරික්, මෙච්චර කාලෙකට ෆේල් වෙලා නැති එක මම දන්නව. මට ඇතුනෙ, මම හිතුවෙ මේකෙදි ටිකක් අඩපන වෙගෙන යන විදියක් මහම විදියට පරීක්ෂණ කරල මිණිමරුවො විතරක් අල්ලගන්න. එදාට මම එස්. පී. තමා ඒ. එස්. පී. ස්ටේනේ ඔ. අයි. සී. ත් එක්කම. මේක මුලු රටම බලා ඉන්න සෑහෙන ප්‍රචාරයක් තිබුන මිණිමැරුමක්"

ඔහු නැඟිට තේනබදු සහ පොලිස් ස්ථානාධිපතිට අතට අත දී පිටව යෑමට සැරසුනේය.

චික්ටර් ඉදිරියට පැමිණ මඳකට ඔහු නැවැත්වීය.

"සර්! තේ ෆැස්ති කරල නියෙන්නෙ. විනාඩියක් ඉඳල යන්න"

පොලිස් අධිකාරිවරයාට සිනහ පහල විය.

"ජරමර අස්සෙ බර කරන්න කිව්වලු. තේ ෆැස්ති කිරිල්ල පැත්තක දාල මේ සුන්බුන් අස්පස් කරල ඉක්මනට ඉස්සරහ කැල්ල හදාගන්න බලන්න. කොහෙමද උඩහටත් යන්නෙ එන්නෙ?"

"වැඩේට දැන් දහ දොලොස් දෙනෙක් එනව. බඩුත් එක්ක.

හවස් වෙනකොට වැඩේ ඉවරයි.

ට්‍රැසී අබේසුන්දර සිනා සුනේය. "සල්ලි වලින් මොනවද ලෝකෙ කරන්න බැරි" යයි කියමින් නෙත් කොන් බැල්මක් තේනබදු හා චික්‍රම දෙස හෙලුවේය.

www.sudduyalbums.net

11

වික්ටර් සහ අනෝමා විසින් පිළිගන්වන ලද තේ පැන් සංග්‍රහයෙන් පසු ට්‍රැසී අභයසුන්දර සැමගෙන් සමුගෙන නික්ම ගියේය. තේනබදු බටයක් සහිත සිසිල් පැන් බෝතලයක් සමඟ නිවසට සිදුව ඇතිව තිබෙන අලාභය හා පාඩුව තක්සේරු කරමින්ද, නොඑසේනම් මෙම ප්‍රහාරය ගැන හේතු සාධක සොයමින්ද සිටින බැව් පෙනින.

"කෝර්පතියන්ගෙ කේස් හැන්ඩල් කරනව කියන්නෙ ලේසි පහසු වැඩක් නෙවි. මතුපිටින් පේන්න තියෙන දේට සම්පූර්ණයෙන්ම වෙනස් අවසානෙ. මේ ගෙදර හැමෝම ලෙන්ගතුයි පොලිසියට. අපිත් ඒ විදියට මූණඉව්වාවට ප්‍රතිචාර දක්වනව. අපේ බොස් ඔය තත්වෙට ඇවිත් තියෙන්නෙ අපරාධකාරයො එක්ක ඇට බෝල ගහල නෙවි"

"ස්ල්ලි වලින් කරන්න බැරි දෙයක් අද සමාජෙ කොහෙද තියෙන්නෙ?"

ඒ බොස්ගෙ සමුගැනීමේ වචන කිහිපයයි.

බැරිද මේ ඔක්කොම ෆැලට්ජාවක් වෙන්න. අපි ඔක්කොම ගොනාට අන්දන විදියෙ? හැමෝම නිදි උඩු මහලෙ. ගෙතව බෝම්බයක් එලිවෙන ජාමෙ, මටත් වෙලපහින් දෙනට බය කරන විදියෙ කෝල් එකක්. මේ වැඩ දෙකම කරන්න ගණනත් වියදම් කරන්න වෙනව. ඒව සිම්පල් කොන්ත්‍රාත්කාරයො වැනි වැහැල. බර තිබුනද. වැඩ නිතට. අහුවෙන්නෙ, කොටුවෙන්නෙ නැතුව අන්තිමට මෝඩය වෙන්නෙ පොලිසිය"

තේනබදු අත රැඳි, මේ වන විට හිස්ව තිබුන බීම බෝතලය ද රැගෙන ගේට්ටුව දෙසට ගමන් කළේය. නිවස දෙස මොහොතක් බලා සිට හිස් බෝතලයෙන් නිවසේ ප්‍රධාන දොරටුව දෙසට මුලු වෙර යොදා දමා ගැසීය. නිවසේ ප්‍රධාන දොරට යාර කිපයක් තිබියදී බෝතලය බිම පතිත විය.

තේනබන්දු පාසැල් දිවියේ සිටි දක්ෂතම ජැවලින් ක්‍රීඩකයෙකි. මලල සහ පිටිය ක්‍රීඩාවලදී මෙම ඉරියව්වෙන් සුවිශේෂ දස්කම් පෙන්වා කුසලතා රැසක් ලබා ගත්තෙකි.

අත්හදා බැලීමේ ප්‍රයත්නය අසාර්ථකත්වය නොව බෝතලය එතැන සිට විසිකිරීමෙන් එක්තරා විදියේ නිගමනයකට පිවිසිය හැකිවීම ගැන යටි සිතින් හිනැහෙමින් පෙරට පැමිණ බෝතලය ද අහුලාගෙන තමා කළ ක්‍රියාවලිය දෙස බලා සිටි පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුලු පිරිස දෙසට නැවත ගමන් කළේය.

මිරිහාන පොලිස් ස්ථානාධිපතිවරයා සිනාසෙමින් ත්නබදු ඇමතීය. "ඩෙරික් මොකෝ ආපහු බහින්න වගෙයි ඇත්ලටික්ස්වලට?"

තේනබදු සිනාසෙමින් අසුනකට බරවීය.

"සර් අපි දැන් යමු නේද?"

"ඉවරද වැඩ?"

සැටොම නිහඬව ඔහු දෙස බලා සිටියහ. තේනබදු තම සහායක වික්‍රම දෙස බැල්මක් හෙලීය.

"එක්ක එනව ජේම්ස්, වටලප්පන් දෙන්න, වැරදුනා වටලප්පන් නෙවි වඩිවේලු"

"මොකා සර්, ඊයෙ පනල නිදා ගත්ත දෙන්න"

වික්‍රම ඉක්මනින් ජේම්ස් සහ විඩිවේල් එතැනට කැඳවාගෙන ආවේය. තේනබදු දෙදෙනාම හොඳින් නිරීක්ෂණය

කලේය.

"ඊයේ රෑ නොපි දෙන්න මර නින්දෙද ගිටියෙ?"

ඔවුන් නිහඬය.

"ගෙදර ඉන්න ඇල්ශේෂන් බල්ල රෑට ගේට්ටුව වහල අත ඇරල නේද ඉන්නෙ?"

දෙදෙනා තවමත් නිහඬය.

"ඇන්නද?"

"මව් - සර්"

"නාඳුනන කවුරුහරි වත්තට ඇතුලු වුනොත් හපා නොකැවත් බුරනව නේද?"

"මස්කට්ටු ටිකක් පැත්තකට දාල දුන්නම කාල බල්ල නිදා ගන්නව. කවදාවත්ම රෑට බුරනව ඇහිල නැහැ."

කවදාවත් නෙවී මම අහන්නෙ ඊයෙ රෑ ගැන. බල්ල බිරුවද?"

"සද්දයක් නැහැ ඇහුනෙ"

"ඒකෙන් තේරෙන්නෙ පිට කෙනෙක් නාප්පෙන් හරි ගේට්ටුවෙන් හරි පැනල, වත්ත ඇතුලට ආවේ නැති එක නේද?"

මේනෙක් නිහඬව හා බියපත් බැව් පලකරමින් සිටි ජේම්ස් තේනබදු දෙස බැලීය.

"සර්, ඔය බල්ලට දැන් වයසයි. ලොකු මහත්තය මෙහෙ ගෙනාවෙ පොඩි පැටිය කාලෙ. හැදුවෙ මම දරුවෙකුට වගේ කන්න බොන්න දීල, නාවල. ඒ දවස්වල කලා මැදිරියෙක් වත්තට ආවත් පලාකම දෙවනත් වෙන්න බුරනව"

"දැන් මොකක්ද සතාට වෙලා තියෙන්නෙ?"

"වයස වැඩි හින්ද වෙන්න ඇති. දුන්න දෙයක් කාල පැත්තකට වෙලා නිදාගන්නෙ"

"ජේම්ස් බොරු නොකිය ඉන්නට. උෆ බුරන්නෙ නැත්තෙ අදුරන මිනිස්සුන්ට විතරයි. රෑට මියෙක් ආවත් පස්සෙන් ඵලවගෙන යනව බුරාගෙන"

එසේ කිවේ අනෝමාය. ඇය කතාකලේ කෝපයෙනි.

"කතාකරන්නෙ ලොකු මහත්තය මැරුනට පස්සෙ අපි බල්ලට නොසැලකුව වගෙ. හැමදාම ගේන බලුමස්, කිරි කන්නෙ බොන්නෙ බල්ලද? තමන්ල දෙන්නද?"

"මම කිව්වෙ ජම්ට වයසයි කියල නෝන"

"කාටත් වයස යනව. නැතුව තරුණ වෙනවයි දවසින් දවස. ජේම්ස් නේද ගිය සුමානෙත් බල්ලට රුපියල් දෙසීයක් දීල ඉන්ජෙක්ෂන් ගහල බේත් අරගෙන ආවෙ"

ජේම්ස් නැවතත් නිරුත්තරවය.

"ඒකෙන් අදහස් වෙන්නෙ බල්ල නාම ඉන්නෙ ෆිට් එකේ. රෑට තමන්ට අයිති ඩියුටිය අකුරට කරනව. පිටකෙනෙක් ආවොත් නාකිකම පැත්තක තියල පැනල බුරනව ඉවට"

"මව් සර් ජේම්ස් කියන්නෙ බොරු රෑට සර්ම ඇවිත් බලන්න. හොරෙන් වත්තට පැනල මොනවද වෙන්නෙ කියල"

තේනබදු ජේම්ස් සහ වඩිවේලු දෙස බලා සිට දොරටුවේ මුරට යොදා සිටි පොලිස් භටයින් දෙදෙනා කැඳවීය.

"මේ දෙන්න ජේම්ස් වඩිවේල් මොනම හේතුවකට හරි ගේට්ටුවෙන් එලියට යවන්න තහනම්. ඒක ගැන පොතේ නෝට් එකක් දාන්න. ඩියුටි මාරුවෙන රාළහාමිලාටත් දැනගන්න එක්ක.මගේ හිතේ තියෙන්නෙ පුදුම විදියෙ දෙගිඩියාවක්. මව දුන්න ඒ කෝල් එකයි මේ බෝම්බ ගැහිල්ලයි ගැන"

තේනබන්දු එසේ පැවසුවේ චිත්‍රම ජයවීර වැනි කල්පනාකාරී බැල්මක් හෙලන අතරය.

"මටත් පුදුමයක්" කියමින් මිරිහාන පොලිස් ස්ථානාධිපතිවරයා ජේම්ස් සහ වඩිවේල් දෙසව් හැරුනි.

"බොරු කියල හිඹුනොත් නිකම්ම හරි එල්ලුම්ගස් යවත්තෙ නවුු අහල නෙවී. අපි නොපි දෙන්න එල්ලල මරන්නෙ මාපට ඇඟිලිවලින්, ඒකත් මතක තියාගනිල්ල හොඳට"යි තද කේන්තියෙන් පැවසුවේය.

තේනබදු අසුනෙන් නැඟී සිට අනෝමා සුදත් සහ වික්ටර් දෙස හැරුනේය.

"ඉක්මනට ගේ හදාගන්න බලන්න. අද හෙටම යන එන ගමන් බිමන් ටිකක් නෙවී සැහෙන්න කල්පනාවෙන් කරන්න. තවත් වැරදි නැතෙයි කියල හිතාගෙනම්"

වික්ටර්ගේ සිනාව උපහාසය මුසුය. "සර්ට කාමත් අපිව සැකයි වගේ?"

"වැරදිකාරයා හරියටම කොටුවෙනකල් කුත් ලෝකෙම සැකකිරිල්ල මගේ රස්සාවේ හැටියක් - පුරුද්දක් මෙහෙක් අත් දැකීම් හරියට කියල සනාථ කරල තියෙනව."

ඩෙරික් තේනබදු සහ වික්‍රම ජයවීර මිරිහාන පොලිස් කාර්යාලයේ භූගේගොඩ පෙදෙසේ රක්තරන් බඩු සාප්පුව කඩා ලෙස ගණනක රන් බඩු සොරා ගැනීමක් ගැන පරීක්ෂන පවත්වා සැකකරුවන් කිප දෙනෙකු අත්අඩංගුවට ගෙන. සෙසු සැකකරුවන් අල්ලා ගැනීම පිළිබඳ ගතයුතු පියවර ගැන සාකච්ඡා පවත්වමින් සිටින විට කාර්යාලයේ දුරකථනය නාද විය.

වික්‍රම රිසීවරය අතට ගෙන මඳක් සවන් යොමා සිට "ආ, ලොකු මහත්තයද? මගොම ටිකක් ඉන්න"යි පවසමින් රිසීවරය තේනබදු අතට දෙමින් "සර්ට කෝල්එකක් ලේඩි කෙනෙක් කනාකරන්නෙ"යි දැන්වීය.

තේනබදු රිසීවරය කනතබා ගත්තේය.

"සර් එදා අර ටෙලිෆෝන් කෝල් එක ගැන සොයන්න ආව දවසෙ සර්ල ගියාට පස්සෙ කැෂියර් මෙසෙ පැත්තක තිබිල මට හම්බවුනා කී ටැග් එකක්, යතුරු දෙකකුත් එක්ක"යි ගැහැනු කෙනෙකුගේ කටහඬක් රිසීවරය තුළින් ගලා එන්නට විය.

"කවුද මය කනාකරන්නෙ"

අර චන්තල වර්ච ට්‍රේ හෝටලේ කැෂියර්"

"හරි, මට මතකයි. ඉතින් දැන් මොකද කියන්නෙ? අයිතිකාරය හොයාගෙන ආවොත් දෙන්න"

"මම හිතන්නෙ මේ අර සර් විස්තර ඇහුව ලේඩිගෙ. රුසියල් දහය මාරුකරන්න පර්ස් එක ඇරිය වෙලාවෙ බැරිවෙලා වැටිල ඇත්තෙ"

මෙය ඇසූ තේනබදුගේ නළල රැළි නැංවින. ඔහු මොහොතක් නිහඬව කල්පනාවේ යෙදී සිටියේය.

"ආවෙ නැද්ද වෙන අයිතිකාරයෙක් ඒක හොයන්න?"

"නැහැ. මෙහෙ ලඟපාත කෙනෙකුගෙ වෙන්න බැහැ. යතුරු දෙකක් තියෙන නිසා නිකමට හරි සොයන්න එනව"

යතුරු දෙක විතරද තියෙන්නෙ?"

"අඟල් තුනක විතර ලස්සන රතුපාට ප්ලාස්ටික් කැල්ලක තමයි කී ටැග් එක තියෙන්නෙ. ප්ලාස්ටික් කැල්ලෙ එම්බෝස් කරල වගෙ තියෙන්නෙ පායන ඉරෙන් භාගයක්. යටින් බී. එන්. හවුස් හෝල්ඩ් ප්‍රඩක්ස් කියල පොඩි ඉංග්‍රිසි අකුරෙන් ගහල

තියෙනව"

"ඇඩරස් එකක් නැද්ද?"

"නැහැ"

"හොඳියි - මම දැන් අපේ පී. ඕ. කෙනෙක් එවනව. කොයි එකටත් කී ටැග් එක එයා අතට දෙන්න. වෙන කවුරුහරි අයිතිකාරයෙක් ආවොත් මිරිහාන පොලිසියට එවන්න. අපරාධ අංශයට. ඔබට බොහෝම ස්තුතියි අපි වෙතුවෙන් මහත්සි වුනාට" තේනබදු ඇයට ස්තුති කොට රිසීවරය තබන ලදී.

www.buddyalbums.net

12

ඩෙරික් තේනබදු රාත්‍රී එකට පමණ තම සහායක උප ඉන්ස්පෙක්ටර් වික්‍රම ජයවීර කැඳවීය.

"මෙහෙ කැන්ටින් එකේ ඇතිකරනව නේ ද පූසෝ එහෙම?" ඔහු වික්‍රමගෙන් ඇසීය. නිදියහනෙන් නැගිට පැමිණි වික්‍රම තම ලොක්කා දෙස පුදුම හඟවන බැල්මක් හෙලීය.

"සර් තාම නැද්ද නිදාගත්තෙ?"

"මම ඇහුව එකට උත්තරයක්ද දුන්නෙ?"

"සමාවෙන්න සර්, විනාඩියකට, මම හොඳට නිදාගෙන හිටියෙ"

යාබද නාන කාමරයට ගොස් නිදිමත මග හැරීමට මෙන් යාන්තමට මුහුණ සෝදාගත් වික්‍රම, තේනබදු ඉදිරියට පැමිණියේය.

"මෙහෙ කැන්ටම පැත්තෙ ඉන්නව වෙයිවාරත පැටව් ලොකු....."

තේනබදු අතින් සන් කර කතාව නැවැත්විය. "ඩියුටි ඉන්න රාලහාමි කෙනෙකුත් එක්ක එහෙ මෙහෙ දුව පැන ඇවිදින සයිස් ඩිමන් ආනන්ද

පූස් පැටියෙක් අල්ලගෙන ජීප් ඩ්‍රයිව්

උප පොලිස් පරීක්ෂක වික්‍රම බැණ වදිමින් රාජකාරියේ යෙදී සිටි කළේය.

කැන්ටිම පැත්තෙන් ඉක් ලොක්කගෙ ඔෆිස් එකට යනව"

නිදි කිරමින් සිටි පොලිස් ද බලා ඔරලෝසුව දෙස නෙත් යෙ

"දැන් වෙලාව රෑ දෙකට කි පූසෝ?"

"ඒකට උත්තර දෙන්නෙ බැලුවොත්?"

තමන්ට පැවරූ රාජකාරිය ග වේලාවක් කල්පනා කරමින් සිටි පොලිස් ද තබාගෙන නිදා සිටි සගයා අවදි කළේය.

"ඒයි නැඟිටපන්, ඒකෙක් අල්ලගන්න යන්න ඔන ඉක්මනට"

මෙසයට හිස තබාගෙන සිටි පොලිස් භටයා වහා නැඟී සිටියේය.

"මොකක්ද? හොරකමක්වත්ද?"

"හොරාට තියෙන්නෙ කකුල් දෙකයි. පස්සෙන් පන්නල වෙඩිතියල හරි අල්ල ගන්න. මේක වහාම පණපිටින් අල්ලගන්න ඔන. කෝ උඹ නාම නිදිමතේ, කොහොමද ඊළඟ ප්‍රමෝෂන් එකට රෙක්මන්ඩ් කරන්නෙ?"

"මොන යකා හරි එකපාරට අල්ලනව. ආයි නෝ හෙල්ලුත්"

අනෙකා සිනාසෙන්නට විය. "හොඳ බ්‍රේව් පොරක්, මට මේ වෙලාවෙ හැටියට හොයාගන්නත් අමාරුයි, අපි යමුද කැන්ටිම පැත්තෙ"

අනෙකා නැවතත් පුදුමය පලකළේය. "කැන්ටිම ආපහු අරින්නෙ හෙට උදේට. උඹට පිස්සු හැදීගෙන එනව වගෙයි"

"මට නෙවී බොස්ට පිස්සු. වරෙන්කො මාත් එක්ක කැන්ටිම පැත්තට යන්න."

"ඇයි කැන්ටිමේ මුදලාලි පොල්ලක්වත් දාලද බොසාට"

"වරෙන්කො කට පියාගෙන. වැඩේ ටිකක් අමාරුයි. හැබැයි අහුවුනොත් අත අරිනව නෙවී."

...ක්‍රම ජයවීර රියදුරා සමඟ තේන
...කීපයකට පසු පොලිස් භටයා
...ෙන එහි පැමිණියහ.
...න්න ඩියුටියට. අපි යමු ගමනක්"
...සිටි රාළහාමිලා එකිනෙකා දෙස

...?"
...මේ වෙලාවට. වෙන කවුරුත්
...ඔහු ඩ්‍රයිවර් දෙස බැලීය. "මේ
...ගනත් තියන්න ඕෆිස් එකෙන්. ඒ
...දකක් තියෙනව පණ තියෙන"
...ට කර ගත නොහැකිව ගොස්
...ගේ ගිනිඅවි දෙක රැගෙනවිත්
නේ...ය නුල...න්පත් කළේය.
"හරි ...ගේමට"

තේනබදු සහ රියදුරා වාහනයේ ඉදිරිපස අසුන්වලය. වික්‍රම ජයවීර සහ බලලුන් දෙදෙනා අල්වාගෙන සිටි කොස්තාපල්වරුන් දෙදෙනා පසුපස අසුනේය. ඔවුන් කුකුසෙන් යුතුව නිහඬව බලා සිටියාහ.

වාහනය පොලිස් ඒනයෙන් පිටවෙද්දි "සර් කොහාටද යන්නේ?" රියදුරාගේ පැනයට තේනබදු පිටකෝටියේ පන්සල පාරේ වීරසිංහ ගේ ළඟට. මතක නේ නැත" යන්න පමණි.

"ඒයේ රෑ ගිය බෝම්බ ගහපු ගෙදරට නේ?"

තේනබදු නිහඬව දිගු කල්පනාවක නියැලී නිවසට යාර සියයක් පමණ තිබියදී වාහනය නතර කිරීමට සන්කර ඉදිරිපස ලාම්පුද නිවාදමන ලෙස රියදුරාට නියෝග කළේය.

"වික්‍රම ගිහින් කියන්න ගාඩ් එකේ රාලහාමිල දෙන්නට සද්ද බද්ද නැතුව ඉන්න, අපි ඒ පැත්තට යනව"

ඔහු පොලිස් භටයින් දෙදෙනා දෙසට හැරුණි. "ඔය දෙන්නට කරන්න තියෙන්නෙ සුලු වැඩක්. ගාඩ් රූම් එකෙන් පුටු දෙකක් අරගෙන උඩට නැගල පූසෝ දෙන්න පුලුවන් දුරට නාප්පෙන් එහා පැත්තෙ වත්ත ඇතුලට වීසි කරන එක විතරයි. මෙන්න ඉන්නව කිට්ටුව."

එම නියෝගය නත්පර කිහිපයකින එලෙසම ක්‍රියාත්මක වී

ගතවූයේ ඇසිපිය හෙලන තරමේ සුලු කාලයකි.

නිසල පරිසරය සසල කරමින් මහ හඬින් බුරා පනින බල්ලෙකුගේ හඬ දසත පැතිර යද්දී තේනබදුයේ මුව'ඟව නැය නිබුනේ රැදුරු සිනාවකි.

"ඇල්ශේෂන් බල්ලෙක් බුරන්නෙ. සද්දෙන් පුලුවනි කියන්න. පූසෝ දෙන්න පස්සෙ එලවනව ඇති. පව් මරල දමාවිද දන්නෙත් නැහැ. දෙන්නම උගෙ කටකට වදී."

එය තේනබදුට ඇසුන නොඇසුන බවක් සෙස්සන්ට නොහැඟිනි.

"අපි යමු ස්ටේමන් එකට"

"සර් පූසෝ දෙන්න"

"රාජ භෝජන තියෙන බංගලාවකට යැවිවේ. කාල හැදිල ඉඳිවි."

දැන් ජීප් රථය මහා මාර්ගයට අවතීර්ණ වීමට ආසන්නය.

"ඔය තියෙන චෙක් පොයින්ට් එක ළඟ නවත්වන්න"

බල්ලාගේ බිරීම හඬ නවමත් නැවතී නැත. වාහනය මාර්ග බාධකය අසල නැවතිණ.

රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් සැවොම නිදිමතින් නමුත් සිරුවෙන්ය.

තේනබදු මුරකපොල්ල නාරම සිටි පැරැසුන් නැහ කැඳවීය.

"ඊයේ රෑ කවුද හිටියෙ මෙතැන ඩියුටි?"

සාජන් තැන ඔහු අසලය.

"අපි හතරදෙනා විතරයි සර්"

"රෑ දොළහයි, එකයි අතරෙ මය ඉස්සරහ තියෙන පන්සල පාරට වාහනයක්, එහෙමත් නැත්නම් මිනිහෙක් යනවි දැක්කද?"

"එකම වාහනේ නමයි පාරට ඇතුල්වුණා. ඒ අපි ගාඩ් කෙරුව වීරසිංහගේ පැජරෝ එක." ඒ නවත් රාලහාමි කෙනෙකි.

"වෙන කවුරුත්ම ගියේ නැද්ද? ලේන් එක ඇතුලට. යන්න තියෙන්නෙ මේ පාර විතරයි."

"මය වීරසිංහ ගෙදර කට්ටිය රෑ පාටියකට ගිහින් ආව. යන ගමන් අපිටත් හොඳට සලකල ගියෙ. බලාස්ට එක ඇහිල ඉස්සරවෙලාම එතෙන්ට ගියේ අපි"

"ඉස්සරහ ගේට්ටුව වහලවු තිබුණෙ යාන්තමට"

"ඇතුලෙන් ලොක් කරල, රාලහාමිල දෙන්නෙක් නාප්පෙන්

ඇතුළට පැන්නුවෙ අමාරුවෙන්"

"ගේට්ටුව වහල තිබුන එක සුවර්ද හොඳටම?"

"ඇයි නැත්තෙ. අපි දෙන්න ඇතුළට පනින කොට බෝම්බෙ පුපරල පළානම දුමෙන් වැහිල උඩතට්ටුවෙ ඉඳගෙන ගෑනු පිරිමි කීපදෙනෙක් ආධාර ඉල්ලල කෑගහනව. බයට පැන්නක්ක හැංගිල හිටිය වැඩකාරයොං දෙන්නෙක්."

"තොහොමද අපි එනකොට ගේට්ටුව ඇරල තිබුනෙ?"

"හැමදාම ගේට්ටුව වහන ජේම්ස් කියන මිනිහ ලඟ යතුර තිබුණ. ඒ දෙන්න හැමදාම නිදාගන්නෙ කුස්සියෙ"

මිරිහාන පොලිසියේ සිට ඔවුන් සමඟ පැමිණි පොලිස් භටයන් දෙදෙන මද වේලාවකට මුර කපොල්ලේ රාජකාරියේ යොදවා එතැන සිටි සිවුදෙන රියට නංවා ගත්තේය.

"වෙලාව තුනට ලන්චේගෙන එන්නෙ. නුගේගොඩ තියෙනව හොඳ රෑ කඩ"

"ඔව් සර්, බඩගිනිත් එක්ක. අපි තේ බීල ඒ දෙන්නටයි, වීරසිංහගෙ ගෙදර ඉන්න දෙන්නටයි ගෙනියමු මොනව හරි"

මහ රෑ ජිම්ගේ බිරුම් හඬින් අවදිව උඩුමහලේ නිදාසිටි සැවොම බියපත්ව සඳලුතලයට පැමිණියහ.

"ජේම්ස් බලනව ජිම් බුරන්නෙ කාටද කියල?"

මුලුතැන්ගෙය යාබද කාමරයේ විදුලි බුබුළු දැල්විණ. ජේම්ස් පමණක් නොව කෝකි වඩිවේල් ද එලියට පැමිණ සඳලුතලය දෙස බැලූහ.

"තමුසෙල දෙන්න මැරිල වගේ නිදි. නැද්ද ඇහෙන්නෙ පලාත දෙවනත් වෙන්න ජිම් බුරනව"

පිටට නොඇසෙන සේ යමක් මුමුණමින් ජේම්ස් ජිම් බුරන දෙසට ගමන් කළේය. වඩිවේල්ද ඔහු අනුගමනය කළේය.

මද වේලාවකින් දෙදෙනා ආපසු පැමිණියහ.

"කොහෙද යන හොර පූසො දෙන්නෙක් වත්ත ඇතුළට පැනල. ජිම් පස්සෙන් පන්නගෙන බුරනව. පූසො දෙන්න අරලිය ගහකට නැගල. ජිම් උන්ට බුරන්නෙ එතන ඉඳල"

"මල කරදරයක්. හැමදාම මොකක් හරි කරුමයක්. සැනසිල්ලෙ එක රෑයක් ඇස් පියා ගන්න දෙනවද?"යි වික්ටර් පරදමට මෙන් එකිනෙකාට ලංවී ජිම්ගේ හදිසි බිරිම හඬින් බියපත්ව සිටි සුදත්, අනෝමා යුවල දෙස බැලීය.

"අලුත් ජෝඩුවගෙ වෙලාව නරිම නැති පාටයි. හෙට බලමු කේන්දර දෙක" ඔහු බිත්ති ඔරලෝසුව දෙස බැලීය. "මයි ගෝඩ් පාන්දර තුනට ළඟයි. අපි ආමු උණු උණු කෝපි පාරක්"නියම යෝජනාව. නින්දත් නැඩිවිව එකේ" සුදත් ද කතාවට එක්විය.

විනාඩි කිහිපයකින් ඔවුන් කෝපි බන්දෙසි රැගෙන සඳලුතලයට පැමිණ අසුන් ගත්හ. උණුසුම් කෝපි කෝප්පයක් තොලගාන අතර වික්ටර් කතා කරන්නට විය.

"මේක මහා විකාරයක්, දැන් මගේ ඔළුවත් හරක් වෙලා තියෙන්නෙ. අයිය වෙඩි තියල මැරුව. අපි ගිරබාරෙට ගත්ත. ඇපත් දුන්න. ගෙදරට ගැනුව බෝම්බ. ඒකත් ඉවසගෙන හිටිය. අද තව කරදරයක්"

"ජීම් බිරුවෙ නරක වෙලාවට. පවන් අරගෙන හරි. පවන් ගන්න හැදුව වැඩක් මිස්පයර් වෙලා. ඒකයි නමේ. කෝ අපි දෙන්න කෑ ගැනුව, දෙඩෙව්ව බල්ල කෙරුවෙ උගේ ඩියුටි එක" අනෝමා කීවාය.

සුදත් මේ සියල්ලට නිහඬව සවන්දී ගෙන කෝපි බොන්නට විය.

"කවුද එන්නෙ මාත් එක්ක හෙට උදේ ඉන්ස්පෙක්ටර් තේනබදු හම්බවෙන්න. කොයි දෙක හරි තියෙන්න ඕන ඉවරයක්. මෙක මට පේන්නෙ දිග්ගැස්සෙන වැඩක් වගෙයි"

සුදත් එසේ කීවේ කෝපි බඳුන කනප්පුව මත තබා දුම්වැටියක් දල්වා ගන්නා අතරය.

සැවොම ඔහු දෙස බලා ගෙනය.

"ඒකත් ඇත්ත. අපි හිමිජ්ජෝ උනා වැඩියි. බහිමු ගේමට. හෙට ඉඳල අපිටත් ඉන්නව කරාල නැවකට"

වික්ටර් තම අදහස පලකළේය. "කරාල, බරාල, සල්ලි තෙව් ඕන. මෙතන සිද්ධවෙලා තියෙන, දැනට සිද්ධ වෙන්නෙ මොකක්ද කියන එක හරියට දැනගන්න. අපි තුන්දෙනා ඇපදීල ආව විතරයි ගෙදරටම ඇවිත් බෝම්බ ගහල නියා. කොහොමද එතකොට ඉස්සරහට අපි ජීවත් වෙන්නෙ. හැමදාම අපි එකෙකුට බයෙන්ද, අපි දෙන්න පිරිමි. ඕන දේකට මුහුණ දෙන්න පුලුවන්. මේ අහිංසක ගෑනු දෙන්න. ඛබෙක් හම්බවෙන්න ඉන්න නිම්මි අක්ක, අනෝම, ඒ දෙන්නට මොකද වෙන්නෙ. මේක මොන විදියකින් හරි ඉවරයක් කර ගන්නම ඕන"

සුදත් කනා බහෙන් තොරව අනෙක් අයට සවන් දී ගෙන සිටියේය.

"නිහැඩියාව නොදම පිළිවෙන" යන ඉංග්‍රීසි ප්‍රස්තා පිරුළ හිස් මුදුනින් පිළිගෙන ඒ අනුකූලව දිවි ගෙවූ නමුත් අවස්ථානුකූලව කලයුතු දේ පැහැදිලි කරදී නිහඬ විය.

"සුදන්ම කියන්න බලන්න කරන්න ඔන දේ?"

සුදත් දෙ වේලාවක් නිහඬව සිට "මම හෙට උදේට යනව ඉන්ස්පෙක්ටර් තේනබදු හම්බවෙන්න. මෙක සෙල්ලමක් නෙවි..... ජීවිත තුන හතරක බරපතල ප්‍රශ්නයක්. එක්කෝ එයා වැඩේ කරාවී. එයාට බැරිද මම යනව සී. අයි. ඩී. එකට. එහෙ ඉන්නව මං හොඳට අදුරණ වැඩකාරයෝ. බැරිම තැනට ආවොත් පාතාලෙට හරි බාරදීල දෙකෙන් එකක් කරගත්තවමයි. කවුරු හරි එකෙක් පැත්තක ඉඳගෙන බොරු මෝ දානව"යි කීය.

"හරියට හරි මල්ලී. බහිනව ගේමට. මමත් දෙනව ෆුල් සපෝර්ට් එක. බලමු මේ කරුමෙ ඉවරයක් කරගන්න"

ඒ සමගම සුදත් පසෙක අසුන්ගෙන සිටි අනෝමා පුටුවද පෙරළාගෙන සඳලුතලයට පැන්නාය.

"ඒයි කවුද, නැවතියන් ඔහොම!"

යමෙකු පසුපස දිවගිය අනෝමා ඔහු අල්වා ගෙන පිරිස අතරට පැමිණියාය.

ඒ ජේම්ස්ය.

වික්ටර් එල්ල කළ පා පහරින් ජේම්ස් බිම ඇදවැටුණි වික්ටර්ගෙන් පමණක් නොව ඔහුට වැදුණු ගුටිබැට කියා නිමකල නොහැක.

"මූ දණගාගෙන වගෙ ඇවිත් අපේ කතාබහට කන්දීගෙන ඉන්නව. මොකුත් නොදන්නව් වගේ. මම දැකල එළියට පනින කොට දිව්ව. වැඩිදුරක් කොගේද මාත් එක්ක දුවන්නෙ මැන්ටලේ." කී ඇය තවත් වේගවත් කම්මුල් පහරක් ජේම්ස්ට එල්ල කළාය. "දැන් කියාපිය තෝ මෙතන හැංගිලා කෙරුවෙ මොනවද කියල.....සුදත් ගත්ත අර මත්තෙ මූ හතරට කපල වලදාන්න වත්තෙ....."

සුදත් ජේම්ස්ගේ කමිස කොලරයෙන් අල්ලා නැඟිටුවා කටත් පහර කීපයක් එල්ල කර බිමට තල්ලු කළේය. "මූ මරන්න ඕන. ඒත් ඇත්ත අහගෙන."

ගෙතුළට ගොස් සිටි වික්ටර් ආපසු එහි පැමිණියේය. ඔහු පැමිණියේ ඇස්ලෝන් බටයකින් තවත් නැනැත්තෙකුට පහර දීමෙනි. පහරට ලක්ව සිටියේ බංගලාවේ කෝකියා වූ වඩිවේල්ය.

"හොඳ වෙලාවට සද්දෙ ඇහිල මම ඔයෙ. නැතුල එතව උඩට අපිට ගහන්න"

සිමෙන්ති පුරවා තිබූ ඇස්ලෝන් බටයෙන් වැදුන පහරල් කිහිපයකින් මෙල්ලවූ වඩිවේල් බිම වාඩිගෙනය.

"මම ආවෙ ජේම්ස් අයියට කරදරයක්ද බලන්න....සර්ලට ගහන්න නෙවී" වඩිවේල් කෙදිරිය.

ඇස්ලෝන් බටය වික්ටර් අතින් උදුරා ගත් අනෝමා වඩිවේල්ට අනුකම්පා විරහිතව දැඩි ප්‍රහාරයක් එල්ල කළාය. ඔහුගේ හිසින් ලේ වැගිරෙන්නට විය.

"තෝ ලොක්කගෙ පිම්පිය.....ජෙමාගෙ කීමට ගැනු නෙත් දුන්න පාහර බල්ල. හිතුවද මේ තෝ නියාගත්තෙ නොදැන කියලා"

ඊළඟ ප්‍රහාරයෙන් වඩිවේල් මියැදුනා සේ බිම පතිත විය.

"දෙන්න එපා පර බල්ලන්ට එක වතුර උගුරක්. මැරුණොත් කොහේහරි ගිහින් ඉමු. කෝ අනිකා?"

නොඳ සිහියෙන් සිටි ජේම්ස් ඇයට දැන් වසඟ වඳිද්දී ඇස්ලෝන් බටය ඉහල පහල ගියේය. පහර වැදෙන වැදෙන සෑම විටම ජේම්ස් මර ලතෝනි දෙන්නට විය. නමුත් ගුටට පිහිට වීමට අසලක කිසිවෙක් නැත.

"පිම්පිය මරලදාල මූ නියාගමු. තව අහන්න නුගාක් දේවල් තියෙනව. පස්සෙ මූන් මරමු ටික ටික දස වද දීල" එසේ කීවේ වික්ටර්ය.

"පොලිසියට හාරදෙමු දෙන්නම බාගෙට තෙවී, කුන්කාලට මරල. යාන්තමට කට උත්තර ගන්න පුලුවන් බැරි විදියට."

"සුදන් ගිහින් ගේන්නකෝ ඩ්‍රින්ක් එකක්. තෙවී බෝතලයක්. සිගරට්ටුත් ඇති එතනම. අපිට වැඩ තියෙනව එළිවෙනකල්."

"සර්....මම.....ආවෙ....මත්තු ....බලන්න නෙවී. මොනවද... ඔන කියල අහන්න?"

අනෝමා කෝපයෙන් පුපුරමින් අසුනෙන් නැඟිට එල්ල කළ තවත් කම්මුල් පහරකින් ජේම්ස් නිහඬය විය.

යාන්තමින් හිසින් ලේ ගලමින් සිටි වඩිවේල් කෙදිරි

ගන්නට විය.

"යු මැරෙයි වාගෙ ඉක්මනට"

නිමේ බියපත්ව කිව්වය.

"අපේ මොකෝ මැරුනොත් ගිහින් නල්ලු කරනව ගහට. නොනේ ඉඳල ආව පිම්පි බල්ලෙක්ද?"

අහෝමා කිවේ කෝපය පාලනය කරගත නොහැකිවාක් මෙන්ය.

කෙදිරිගාමින් සිටි වඩිවේල්ගේ මෙල්ල වැරෙන් පාගමින් "ඉක්මනට මැරිය බල්ලො. වද නොදී. නෝව කැළඹි ගඟේ මාළුන්ට කන්න දාන්න."

දෙදෙනම ඇන් නිහඬය. සුදත් සහ වික්ටර් මත්පැන් පානනය කරමින් කතා බහෝය. නිමේ සහ අහෝමා සඳලුනලයේ සිට අරුණෝදය උදාවන තෙක් නොඋවසිල්ලෙන් බලා සිටියහ.

ඉදිරිපස දොරටුවේ රැකවලේ යෙදී සිටි පොලිස් නිලධාරීන් දෙදෙනාට ඇසිලින් නමැති මෙහෙකාරිය තේ රැගෙන ගියාය.

මුවුන් තේ බඳුන් පිළිගනිමින් "තෝ අද පේමිස්" යැයි විමසුහ.

ඒ විමසුම වෙනදාට තේ හෙනෙන තැනැත්තා හඳුනා ගැනිනි.

"රාළහාමි ඩියුටි මේ වෙන්නෙ කියටද?"

"හරියට අටට තව පැය දෙකෙන්"

"උදේට මොනව හරි කාලම යන්න. එලිවෙනකල් නිදිමරල බඩගින්නෙ යනව එහෙම නෙවි. වටුවෙකුගෙ මස් ගරීරෙන් අඩුවෙනවලු" යි ඇසිලින් සිනාමුසුව සඳහන් කළාය.

එයට නිලධාරීන් දෙදෙනා සිනාසුනහ.

"කට හේදගෙන කුස්සියෙන්ම කාල යනව වෙනදවගේ."

ඇය හිස් බඳුන් දෙක සහිත බන්දේසිය රැගෙන මුළුතැන්ගෙය දෙසට ගමන් කළාය.

13

ඩෙරික් තේනබදුගේ සහාය උප පොලිස් පරීක්ෂක වික්‍රම ජයවීර පෙරදින රාත්‍රියේ අත්දැකීම් ගැන වෙනෙහි කරමින් සයනයේ වැතිර සිටියදී කොස්තාපල්වරුන් දෙදෙනෙක් කාමරයට ඇතුළු වූහ.

"පියේ රෑ මොස්ට සැහෙන්න වියදන්. මොකක්ද සර් පුසෝ අල්ලගෙන කරපු වැඩේ තේරුම?"

"මම කල්පනා කරන්නෙත් ඒක ගැන. පුසෝ දෙන්න ඇතුළට දැම්ම. විනාඩි පහක් හිටිය. හිනාවෙවී ආපහු ඇවිත් හැමෝටම සර් ගානෙ බීත්තර ආප්ප, වී. සිගරට්"

"ඒ වීතරක්ද, අපි දෙන්නට රුපියල් දෙසීයක් දුන්න පුසෝ ඇල්ලුවයි කිව්ව හැටියෙම."

මේ අතර වික්‍රම ජයවීරගේ මේසය මත තිබූ සෙලිපුලර් දුරකථනය නාදවන්නට විය.

"ගන්නව ඔය ෆෝන් එක මොහොට. කවුද මේ වෙලාවෙ වට කතා කරන්නෙ?" තමාටම කියා ගනිමින් වික්‍රම මෙලෙම කණ තබා ගන්නේය. අනතුරුව මද වේලාවක් සවන් යොමා සිටි අතර

කතා කිරීමෙන් වැලකී සිටින්ය.

එහෙත් ගිට හැරියේම "මව් මේ දැන් පැය බාගෙන්, මේ තාම ඉන්නෙ.ඇදේ" කිය.

අනෙක් පසින් විධානයක් ලැබුන බැව් ඔහු දෙස බලා සිටි කොස්තාපල්ට නොදවම පැහැදිලිය.

"පැය බාගෙන් මෙයි, ඊයේ රෑ ගිය පී.සී ල දෙන්නයි සර්ගෙ ඩ්‍රයිස් එකේ ඇති. වාහනේට පෙට්‍රල් ගහල රෙඩි කරගන්න. මම ඔඩර් මේ දැන් දෙනව."

අනෙක් පසින් නවන් වචන කීපයක් හුවමාරු වනු ඇසිනි.

"ටයිම් එකට ඔෆිස් එක ළඟ ඇති"

දුරකථනය මේසය මත තැන්පත් කළ වික්‍රම කොස්තාපල් දෙස බලන අතරම සයනයෙන් නැගී සිටියේය.

"ඉක්මන්ට ගිහින් ප්‍රෙඩීව කියන්න ජීප් එක රෙඩි කරගෙන වහාම මෙතෙන්ට එන්න කියල.ටිකක් දුර ගමනක් යන්න වගෙයි හදන්නෙ බොස්. ෆුල් ටෑන්ක් ගහල ඔයිල් දාගෙන එන්න කිව්වෙ ඒකයි."

වික්‍රම ඔහු අහට කිසියම් මුදලක් දී "මටත් මොනව හරි කන්න අරගෙන ඔයත් කාල ඉක්මනට එන්න. යාළුවටත් ගමනට රෙඩිවෙන්න කියන්න තියෙන්නෙ"

කැන්ටිමට ගිය කොස්තාපල් නැන තේ සිගරට් සහ කෑමට යමක් ගෙන නැවතත් කාමරයට ඇතුලුවිය.

අඩ හෝරාවකින් පසු ඩෙරික් තේනබදු, වික්‍රම ජයවීර සහ පොලිස් කොස්තාපල්වරු දෙදෙනෙකු රැගත් ජීප් රිය රියදුරු ප්‍රෙඩී විසින් ධාවනය කරමින් තිබිණි. ගමනාන්තය රියදුරාට දී ඇති උපදෙස් අනුව කුරුණෑගල පෙදෙසේ බම්ම නැමති පිටිසර ගමකි. එය වීරසිංහ නිවසේ මෙහෙකාරිය වශයෙන් සිටි සොපිගේ ගමය.

පොලිස් ජීප් රිය කුරුණෑගලට සේන්දු වීමට ගතව තිබුණ දෙපැයක කාලසීමාව ගැන තේනබදු අප්‍රසාදය පලකල බවක් නොපෙනුනි.

"සමහර නැන්වල තිබුණ ට්‍රැෆික් බලොක්වල හැටියට පැය දෙකකටත් අඩුවෙන් කුරුණෑගලට ආපු එක ප්‍රෙඩීගේ ඔය රේස්ට -ගෙට්ස් හවුස් එකකට යමුකෝ මොනව හරි සප්පායම්වෙලා

යන්න. මම උදේට කෑවෙත් නැහැ, මේ වික්‍රමයෙ කඳියවට නොකා නොබී නිදිමරාගෙන රට වටේ ලුණු පැන ඇවිදින්. මෙත් දැන් එපාවෙලා තියෙන්නෙ"

වාහනය තුළ සිටි සැමොම ඒ කියමනෙන් විනෝදයක් ලබමින් සිනාසුනහ.

"සර්, වික්‍රම මහත්තය කියන්නෙ වෙන කතාවක්"

"ඔන කෙනෙකුට පුළුවනි බොරු වෙගල් ඇද බාන්න. දැන් මේ යන ගමන මම බැහැම් කිව්ව. ඒත් එයා බලකරනව යන්නම දිපන්කරේක යනව."යි තේනබදු සිනාසෙමින් වික්‍රම දෙස බලා කිය. "කොහොම්හරි හොඳ නැහකට ගිහින් අපිට අදුනාතෙ උදේකෑම වේල හරි අරගෙන දෙනවකො ලෝබ නැතුව"

වික්‍රමද තම ලොක්කාගේ විහිළු කතාවලට සිනාතොවී සිටිය නොහැකි විය.

"බිල් ගෙවන්න කෑම බීමෙන් පස්සෙ යමු හොඳ ප්ලේස් එකකට. සර්ටත් බඩගිනි වෙලා වගෙයි පේන්නෙ හොඳව"

කුරුණෑගල නගරයට මදක් නුදුරින් පිහිටි අවන්හලකින් උදෑසන ආහාරය ගත් පිරිස විහිලු තහලු මැද බම්මන නගර පිවිසෙන විට දහවල් එකොළහට ආසන්න වෙමින් තිබුණි.

ගඩොල් පෝරණු දෙක තුනක් අසල අක්පරයකින් වටා විශාල ඉඩමක පිහිටි සොපීගේ නිවෙස ඉඩමේ ප්‍රමාණයේ එසකි.

"ඔයාල ඉන්න ජීප් එකේ. වික්‍රම විතරක් එන්න" වික්‍රමදෙ බිමට බැස තේනබදු හා එක්විය.

පොලිස් ජීප්රියක් උණබම්බු තවුල්ල ළඟ නවතා තිබෙනු දුටු සොපී ඉදිරියට ආවාය. ඇගේ මුහුණේ භීතිය හා කුතුහලය ගැබ්වී තිබිණි.

ඇය දැන් තේනබදු අබියසට පැමිණ ඇත.

"මගෙ අම්මෝ, මේ අපේ පොලිසියෙ මහත්තුරුනේ. ඇවිත් තියෙන්නෙ.....එන්නකො සර්ල ගෙට.....නැබැයි මෙව බංගලාවල් නම් නෙවි"

තේනබදු හා වික්‍රම නිවෙස තුළට ගොස් ආලින්දයේ අසුන් ගත්හ. තිදෙන අතර විනාඩි පහළොවක පමණ සාකච්ඡාවක් පැවතුණි. මේ අතරතුර හොඳට ඉදුන ආනමාලු පෙසෙල් ගෙඩි ඇවරි කීපයක් සහිත බත්දේසියක් රැගෙන විත් කනප්පුව මත

නැන්පත් කළ නවත් නැනැත්තියකි. සොපි නිලධාරීන්ට ඇය හඳුන්වා දුන්නාය.

"සර්, මේ මගේ එකම නංගී. බංගලාවේ වැඩ කරල හරි නම්බ කරපු නැම සතයක්ම දුන්නෙ මෙයාට. ළමයි දැන් ලොකු මහත්. කුලී වැඩ හරි කරල ගෙවල් දොරවල්වලට පණුන් හතර ගෙනත් දෙනව හැමදාම. ඉනින් සර් කන්නකො කෙසෙල් ගෙඩි මේචර රහ ඒව ඒ පළාත්වල නැහැනේ"

"අපිට මොකුත් එපා සොපි. අපි දැන් යන්න ඕන. සොපි කිව්ව ඔය වැල්ලව නැත හොයා ගන්න අමාරුවෙයිද?" තේනබදු විමසීය.

සොපි බුලත් කසට බැඳි දසන් විදහා සිනාසුනාය.

"මහත්තෙයල දැක්කම ගමේ ඕනම එකෙක් හරියටම නැත පෙන්නාවි. මේ කෙසෙල් ගෙඩි කන්නකො. ගෙදර එත්තෙ හැදුන ඒව."

තේනබදු සහ වික්‍රම ආනමාලු ඇවරියෙන් බාගයක් පමණ කා අවසන් කළහ.

සොපිගේ ගම්බද ආගන්තුක සත්කාර හා සුහදතාවය හම්බවේ නගරයේ ප්‍රධාන තැනක ඉහළම තනතුරක් දරණ පොලිස් නිලධාරී තැන පවා යථාර්ථය කෙරෙහි සිත යොමුකළ මොහොතකි එය.

පොලිස් නිලධාරීන් දෙදෙනා පෙරලා ජීප්රියට ගොඩ නඟිද්දී සොපි සහ ඇගේ සොහොයුරිය ඉනිරි කෙසෙල් ගෙඩි සහ තවත් තරමක කාඩ්බෝඩ් පෙට්ටියකුත් රැගෙන රිය අසලට පැමිණියහ. වාහනයේ සිටි තිදෙන සදහා තේ බන්දේසියක් රැගත් තරුණියක්ද එවුන් සමඟය.

"මෙන් තියෙනව සර්ලටත් කෙසෙල්. කාල තේ බොන්න. මගදි කන්න හොඳ ඉදිච්ච අඹ ටිකකුත් මේ පෙට්ටියෙ ඇති" ඒ වාහනයේ සිටි තිදෙනාට සංග්‍රහ කිරීමට පැමිණි සොපිය.

සොපි විසින් දක්වන ලද මඟ සලකුණ අනුව වාහනය පැයකින් පමණ වැල්ලව නගරට පැමිණි අතර එවුන් සොයා පැමිණි තැන ගැන විමසිමේදී තරුණයෙකු එවුන් සොයා පැමිණි නිවෙස පෙන්වාදීමට ඉදිරිපත්ව ජීප්රියට ගොඩවිය.

එවුන් පැමිණ සිටියේ ජේමිස්ගේ ගමේ ගෙදරටය. දැනට වෙනත් මිනිසෙකු සමඟ පවුල් ජීවිතය ගතකළ සුමනාවති නමැති

ජේමිස්ගේ හිරිඳ පොලිස් නිලධාරී විරිය දැක සොපි මෙන් නොව නරමක චකිතයකින් යුතුව සිටිනු තේනබදු හොඳින් දුටුවේය.

"දැන් ජේමිස් මේ ගෙදරට යන්නෙ එන්නෙ නැද්ද?" තේනබදු මුනගැසීමෙන් පසු පළමුවරට ඇගෙන් විමැසිය.

"එනව මහත්තය. ඉඳල හිටල. මාස තුන හතරකට වතාවක්. ආවත් සල්ලි ටිකක් දීල යනව. බඩු මුට්ටුත් අරගෙන එනව."

"අන්නිමට මෙහාට ආවෙ කවදද? ආපු දවස තමන්ට මතකද?"

ඇය මඳ වේලාවක් කල්පනාවේ යෙදී සිටියාය.

"හුඟාක් දවසකින් ආවේ නැහැ. අපි කොළඹ ඉඳින් එයා හදි ගැහුණා"

"කවදද?"

"මට හරියටම නිච්චි නැහැ. සුමාන තුන හතරකට විතර කළින්"

"සැලකුවද හොඳට ගිය දවසෙ? බංගලාවට ඉහිල්ලද හදිගැහුනෙ?"

සුමනාවති සැලෙන හඬින්. බියෙන් හා චකිතයෙන් හෙත ගසමින් පිළිතුරු සපයන ආකාරය දැන තේනබදුගේ සහ වික්‍රමගේ අවධානය යොමු වී තිබිණ.

"කොලුවා රට යවන්න ගියෙ සර්"

"යැව්වද ඉනින්?"

"ඔව් සර්, දැන් අපේ පුතා රට.....ජේමිස් අයියා ගෙයි මේ බර සේරම කරට අරගෙන කටයුතු කෙරුවෙ."

"පාස්පෝට් එහෙම හැදුවෙ කවුද?"

"ඒව ඔක්කොම එයා කොළඹදි කරල. ඒජන්සි එකකටත් සල්ලි බැන්ද"

"මොකක්ද ගිය රට?"

ඇය නරමක් කල්පනා කරමින් සිට තෙතළට ගොස් බෑගයක් ගෙනැවිත් තේනබදු අතට දුන්නාය.

"මේකෙ තියෙන කොළ ඔක්කොම රට යවන්න ලිව්ව ඒව සර්....."

තේනබදු ඒ තුළ තිබූ ලිපි කිහිපයක් පරීක්ෂාකර බලා බැනය නැවත ඇයට දුන්නේය.

"පුතා යවල තියෙන්නෙ හොඳ රටකට. සයිප්‍රස්. නොද පඩි

නෙවන රටක්. ඒජන්සි එකටත් රුපියල් හැත්තෑපන්දාහක් ගෙවල. පාස්පෝට්. අනික් වියදම් කවුද වැඩවලට සල්ලි වියදන් කෙරුවේ?"

"ජේම්ස් නමයි මෙන කවුරු ඉතින්, අපිට වියදම්වුනෙ බස්වලට මේ වියදන්, එයාන් යන එන සැරවල් වලට සල්ලි දෙනව."

"රුපියල් හැත්තෑපන්දාහක් කියන්නෙ විශාල මුදලක්. මේච්චර සල්ලියක් වියදන් කරන්න එකපාරටම සල්ලි කොහෙන්ද හම්බවුනෙ. කවුද දුන්නෙ? ඒ ගැන ඇහුවේ? බැලුවෙ නැද්ද? නිකමට හරි?"

සුමනා එම ප්‍රශ්ණයෙන් තවත් තැතිගැනුන සේය. ක්ෂනිකව ඇගේ පෙනුමද වෙනස් විය.

"මම ඒ මොකුත්ම ඇහුවෙ බැලුවෙ නැහැ."

"ලොකු මහත්තය ඉන්න කාලෙ පුතත් එක්ක ගිහින් සල්ලි ඉල්ලුව නේද?"

එන පොට හොඳ නැති බැව් ඇය වටහා ගත්තාය.

"දෙතුන් වතාවක් ගියා. ඒත් හරිගියේ නැහැ."

"ජේම්ස් ලොකු මහත්තයාත් එක්ක රංඩුවෙලා හිත හොඳ නැතුව නේද හිටියෙ. මරන්ට කලින් ඉඳලම"

"අපිට ඒක ගැන කිව්වෙ නැහැ මොකුත්. ඒත් එයා එහනමතේ වැඩ කරන්නේ තාමත්"

"වැඩ කරන එක වෙන කතාවක්. දෙන්න හිත් නොහොඳින් නේද හිටියෙ?"

ඇය එම පැණයට පිළිතුරුදීමට මැළි වූවාය.

"ඒ ගෙදරම වැඩ කෙරුව හින්ද මම එහෙම දෙයක් හිතුවෙ නැහැ."

සුමනාවතීගෙන් ඊට වඩා දැන ගැනීමට යමක් නැති බවක් මිණිමැරුමට ඇය මොනම අයුරකින් හෝ සම්බන්ධයක් නැති බැව් අවබෝධ කරගත් පොලිස් පිරිස නැවත ගමන් ඇරඹුහ. හලාවත පෙදෙසේ පිහිටි මියගිය වීරසිංහගේ දැනට වසර කිහිපයකට පෙර දික්කසාද කළ කල්‍යාණි නැමැත්තිය සොයා ගැනීම තේනබදුගේ මිළඟ අපේක්ෂාවිය. ඇය මියගිය වීරසිංහගේ ප්‍රථම භිරිඳයි.

හලාවත මුන්නේස්වරම් කෝවිල පාරේ සැතපුම් තුනක්

පමණ ගිය විට සොයිහාම් විසින් විස්තර කරන ලද කල්‍යාණිගේ නිවෙස සොයා ගැනීම එතරම් අපහසු දෙයක් නොවිය. ඇතුළුවන ගේට්ටුවේ දකුණු කණුවේ කල්‍යාණිගේ පියාගේ නම සඳහන් කර තිබිණ. මේ වන විට ඔහු මියගොස් සිටියද ඔහුගේ නම එලෙසම තිබිණ. ගෙවත්ත අක්කරයක් පමණ ඇත. වත්ත මැද හරියේ පිහිටි නිවස නවීන පන්නයේ එකක් නොවූවද, ඔලන්ද ගෘහ නිර්මාණ ශිල්පයට නැකම් කියන මධ්‍යයේ පන්තියේ එකකි.

පොලිස් ජීප් රථය ගෙම්බුලේ නවතන විට ගෙය තුළ සිටි කිහිප දෙනෙක්ම පෙරට පැමිණියේ කුතුහලයෙන් හා සැකයුතු මුහුණුවලින් යුතුවය.

ජීප් රියෙන් බැසගත් තේනබදු මඳක් ඉදිරියට ගොස් කල්‍යාණියයි සිතිය හැකි අවුරුදු හතළිස් පහක් පමණ වැනි කාන්තාවක් දැක "මට කල්‍යාණි නෝනව මුණ ගැහෙන්න පුළුවන්ද?"ය ඇසිය.

"ඒ මම ඉන්ස්පෙක්ටර් මොකක්ද මේ හදිසියක්, එන්න ඇතුළට" ඇය නිලධාරියාට ආරාධනා කළාය.

ඇගේ ඇරයුම අනුව ඩෙරික් තේනබදු සහ වික්‍රම් ජයවීර විසිත්ත කාමරයට පිවිස අසුන් ගත්හ.

"මම තමයි මැරිච්ච මිස්ටර් වීරසිංහගෙ මිණිමැරුම් හැත ඉන්ක්වයරි එක භාරව වැඩ කරන්නෙ. මේ මගේ දෙවැනියා වික්‍රම"

කල්‍යාණි දැන් ඔවුන් ඉදිරිපිට අසුන් ගත්තාය. ඇය සමඟ පිටතට පැමිණි සිටි අවුරුදු විසිගණන්වල යයි අනුමාන කළ හැකි තරුණයා සහ තරුණිය ගෙතුළට ගොස් සිටියහ.

"ඒ මිණිමැරුමට තුන් දෙනෙක් ටිමාන්ඩ් කෙරුව නේද? මය පත්තරවල තිබුනෙ ලොකුවට දාල."

"ඒක ඇත්ත. ඒ තුන්දෙනා පොලිස් අත්තඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කෙරුව. එතනදි ඇප දුන්නා."

කල්‍යාණි පොලිස් පරීක්ෂකයා වෙත හෙලූ බැල්ම පිළිකුල හා තේන්තිය මුසු එකකි.

"ඒ ගැනත් දාල තිබුනෙ පත්තරවල. ඒ තරම් දරුණු මිණිමැරුමකට මුල් නවු දවසෙම ඇප දුන්නෙ පොලිසියෙ කැමැත්ත නිසයි කියල"

එම වචන ප්‍රකාශ කළ ආකාරය සරදමකට හුරුය.

"මම තමයි ඇප දෙනවට විරුද්ධ නුනෙ"

කල්‍යාණි නොදැනුවත්වම ඇගේ මුවින් දිගු සුසුමක් පිටවිය.

"මට විරසිංහ මැරුණත්, මරුවත්, හිටියත් දෙක තුනම එකයි. ඉලන්දාරි පුතෙකුයි, ලමිස්සි දුවෙකුයි ඉන්නව කියල ඒ කාලකන්ණිය නිකමට හරි එක දවසක් බලන්නවත් ආවද?"

"නඩත්තු ගෙවනව නේද?"

"ඒකත් උගාවිය නීන්ද කෙරුව ගාන විතරයි. ඒ අවුරුදු කියකට ඉස්සරද? ඒ හම්බවෙන ගාන. දැන් රවේ වියදමේ හැටියට අපි තුන්දෙනාට කෑඳ බොන්නත් මදි"

"විරසිංහ ජීවත්වෙලා ඉන්න කාලෙ ගණන වැඩි කරගන්න බැලුවෙ නැද්ද?"

ඇය පොලිස් නිලධාරියා දෙස අධිමානය මුසු බැල්මක් හෙලුවාය.

"ඇයි නැත්තෙ ඉන්ස්පක්ටර්. මම නිකම්ම දික්කසාද වුණාට පස්සෙ ඒ අවලන් සල්ලාලයගෙ මූණ මුලිච්චි වෙන්නවත් පැත්ත පළාතෙ පස් පැගුවෙ නැහැ. ළමයි දෙන්න කිප වතාවක් යැව්ව"

"විය හියදන් ගැන ළමයි නාත්තට පැහැදිලි කරල දෙන්න උපාය."

ඇය කෝපයට පත්ව ඇති බැව් පෙනුමෙන් පැහැදිලි විය.

"මම කිව්වෙ ඉන්ස්පෙක්ටර්, උෆ මිනිහෙක් නෙව්. නිරිසනෙක්. ගැනු පෙරේතයෙක්. පේන්නෙ නැද්ද දැන් කසාද බැඳල ඉන්න නැට්ටුක්කාර බඩඩ. මේ දුවගෙ වයසෙ කෙල්ලෙක්, පත්තරේ හිනාවෙවි ඉන්න පොටොදාල තිබුණෙ. මිනිහත් මරලදාල මුලු බූදලේම අයිතිකරගෙන"

තේනබද එම කතාව ගණන් නොගත්තේය.

"ඉතින් දුවල පුතාල හම්බ වෙන්න ගියාම විරසිංහ එයාලට සලකනවද?"

ඇයගේ දෙතොලට සරදම් සිනාවක් නැගුණි. "මොකද නැත්තෙ. මහලොකු කෝටිපතිය. රුපියල් හාරපන්දාහක් දීල එවනව. මේ කෙල්ලට එක රත්තරන් බඩුවක් අරගෙන දුන්නද? මෙච්චර වයසට ගිහිල්ල හෙට අනිද්ද කසාද බඳින්න ඉන්න එකේ?"

"ඉල්ලුවෙ නැද්ද? දුවට දුවැද්ද, කතකර බඩු එහෙම"

"දුව ගිහින් ඉල්ලුව. ලියුනුත් ලිව්ව කෙල්ලරක් නැතුව. මැරෙනකල්ම. පස්සෙ බලමු වෙලාව ආවම බැරිය මොකක්ද ඔය නැට්ට හදිස්සි. ඔන්න ඔය වගෙ දෙකට දෙවාරටම නැති ගානක් දුන්න මාසෙන් මාසෙට ඒකිට ගෙවන්න සූරාවව කරුමෙ"

"එකෙන් තේරෙන්නෙ මරාදාන්න කලින් ඉඳලම දරුවො දෙන්නයි, මේ නෝනයි තමන්ගෙ දික්කසාද ස්වාමිපුරුෂයව එපත නොසැහෙන්න වෛරයකින් හිටියෙ එක නේද?"

කල්‍යාණිගේ දෙනොලට නැඟ ආවේ වියරු සිනාවකි. දෙනෙතේ පෙනුමද සම්පූර්ණයෙන්ම වෙනස් විය.

"පත්තරවල ප්‍රසිද්ධකරල තිබුණ නොවෝ එහෙත් එක ඩෙරික් තේනබදු ඇනට ලංකාවේ ඉන්න දක්ෂම පොලිස් නිලධාරියෙක් හැටියට. ඒත් අහන ප්‍රශ්න බැලුවම මට පුදුමත් හිතෙනව."

තේනබදු පමණක් නොව විතුම පයිරගේ පෙනුමද කණිකව වෙනස් විය. දෙදෙනාම දෙතෙකින් ඇය නිරීක්ෂණයකට භාජනය කළහ.

"මට දැනගත්ත ඕන විරසිංහ මැරෙන්න කලින් තමන්ට, තමන්ගෙ දරුවන්ට උදව් උපකාර කෙරුවද නැද්ද කියන එක. මිල මුදල් අහින්?"

"අපිට කරපු කිසිම උදව් උපකාරයක් නැහැ."

තේනබදු නැවතත් නැහැඬියාවකය.

"උදව් ගිහින් ඉල්ලුවෙ කට වචනයෙන්. ලියුම් වලින් ඒත් නැහැ ලැබුණෙ. තමන්ගෙ අවශ්‍යතාවයන් ඉටු නොවුනයි කිව්වොත් හරිද?"

"ඒකෙ ඇති වැරැද්දක් නැහැ."

"ඔය තරම් සල්ලි කන්දරාවක් තියෙන කෙනෙක් දික්කසාද කතාව පැත්තකට දාමු. තමන්ගෙ ජාතක දරුවො දෙන්නට පිරිමි දරුව ඇත් කරල දාල ගැනු දරුවට නොසලනකොට මොකක්ද විකල්පයක් හැටියට ගන්න තිබුව ක්‍රියාමාර්ගය? ඇය සිනාසුනාය.

"ඔවාන විකල්පයක්ද ඉන්ස්පෙක්ටර්, අපි හීරණේ කෙරුව

මෙරේ හැටියට පදේ ගහන්න. අපිට ලොකු අතු අල්ලන්න බැහැ. තාත්ත සලකන්නෙත් නැහැ. තනි මම මොනවද කරන්නෙ?"

තේනබදු කල්පනා කරන්නට විය.

"ඒකත් ඇත්ත. දැන් ඉතින් මොකක්ද කල්පනා කරගෙන ඉන්නෙ?

"දුව හලාවත ප්‍රයිවට් හොස්පිට්ල් එකක නර්ස්. එයාගෙ කණ කර ඇඳුම් ඇළඳුම් ටික හරි ගන්නෙ පඩියෙන් සිට්ටු දෙක තුනකට ගිහින් හරිබරි ගස්ස ගන්නව. පුතා යනව කොම්පියුටර් කෝස් එකකට. මීගමුවෙ. රුපියල් තිස්පන්දාහයි. බස් ගාස්තු - ගමන් වියදම් හැමදේම කරන්න ඕන මගේ අතින්. තනි වියදමෙන්."

"ඒ තත්ත්වය අනුව වීරසිංහ ගැන වෛරයක් ඇතිවීම ස්වභාවිකය."

දැන් කල්යාණි මවුන් දෙදෙන දෙස තියුණු බැල්මක් හෙලා ගෙන එක එල්ලේම බලා සිටියාය.

"එහෙම නොවින්න තියෙනවද හේතුවක්?"

"හරියට හරි කතාව. මේ නෝනට ඉන්නව කිව්වනේ සහෝදර සහෝදරියො. නැද්ද ඒ කිසිම කෙනෙකුගෙන් පිළිසරණක් උදව්වක් උපකාරයක් එහෙම?"

කල්යාණිගේ මුහුණ එක්වරම ගල් පිළිමයක ස්වරූපය ගනු පෙනින. හැඟීම්වලින් තොරව ඈ වචන පළ කළාය.

"මේ කාලෙ තමන්ගෙ බඩ ගෝස්තරේවත් හරි කර ගන්න බැරුව හැමෝම වලිකනව. කොහොමෙයි තවත් කෙනෙකුට පිහිටක් උදව්වක් උපකාරයක් කරන්නෙ?"

"ඒකත් ඇත්ත. නංගියි මල්ලියි එතකොට උදව් කරන්නෙම නැද්ද?"

"මම කළින් කිව්වෙ. ඒ ගොල්ල ජීවතත් වෙන්නෙත් බොහොම අමාරුවෙන්"

"අයි ඇම් වෙරි සොරි. අපි බොමු මොනව හරි කුල් එකක්"

කල්යාණි ගෙතුළට ගියාය. තේනබදු දුම්වැටියක් දල්වාගෙන පැකට්ටුව චිත්‍රම අතට දෙමින් දුම්රොටු කිපයක් ගුවනට මුසු කරමින් විසිත්ත කාමරයේ වට පිටාව දෙස දෙනෙත් යොමු කළේය.

"නැහැ අඩුපාඩුවක් පේන්නෙ. හොඳ පුටුසෙට්, කබඩ්, බිත්ති

සරලෝසු. මහත මැමින්. ලන්ච් ඩිනර් සෙට්ස් වෙඩිවාරණ බඩු හැටපන්දාහක් විතර වටින අලුත් වී. වී. සෙට් එක.

ඒ ඔහුගේ නෙත ගැටුන විසිත්ත කාමරය අවට තිබූ බඩු ධාහිරාදියයි.

ඔහු බිත්ති දෙස බැලීය.

ගෝන්නු- මුවෝ- අලි- සිංහ- කොට ඇතුලු වනයත සිවපාවුන් සහිත වටිනා තිරරෙදි කිපයකි. ඒ සමගම ඔහුගේ අවධානය තවත් එක් තැනකට යොමුවිය.

එක් දින දර්ශනයක අඩි හතරක පමණ සලකුණකි.

සලකුණ හිරුය. තේනබදු එක්වරම තිගැස්සුන නමුදු ඉක්මනින් එය යටපත් කර ගත්තේය.

සිරස්තලය HOME NEEDS AND SJ. PRODUCTS. ඔහුගේ දෙනෙත් කැලැන්ඩරය වෙත යොමුවී තිබියදී තල්යාණි විසිත්ත කාමරයට පැමිණියාය.

"මෙන් ඉන්ස්පැක්ටර් දුව කටලට්ස් ටිකකුත් ඇදල. එකක් දෙකක් කාල බොමු ට්‍රින්ක් එකත්. ඊප් එකටත් මම යැව්ව ඔක්කොම"

තේනබදු කල්පනා කරමින් දින දර්ශනය වෙතින් දෙනෙත් මෑත් කළේය.

"අයියෝ මැඩම් සැනෙන්න කරදර වෙලා තියෙනව"

"ආගන්තුක සත්කාරෙ අපේ ගම්බද පුරුද්දක්"

ඇය කිවාය.

වික්‍රම සමඟ එක්ව තේනබදු කටලට්ස් කිපයක් කැමෙන් පසු සිසිල් බීම බෝතලයක් අතට ගත්තේය.

"කල්යාණි නෝනට ඉන්නෙ සහෝදර සහෝදරියො දෙන්න විතරයි නේද?"

"ඔව්, ඒත් ඉන්ස්පෙක්ටර්, මල්ලි මේ ගමේම එයාගෙ වැඩකටයුතු බලා හදාගෙන ඉන්නෙ. මගේ එකම නංගි එයා ගැන හිතන කොටත් පව් කියල හිතෙනව. හරිම හරි අමාරුවෙන් ජීවත් වෙන්නෙ. මෙහෙත් යනව එනව. ඉදල හිටල මෙත් පුලුවන් විදියට උදව් පදව් කරනව. ළමයි ඉන්නව නතර දෙනෙක්."

"නැද්ද දෙමව්පියන්ගෙ උරුමෙන් එයාට මොකුත් අයිති වුනේ?"

"මේ තියෙන්නෙ, මහ ලොකු දෙමව්පියන්ගෙ උරුමෙ. කී

දෙනෙකුටද මේක ? පවුලට මොනවහරි උදව්වක් කරන්න හිටියෙ මම විතරයි. ඒකත් වතුරේ ගිය අර කාලකන්ණිය හින්දා."

"මල්ලි මෙහෙ, එහෙකොට නගා?"

ඇය එය එතරම් ගණනකට නොගත්තාක් මෙන් "එහව ඉඳල හිටල. එකපාරක පැලියගොඩ ආයිත් වැල්ලමිටියෙ. ඊළඟට රාජගිරියෙ. ඔහොම තමයි එයාගෙ ජීවිතේ"

"නැද්ද එයා කසාද බැඳල?"

"මොකෝ නැත්තෙ. දැනට හය හත් දෙනෙක් විතර"

"එහෙනම් අපි යනව මැඩම්. මොකුත් හිරිහැරයක් කරදරයක් එහෙම සිදුවුනේ නැහැනේ?"

"අයියෝ නැහැ. ඉන්ස්පෙක්ටර් ඔන වෙලාවක ඇවිත් යන්න. දැන් කොහොමද වීරසිංහගෙ නඩුව. අරකි තමයි වැඩේ දිල ඇත්තෙ. වික්ටරයත් එක්ක එකතුවෙලා. අර සුදත් කියන කොල්ලගෙ කරේ එල්ලෙන්න බලාගෙන."

"අපි නාමත් ඉන්ක්වයිරිස් ඉවර කරල නැහැ. තුන්දෙනාම මම ඉවර කරන්නෙ කොළ නැති ගහෙන්. මම මෙහෙ ආවෙත් උන්ගෙ තොණ්ඩුවට හිර කරන්න සාක්කි සොයාගෙන. ඔයාලගෙන් නියෙනව වැරදි. තාත්ත, දුව,කැන්ඩි කොන්වන්ට එකේ බෝඩින් කරල ඉගැන්නුවෙ"

"ඉන්ස්පෙක්ටර්ට පිස්සු. මොන කැන්ඩි කොන්වන්ටද? අපි දුවව යැවිවෙ හලාවත සෙන්ට්‍රල් එකට"

"එතකොට සොපී බොරුද කිව්වෙ?"

"ඒ බැල්ලිගෙ නම වත් මතක් කරන්න එපා. වීරසිංහය මොන පාගර වැඩේ කෙරුවත් ඒකි බඩ බැඳ ගත්ත විගෙයි. වීරසිංහ ඒකිට පෙනුනෙ දෙවියෙක් වගෙ. අනිකා ජෙමා. මම නොකිව්වට දැනගෙන ඇතිනෙ ඉතිහාසේ"

තේනබදු සිනාසෙන්නට විය.

"අපි සුමනාවතීවත් හම්බවෙලා ආවෙ?"

"ඒකිට ජයයි. පොල් අක්කර පහක්, කුඹුරු වෙනම. වෙන මිනිහෙක තියාගෙන ඉන්නෙ. ජේම්ස් එහෙමත් හොඳට සලකනව."

තේනබදු ඇගේ කතාව මග හැරීමට උත්සාහ දැරීය.

"ජීවිත කාලෙදි මිනිස්සුන්ට එක එක දේවල් වලට මූණ දෙන්න සිද්ධ වෙනව. ඒ අතරතුරෙන් එක එක විදියෙ හිතපු

නොහිතපු හිතෙකින්වත් බලාපොරොත්තු නොවුණ දේවලටත් මූණ දෙන්න සිද්ධවෙනව. මැදිවෙනව. ඒක ලෝක සොහාධර්මෙ. මහබඹා ඉන්නව නම් එයාට ඇර වෙන මොන ජගතෙකුටවත් මේ තුන් ලෝකෙ අබලේ රේණුවකින් හරි වෙනස්කරන්න බැහැ."

"අනේ මන්දා ඉන්ස්පෙක්ටර්, මට වෙන්න තියෙන නැම හෙණ පතයක්ම වෙලා ඉවරයි. පුරුවෙ කරපු පාප කර්මයත් පධිසත් දුන්න වගෙ. මට දුක දුවයි පුතයි නැත. ඉතින් වෙන මොනවද මහත්තයලට මගෙන් කෙරෙන්න. අහන්න තියෙන්නෙ?"

"වරදවල තේරුම් ගන්න එපා. මේක නිකං රුටින් චෙකප් එකක් විතරයි. සොපී, සුමන, අන්තිමට මෙහෙ. අපි දැන් යනව. අවශ්‍යවුණොත් ආපහු එනව. අපෙන් ඔනම දෙයත් කෙරෙන්න තියෙනවද? එක ටෙලිෆෝන් කෝල් එකෙන් නැම දේම කරනව" කී තේනබදු විකුම දෙසට හැරුණේ, "දෙන්න මේ නෝනාව අපේ ස්ටේෂන් ඩිරෙක්ට් ඩයල් නම්බර් එක" සීය.

විකුම එම නියෝගය සැනින් ඉටු කළේය.

"කෝ කතාකරන්න දුවට, පුතාට වහාම. අට්ටම නොඳට සැලකුව. නිකමට හරි ස්තුති කරල යන එක යුතුකමක්"

සිනාමුසු මුහුණින් පෙරට පැමිණි කල්‍යාණියේ දියණිය සහ පුතා දෙස මඳ වේලාවක් බලා සිටි තේනබදුගේ සිතට නැඟුන අදහස් කෙසේවිද?

"හිතන්න එපා අපි ඔයාලට කරදරයක් කරන්න ආව කියල. ඔයාලගෙ කාන්තගෙ මර්ඩර් එකේ ඉන්ක්වයරිස් නාම ඉවර නැහැ."

දියණිය අහිංසක ලෙස සිනාසුණාය.

"එතකොට අම්මල කියන්නෙ මිණිමරුවො අල්ලල නඩුදාලත් ඉවරයි කියල. ඔය පත්තරවලත් තියෙන්නෙ හැම්මාම වගේ"

තේනබදු තරුණ තරුණියන් තම දරුවන් දෙදෙනෙකු මෙන් සිතා මඳ කල්පනාවකය.

"මිණිමරුවො අපි අල්ලල ඉවරයි. ඒත් නඩුව හරියට ඔප්පු කරන්න නම් සාක්කි කිපයක් අවශ්‍යයයි. ඒකයි මෙහෙ ආවෙත් කරන්න නම් සාක්කි කිපයක් අවශ්‍යයයි. ඒකයි මෙහෙ ආවෙත්"

දෙදෙනාගේම මුහුණුවල නොයනුට පල විය.

"අපිත් එන්න ඕනද සර් සාක්කි දෙන්න?"

තේනබදු සිනාසුනි.

"නඩුව කතාකරගෙය යනකොට මොන මොන දේවල් වෙයිද කියල කවුද දන්නෙ? සමහර වෙලාවට අම්ම ඔය දෙන්න හැමෝටම එන්න වෙයි උසාවියට. බය වෙන්න කාරියක් නැහැ. අපි ඉන්නව හැම දේම බලාගන්න. දුවට බොහොම ස්තුතියි කට්ලට්ස් ටිකට."

ඇය ඉදිරියට පැමිණ පියෙකුගේ මෙන් ඔහුගේ සුරත අල්ලා ගත්තාය.

"සර් බත් ටිකක් කාලම යන්න. අපේ ගෙදර ආව මුල්ම වතාවනේ"

තේනබදු ඇගේ අත අල්වාගෙන මඳ කල්පනාවකය.

"තව වතාවක් ස්තුතියි දුවට. අපි වෙන වෙලාවක කමු. බොමු. මට දැන් හුගාක් වැඩ තියෙනව. දුවල කොළඹ ආවොත් එන්න මිරිහාන පොලිසියට. මම නැතත් මගේ නෝන ගෙදර ඉන්නව. ඕන් අපි ගියා."

නිලධාරීන් දෙදෙනා ජීප් රියට ඇතුලු වූහ.

"ඊළඟට කොහාටද සර් යන්න ඔන?"යි රියදුරු ප්‍රෙඩී විමැසීය.

"කැවේ නැද්ද කට්ලට් එහෙම ඔය කව්ටිය?"

"මොකෝ නැත්තෙ. එක්කෙනා පහ හය කෑවා"

තේනබදු සිනාසුණි. "එහෙනම් දවල් කෑම ප්‍රශ්නෙත් කට්ලට්ස්වලින්ම විසඳුනා. අපි දැන් යමු හලාවත පොලිසියට"

හලාවත පොලිසියට යාමෙන් පසු තේනබදු පොලිසියේ ලොක්කා හමුව පැමිණි කාරණය අවබෝධ කරදුන් පසු ඔහු තමන්ට අවශ්‍ය රාජකාරී මට්ටමේ සහාය ඉල්ලා සිටියේය.

මුලු මහත් දිවයින පුරාම ඉමහත් ආන්දෝලනයකට තුඩුදුන් මෙම මිණිමැරුම ගැන මනා අවබෝධයකින් යුතුව සිටි හලාවත පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තැන තේනබදුට අවැසි සියලු පහසුකම් සැලසීමට යුනුසුලු විය. එපමණක් නොව ඔහු ඔවුන්ගේ දහවල් ආහාරය ගැනද සොයා බැලුවේය.

"දැන් ඔයාලට දවල් කෑමට හෝටල් තියෙනව මේ ටවුමේ" හලාවත පොලිස් ලොක්කා සිනාසෙන අතර කීය.

"මොන ටවුමෙද නොටල් නැත්තෙ?"

"මයාල මිරිහානෙ ඉඳල ඇවිත් තියෙන්නෙ මගේ වැයික්කියව. හෝටලෙන් බත් පාර්සල් ගෙනැල්ල කනකොට මොකක්ද මගේ තත්ත්වේ?"

තේනබදු සිනාසෙන්නට විය.

"අපිට අඩුට ස්ටේතේ ඩියුටිවලට නොදට ගේවනව."

හලාවත පොලිස් ලොක්කා උස් හඬින් සිනාසෙන්නට විය. "මටද කියන්නෙ පොලිසිය ගැන. පිස්සු නැතුව ඔය දෙන්න මගේ ඔෆීස් එකේ බාත්රූම් එකට ගිහින් නාල කියල එන්න"

මෙසේ පැවැසූ ඔහු තවත් කොස්තාපල්වරයෙකු කැඳවා "මය ජීප්එකේ ඉන්න දෙන්නටත් නාකියා ගන්න දෙන්න මයාලගෙ බාත්රූම් වලින්. ඒව සේරම කරල ඉස්මනට මෙහෙට එන්න"යි විධානය කළේය.

අඩ හෝරාවකට පමණ පසු හලාවත පොලිස් ස්ථානාධිපති තැනගේ කාරුණික ආහාරපාන සංග්‍රහ වලින් සන්තර්පණය වූ තේනබදු ඇතුලු පිරිස මඳ වේලාවක් විවේක සුවයෙන් පසුවූහ. නිලධාරීන් පිරිස ආපසු මිරිහාන පොලිස් ස්ථානය වෙත ලහාවන විට ඇදිරි වැටෙන්නට ආසන්න වෙමින් තිබිණි.

"හලාවත ලොක්ක අපිට සැලකුව හොඳට." තේනබදු සිනාසෙමින් කියන්නට විය. "අපිත් එහෙම කරලා නැද්ද? අවුට් ඔෆෙන්වලින් ආපු පාටිවලට, අපේ සල්ලි වියදම් කරල හොඳට සලකල තියෙනව"

වික්‍රම ලජ්ජාවට පත්වූවාක් මෙනි.

"අනන්තවත් කරල තියෙනව."

තේනබදු කල්පනා කරන්නට විය.

"වික්‍රම හෙට හලාවත යන්න ඕන නනියම්"

වික්‍රම පුදුමයෙන් තම ජ්‍යේෂ්ඨ නිලධාරියා දෙස බැල්මක් හෙලීය.

"ආපහු යන්න? අපි ගිහින් ආවෙ හලාවත නේ?"

"මේ අහන්න මම කියන දේ. කට්ලට්ස් නඳල ගෙනත් දුන්න ගෑනු ළමය නෝට් නේද?"

වික්‍රමගේ දෙතොල්වල මඳ සිනාරැල්ලකි.

"හලාවත ගිහින් ඒ කෙල්ලව හම්බවෙන්නද තියෙන්නෙ. මම රෙඩී දැන් හරි..... ඔව් මේ දැන්ම"

තේනබදු කෝපයට පත්වූවාක් මෙනි.

"ඒ කෙල්ල හම්බුවෙන්න යනව නෙව්. එයා ප්‍රයිවට් හොස්පිටල් එකක කර්ස් කෙනෙක්. සොයා ගන්න ඕන එයා අද හෙට බඳින්න ඉන්න කොල්ල කවුද කියල?"

තමාටද සිනාසීමේ අවස්ථාව පැදී ඇතැයි වික්‍රමට සිතිණි.

"අනේ මන්ද සර්ගෙ අප්‍රහංශ වැඩ. අර මහ ගැනිගෙන් හරි කෙල්ලගෙන් හරි ඔක නිකමට ඇහගන්න නිසුනනේ"

තේනබදු නම සහායකයා දෙස හෙලූ බැල්ම ඔනු සිත් නොගත්තේය.

"නමා වැඩ කරන්නෙ අපරාධ අංශයෙ. මගේ දෙවැනියා හැටියටයි. යමක් කියන කරන වෙලාවට ඒක කරන්නෙ මොනවද, ඇයි එහෙම මෙහෙම කරන්නෙ. ඇයි ලේසි වැඩේ අමාරු විදියට කරන්නෙ කරල හිනා මතා ගන්න තාම නැද්ද දැනුමක්, අවබෝධයක් එහෙම?"

වික්‍රම ලජ්ජාවෙන් මෙන් බිම බලා ගත්තේය.

"යනව හෙට උදේට හලාවත. යුනිෆෝම් එකෙන් නෙව්. සිවිල් ඇදුමෙන්. ඒ කෙල්ල වැඩ කරන ප්‍රයිවට් හොස්පිටල් එක ළඟ ටිකක් කල් මරල ලෙඩෙක් ඇතුල් කරන්න නැත්නම් ඉන්න ලෙඩෙක් බලන්න ආව විදියට. ඉඹෙම දකින්න හම්බවෙයි කෙල්ලයි කොල්ලයි දෙන්න එකතුවෙනව"

වික්‍රම තවමත් පසුවූයේ දෙගිඩියාවෙනි.

"ඊට පස්සෙ?"

"කෙල්ල බස් එකෙන් යාවි. ඔය ස්නැක් බාර් එකකින් කුල් එකක් එහෙම බීල දැන් තියෙන තත්වෙ එහෙමනේ. තමන්ගෙ යාලු කෙල්ල බලන්න ගියත් කරන්නෙ හෝටලේට ගිහින් බඩ පිරෙන්න බත් අරන් දෙනවද?"

වික්‍රමගේ මුහුණ විලියෙන් බරවන ආකාරය තේනබදු හොඳින් දුටුවේය.

වික්‍රම සිනාසෙන්නට විය.

"සර් අද සමාජෙ ගැන, විශේෂයෙන්ම දැන් හැදෙන කෙල්ලො. කොල්ල්ලන්ගෙ හැටි හොඳ හැටි දන්නව"

"නැතුව කොහොමද මේ ජොබ් එක කරන්නෙ. දැන් කියන්න බලන්න තමන්ගෙ ඊළඟ පියවර?"

වික්‍රම මදක් කල්පනාවේ යෙදී සිටියේය.

"මම බලනව මිනිහ කොහාටද යන්නෙ කියල. එයාට

නොදැනෙන්න පිටි පස්සෙන් ගිහින්?"

"හරියට හරි. තියෙනව හරකට වගේ තඩි මොළෙ වෙටියක්"

"එතකොට රස්සාව කරන තැන ඉඹෙම දැනගෙන ඉවරයි. මම ආපහු එනව"

තේනබදු පසෙක හිඳු බැටන් පොල්ල අතට ගත්තේය.

"හරි එතකොට ගිය ගමනෙ ප්‍රථිඵල?"

"හරිනේ සර්, කොල්ල ඉන්න තැන මම සොයා ගත්ත. ඊළඟ එක සර්ට දැනගන්න ඕන"

තේනබදු බැටන් පොල්ලෙන් සෙමින් වික්‍රමගේ හිසට පහරක් දී "මොනවද ඔය ඔලුගෙඩියෙ තියෙන්නෙ. මොළේද? ගොමද?, පස්ද?" විමැසීය.

"ඒ කෙල්ල තමන් අද හෙව් කසාද බඳින්න ඉන්න කෙල්ල බස්එකට නග්ගල යාලුවෙක් හම්බවෙන්න ගිහින් හිඳුණොත් මොකක්ද තත්වෙ? එයා වැඩ කරන තැනට එකපාරටම නොගිහින්?"

වික්‍රම නැවතත් අසරණ තත්ත්වයට පත්විය.

"ඒකත් හැබැට සර්, මිනිහ අන්තිමට යන තැන ගැන බලාගෙන ඉන්න ඕන"

"පැදුනා වගේ මොළේ ටිකක්."

"ඩියුටි ඕෆ් වෙලා එනකල් ඇහැ ගහගෙන ඉඳල මැන් මැල් කරනව බොරුවට මොනව හරි අහල. ඔට ෆුවර් එකක් තියෙනව., හලාවත ලයින් එකේ අඩුම ගානෙ බියර් එකක් නරි නොබොන කෙනෙක් සොයා ගැනිල්ල නිකිණි සොයනවටත් වැඩිය අමාරුයි කියල. ඒ හින්ද යාලු මිතු ලීලාවෙන් තමන් හලාවත ටවුමට අමුත්තෙක් නිසා බාර් එකකට වඩම්මගෙන යනව. පාවාඩ නේවිසි නැතුව."

"ඉතුරු හරිය මම බලාගන්න ඕන"

"අපිට දැනගන්න ඕන එකම දෙයයි. එයා ගැහු ළමයා බඳින්නෙ දාවැද්ද ඇතුවද? නැතුවද? දාවැද්ද ගත්තවනත් කීයද? දාවැද්ද? ගැහු ළමයගෙ නම මන්දිරා. වික්‍රමත් ඒ ළමයට කැමති බවක් අඟවන්න. දාවැද්දක් නැතුව වුනත් බඳින්න.....අහන්න. ඒ වගේ පාට් එකක් ඇට කරල පෙන්වන්න"

"ඔකත් වැඩක්ද සර්. වියදන් සල්ලි එහෙම කොහොමද? මගේ පොකට් එකටද වදින්නෙ?"

තේනබදු 'උස් හඬින් සිනාසෙන්නට විය. මෙස ලාච්චුව විවෘත කර දාගේ කොල කිහිපයක් අතට ගෙන පොතක සටහන් තැබිය.

තම ලොක්කා විසින් දෙන ලද මුදල් සාක්කුවේ දමාගත් වික්‍රම අසුනෙන් නැඟී සිටියේය.

"මම යනව සර්"

"යනව විතරක් නෙවි. යන වැඩේ හරියට කරගෙන එන්නත් මතක තියා ගන්න ඕන. බැරිවෙලාවත් වැඩේ ගැස්සිලා තිබුනොත් ඔය පුටුවෙ හෙට ඉඳල ඉන්නෙ වෙන කෙනෙක්. ඒක ගැන නැහැ කතා දෙකක්"

එය අනතුරු ඇඟවීමක් බැව් වික්‍රමට අවබෝධ විය. තමන්ට පවරා ඇති මෙහෙය වචනයේ පරිසමාප්තයෙන්ම ඉටුකළ යුතුය. නොඑසේනම් කැපිල්ලට මුහුණ දිය යුතුය.

අදක්ෂතාවය තේනබදු පිළිකුල් කළ දෙයකි. තමා මෙන්ම අපරාධ අංශයේ තම ගෝල බාලයින්ද දක්ෂතාවයෙන් පිරිපුන් සිරිසක් විය යුතුය යන්න ඔහුගේ තීරණයකි.

තේනබදුගෙන් සමුගත් වික්‍රම හලාවතට පැමිණෙන විට වේලාව සවස හතරට ආසන්න වෙමින් තිබිණි. තේනබදු විසින් සපයන ලද තොරතුරු අනුව මන්දිරාගේ රාජකාරී වේලාවන් උදේ 8.00 සිට සවස 5.00 දක්වා කාලයයි.

තවත් හෝරාවක පමණ කාලයක් ඉතිරිව තිබුණ බැවින් වික්‍රම හලාවත නගරයේ තැන් තැන්වල ඇවිදිමින් අඩ හෝරාවක් පමණ මිඩංගු කර මන්දිරා සේවය කරන පුද්ගලික රෝහල දෙසට ගොස් එහි ප්‍රධාන දොරටුව පෙනෙන අයුරු අනෙක් පස පදික වේදිකාවට වී දුම්වැටියක් දල්වා ගත්තේය. නේවාසික ලෙඩුන් බැලීමට එන අය සහ ලෙඩුන් බලා ආපසු යන අය දෙසද ඔහු විමසිලිමත්ව බලා සිටියේය.

හරියටම හතර පසුවී විනාඩි හතළිස් පහ වන විට මන්දිරා රෝහලේ ප්‍රධාන දොරටුව අභියසට පැමිණියාය. දොරටුවෙන් පිටතට පැමිණි ඇය අත්ඔරලෝසුව දෙස නෙත් යොමු කර වටපිට බැලුවාය.

වික්‍රම ඇය නිරීක්ෂණය කරන්නට විය.

ඇය එතරම්ම රූමත් නොවූවද, කැපී පෙනෙන අඟ පසඟවලින් යුතුවූවාය. ඕනෑම තරුණයෙකු තම වසඟයට

ගැනීමට තරම් රූ සපුවක් ඇය සතුව තොසිබුණද, තම වසඟයට පත්වන තරුණයෙකු රැවටා ගැනීමට හැකි තත්වයක පසුවන්නියක බැව් වික්‍රම තේරුම් ගත්තේ ඇගේ ඉරියව් සහ රැව දෙස විනාඩි කිහිපයක් අවධානය යොමුකර සිටින අතරය.

හරියටම පස්වරු පහට මනාව හැඳ, පැළඳ ගත් අඳුරුඳු වීසිපහකට, වීසි හයකම පමණ තරුණයෙකු ඇය වෙත සමීපව තම අත් ඔරලෝසුව දෙස බලා යමක් පවසමින් ඇගේ උරහිසට හෙමින් තට්ටු කළේය.

ඒ ඔහු විනාඩි කිහිපයක් ප්‍රමාද වීම ගැනූ කණගාටුව පලකිරීමක් විය හැකි බව වික්‍රම කල්පනා කළේය.

දැන් තරුණයා සහ තරුණිය නගරය දෙසට ගමන් කරමින් සිටියහ.

වික්‍රම අනෙක් පස පදික වේදිකාව දිගේ ඔවුන් අනුගමනය කළේය. නගරය මධ්‍යයට පැමිණි තරුණ යුවල හෝටලයකට ඇතුළු වූ අතර වික්‍රමද නිසොල්මනේ අනෙක් පසට වී සිටියේය.

තවත් විනාඩි දහයක් පමණ ගෙවියත්ම සිනාමුසු මුහුණින් යුතුව, හෝටලයෙන් පිටතට පැමිණි තරුණ යුවල කෙළින්ම ගියේ බස් නැවතුම වෙතය.

මන්දිරා නිවස බලා යාමට බස්රියකට ගොඩවූහාය. තරුණයා අතවනා ඇයට ආචාර කරමින් දිනයට සමුගනිමින් ආපසු හැරී ගමන් කරන්නට විය.

වික්‍රම හෙමින් සීරුවේ ඔහුට ළඟාවිය.

"මේ මිස්ටර්.....සමාවෙනවද තත්පරේකට. මට පොඩි විස්තරයක් දැනගන්න තියෙනව"

තරුණයා තමා අමතන ලද අමුත්තා දෙස හැරී බැලීය.

"ඔයා කොයි පළාතෙ ඉඳලද ආවෙ?"

ඔහු කෙළින්ම ප්‍රශ්න කළේය.

"මමද? මේ පුත්තලමේ. කොට්ටුකච්චියෙ ඉඳල.

කොට්ටුකච්චිය, ගමේ නම හොඳට අහල තියෙනව. බස් එකක් එහෙමත් වැඩ කරනව නේද කොළඹ ඉඳලා?"

"හරියට හරි. කොට්ටුකච්චිය ඇවිල්ල ලොකු කොලොනියක්. විශාල වැවකුත් තියෙනව. මම පදිංචි එහෙ."

දැන් දෙදෙනම ඉදිරිපිට ගමන් කරමින්ය.

"මයා රස්සාවක් කරනවද?"

"මගෙත් ගම මෙහෙ නෙවී. මානලේ. ඇල්දෙණියෙ. රස්සාව කරන්නෙ රත්තරන් බඩු සාප්පුවක. සේල්ස්මන්"

වික්‍රම සිනාසුණි. "ඒ වුනාට අතේ කරේ රත්තරන් මොකුත් පේන්න නැහැනේ"

එයට තරුණයාට සිනා ගියේය.

"හරි කතාවක්කේ මම රත්තරන් බඩු සාප්පුවේ සේල්ස්මන් විතරයි. අයිතිකාරය නෙවී."

එයට දෙදෙනාම සිනාසුනහ.

"මගේ නම ඇන්ටනී. මහත්තය"

"මම පාලිත. ඉතින් මොනවද මගෙන් දැන ගන්න ඕන හැබැයි මම පිටගන්කාරයෙක්. මේ පළාත ගැන දන්නෙ සොච්චමයි. ටවුම ගැන සැහෙන්ඩ දන්නව. මම මෙහෙ අවුරුදු පහක් විතර වැඩ."

"දැන් ඩියුටි ඉවරද?"

"ඔව්, හරියට පහට වැඩ ඉවරයි. වික්‍රම අත්ඔරලෝසුව දෙස බැල්මක් හෙලීය."

"දවල් ඉඳල රස්තියාදුව. ඇපොයින්මනට එකක්දිල යාලුවෙක් හම්බවෙන්න ආවෙ. මිනිහ ආවෙත් නැහැ. තියෙනවද මේ ළඟ පාත බියර් එකක් බොන්න තැනක්?"

"එකක් නෙවී. පණහක් විතර තියෙනව, මේ ළඟපාත"

"එහෙම නෙවී. අපිට ටිකක් නිවී සැනසිල්ලෙ කතා බහ කරල බියර් බෝතල් දෙක තුනක් බොන්න පුලුවන් නිස්කලංක තැනක්"

තරුණයා සිනාසෙන්නට විය.

"අපොයි තියෙනව. අපිට ඉඳල හිටල චාන්ස් එකක් වැදුනහම කට්ටියම ඩ්‍රින්ක් එක දාන්න යන නියම ස්පොට් එකක් තියෙනව. එතන හිතේ හැටියට ඕන ජාතියෙ බඩිව් එහෙමත් තියෙනව. මම තැන පෙන්නල දෙන්නම්."

වික්‍රමගේ දෙතොලේ අඩ සිනාවකි.

"තැන පෙන්නල දීල විතරක් මදි. දැන් ඩියුටි ඕෆ්. බෝඩිමට යන්න වේලපන වැඩිනේ. දෙන්න ඔහෙ මොනව හරි දොඩව දොඩව බියර් එකක් ගහමු."

පාලිත මදක් පැකිලෙමින් පසුබාන බවක් පලකළේය.

"එහෙමත් නොද නෑ තේද? පළවෙනි දවසෙ හම්බවුනේ අමුත්තෙක් ඒක්ක. අද මගේ ළඟ වැඩිපුර බරත් නැහැ."

"මමනේ ඉන්නවිට කෙරුවෙ. යමුකෝ ස්පොට් එකට. බර තියෙනව මා ළඟ"

වික්‍රම සහ පාලිත පළමු බියර් බොතල් දෙක හිස්කර අවසන්ය. වික්‍රම නැවතත් ට්‍රේ කැඳවීය.

"තව බියර් බෝතල් දෙකයි, අරක්කු බාගයකුයි ගේන්න. මේක නිකම්ම බඩ පිරෙනව විතරයි. නැහැ කිසිම ගතියක්"

පාලිත ද එය අනුමත කළේය.

"මම නොකිය හිටියෙ. දෙක මික්ස් කෙරුවම පදමට වදිනව. හැබැයි ඕවර් වෙනව නෙවී."

දෙවැනි රවුමේ අඩක් අවසන් වෙද්දී වික්‍රම තමන්ව අවැසි තත්ත්වයට පාලිත පත්ව දොඩලුව ඇති ආකාරය දැක යටි සිතින් සතුටුවෙමින් තමන් පැමිණි මෙහෙය ඉටුකර ගැනීමේ අභිලාෂයෙන් කතාව පටන් ගත්තේය.

"පාලිත කසාද බඳින්න ඉන්න ගෑනු ළමයද ඒ බස් එකට නැග්ගුවෙ?"

ඔහු වහෙන් වහෝ නැතිව කෙළින්ම අවැසි මාතෘකාවට අවතීර්ණ වී.

"ඔයා කොහොමද ඒක දැන ගත්තෙ? තරමක් බීමතින් සිටියද, පාලිත කුතුහලයෙන් යුතුව ඇසීය.

"ඒක ටිකක් දිග කතාවක්"

"බැරිද කෙටියෙන් කියන්න. වැඩි වෙලා කතා කර කර හිටියොත් තට්ටු වෙන්නෙ ඔයාගෙම පර්ස් එකට"

වික්‍රමට සිනා පහල විය.

"ඒක සුලු දෙයක්. අනික අපි දෙන්න හම්බවුන පළවෙනි දවසනේ. දැන අදිනගන්නත් එක්ක ගහමු නොඳට"

දෙදෙනාම මත්පැන් ස්වල්පයක් පානය කර දුම්වැටි දෙකක් දල්වාගෙන "ඉස්සො ටික ගැන කියල වැඩක් නැහැ. මසුරන් පහට වැඩේ දීල තියෙනව" වික්‍රම ආරුඪ කරගත් බීමත් ස්වරයෙන් කීය.

"මම කිව්වෙ නැද්ද මෙතෙන්ට එක්ක එන කොටම නියම පාස්පොට් එක කියල. කියන්නකො ඉතින් ඔයාගෙ අරාබි නිසොල්ලාසෙ දිග කතාව"

වික්‍රම බැඳපු ඉස්සෙකු හපා දුම්රොටු කීපයක් ගුවනට මුසුකර පාලිත දෙස නෙත් යොමු කළේය.

"ඩෙල්මන් නර්සින් හෝම් එකද හලාවත තියන ප්‍රයිවට් හොස්පිටල් එක?"

පාලිත ඔහු වෙත නෙත් යොමු කළේය.

"නැතුව. එතෙන්ට එන්නෙ ඔක්කොම ස්පෙෂලිස්ට් ඩොක්ටර්ස්ලා. ගණන් ටිකක් වැඩියි. මම බදින්න ඉන්න මන්දිරා වැඩකරන්නෙත් එතන. නර්ස් කෙනෙක්"

වික්‍රම මත්පැන් විදුරුව අතට ගත්තේය.

"ඒක මම දන්නව"

පාලිතගේ දෙනෙත් වලට කුහලය කැටි බැල්මක් එක්විය.

"මොනවද කිව්වෙ?"

"මම මන්දිරා ගැන හොඳට දන්නව"

පාලිත තවත් පුදුමයට පත්වූවාක් සේය.

"කොහොමද, ඔයාගේ ගම කොට්ටුකච්චිය කිව්වනේද?"

වික්‍රම මත්පැන් විදුරුව හිස්කර විදුරුව මේසය මත තැබීය.

"අපේ නැන්දට අසනීප වෙලා ගෙනත් නැවැත්තුවෙ එතන. සුමාන දෙකක් විතර නැවතිල හිටිය. එයාට ඩෙත් දෙන්න ඉන්ජෙක්ෂන් ගහන්න එහෙම මන්දිරා නිතර ආව ගියා. මන්දිරා මම දැකලා අඳුරගත්තෙ එතනදී."

පාලිත නිහඬව බීම විදුරුව හිස්කර එය නැවත බියර්වලින් බාගෙට පුරවා අරක්කු ටිකක් ද වක්කර මේසය මත තබා වික්‍රම දෙස බැලීය.

"මන්දිරා අඳුරගත්ත කිව්වෙ?"

වික්‍රමගේ දෙතොලේ සරදම් සිනා රැල්ලකි.

"අඳුරගත්ත කිව්වෙ, දැන අඳුරගත්ත. වෙන දේකට නෙවේ"

"හරි දැන අඳුරගන්නම ඕන මනුස්සයො කවුරු කවුරුත්. මොකක්ද දැන් තියෙන ප්‍රශ්නෙ?"

වික්‍රම මද වේලාවක් නිහඬව කල්පනාවලියක වෙලී සිටියේය.

"ප්‍රශ්නෙද? මම කෙළින්ම ඇහුවොත් තරහක් මරහක් අමනාපයක් එහෙම ඇති වෙයිද?"

"කෙහෙල්මල් තරහ මරහ. අහන්න ඕන දෙයක්"යි කී ඔහු මත්පැන් ටිකක් පානය කළේය.

"මම උත්තර දෙනව හරි කෙළින්"ය ඔහු වැඩිදුරටත් කීය.

"ඒ කියන්නෙ දැ කැත්ත වගේ කෙළින්ද?"

එයට දෙදෙනාම උස්නඩින් සිනාසුනහ.

"අපි හිතමු එහෙම හරි. කොහොමවුනත් මේ ප්‍රශ්නෙට උත්තරේ දිල ඇති කෙස්ගහට"

"නැබැයි දෙමළ කෙස් ගහකින් හරි වෙනස් නොවී මයා මන්දිරා කසාද බඳිනවද?"

පාලිතගේ පෙනුම යාන්තමට වෙනස් විය.

"ඇයි එකපාරටම එහෙම ඇහුවෙ?"

"කෝ මගේ ප්‍රශ්නෙට උත්තරේ?"

ඔහු මද දෙගිඩියාවකින් පසුවන බැව් පෙනින.

"අපි දෙන්න තව සුමාන දෙකකින් කසාද බඳිනව"

වික්‍රම බොරුවට මෙන් මුනුණ ශෝකාකුල කරගෙන දිගු සුසුමක් හෙලා පාලිත දෙස බැලීය.

"ඒක ඔයාගෙ පින. මගේ නොලැබීම. මොනට වුනත් දෙවියන් වහන්සේගෙ තීරණේට ඔළුව පහත් කරල පිළිගන්න එක මනුස්සකම. මන්දිරා හැඩ වැඩ ඇති කෙල්ල. නම්බවෙනව ඇති ලොකු බරක් දැවැද්ද?"

පාලින හිස ධීමට නැඹුරුකරගෙන කල්පනාකාරී විය.

"මොන බරද එයාලට එයාගෙ තාත්ත අම්ම දික්කසාද කරල ඉන්නෙ. මාස්පතා ගානක් ගෙවනව. මිනිහත් පසුගිය දවස්වල මරලදාල. හැබැයි මන්දිරාගෙ පුංචි අම්ම කෙනෙක් ඉන්නව නියම බර. එයා නමයි අපිටත් ලක්ෂ පහක් දෙන්නෙ"

වික්‍රම මවිතයට පත් බැවි පලකරන බැල්මක් ඔහු දෙස හෙලීය.

මගෙ අම්මෝ, ලක්ෂ පහක්. මේ රන්හරත් බඩු කඩෙක සේල්ස්මන් කෙනෙකුට!

ඉන් අනතුරුව පාලින කළ විස්තර ඇත්ත වශයෙන්ම වික්‍රම මුදල් වියදම් කළ ගණනට වඩා දහස් ගුණයක් වටිනා බැවි ඔහුට දැනිණ. පාලින මන්දිරා පෙම් සබඳකම ගෙදරට ආරංචි වී ඔහු නිවසට කැඳවා විස්තර විමසා ඇත. ඔහු නිරත රැකියාව අනුව දියණිය විවාහ කර දීමට මව අකමැති වී ඇති අතර ඔහු කළ කරුණු පැහැදිලි කිරීමේදී මවගේ නැගණිය ඔවුනට පිලිසරණ වීමට පොරොන්දු වී ඇත.

පාලිතගේ අදහස හලාවත නගරයේ තමන්ගේම ස්වර්ණාභරන හලක් ඇරඹීමයි. ඒ සඳහා ඔහුගේ මිතුරෙකු විසින් අත්තිකාරම් මුදල් රහිතව කඩයක් ලබාදෙනු ලැබීය. ඔහු තමාගේ අවුරුදු පනස සේවා කාලය තුළ ඉතිරි කරගෙන තිබුණු මුදල් යොදවා කඩය නවීකරණය කර සියල්ල සූදානම්කර ඇත.

"කඩේ හදල, ඇලුමිනියම් පාට්ෂන් ගහල, නියම කන්ඩිෂන් එකට ගත්ත. මගේ ඉතුරු කරල තිබුන සල්ලිවලින්. එයාලටත් ආස හිතුන කඩේට. මන්දිරාගෙ පුංචි කඩේ දිල තිබුණ වැඩපාර දැක්කම පුදුම වුනා. එදා කඩේදි මන්දිරාගෙ අම්මත් ඉස්සරහ තමයි කිව්වෙ "හරි මම දෙනව ලක්ෂ පහක්. හැබැයි මන්දිරා කසාද බැඳල මෙහෙ කැෂියර් හැටියට ඉන්න ඕන. පස්සෙ අනන්මනන් දොඩවනව විතරක් නෙවී. මම හොඳට හරිම හොඳයි. නරකටත් එ වගේම නරක ගැනියෙක්. අක්ක වගෙ නෙවී. මේ තත්ත්වෙ ඉන්නෙ ඒකයි"

වික්‍රම ඔහුට සවන් යොමා සිටියදී සිතට නැඟුන අදහස් විශ්ධය.

"මාර චන්ඩි ලෙවල්- බඡාර් ටෝක් එකක් නේ දිල තියෙන්නේ"

පාලිත අහිංසක ලෙස සිනාසුනි. "මොන ටෝක් එක හරි පොරොන්දු විදියට සුළාත දෙකකට කලින් ඇන්ටි ලක්ෂ පහක් දුන්නා. මම ලක්ෂ පහටම බඩු දැම්මා. ඔරිජිනල් විදියට. අපි දෙන්න කසාද බැන්ද හැටියෙම ඔපන් කරනව මන්දිරා ජුවලරි මාවි එක, කොහොමට හිටිවිද එතකොට. පරණ කස්ටමර්ල සේරම ඇදල ගන්න මම දන්නව ක්‍රම සහ විධි. බඩු හදන්න අපේ කඩේ සුපර් වැඩකාරයොත් මාත් එක්ක එක පයින්"

"ලක්ෂ පහක් අක්කගෙ දුවට දැවැද්දට දෙන්න නගා ලොකු බිස්නස් කාරියක් වෙන්න ඇති" වික්‍රම විමැසීය.

"අපිට මොනවටද අලගිය මුලගිය තැන්. සල්ලි හම්බ වුනාට පස්සෙ"

"කොතනද ඉන්නෙ ඒ ඇන්ටි?"

"ඒක දන්නෙත් නැහැ නාම හරියට. මන්දිරා බැන්දට පස්සෙ බැරිය නෑදෑයින්ගෙ ගෙවල් දොරවල් දැනගන්න"

වික්‍රම මිරිහාන පොලිසියට ආපසු පැමිණ තේනබදුගේ කාර්යාලයට ඇතුලුවන විට වේලාව රාත්‍රී දහයට ආසන්න

වෙමින් තිබිණි.

"ඔත්න මම ආව සර්, තවමත් ඕත්ත වී වික්‍රම් ලොක්කා ඉදිරිපිට වූ අසුනට බර වෙමින් කීය.

තේනබදු ඕමත්ව සිටින තම දෙවැනියා දෙස අමුතු බැල්මක් හෙලීය.

"මම හිතුවෙ වියදමට සල්ලි අරගෙන නොදාටම බිල කොහේහරි වැටිල ඇති කියල. කොහොමද ගියෙ වැඩේ?"

වික්‍රම තරමක් උස් හඬින් සිනාසෙන්නට විය.

"මොනවද මේ කතා. වික්‍රම යමකට අත ගැහුවොත් වැඩේ දිල ඇති කට උත්තර නැති වෙන්න"

"ඒ කියන්නෙ තමන්ට කට උත්තර නැතිවෙන්න එහෙමද?" එයට දෙදෙනම සිනාසුනහ.

අනතුරුව තමාට පවරන ලද මෙහෙය ඉටු කළ ආකාරය වික්‍රම විසින් ලොක්කාට සවිස්තරව පවසනු ලැබීය. ඔහුගේ ඕමත් දිගු කතාවට සවන් යොමා සිටි තේනබදු අවසන සැහීම් පත් බවක් පල කළේය.

"බාරදුන්න වැඩේ හරියට කරල තියෙනව. මෙහාට ගන්නව කරුණාකරල රුපියල් පන්දාහෙ ඉතුරු සල්ලි. එතට මේනන කොහේද නැති එකෙක් අල්ලගෙන කට ගොන්නක් බිගෙන කෙළින් ඉන්නවත් බැරුව"

වික්‍රම මවිතයට පත්ව, කලිසම සාක්කුවට අත දමා ඉතිරි මුදල් ගැනීමට අග පත ගාන්නට විය.

"කෑවද රෑට?"

"මොන කනවද සර්? මේ එන ගමන්"

"මම කැම එක ඔෆිස්එකට ගෙන්නව ගත්ත. ඉතුරු එක කාල ගිහින් ටිකක් සූර් හිදෙන්න නොදට නිදාගන්නව. හෙට උදේ ඉඳල වැඩ ගොඩාක් තියෙනව."

වික්‍රම සාක්කුවට දැමූ අත එළියට ගත්තේ මුදල් නෝට්ටු කිහිපයක් ද සමඟය.

"ඔය සල්ලිත් තියාගෙන කාල ගිහින් නිදාගන්න. හැබැයි හරියට උදේ හතට ඉන්න ඕන ඔෆිස් එකේ. තේරුණාද?"

14

ආහාර ගැනීමෙන් පසු සමුගෙන යාන්තමට ඒ මේ අත වැනි වැනී පොලිස් බැරැක්කයේ කාමරය වෙත යන වික්‍රම දෙස තේනබදු අඩ සිනාවකින් යුතුව බලා සිට යළි රාජකාරියේ නියැලුණි.

දහවල ඔහු සොයා පැමිණි තරුණයන් දෙදෙනා ගැන ඔහුට සිහිපත් විය.

"සර් අපි වැඩ කරන්නෙ වෙලිකොම මිකැනික්ල නැටියට. ඔය පිටකෝට්ටේ පන්සල පාරේ. ඒ හරිය අයිති අපට බාරදීල තියෙන සෙක්ෂන් එකට"

තේනබදු තරුණයන් දෙදෙනා යාන්තමට නිරීක්ෂනය කළේය. "ඔය මිණිමැරුම වෙච්ච ගේ ළඟද තමන් එදා වැඩ කෙරුවේ?"

"නරියටම ඉස්සරහ ගෙදර. අපිට මතක් වුනෙ පහුගිය දවසෙ. ඒ ගෙදරට බෝම්බ ගහල, කැඩිල තිබුණ ඒරියල් එක ෆැට් කරන්න ගියාට පස්සෙ හොඳට මතකයි. වාහනේ හයිඒස් වෑන්

එකක්. එලවගෙන ගියෙ නෝන කෙනෙක්. කළු පාට කණ්නාඩි දෙකක් දාල. කොන්ඩෙ කොටට, කපල. හදිස්සියෙන් වගෙ යන්න හැදුව. වාහනේ දෙපැත්තෙයි පිටි පස්සෙයි මොකක්දෝ සලකුණක් තිබුණ.

"මෙන් මේ වගේ සලකුණක්ද තිබුණෙ?" යි තේනබදු වත්තල චමර්වව්ව හෝටලයේ අයකැමි කාන්තාව විසින් බාරදෙන ලද යතුරු රදනය තරුණයන්ට පෙන්වමින් ඇසීය.

දෙදෙනාම හිස් සලමින් එය අනුමත කලහ.

"හරියට නරි සර්, මේකම තමයි දොරේ තිබුණෙ ගොඩාක් ලොකුවට. තවත් මොනවද ලියල තිබුන ඉරට යටින් ඉංග්‍රීසියෙන්. ඒ අපි නොදන්න භාෂාවක්"

"ඔය කියන ගැනියි වාහනේයි බැරිවෙලාවත් ආපහු දැක්කොත් බැරිවෙයිද අඳුරගන්න?"

"මොකද බැරි, ඕන වෙලාවක පුලුවනි. ඒ නෝන අපිටත් ගෙම්බර් පාට් එකක් දාල ගියේ. වාහනේ මහොම ගැනුවම අනිත් බංගලාවලට යන්නෙ නමුසෙලාගෙ ඔළු ගෙඩියෙන්ද? ඉක්මනට අයින් කරගන්නව මම යන්නෙ හදිසි ගමනක්"

"හොඳටම විශ්වාසයි නේද ඒ වැන් එක ආවෙ ඒය කියන බංගලාවේ ඉඳල විත්තිය?"

"ඒ ගැන ආයි නෑ සර් කතා දෙකක්. ඇේටපුව හාපි ගාල ඇරල තිබුණෙ. අපි යන කල්ම ඉෆිස් එකව"

"වාහන නොම්මරේ එහෙම නැද්ද නිච්චියක්?"

"අනේ නැහැ සර්. අපිට වුවමනාවක් තිබුනෙ නැහැනේ වාහනේ නොම්බරේ බලන්න. හැබැයි වෑන් එක හයිඒස්"

"ඔය දෙන්නගෙම ඇඩ්‍රස් තියෙනව අපි ළඟ. දැන්වුවොත් එන්න ඕන. පොලිසියෙන් ඒවට ගෙවනව."

දින කිපයකට පෙර නැටීමට පටන් ගත් නොවිලය මේ වන විටත් සැහෙන ප්‍රමාණයකට, තුනෙන් දෙකකටත් වැඩි ප්‍රමාණයක් නටා අවසන්ය. නොවිලේ වැදගත් හා විශේෂ කොටස දහඅට පාලියෙනුත් පාලි දා ගනක්ම නටා අවසන්ය. දැන් ඉතිරි මහා පාලිය වන මහ සොහොන් සමයමය.

මුහුණ පුරා පොල්තෙල් මිශ්‍ර දැලි තවරා, බුරුල්ල කොල ඇඳුමෙන් සැරසී, දිව එළියට අදුන මුහුණකින් හිස වසා, කුකුල් බිල්ලක්ද අතැතිව රුදුරු වෙසින් ආතුරයා වෙතට අනපේක්ෂිත

ලෙස පැන ඔහු බියගන්වා සියලු රෝග නිවාරණය කර යක්ෂ, ප්‍රේත, භූතයින් පලවා හැරීම සමයමේ ඒකායන අරමුණය.

එය පැරදි ගියහොත් වෙනෙස මහන්සිව දිවා රෑ නොතකා නොබලා නටන ලද තොවිලයද ඉඩෙම නිකම්ම නිකම් පුස්සක් බවට පත්වනු නියතය.

එම නිසා අවසන් මහසෝන් සමයම නොවරදින සේ කල්යල් බලා ඇති සුපරික්ෂාකාරීව නිමකළ යුතු බාරදූර මාරක කර්තව්‍යයයි. එය නැටීම සඳහා සෑම අස්ථාවකම තෝරා ගනු ලබන කට්ටඩියාද අති දක්ෂ පලපුරුදු. මීට පෙර ආතුරයින් මෙල්ල කර සුවසෙන ළඟාකර දී ඇති ප්‍රවීනයෙකු විය යුතුමය. නමුත් තොවිලය සාර්ථක කරගැනීමෙහිලා අතබාල පරිවාර කට්ටඩින්ගෙන් ලැබෙන රුකුල හා සහායද සෑම අයුරින්ම අත්‍යාවශ්‍යය.

පසුදා උදැසන තේනබදු තම කාර්යාලය තුළ අසුන්ගෙන ඉන්නා විට වික්‍රම නියමිත වේලාවට ඔහු ඉදිරියට පැමිණියේය.

"මෝනිං සිර්....."

"මෝනිං.....කොහොමද ඊයේ රෑ හොඳට නින්ද ගියාද?"

"සැපට නින්ද ගියා සර්. බාරදූන්න වැඩේ නිතට කළ නිසා හිතේ බරක් නිබුනෙම නැහැ"

"දැන් කියද වෙලාව?"

"හතහමාරයි" ඒ වික්‍රමය.

"අපට මෙහෙන් පිටත් වුණොත් හලාවතට යන්න පැය කියක් විතර ගතවෙයිද?"

"ඉන්ටර්සිටි බස් එකෙන් ගියොත් නම් පැය දෙකයි"

"මේක ඉන්ටර්සිටි බස් වලින් යන ගමනක්නෙව්. මේක ජ්ලයිට් එකකටත් වඩා වේගයෙන් යන්න ඕන ගමනක්"

වික්‍රම සමඟ සිටි කොස්තාපල්වරුන් දෙදෙන ගල්ගැසී තේනබදු දෙස බලා සිටියහ.

"හරි අන්තිම චාන්ස් එක මේ දෙන්නෙ. අපි හරියටම අටට මෙහෙන් පිටත් වෙන්න ඕන. තව තියෙන්නෙ හරියටම විනාඩි විස්සයි. ඉක්මනට ජීප් එක රෙඩි කරගෙන මෙතෙන්ට එන්න හරියටම අටට."

ලොක්කාගේ විධානය පිළිගත් වික්‍රම එතැනින් ඉවත් වූයේ ඔහුට මේ අපරාධය පිළිබඳ කිසියම් පොටක් පැදිගෙන එන බවක්

ඉවෙන් මෙන් දැනුන නිසාවෙනි. තේනබදු මේපරම නොසන්සුන්තාවයට පත් අවස්ථාවක් මින් පෙර වික්‍රම දැක නැත.

මිරිහාන පොලිසියේ ජීප් රථය හලාවත නගරයට් සේන්ද වන විට වේලාව දහයයි කාලට පමණ විය. ජීප් රියේ රියදුරා ප්‍රෙඩී සැනසුම් සුසුමක් හෙලමින් පසෙක වාඩිගෙන සිටි තේනබදු දෙස බැලීය.

"සර් හලාවත වවුමට ආව. මෙතනින් අපි කොහාටද යන්නෙ? මෙතෙක් වේලා සමවැදී සිටි සමාධියෙන් අත් මිදුන තේනබදු රියදුරු දෙස සිය අවධානය යොමු කළේය.

"අපි යමු ඉස්කෝලෙට"

ප්‍රෙඩී කුකුස කැට බැල්මක් තම ලොක්කා දෙස හෙලීය.

"සර් ඉස්කෝලෙටයි කිව්වෙ"

"ඉස්කෝලෙට කිව්වෙ බාර් එකටද? යන්න ඕන හලාවත සෙන්ට්‍රල් එකට"

ප්‍රෙඩී අවිනිශ්චිත මද දෙගිඩියාවකය.

"මම හලාවත ගැන වැඩිය දන්නෙ...."

"සෙන්ට්‍රල් එක හොයා ගන්න හලාවත, ඉපදිල නැදිල වැවිල තියෙන්නම ඕනද? මම දන්නෙත් නැහැ, අනල බලන්නකො කොහේ හරි සෙන්ට්‍රල් එක තියෙන ඉසව්ව"

එයට ජීප් රථ සිටි තිදෙන සෙමින් සිනාසෙන ආකාරය තේනබදු, ප්‍රෙඩී දෙදෙනාටම නොපෙනුනා නොවේ.

උදින ගනිදාවක් බැවින් හලාවත මධ්‍ය මහා විද්‍යාලය පාසැල් නිවාඩුය. එහෙත් විවිධ ක්‍රීඩාවන්හි නිරතව සිටි සිසු සිසුවියන් පිටිටනිය පුරාම විසිර සිටියහ.

තේනබදු සහ වික්‍රම විදුහල් පතිතුමාගේ නිවහන වෙත කැඳවාගෙන යන ලද්දේ ක්‍රීඩා කරමින් සිටි සිසුන් නීප දෙනෙකු විසිනි. විදුහල්පතිතුමාගේ නිල නිවෙස පිහිටියේ පිටටනිය කෙලවරය.

පනස් වියේ පමණ අනුමාන කළ හැකි විදුහල්පතිතුමා පොලිස් නිලධාරීන් නෙත ගැටුණු විට පුදුමයෙන් හා කුතුහලයෙන් ඔවුන් දෙස බැලීය.

ප්‍රථමයෙන් තේනබදු ඔහු ඇමතීය.

"අපි මිරිහාන පොලිසියෙ. ප්‍රින්සිපල් මහත්තය

හම්බවෙන්න ආවේ. වැදගත් වැඩකට."

විදුහල්පතිතුමා ඔවුන් නිරීක්ෂණය කරන අතර, අඩ සිනාවකින් මුව සරසා ගත්තේය.

"එන්න ඇතුළට. එහෙම නැතුව මෙහාට ඒවි යැ හදිස්සියෙ"

දැන් තිදෙනම විදුහල්පති නිල නිවසෙ විසිත්ත කාමරයේ අසුන්ගෙනය.

අවුරුදු හතළිස් ගණන්වල පසුවන කාන්තාවක් සහ ළමයින් කීප දෙනෙකුද පොලිස් නිලධාරීන් දෙස යාන්තමට බලා ඉවත්ව යනු පෙනින.

"මහත්තයල මිරිහානෙ ඉඳලනේ ආව කිව්වෙ?"

"හරි, අපි ආවෙ මහත්තය හම්බවෙන්න වැදගත් වැඩකට"

විදුහල්පතිතුමා සිනාසෙන්නට විය.

"නැතුව මගේ දුක සැප අහල, බලල යන්න ආවාය. කියන්නකෝ බලන්න ආව කාරණේ"

විදුහල්පතිතුමා සහ තේනබදු අතර කතාබහ විනාඩි පහළොවකට පමණ සීමා විය. ඒ අතරතුර සපයන ලද තේ පැන් වලින් සංතර්පනය වූ තිදෙනම විදුහල් කාර්යාලයට ඇතුලුවූහ.

"අවුරුදු තිහකට තිස් පහකට ඉස්සර වෙලා නෙවි. මේ ඉස්කෝලෙ පටන් ගත්ත දවසෙ ඉඳලම පොත් පත් තියෙනව. මේ ඔෆිස් එකේ මහත්තෙයලම ඕන දේවල් හොයල බලල ගන්න. මගෙන් කිසිම බාධාවක් නැහැ. අනිත් එක මිණිමැරුමක් ගැන කිව්ව නේද?"

"ඔව් මහත්තයා"

"වෙන මොනවද මගෙන් කෙරෙන්න තියෙන්නෙ. සහයෝගය නොදුන්නොත් පැත්තක ඉන්න මටත් කම්බි ගණන් කරන්න වේවි කුට්ටක"

එයට පොලිස් නිලධාරීන් දෙදෙනා සිනාසුනහ.

"එහෙම වෙන්න අපි ඉඩතියනවද?" කී තේනබදු වික්‍රම දෙසට හැරුණි. "වික්‍රම ගිහින් අර දෙන්නව එක්ක එන්න. මෙතන පොත් පත් ගොඩාරියක් අවුස්සන්න වෙනව"

වික්‍රම විදුහල් කාර්යාලයෙන් ඉවත්ව ගොස් පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනා පමණක් නොව රියදුරු ප්‍රේඩිද කැටුව ආපසු පැමිණියේය.

"තේ බිව්ව නේද?"

"එහෙමයි සර්" ඒ එක් පොලිස් නිලයෙකි.

"දැන් තියෙනව පොඩි ජොබ් එකක්" කී තේනබදු පලපුරුදු ඉවත්විය.

ඔවුන් දෙදෙන ආලින්දයේ පහුටු පාමිවියේ යෙදී සිටින අතර කහ ගැසුණු ලෙජර් පොත් දෙකක් රැගත් වික්‍රම එතැනට පැමිණියේය. ඔහුගේ මුහුණ සිනාවකින් ප්‍රභාමත් වී තිබිණ.

"හරිද වැඩේ?" තේනබදු මහත් නොඉවසිල්ලෙන් විමසුවේය.

වික්‍රම නොරිස්සුම් සහගතව ලේඛන දෙක මහු අතට දුන්නේය.

"වැඩේ හරියට හරි සර්. අපි තුන්දෙනා නැවිල ඉන්නෙ දුවිලිවලින්. ඒ ඔෆිස් එක ජීවිතේටම සුද්ධ බුද්ද කරල අතුගාල නැහැ."

විදුහල්පතිතුමා සිනාසෙන්නට විය.

"දැන් ඉතින් වැඩේ හරිනේ" හලාටන පොලිසියටත් කියල බැරිද ශ්‍රමදානයක් දාල ඔය අතපහු වෙච්ච වැඩේ කරල දෙන්න. මේ ගේ පිටිපස්සෙ ටැංකියෙ වතුර පිරිල තියෙන්නෙ. ඔහින් නොදට මුහුණ කට සෝදා ගෙන පිරිසිදු වෙලා එන්න කට්ටියම " විදුහල්පතිතුමා වික්‍රමට සහ නිලධාරීන් දෙදෙනාට කරුණාන්විතව පැවසීය.

කල්යාණිගේ නැගනියගේ නම රශ්මිය. ඇය අක්කාට වඩා වසර දෙකකින් බාලය. තේනබදුට අවශ්‍යව තිබූ සියලුම විස්තර වික්‍රම විසින් රැගෙන එන ලද ලේඛනවලින් උපුටා ගන්නා ලදී.

කල්යාණි සහ රශ්මි පාසැලේ ඉගෙන ගත් කාලසීමාව තුළ සේවයේ යෙදී සිටි සියලුම ගුරුවරුන් ගුරුවරියන් දැනට විශ්‍රාම ගොස්ය. දැනට සේවයේ යෙදී සිටි විදුහල්පතිතුමා හෝ එම පාසලේම ගුරුවරියක් ලෙස සේවය කළ බිරිඳ කල්යාණි හෝ රශ්මි ගැන විස්තරයක් දැන නොසිටියහ. එසේ දැන සිටීමට හේතුවක්ද නොතිබුණි.

විදුහල්පතිතුමා සහ බිරිඳ විසින් සපයන ලද විශිෂ්ඨ ගනයේ දිවා ආහාරයෙන් පසු තේනබදු ඇතුළු නිලධාරීන් මද වේලාවක් විවේක සුවයෙන් පසුවූහ. අනතුරුව විදුහල්ගතිතුමාගෙන් ලබාගත් විස්තර, නොරතුරු අනුකූලව ඔය පොලිස් පිරිස එක්

www.buddhaliyan.com

නිවසක් දෙරිපිට ජීප් රථය නැවැත්වූහ.

නිවසේ වසා නිබූ දොර විවෘත කළ කාන්තාවක් ඉදිරියට පැමිණියාය. ඇය අවුරුදු තිස් පහක් පමණ තවමත් තරුණ පෙනුම තියැකී ගොස් නැති නැනැත්තියක් බැව් බැලූ බැල්මට පෙනින. පොලිස් ජීප් රථය දැක ඇය පුදුමයට පත් බවක් පල කළාය.

"මිස්ස් ජානකි වික්‍රමසිංහ ද නම්?"

වික්‍රමගේ දර්ශනයෙන් ඇය වඩාත් පුදුමයට පත්සේය.

"ඔව්, ඒ මම. ඒත් ඔයාල මෙහාට ආවේ.....? ඇය මවිතයට පත්ව ප්‍රශ්න කළාය

වික්‍රම යාන්තමට දසන් දක්වා සිනාවක් පෑවේය.

"නෝනල, මහත්තයල ටිකක් හම්බවෙලා ආස්සරේ කරල යන්න"යි විහිලුවක ස්වරූපයෙන් කිය.

තේනබදු ඇය දෙස හෙලුවේ නියුණු බැල්මකි. මෙතෙක් වේලා බලා නිහඬව සිටි ඔහු කාන්තාව දෙසට හැරුණි.

"පොලිසියෙන් ගෙවල්වලට ඇවිල්ල ප්‍රශ්න අහනවද නිකමට. සෙල්ලමට. බලන්නෙ නැද්ද පත්තර එහෙම. ටී. වී. අර කල්‍යාණිගෙ මහත්තයට වෙඩිනියල මරල දැම්ම එක ගැන තමන් දන්නෙම නැද්ද?"

ඇගේ දෙනෙත් එක්වරම මහත් විය.

"මොකද නැත්තෙ. අපි කල්‍යාණිට කෝල් කරලත් ඇහුව. අපේ කණගාටුවත් දැන්නුව"

"ඒක නෙවි. කල්‍යාණිගෙ නංගි ඔයාලත් එක්ක එක පන්තියෙ නේද ඉගෙන ගත්තෙ?"

"නැහුව. එයා අපේ නියම හාණ්ඩයක්, නියමෙට මිමින්, එක එක්නොගෙ කට හඬින් කතා කරනව ඒ විතරක්ද? අත් අරකුරු, මහත්තයගෙ අත්සන ගහවි මහත්තයටත් වැඩිය හොඳට"

තේනබදු සහ වික්‍රම එකිනෙකාගේ මුහුණ බලාගෙනය. මෙහිදී තේනබදු ප්‍රශ්නයක් නැඟිය. "එයාට ඕනෑම කෙනෙකුගෙ අත්අකුරු ලියන්න, ඕනෑම කෙනෙකුගෙ කට හඬින් කතා කරන්නත් දක්ෂතාව තිබුණද?

ඇය සිනාසෙන්නට වූවාය.

"මොකද නැත්තෙ? අපේ ඉස්කෝලෙ ඇනුවල් කොන්සට් වලදි එයා තමයි ප්‍රධාන පස්‌බිම් චරිතෙ. හතර පස් දෙනෙකුගෙ

වොයිස් වලට හඬ දුන්නෙ රශ්මි....." කටහඬ වෙනස්කරල කතාකරන එක හැමෝටම කරන්න පුලුවන් දෙයක් නෙව.

තේනබදු කාන්තාව දෙස හෙලුවේ උපහාසය මුසු බැල්මකි. "මැඩම්.....ඔබ ඔය ගුවන් විදුලියට එහෙම ඇනුම්කන් දෙනවා නම්, කටහඬ වෙනස් කරල කතා කරන උදවිය දුසිම් ගානෙ ඉන්නව, එහෙම නේද?"

ඇයද සිනාසුනාය. තේනබදු උපහාසයට ලක්කිරීමේ අභිප්‍රායෙනි.

"ඒ හොල්ලො කතා කරන්නේ එක්කෝ තුටේ ඇඟිලි ගහගෙන. නැත්නම් මොනව හරි තද කරගෙන. ඒත් අපේ රශ්මි කෙල්ල ඔය මේන කෙනෙල්මෙක් වත් නැතුව ඕනම කෙනෙකුගේ කටහඬකින් කතා කරනව, ඔයාට නැත්නම් මේ ඉන්න කාට හරි පුලුවන්ද මගේ කටහඬින් කතා කරන්න. මගේ යාලුවට තිබුණ ඒ නපන්කම. කාගෙහරි දෘෂ්‌ටියක් අපි අතේ කරන්න ඕන"

"එතකොට ඔය අත් අකුරු?"

"ඉන්ස්පෙක්ටර් එයාට තිබුනෙ පුදුම විදිහෙ දෘෂ්‌ටි දෙකක්. එකක් ඕනම කෙනෙකුගෙ අත් අකුරු ඒ විදියටම ඇලපිලි පා සිලි වෙනසක් නැතුව ලියන එක"

මේ සියලුම විස්තර ජානකි වික්‍රමසිංහගෙන් ලබාගත් බෙරිත් තේනබදු තමන් දැනුවත් කිරීම ගැන ඇයට කෘතඥතාවය පල කළේය.

15

ඩෙරික් තේනබදු දකුණු කොළඹ නියෝජ්‍ය පොලිස් අධිකාරි ට්‍රැසී අබේසුන්දර ඉදිරිපිට අසුන්ගෙනය.

"මොකද ඩෙරික්. අද එක විදියකට හිනාවක් මූණෙ ? කොහොමද විරසිංහ මරඩර් කේස් එකේ ඉන්ක්වයරිස් කෙරිගෙන යන්නෙ?"

තේනබදු ඔහු දෙස ගැඹුරු බැල්මක් හෙලීය.

"මම අතගහපු වැඩක් වැරදිල තියෙනවද සර් මෙච්චර කාලෙකට"

නියෝජ්‍ය පොලිස් අධිකාරිවරයාගේ පෙනුම වෙනස්ව පුදුමය කැටි බැල්මක් දෙනෙතට නැගෙන අන්දම තේනබදු හොඳින් බලාගෙනය.

"අතීතය ගැන නෙවි මම අහන්නෙ. වර්තමානෙ, මේ දවස්වල කරගෙන යන ඉන්ක්වයරි එක ගැන"

"ඔය තියෙන්නෙ මම කිව්ව විදියට පරීක්ෂණ වාර්තාව සර්ගෙ මේසෙ උඩ....ඉස්සරහ ටිකක් කියවල බැලුවොත්

නරකද?"

මෙය මුල සිටම දවන්ද සටනක ස්වරූපයක් ගත් පරීක්ෂණයකි.

ඔහු තමා ඉදිරියේ තැන්පත් කරන ලද යතුරු ලියන පිටු රැසකින් සමන්විත වාර්තාව ගෙන නොකියවා පිටු පෙරළීමෙන් පසු තේනබදු දෙස බලා සිනාසුනේය.

"මේක අරාබි නිසොල්ලාසෙ වගෙයි. කියවල ඉවර වෙන්න යාව් සැහෙන වෙලාවක්. මට කියන්නකො විස්කර කෙටියෙන්"

සේවකයෙකු විසින් අබේසුන්දරගේ අණපරිදි රැගෙන එන ලද තේ කෝප්පය පානය කරමින්, තේනබදු මිණිමැරුම පිළිබඳ තමා විසින් කරන ලද පරීක්ෂණ- ප්‍රශ්න කරන ලද පුද්ගලයන් ආ ගිය හා යාමට සිදු වූ තැන්, මිණිමැරුමට කෙළින්ම සම්බන්ධ අත්අඩංගුවට ගතයුතු සැලොම් නැන දීර්ඝ විස්තරයක් කරගෙන යද්දී පොලිස් අධිකාරිවරයා විවිධ අතුරු ප්‍රශ්න තුළින් තේනබදු වෙහෙසට පත් කිරීමට වෙරදැරූ නමුදු අවසන පරීක්ෂණය තත්ත්වාකාරව පවත්වා ඇති බව පිළිගත්තේය. ඔහු එසේ කළේ නරමක නොකමැත්තක් හා පසුබැමකින් යුතුවය.

"තඩුව ඔප්පු කරන්න පුලුවන් කෙස් ගහට. සාක්ෂි තියෙනව ඉහටත් උඩින්. සැකකාරයො දෙන්නෙක් අත් අඩංගුවට ගන්න එක සිම්පල්. ඒත් අපිට අවශ්‍ය හැම දෙයක්ම අකුරට ප්ලෑන් කරල වැඩේ නියමෙට දුන්න එක්තෙනා අල්ල ගන්න එක"

තේනබදු තේ කෝප්පය අවසන් වන තෙක්ම පානය කර සිනාසෙමින් අසුනෙන් නැඟී සිටියේය.

"සර් ඔය රිපෝට්ස් එක කොයි එකටත් ටිකක් උඩින් පල්ලෙන් හරි කියවන්නකො. මම එනව විනාඩි දහයෙන්"

ට්‍රැසී අබේසුන්දර සිනාසෙන්නට විය. "කමක් නැහැ. මම හිටියට, බොන්න සිගරට් එක සීට් එකේ ඉදගෙන"

"මට යන්න ඔන ටොයිලට්. විනාඩි දහයෙන් ආපහු එනව සර්"

මෙතෙක් වාර්තාව දෙස නෙත් රඳවාගෙන සිටි පොලිස් අධිකාරිවරයා එය අතට ගන්නේය. මද වේලාවකින් ආපසු පැමිණි තේනබදු තම ජ්‍යේෂ්ඨ නිලධාරියා ඉදිරිපිට අසුන් ගත්තේය.

"ඉර ලකුණ දරණා ගෙදර දොර අවශ්‍යතාවයන් පැකට වශයෙන් අසුරන ලද කුළුබඩු, පපඩම්, නුඩ්ලස්, සෝස් වර්ග, එටනි, මේක එක විදියක මහා පරිමාණෙන් කෙරීගෙන යන ව්‍යාපාරයක්"

තේනබදු හිස සැලීය. "ඒ ආයතනයේ නිෂ්පාදන මුළු ලංකාවෙම බෙදා හරිනවා. ඩිලිවරි වෑන් වලින්. සේවකයොත් දෙනුන් සීයක් වැඩ"

"අපේ වැඩකාරයො මොනවද එතන කරන්නෙ? කොම්පැනිය අයිති එයාටද?"

"නැහැ අවුරුදු කීපෙකට කළින් එයා සේල්ස් මැනේජර් කෙනෙක් හැටියට කොම්පැනියට බැඳිල තියෙන්නෙ. දැන් විධායක ශ්‍රේණියෙ කෙනෙක් හැටියට වැඩ කරන්නෙ. නිෂ්පාදනය බෙදා හැරීමේ අංශයෙ නිතරම පිටපළාත්වලටත් යනව. එනව"

"කේස් එක ඉවරයිනේ, අත අඩංගුවට ගත්තම"

"ඒක සහතික ඇත්ත. මිස්ටර් වීරසිංහට වෙඩි තියල තිබුන රිවෝල්වර් එක දිහා බැලුවම වැඩෙට පාතාලෙත් සම්බන්ධ කරගෙන තියෙන විත්තිය මට හිතෙනව. මේ සැකේට භාජනය වෙලා ඉන්න පුද්ගලයා හලාවත පැත්තෙ කසිප්පු එහෙම පෙරල. මහා පරිමාණෙන් බෙදා හරින නයිට ක්ලබ් කාරයෙක් එක්කත් නුහාක්ම කිට්ටු සම්බන්ධකමක් තිබිල තියෙනව. දැනටත් තියෙනව. ඔය රිපෝට් එකේ ඇති ඔක්කොම විස්තර. සර් කියවලා බලල තීරණයක් ගන්න."

පොලිස් අධිකාරී අබේසුන්දර මද වෙලාවක් නිහඬව තේනබදු දෙස බලා සිටියේය.

"හෙට උදේ දහයට ඔෆිස් එකට එන්න මම රිපෝට් එක කියවල බලල එස්. පී. මහත්තය එක්කත් සාකච්ඡා කරල තීරණයක් ගන්නවා."

පසුදින සහකාර පොලිස් අධිකාරීවරයා හමුව කළ සාකච්ඡාවෙන් පසු වීරසිංහගේ මිණීමැරුම සම්බන්ධයෙන් සැකකළ තිදෙනාගෙන් දෙදෙනෙකු වන ජේමිස් සහ වඩිවෙල් අත් අඩංගුවට ගෙන ඔවුන් සමඟ වත්තල පිහිටි ඉර ලකුණ නිෂ්පාදන ආයතනයට පැමිණි තේනබදු සහ වික්‍රම එක් කාන්තාවක් රාජකාරියෙහි බැව් ආරක්ෂක අංශයෙන් විමසා

දැනගෙන කමිහල තුළට ගමන් කරද්දී ආරක්ෂක නිලධාරී විසින් දුරකතනය මඟින් මේ බව ඇතුලේ කාර්යාලයක් තුළ සිටී ඇයට වහාම දන්වනු ලැබිය.

දැන්වල විලංගු සහිතව ජේමිස් සහ වඩිවෙල් සමඟ නිලධාරීන් දෙදෙනා ඇගේ කාර්යාලයට ඇතුලු වෙද්දී සිරිදෙනා ඇගේ දෙතොලට නැගුනේ වියරු සිනාවකි.

ඇය රශ්මිය. ඈ කලයාණිගේ එක කුස උපන් සොහොයුරියයි.

"එන්න ඉන්ස්පෙක්ටර් ඇතුලට.....දවස් දෙක තුනකට කළින් ඉඳල වැඩේ ගැන මට ඉව වැටුනා.....මේ ඔයාල බලා පොරොත්තුවෙන් හිටියෙ."

සාවඥ එහෙත් ටියරු නඩකින් කි රශ්මි එක්වරම අසුනෙන් නැගී සිටියාය. ඇගේ අත පොයින්ට දෙකයි දෙක .22 ලියුගර් වර්ගයේ රිවෝල්වරයකි.

රශ්මි සත්සුන්ව වචන හරඹ කරන්නට පුළුවන. "ඉන්ස්පෙක්ටර් එකෙක් මැරුවත්, දෙනුන් දෙනෙක් මැරුවත් එකම පනිෂ්මන්ට් එක. මේ කාලකන්ණි පාතර බල්ලො දෙන්න හින්ද නමයි මාත් කොටුවුනෙ."

ඇය විසින් එල්ල කරන ලද වෙඩි පහරවල් දෙක කානෙන ලේ වගුරවමින් ජේමිස් සහ වඩිවෙල් බිම පතිත වන්වාත් සමඟම ඉද්ද ගැසුවාක් මෙන් ඇය වෙත කඩා පැන්න තේනබදු සහ වික්‍රම ඇය මෙල්ල කර ඇය අත් අඩංගුවට ගන්නා විට මුලු කාර්යාලයම වෙඩි හඬින් නා ජේමිස් නා වඩිවෙල් දෙදෙනාගේ මර හඬින් සසලව ගියේය.

තේනබදු නා වික්‍රම වෙඩිවැදී කෙදිරිගාමින් සිටී ජේමිස් සහ වඩිවෙල් වහාම තවත් පොලිස් නිලධාරීන් දෙදෙනකු සමඟ රශ්මිද කැටුව මිරිහාන පොලිස් ස්ථානය බලා පිටත්වූහ.

16

ඉන්ස්පෙක්ටර් ඩෙරික් තේනබදු සහ වික්‍රම ජයවීර පිට කෝච්චියේ රාජ්‍යෝ විහාර පාරේ වීරසිංහ නිවසට පැමිණෙන විට වේලාව රාත්‍රී අටට පමණ ආසන්නය. ඔවුන් දුටු නිවැසියන්, අනෝමා, වික්ටර්, සහ සුදත් තිදෙන බියපත් වූහ.

ජේමිස් සහ වඩිවේල් උදේ කාලයේ පොලිසියෙන් රැගෙන යාම ඔවුන්ගේ කුතූහලයට ප්‍රධාන හේතුව විය.

නිමේ සහ ප්‍රේමා කුස්සියේ රාත්‍රී ආහාරය පිළියෙල කරමින් සිටියහ.

"එන්න! එන්න!! ඉන්ස්පෙක්ටර් මහත්තුරු දෙන්න ඇතුළට. අපි බයෙන් හිටියෙ ජේමිස්. වඩිවේල් දෙන්න පොලිසියෙන් අරගෙන ගියාට පස්සෙ" වික්ටර් කීවේ අපහසුවෙන් නමුත් කාලෝචිතව දෙතොලට සිනාවක් නගා ගනිමිනි.

පොලිස් නිලධාරීන් දෙදෙනා ගෙතුළට පිය නගන අතර වටපිටාව හොඳින් නිරීක්ෂණය කලහ.

"බෝම්බ ගහල කැඩුණු බිඳුණු ඒව හදල තියෙන්නෙ

නියමෙට. තිබුණටත් වැඩිය හොඳට - තේනබදු සිනාමුසුව සඳහන් කළේය.

වික්ටර් බවුන් දෙදෙනා අසුන් ගැන්විය. සුදත් සහ අනෝමා තවමත් වාඩිගෙන සිටි අසුන්වලය. ඔවුන් තවමත් පසුවන්නේ බියෙන් නා සැකයෙනි.

"අපේ ජ්. එස්. පී. අබයසුන්දර කිව්ව වගෙ මොනවද කරන්න බැරි සල්ලි බාගෙ අතමිටේ ගැවසෙන කොට. ඒත නෙවි සර්, මොකද ඇත් වෙලා තියෙන්නෙ. වෙන්න යන්නෙ ඉස්සරහට?" වික්ටර් ප්‍රශ්නයක් නැගීය.

තේනබදු නා වික්‍රම එකිනෙකාගේ මුහුණ බලා ගත්හ.

"වෙන්න ඕන හැම දේම සිද්ධ වෙලා ඉවරයි. මයගොල්ලා අඳුරනවද, නැත්නම් අහල තියෙනවද රණ්මි ගැන? කල්යාණිගෙ නංගි ගැන?"

අනෝමා සහ සුදත් වික්ෂිප්තවය.

"අපි එයා ගැන මොකුත්ම දන්නෙ නැහැ"

ඉන්පසු තේනබදු කළ විස්තරය විඩිත්ත කාමරයේ සිටි තිදෙනා පමණක් නොව මුලු නැන් ගෙයි සිට පැමිණි නිමේ සහ ප්‍රේමා පවා අසා සිටියේය. පුදුමයෙනුත් පුදුමයට පත්වය.

"එතකොට ජේමිස් නමැයි මේ අදහස කල්යාණිගෙ නංගිගෙ ඔළුවට දාල තියෙන්නේ " ජ් වික්ටර්ය.

"නැතුව, උෑට හම්බවුනා ලෂයක්. රණ්මි මහත්තයගෙන් විරසක වෙලා ඉන්නෙ. මිනිහ ක්ලබ් කාරයෙක්.....අත්තගෙ දුවට ලෂ පහක් දැවැද්දට දුන්න. කණකර, රෙදිපිළි, එහෙමත් ගත්ත. කල්යාණිටත් ලක්ෂයක් විතර දුන්න. ඉතුරු හරිය ගැනි තියාගෙන ජොලියෙ ඉන්න බැලුවෙ"

"එතකොට ආයුධ එගෙම කොයින්ද?"

"ඒව අරගෙන තියෙන්නෙ එයාගෙ මහත්තය ක්ලබ් කාරය මහත්තයගෙ ගෝලයො දාල. හෙට මුලු රොත්තම ගන්නව හිර බාරෙට."

වික්ටර් කෘතඥපූර්වක බැල්මක් නිලධාරීන් දෙදෙනා දෙස හෙලීය.

"සර්ලට අපෙන් මොනවද කෙරෙන්න ඕන, තොන්දුවි අපේ බෙල්ලෙන් ගැලෙව්වට?"

ඉන්ස්පෙක්ටර් තේනබදු සිනාසෙන්නට විය.

"අපිට ඔයාගෙන් මොකුත්ම එපා. දෙපාර්තමේන්තුවෙන් අපට ලැබෙන්න තියෙන දේවල් නියම වෙලාවට ලැබෙවි. අපි දෙන්න කුත්දෙනාට විතරක් නෙවි. අපේ ලොක්කත්ට එක්ක"

buddyalbums
www.buddyalbums.net

අග්නි වර්ෂ

ඩීමන් ආනන්ද

මේ ඩීමන් ආනන්ද නම් වූ මිනිසා ලොව දුඩියරීතුරු සොල්දාරයෙකු විය. සමාජයට විනාශකාරී වූ අපරාධකාරයන් විරුද්ධ වූවාට හොඳ වීමට හේ සිය පැන මෙහෙය. ඔහු පුළුවන්කම ජයගත් වීරයකු මෙන්.

අරාබි සිඳුබාද්ලාසයේ ඇති කතා ගණනටත් වැඩියෙන් කතා ගණනක් ලියා ලංකාවේ ජනප්‍රිය නොව මුළු මහත් ආසියාවේම වාර්තාගත වූ කතිකාචාර්යයා ඔහු ය. මාරක කතා, ත්‍රාසජනක කතා, ප්‍රේම කතා ලියා පාඨකයා රසවත් කළ ඩීමන් ආනන්ද දිගු නිහැඬියාවකට පසු ලියූ 1013 වන නවකතාවයි "අග්නි වර්ෂ".

ISBN 955-8091-43-X

රු. 160

ප්‍රකාශනය

තාරක ප්‍රකාශකයෝ

Re Upload By
www.sinhalaelibrary.com

තම කාලය, ශ්‍රමය වැය කරමින් අන්තර්ජාලයට මෙම
පොත් එක්කල සියල්ලන්ටම අපගේ හෘදයාංගම
ස්තුතිය පුදකරමි!